77 වන කාණ්ඩය
3 වන කලාපය

සෙනසුරාදා
1968 පෙබරවාරි 10

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

නිල වාර්තාව

### අන්තර්ගත ප්‍රධාන කරුණු

ඔඩිටර් ජනරාල්ගේ වාර්තාව [තී. 289]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තී. 290]

පෞද්ගලික මන්ත්‍රීගේ පනත් කෙටුම්පත [තී. 315] :
**Kataragama Bauddha Seva Mandalaya (Incorporation) Bill—** [එම්. එස්. අමරසිරි මයා.]
පළමුවන වර කියවන ලදී.

වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්නය : 68-2-9 වන දින "සිලෝන් ඩේලි නිව්ස්" වාර්තාව [තී. 316]

ඉන්දු-ලංකා ගිවිසුම (ක්‍රියාවට නැංවීමේ) පනත : නියෝග [තී. 318] :
විවාදය කල් තබන ලදී.

කල් තැබීමේ යෝජනාව [තී. 433]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 77
இல. 3

சனிக்கிழமை
10 பெப்ரவரி, 1968

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

*அதிகார அறிக்கை*

*பிரதான உள்ளடக்கம்*

கணக்குப் பரிசோதனை அதிபதியின் அறிக்கை [ப. 289]

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப. 290]

தனி அங்கத்தவர் மசோதா [ப. 315] :
Kataragama Bauddha Seva Mandalaya (Incorporation) Bill—
*[திரு. எம். எஸ். அமரசிறி]—முதன்முறை மதிப்பிடப்பட்டது*

சிறப்புரிமை விடயம் : 9.2.68 சிலோன் டெயிலி நியூஸ் அறிக்கை [ப. 316]

இந்திய-இலங்கை ஒப்பந்தம் (செயற்படுத்தல்) சட்டம் : பிரமாணங்கள் [ப. 318]
*விவாதம் ஒத்திவைக்கப்பட்டது*

ஒத்திவைப்புப் பிரேரணை [ப. 433]

---

Volume 77
No. 3

Saturday
10th February 1968

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS

REPORT OF THE AUDITOR-GENERAL [Col. 289]

ORAL ANSWERS TO QUESTIONS [Col. 290]

PRIVATE MEMBER'S BILL [Col. 315] :
Kataragama Bauddha Seva Mandalaya (Incorporation) Bill—
[Mr. M. S. Amarasiri]—Read the First time

QUESTION OF PRIVILEGE : "CEYLON DAILY NEWS" REPORT OF 9.2.68 [Col. 316]

INDO-CEYLON AGREEMENT (IMPLEMENTATION) ACT : REGULATIONS [Col. 318] :
Debate adjourned

ADJOURNMENT MOTION [Col. 433]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

## பிரதிநிதிகள் சபை

## *House of Representatives*

**1968 පෙබරවාරි 10 වන සෙනසුරාදා**

*சனிக்கிழமை, 10 பெப்ரவரி 1968*

*Saturday, 10th February 1968*

---

අ. භා. 2 ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. කථානායකතුමා [ගරු එස්. සී. ෂර්ලි කොරයා] මූලාසනාරූඪ විය.

சபை, பி. ப. 2 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [கௌரவ எஸ். சி. ஷேளி கொறயா] தலைமை தாங்கினார்கள்.

*The House met at 2* P.M., MR. SPEAKER [THE HON. S. C. SHIRLEY COREA] *in the Chair.*

---

## ඔඩිටර්ජනරාල්ගේ වාර්තාව

*கணக்குப் பரிசோதனை அதிபதியின் அறிக்கை*

AUDITOR-GENERAL'S REPORT

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

I present the first instalment of the Report of the Auditor-General, under Article 71 (2) of the Ceylon (Constitution and Independence) Orders in Council, 1946 and 1947, on the Accounts of the Government of Ceylon for the financial year 1966-67. (Part I).

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන (කර්මාන්ත හා ධීවර ඇමති)**

*(கௌரவ டீ. பி. ஆர். குணவர்தன—கைத்தொழில், கடற்றொழில் அமைச்சர்)*

(The Hon. D. P. R. Gunawardena—Minister of Industries and Fisheries)

I move,

"That the first instalment of the Report of the Auditor-General, under Article 71 (2) of the Ceylon (Constitution and Independence) Orders in Council, 1946 and 1947, on the Accounts of the Government of Ceylon for the Financial year 1966-67 (Part I) be printed."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.

அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.

*Ordered that the Report be printed.*

2—ඒ 11283—793 (68/2)

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු

*வினாக்களுக்கு வாய்மூல விடைகள்*

ORAL ANSWERS TO QUESTIONS

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

4 වන ප්‍රශ්නය.

**ගාමිණී ජයසූරිය මයා. (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. காமனி ஜயசூரிய—கல்வி, கலாசார விவகார அமைச்சரின் பாராளுமன்றக் காரிய தரிசி)*

(Mr. Gamani Jayasuriya—Parliamentary Secretary to the Minister of Education and Cultural Affairs)

මේ ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට සතියක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

வினவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

5 වන ප්‍රශ්නය.

**ජයසූරිය මයා.**

*(திரு. ஜயசூரிய)*

(Mr Jayasuriya)

ඒ ප්‍රශ්නයට පිළිතුරු දීමට මාසයක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

வினவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down*

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

Question No. 6.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන (විද්‍යාත්මක පර්යේෂණ හා නිවාස ඇමති)**

*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன—விஞ்ஞான ஆய்வு, வீடமைப்பு அமைச்சர்)*

(The Hon. M. D. H. Jayawardena—Minister of Scientific Research and Housing)

The Hon. Minister of Home Affairs would like to have two months' time to answer this Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

வினவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*

### ජේ. ආරියවංස මහතා, බිබිලේ රජයේ වී ගබඩාවේ මුරකරු

திரு. ஜே. ஆரியவங்ச, பிபில அரசினர் நெற்களஞ்சிய காவல்காரர்

MR. J. ARIYAWANSA, WATCHER, GOVERNMENT PADDY STORES, BIBILE

7. **ආර්. එම්. ධර්මදාස බණ්ඩා මයා.** (බිබිලෙ)

*(திரு. ஆர். எம். தர்மதாச பண்டா—பிபிலை)*

(Mr. Dharmadasa Banda—Bibile)

කෘෂිකර්ම හා ආහාර ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) බිබිලේ රජයේ වී ගබඩාවේ 1963.9.9 සිට අනියම් මුරකරුවෙකු වශයෙන් වැඩකරන ජේ. ආරියවංශ නමැති අය මේතාක් ස්ථිර කර නොමැති බව එතුමා දන්නවාද? (ආ) මෙම අය ස්ථිර කිරීමට කටයුතු කරන්නේද? ඒ කවදාද? (ඉ) නොඑසේනම්, ඒ මන්ද?

*விவசாய, உணவு அமைச்சரைக் கேட்ட வினா: (அ) பிபிலை அரசினர் நெற்களஞ்சியத்தில் 9.9.1963 இலிருந்து சமயோசித காவல்காரராக வேலை செய்யும் திரு. ஜே. ஆரியவங்ச இதுவரை நிரந்தரமாக்கப்படவில்லையென்பதை அவர் அறிவாரா? (ஆ) இவரை நிரந்தரமாக்குவதற்கு அவர் நடவடிக்கை எடுப்பாரா? அங்ஙனமாயின், எப்போது? (இ) அன்றேல், ஏன்?*

asked the Minister of Agriculture and Food: (*a*) Is he aware that J. Ariyawansa who has been a casual watcher at the Government Paddy Stores, Bibile, since 9.9.1963 has not been absorbed into the permanent staff as yet? (*b*) Will action be taken to absorb him into the permanent staff and when? (*c*) If not, why?

**පී. සී. ඉඹුලාන මයා. (කෘෂිකර්ම හා ආහාර ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. பீ. சீ. இம்புலான—விவசாய, உணவு அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. P. C. Imbulana—Parliamentary Secretary to the Minister of Agriculture and Food)

(අ) එනමින් මුරකරුවෙක් නැත. (ආ) පැන නොනගී. (ඉ) පැන නොනගී.

**ධර්මදාස බණ්ඩා මයා.**

*(திரு. தர்மதாச பண்டா)*

(Mr. Dharmadasa Banda)

ගරු කථානායකතුමනි, ජේ. ආරියවංශ නමින් අනියම් මුරකරුවකු බිබිලේ රජයේ වී ගබඩාවේ නැද්ද කියා දැන ගන්නට කැමතියි.

**ඉඹුලාන මයා.**

*(திரு. இம்புலான)*

(Mr. Imbulana)

ඔය නමින් මුරකරුවෙක් නැහැ. වෙන නමකින් නම් මුරකරුවකු සිටිනවා.

### ඉඟිනියාගල-පල්ලන්ඔය පාර

இங்கினியாகல—பல்லன் ஓயா தெரு

INGINIYAGALA-PALLANOYA ROAD

8. **ධර්මදාස බණ්ඩා මයා.**

*(திரு. தர்மதாச பண்டா)*

(Mr. Dharmadasa Banda)

ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ඉඟිනියාගල-පල්ලන්ඔය පාරේ තාර දැමීම සඳහා ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයෙන් 66/67 වර්ෂයේදී මුදල් වෙන්කර කොන්ත්‍රාත් කැඳවා වැඩය ගිවිසුම් පිට භාරදුන් බව එතුමා දන්නවාද? (ආ) මෙම වැඩය සඳහා ගිවිසුම් අත්සන් කර ඇති මුදල කොපමණද? (ඉ) මෙතෙක් මෙම පාරේ කොපමණ වැඩ කර තිබේද? (ඊ) මෙම පාරේ වැඩ හදිසියේම නවත්වා ඒ සඳහා එකතු කර ඇති ගල් ආදී භාණ්ඩ වහාම වෙනත් පාරකට ගෙනයෑම සඳහා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නැගෙනහිර ප්‍රදේශයේ නිලධාරියෙක් කොන්ත්‍රාත්කරුට නියෝග දී ඇති බව දන්නවාද? (උ) මණ්ඩලයේ තීරණයක් නිලධාරියකු විසින් මේ අන්දමින් වෙනස් කිරීමට එම නිලධාරියාට නියෝගයක් දී තිබේද? (ඌ) එසේනම්, ඒ කවරෙකු විසින්ද? (එ) මෙම පාරේ වැඩ පෙර පරිදි ගිවිසුමේ ප්‍රකාර කරගෙන යෑමට අවශ්‍ය කටයුතු කරන්නේද? (ඒ) නොඑසේ නම්, ඒ මන්ද?

*காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா: (அ) இங்கினியாகல—பல்லன் ஓயா தெருவில் தாரிடுவதற்காக ஆற்றுப் பள்ளத்தாக்கு அபிவிருத்திச் சபையின் 1966-67 ஆம் ஆண்டில் நிதியொதிக்கி, கேள்விப் பத்திரம் கோரி, ஒப்பந்தமும் கையளிக்கப்பட்டதை அவர் அறிவாரா? (ஆ) இவ்வேலைக்கென ஒப்பந்தஞ் செய்யப்பட்டுள்ள தொகை எவ்வளவு? (இ) இதுவரை இந் தெருவில் எவ்வளவு வேலை முடிவடைந்துள்ளது? (ஈ) இத்தெருவின் வேலையைத் திடீரென நிறுத்தி, இதற்காகக் குவிக்கப்பட்ட கல் முதலிய பொருள்களை உடனே வேறு தெருவிற்குக் கொண்டு செல்லுமாறு கிழக்குப் பகுதி உத்தியோகத்தரொருவர் ஒப்பந்தகாரருக்குக் கட்டளையிட்டுள்ளாரென்பதை அவர் அறிவாரா? (உ) சபையின் தீர்மானத்தை உத்தியோகத்தரொருவர் இம்மாதிரி மாற்றுவதற்கு, அவ்வுத்தியோகத்தருக்குக் கட்டளையிடப்பட்டுள்ளதா என அவர் தெரிவிப்பாரா? (ஊ) அவ்வாறெனில், யாரால் கட்டளையிடப்பட்டது? (எ) இத்தெருவின் வேலையை முன்போல ஒப்பந்த நிபந்த...களின்படி செய்வதற்கு அவர் வேண்டிய நடவடிக்கை எடுப்பாரா? (ஏ) அன்றேல் ஏன்?*

asked the Minister of Land, Irrigation and Power: (*a*) Is he aware that funds were allocated in 1966-67, tenders were called and the contract given by the River Valleys Development Board for the tarring of the Inginiyagala-Pallanoya Road? (*b*) What is the sum agreed upon for this work in the contract? (*c*) What progress has been made on work on this road? (*d*) Is he aware that an officer in the Eastern region has ordered the contractor to stop work on the road immediately, and to remove the metal and other materials kept for the purpose to another road? (*e*) Since it is a decision of the Board that has been changed by an officer in this manner, will he state whether this officer was ordered to do so? (*f*) If so, by whom? (*g*) Will he take necessary steps to enable the work on this road to proceed as before, in terms of the contract? (*h*) If not, why?

**සී. පී. ජේ. සෙනෙවිරත්න මයා. (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. சீ. பீ. ஜே. செனெவிரத்ன—காணி, நீர்ப்பாசன. மின்விசை அமைச்சரின்பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. C. P. J. Seneviratne—Parliamentary Secretary to the Minister of Land, Irrigation and Power)

(අ) පල්ලන්ඔය-ඉගිනියාගල පාරේ කොටසක් තාර මැකඩම් දමා තැනීම සඳහා, 1966-67 දී මුදල් වෙන් කරනු ලැබ, විවෘත ටෙන්ඩර් ද කැඳවන ලදී. එහෙත් ටෙන්ඩර් මිළ ගණන් අධික බව පෙනී ගිය හෙයින් මණ්ඩලය විසින් අනුමත කළ මිළ ගණන් අනුව මේ වැඩය කළ යුතුයයි මධ්‍යම ටෙන්ඩර් මණ්ඩලය තීරණය කළාය. (ආ) මණ්ඩලය විසින් අනුමත කළ මිළ ගණන් අනුව වැඩ කිරීම සඳහා එකක් රු. 8,000 සිට රු. 12,000 දක්වා ගණන්වලට වැඩ ගිවිසුම් අටකට බෙදනු ලැබීය. (ඉ) 1967.9.30 දින වන විට, සක්කගල් කියුබ් 45ක් සහ කැටගල් කියුබ් 35ක් පාරට ගෙන ඒම ආදී වශයෙන් වැඩෙන් සුළු කොටසක් කරන ලද අතර, 1967-68 අයවැයෙහි මුදල් නොමැති වීම නිසා වැඩ නවත්වන ලදී. (ඊ) මේ පාරේ වැඩ නවත්වන ලද්දේ 1967-68 දී මුදල් නොමැති වූ නිසාය. කැටගල් වෙනත් පාරකට ප්‍රවාහණය කිරීමට නියෝග කිරීම හෝ වැඩය කිරීමද කර නැත. (උ) ඉහත (ඊ) ඡේදය හේතුකොටගෙන මේ ප්‍රශ්නය මතු නොවේ. (ඌ) මතු නොවේ. (එ) හා (ඒ) මෙම මණ්ඩලය මගින් ගල්ඔය ප්‍රදේශයේ කරණු ලබන වැඩ රජයේ දෙපාර්තමේන්තු වෙත භාර දීගෙන යයි. මෙම පාරෙහි වැඩ, එම කාර්ය අදාළ දෙපාර්තමේන්තුව මගින් කරනවා ඇත.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ධර්මදාස බණ්ඩා මයා.**
*(திரு. தர்மதாச பண்டா)*
(Mr. Dharmadasa Banda)

දෙන ලද පිළිතුර අනුව පෙනී ගියේ මුදල් නොමැතිකම නිසා 1967/68 මුදල් වර්ෂයේදී වැඩ නතර කරන්නට සිදු වූ බවයි. එහෙත් ගල්ඔය සංවර්ධන මණ්ඩලයේ හැම පාරක්ම වාගේ සාදාගෙන යන බව මා හොඳටම දන්නා කරුණක් නිසා මුදල් නැති වුණේ මේ පාර සෑදීමට පමණක්දැයි දැන ගන්නට කැමතියි. පාර සෑදීම නතර කරන්නට සිදු වුණේ වෙන යම් හේතුවක් නිසාදැයි දැනගන්නට කැමතියි.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

1967/68 අයවැය ලේඛනයෙහි මුදල් නොමැතිවීම නිසා වැඩ නතර කරන ලද බවයි කිව්වේ.

**ධර්මදාස බණ්ඩා මයා.**
*(திரு. தர்மதாச பண்டா)*
(Mr. Dharmadasa Banda)

ගල්ඔය සංවර්ධන මණ්ඩලයේ සෑම පාරකටම ඔය තත්ත්වය බල පෑවාද? ඒ ප්‍රතිපත්තිය සෑම පාරකටම ඒ විධියටම අනුගමනය කර තිබෙනවාද?

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

මුදල් මදි වූ නිසයි වැඩ කිරීම නැවැත්තුවේ.

**ධර්මදාස බණ්ඩා මයා.**
*(திரு. தர்மதாச பண்டா)*
(Mr. Dharmadasa Banda)

මේ අවුරුද්දේ නැවත වරක් වැඩ පටන් ගන්නවාද?

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

මේ ප්‍රදේශය මණ්ඩලයෙන් ඉවත් කර දෙපාර්තමේන්තුවට භාර දීමට දැන් වැඩ කටයුතු කරගෙන යනවා. එවිට ඒ පාරේ වැඩත් රජයේ වැඩ දෙපාර්තමේන්තුවෙන් හෝ ගම්කාර්ය සභාවෙන් හෝ කෙරෙනවා ඇති.

## නිවාස ණය : රජයේ සේවකයින්ට ප්‍රමුඛත්වය

*வீடமைப்புக்கடன் : அரசாங்க ஊழியர்க்கு முதலிடம்*

## HOUSING LOANS : PRIORITY FOR GOVERNMENT SERVANTS

10. **එල්. සී. ද සිල්වා මයා.** (බලපිටිය)
*(திரு. எல். சீ. டி சில்வா—பலப்பிட்டிய)*
(Mr. L. C. de Silva—Balapitiya)

විද්‍යාත්මක පර්යේෂණ හා නිවාස ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) නිවාස ණය දීම තාවකාලිකව අත්හිටවූවාට පසු ලැබී ඇති නිවාස ණය ඉල්ලුම් පත් සංඛ්‍යාව කොපමණද? (ආ) එම ඉල්ලුම් පත්වලින් කොපමණක ණය අනුමත කිරීම සඳහා ක්‍රියා කර තිබේද? (ඉ) රජයේ සේවකයින් විසින් වැටුප් අත්තිකාරම් ලබාගෙන ඉඩම් මිළදී ගැනීමෙන් පසු ගෙවල් තැනීම සඳහා එවන ලද ඉල්ලුම් පත් සංඛ්‍යාව කොපමණද? (ඊ) ණය මුදල් අනුමත කිරීමේදී එකී රජයේ සේවකයින්ගේ ඉල්ලුම් පත් සඳහා ප්‍රමුඛත්වය දීමට ක්‍රියා කරන්නේද? (උ) නො එසේ නම්, මන්ද?

*விஞ்ஞான ஆய்வு, வீடமைப்பு அமைச்சரைக் கேட்ட வினா: (அ) வீடமைப்பதற்குக் கடன் அளிப்பதைத் தற்காலிகமாக நிறுத்திய பின்னர், வீடமைப்பதற்குக் கடன்கோரி விண்ணப்பித்தவர்களின் எண்ணிக்கை யாது? (ஆ) அவற்றில் எத்தனை விண்ணப்பங்களுக்குக் கடன் வழங்குவதை அங்கீகரிக்க நடவடிக்கை எடுக்கப்பட்டுள்ளது? (இ) அரசாங்க ஊழியர்கள் சம்பள முற்பணத்தைப் பெற்றுக் காணி நிலம் வாங்கிய பின்னர் வீடு கட்டுவதற்காக விண்ணப்பம் அனுப்பியவர்களின் எண்ணிக்கை எத்தனை? (ஈ) கடன் அங்கீகரிக்கப்படும் போது மேற்கூறிய அரசாங்க ஊழியர்களின் விண்ணப்பங்களுக்கு முதலிடம் அளிக்க நடவடிக்கை எடுக்கப்படுமா? (உ) அன்றேல், ஏன்?*

asked the Minister of Scientific Research and Housing: (*a*) How many applications for housing loans have been received after the temporary suspension of the grant of such

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

loans? (*b*) In regard to how many of them has action been taken to approve the loans? (*c*) How many applications for housing loans have been received from government servants who have purchased property on salary advances? (*d*) Will he take action to give priority to the applications of such government servants in approving such loans? (*e*) If not, why?

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டி. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)

(*a*) 2,895 up to 31.1.1968. (*b*) Nil. (*c*) 255. (*d*) This will be considered as soon as funds become available. (*e*) Does not arise.

**එල්. සී. ද සිල්වා මයා.**
*(திரு. எல். சி. டி சில்வா)*
(Mr. L. C. de Silva)

Does the Hon. Minister appreciate the fact that government employees who have obtained two years' salary advances have now to go on paying the instalments on the salary advance in addition to paying exorbitant rents for the houses they occupy? Therefore will he guarantee that these applications will be given preference when money is available?

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டி. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)

I have stated that in my Answer.

**එල්. සී. ද සිල්වා මයා.**
*(திரு. எல். சி. டி சில்வா)*
(Mr. L. C. de Silva)

The Hon. Minister said they would be considered. What I am asking is whether they will be given preference over the other applicants.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டி. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)

It all depends on the circumstances.

**එල්. සී. ද සිල්වා මයා.**
*(திரு. எல். சி. டி சில்வா)*
(Mr. L. C. de Silva)

Particularly in view of the circumstances they are placed in. They have to go on paying the instalments on the salary advance and also pay exorbitant rents for the houses they occupy.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டி. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)

Normally, the Housing Department gives preference to government servants.

## ලංකා අ. පො. ස. (උසස් පෙළ) සමත් ගුරුවරුන්ගේ වැටුප

இலங்கை க. பொ. த. (உயர்தர) ப. உடைய ஆசிரியர் சம்பளம்

SALARY OF TEACHERS WITH CEYLON G. C. E. (ADVANCED LEVEL)

11. **ප්‍රින්ස් ගුණසේකර මයා.** (හබරාදුව)
*(திரு. பிறின்ஸ் குணசேக்கர—ஹபருதுவ)*
(Mr. Prins Gunasekera—Habaraduwa)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) 1964 ලන්ඩන් අධ්‍යාපන පොදු සහතික උසස් පෙළ විභාගය අවලංගු කිරීමට පෙර එම විභාගයෙන් සමත්වූ ගුරුවරුන්ට රු. 112 මූලික වැටුප් ක්‍රමය යටතේ පත්වීම් දී ඇති බැව් එතුමා දන්නවාද? (ආ) එහෙත් 1964 සිට ලංකා අ. පො. ස. උසස් පෙළ සමත් ගුරුවරුන් බොහෝ දෙනෙකුට රු. 112 මූලික වැටුප යටතේ පත්වීම් ලබා ගැනීමට නොහැකිව ඇති බැව් දන්නවාද? (ඉ) ලන්ඩන් අ. පො. ස. උසස් පෙළ සාමාර්ථ්‍යය හා ලංකා අ.පො.ස. උසස් පෙළ සාමාර්ථ්‍යය එක හා සමාන බව එතුමා දන්නවාද? (ඊ) එසේ නම්, 1964 සිට ලංකා අ. පො. ස. උසස් පෙළ සමත්, නියමිත පැය ගණන ඉගැන්වීමේ යෙදී සිටින ගුරුවරුන්ට රු. 112 මූලික වැටුප නොගෙවන්නේ ඇයි? (උ) මේ සම්බන්ධව ක්‍රියා කිරීමේදී ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලවලට දී ඇති උපදෙස් මොනවාද? (ඌ) මේ වරද නිවරද කිරීමට එතුමා අප්‍රමාදව ක්‍රියා කරනවාද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) 1964 ஆம் ஆண்டில் இலண்டன் கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர்தர)த் தேர்வு நடாத்துவதை நிறுத்துவதற்கு முன்னர் அத்தேர்வில் தேர்ச்சி பெற்ற ஆசிரியர்களுக்கு 112 ரூபா அடிப்படைச் சம்பளத்திட்டத்திற்கமைய நியமனம் வழங்கப்பட்டுள்ளதை அவர் அறிவாரா? (ஆ) எனினும் 1964 ஆம் ஆண்டிற்குப் பின்னர் இலங்கை க. பொ. த. (உயர்தர)த் தேர்வில் தேறிய ஆசிரியர் பலர் 112 ரூபா அடிப்படைச் சம்பளத் திட்டத்திற்கமைய நியமனம் பெற்றுக்கொள்ள முடியாதிருப்பதை அவர் அறிவாரா? (இ) இலண்டன் க. பொ. த. (உயர்தரத்) தேர்வில் பெறுகின்ற தேர்ச்சியும், இலங்கை க. பொ. த. (உயர்தரத்) தேர்வில் பெறுகின்ற தேர்ச்சியும் சமமானவை என்பதை அவர் அறிவாரா? (ஈ) அவ்வாறெனில், 1964 ஆம் ஆண்டிலிருந்து இலங்கை க. பொ. த. (உயர்தரத்) தேர்வில் தேறிய, குறிக்கப்பட்டுள்ள நேரம் முழுவதும் கற்பிக்கும் ஆசிரியர்களுக்கு 112 ரூபா அடிப்படைச் சம்பளம் வழங்காததேன்? (உ) இதுபோன்ற விடயங்கள் சம்பந்தமாகப் பிராந்தியக் கல்வி அலுவலகங்களுக்குக் கூறப்பட்டுள்ள அறிவுறுத்தல்கள் யாவை? (ஊ) இத்தவறைத் திருத்த அவர் தாமதமின்றி நடவடிக்கை எடுப்பாரா?

asked the Minister of Education and Cultural Affairs: (*a*) Is he aware that prior to the cancellation of the London General Certificate (Advanced Level) Examination in 1964, teachers who had passed this examination were appointed on a salary scale with an initial of Rs. 112? (*b*) Is he aware that after 1964 a large number of teachers who passed the Ceylon G. C. E. (Advanced Level) Examination have not been able to secure appointments on an initial salary of Rs. 112? (*c*) Is he aware that a pass in the London G. C. E. (Advanced Level) Examination is equal to a pass in the Ceylon G. C. E. (Advanced Level) Examination? (*d*) If so, why are teachers who have passed the Ceylon G. C. E. (Advanced Level) Examination and are teaching the required number of hours not paid an initial salary of Rs. 112? (*e*) In regard to this matter, what instructions have been given to the regional education offices? (*f*) Will he take action without delay to rectify this error?

**ජයසූරිය මයා.**

*(திரு. ஜயசூரிய)*

(Mr. Jayasuriya)

(අ) එසේය. (ආ) එසේය. (ඉ) නැත. ලන්ඩන් අ. පො. ස. (උ. පෙ.) විභාගය සාමාන්‍ය කලා/විද්‍යා යෝග්‍යතා පරීක්ෂණයට සමානය. ලංකාවේ අ. පො. ස. (උ. පෙ.) විභාගය විශ්ව විද්‍යාල ප්‍රවේශ පරීක්ෂණයකට සමානය. (ඊ) (ඉ) අනුව උද්ගත නොවේ. (උ) මේ සම්බන්ධයෙන් දැනටම ප්‍රාදේශීය අධ්‍යාපන නිලධාරීන් වෙත උපදෙස් යවා තිබේ. (ඌ) උද්ගත නොවේ.

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

12 වන ප්‍රශ්නය.

**සෙනෙවිරත්න මයා.**

*(திரு. செனெவிரத்ன)*

(Mr. Seneviratne)

ගරු කථානායකතුමනි, ඒ ප්‍රශ්නයට පිළිතුරු දීමට මාස තුනක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

வினா மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*

## කුකුලේගම වැවිලි ව්‍යාපාරයට යන පාර

## குகுலேகம பயிர்ச்செய்கைக்குப் பாதை

## ROAD TO KUKULEGAMA PLANTATION

1. **ධම්දාස බණ්ඩා මයා.** (ඒ. පිලපිටිය මයා.—කලවාන—වෙනුවට)

*(திரு. தர்மதாச பண்டா—திரு. ஏ. பிலப்பிற்றிய—கலவான—சார்பாக)*

(Mr. Dharmadasa Banda—on behalf of Mr. A. Pilapitiya—Kalawana)

ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) පසුගිය රජයේ පාලන අවධියේ සිට කුකුලේගම වැවිලි සංයුක්ත

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මණ්ඩලය නමින් ව්‍යාපාරයක් ඇරඹීමට කටයුතු කළ බව එතුමා දන්නවාද ? (ආ) මෙම ව්‍යාපාරයට යාම සඳහා රුපියල් ලක්ෂ ගණනක් වියදම් කර මීට අවුරුදු පහකට ප්‍රථමයෙන් පාරක් කැපූ බවත්, මේ වන තුරු එකී පාරේ වැඩ කටයුතු අඩපණවී සම්පූර්ණ නොකර ඇති බවත්, එතුමා දන්නවා ද ? (ඉ) ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කඩා බිඳ දැමූ මෙම පාරේ අද තත්ත්වයත්, දිනපතා ගම් දහයකට පමණ යන එන ජනතාවට ගමන් කිරීමට ඇති එකම මග මෙය බවත් එතුමා දන්නවාද ? (ඊ) මහජනතාවගේ සුභ සිද්ධිය පිණිස මෙම පාරේ වැඩ වහාම නිම කිරීම සඳහා ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවට වහාම නියෝග කිරීමටත්, පාරේ නිසි ප්‍රයෝජනය ලබා ගැනීමටත්, වැය කරන ලද මුදලින් සතුටුදායක ප්‍රතිඵලයක් ගැනීමටත්, ඉහත කී ව්‍යාපාරයේ කුරුඳු හෝ වෙනත් වගාවක් යොදන ලෙසටත්, නො එසේ නම්, ගම් පුළුල් කිරීමේ ක්‍රමය යටතේ වැසියන් අතර බෙදාදීමටත්, එතුමා කටයුතු කරනවාද ? (උ) එසේ නම්, ඒ කවදා සිටද ?

காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா: (அ) கடந்த அரசாங்கத்தின் ஆட்சியின்போது குகுலேகம பயிர்ச்செய்கைக் கூட்டுத்தாபனம் என்னும் பெயரில் ஒரு திட்டத்தை ஆரம்பிப்பதற்கு நடவடிக்கை எடுத்ததை அவர் அறிவாரா? (ஆ) இத் திட்டத்திற்குப் போவதற்கு ஒரு இலட்ச ரூபா செலவிட்டு ஐந்து ஆண்டுகளுக்குமுன் தெரு அமைக்கப்பட்டதையும் இதுவரை அத் தெருவின் வேலை முடிவடையவில்லை யென் பதையும் அவர் அறிவாரா? (இ) சீர்திருத்தி அமைப்பதற்காக உடைத்த இத்தெருவின் இன்றைய நிலையையும் நாள்தோறும் பத்துக் கிராமங்களுக்கு போக்குவரத்துச் செய்யும் மக்களுக்குள்ள ஒரே பாதை என்பதையும் அவர் அறிவாரா? (ஈ) பொதுமக்களின் நன்மைக்காக இத்தெருவின் வேலையை உடனே நிறைவேற்றவும், காணி அபிவிருத் திப் பகுதிக்கு உடனே கட்டளையிடவும், தெரு வின் பயனைப்பெறவும், செலவிட்ட பணத்தில் திருப்தியான பயனைப்பெறவும், மேற்படி திட் டத்தில் கறுவா அல்லது வேறு பயிர்களைப் பயிரிடவும், இன்றேல் கிராம விரிவாக்கத் திட் டத்தின் கீழ் மக்களிடையே பகிர்ந்தளிக்க வும் அவர் நடவடிக்கை எடுப்பாரா? (உ) அவ்வாறெனில், எந்நாளிலிருந்து?

asked the Minister of Land, Irrigation and Power: (*a*) Is he aware that during the period when the previous Government was in office, action was taken to set up an undertaking known as the Kukulegama Plantation Corporation? (*b*) Is he aware that five years ago a road leading to the site of this plantation was constructed at a cost of several lakhs of rupees and that the work on this road is still very slack and incomplete? (*c*) Is he aware of the present state of this road, which was broken up for effecting repairs, and the fact that it is the only road available to people travelling up and down to about ten different villages? (*d*) Will he take action to instruct the Land Development Departmnet to complete the work on this road immediately in the interest of the general public, to make proper use of this road, to obtain satisfactory results from the funds already expended, to plant either cinnamon or some other crop on the above plantation; or in the alternative will he take action to alienate this land among the residents under the village expansion scheme? (*e*) If so, from what date?

**සෙනෙවිරත්න මයා.**
(திரு. செனெவிரத்ன)
(Mr. Seneviratne)

(අ) නැත. 1958 අග කොටසේදී කුකුලේගම ප්‍රදේශයේ රජයේ තේ වගාවක් ආරම්භ කිරීමට යෝජනාවක් තිබුණේය. (ආ) ප්‍රවේශ මාර්ගයේ මූලික වැඩ කටයුතු පමණක් ආරම්භ කර ඇත. එවකට තිබුණු, සැතපුමක් දිගැති ගම්සභා පාරක් වැඩි දියුණු කරන ලදී. මීට අමතරව, අඩි පාරක් වශයෙන් පැවැති 2 වෙනි සැතපුමේ පස් වැඩ සහ බෝක්කු ආදිය බැඳීම සහ තුන්වැනි සැතපුමේ පස් වැඩ කිරීම නිමකර ඇත. තුන්වැනි සැතපුමේ කොටසක බෝක්කු බැඳීම කරනු ලැබේ. මේ කාර්‍යය සඳහා දැනට වැය කොට ඇති මුදල රු. 75,231 කි. (ඉ) පාර වැඩි දියුණු කිරීම සඳහා කැඩීමක් කර නැත. මේ ප්‍රදේශයේ ගම් කීපයකටම ප්‍රවේශ මාර්ගය මෙය පමණි. (ඊ) තේ කර්මාන්තයේ අනාගතය සැකසහිත නිසා අළුත් රජයේ තේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සෙනෙවිරත්න මයා.]

වගාවක් ආරම්භ කිරීම අත්හැර දමා ඇතත්, මෙම පාරින් නොයෙක් ගම්වලට සේවයක් සිදුවන නිසා මේ පාරේ වැඩ දිගටම කරගෙන යන ලෙස ඉඩම් කොමසාරිස්ට සහ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂකට නියෝග කොට ඇත. මේ ප්‍රදේශයේ ගම් පුළුල් කිරීමේ ව්‍යාපාරයක් ඇති කරන ලෙස දිසාපතිට නියෝග කොට ඇත. (ඉ) 'ඊ' පිළිතුර බලන්න.

## තංගොඩ හඩුවවත්ත පිළිබඳ ඉඩම් කච්චේරිය

தங்கொட ஹடுவவத்தை சம்பந்தமாக காணிக் கச்சேரி

LAND KACHCHERI RE HADUWAWATTA, TANGODA

2. **එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා.** (මිනුවන්ගොඩ—ටී. බී. ඉලංගරත්න මයා.—කොලොන්නාව—වෙනුවට)

*(திரு. எம். பீ. டி சொய்சா சிறிவர்தன—மினுவாங்கொட—திரு. ரீ. பி. இலங்கரத்ன—கொலொன்னுவ—சார்பாக)*

(Mr. M. P. de Zoysa Siriwardena—Minuwangoda—on behalf of Mr. T. B. Ilangaratne—Kolonnawa)

ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) 1967 ඔක්තෝබර් මාසයේ පවත්වන්නට අදහස් කළ මහනුවර දිස්ත්‍රික්කයේ තුම්පනේ මුරුද්දෙණිය වසමේ තංගොඩ පිහිටි හඩුවවත්ත පිළිබඳ ඉඩම් කච්චේරිය අවලංගු කෙළේ මන්ද? (ආ) එය නැවත පවත්වන්නේ කවදාද?

*காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா: (அ) கண்டி மாவட்டம், தும்பனே, முறுத்தேனிய வசமவைச் சார்ந்த தங்கொடவிலிருக்கும் ஹடுவ வத்தை சம்பந்தமாக 1967 ஒக்ரோபரில் நடைபெற இருந்த காணிக் கச்சேரி இரத்துச் செய்யப்பட்டதேன்? (ஆ) அது எப்பொழுது நடாத்தப்படும்?*

asked the Minister of Land, Irrigation and Power: (*a*) Why was the land kachcheri in respect of Haduwawatta situated at Tangoda in Munuddeniya Wasama, Thumpane, in Kandy District, which was to be held in October 1967, cancelled? (*b*) When will he be held?

වාචික පිළිතුරු

**සෙනෙවිරත්න මයා.**

*(திரு. செனெவிரத்ன)*

(Mr. Seneviratne)

(අ) සම්පූර්ණ මුරුද්දෙනිය වසමට පළල් වන ලෙස ඉඩම් ලැබීමට සුදුස්සන් තෝරා ගැනීම මැනවැයි හැඟුන බැවින් ඉඩම් කච්චේරිය අවලංගු කරන ලදී. 1967 ඔක්තෝබර් මස 27 වැනි දිනට නියමිත වූ ඉඩම් කච්චේරිය තංගොඩ ගමෙන් පමණක් ඉඩම් ලැබීමට සුදුස්සන් තෝරා ගැනීමට සීමාකර තිබුණි. තංගොඩ ගම මුරුද්දෙනිය වසමට අයත් ගම් දෙකෙන් එකකි. (ආ) මුරුද්දෙනිය වසමේ ඉඩම් නොමැති සැම කෙනෙකුටම විවෘත වූ ඉඩම් කච්චේරියක් 1967.10.30 වැනි දින ප්‍රසිද්ධ කර 1967.12.20 වැනි දින පවත්වන ලදී.

## ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ 1967 ප්‍රථම වර්ෂ පරීක්ෂණ

இலங்கைப் பல்கலைக்கழக முதல்வருடத்தேர்வுகள், 1967

CEYLON UNIVERSITY FIRST YEAR EXAMINATIONS, 1967

3. **ද සොයිසා සිරිවර්ධන මයා.** (ඉලංගරත්න මයා. වෙනුවට)

*(திரு. டி சொய்ஸா சிறிவர்தன—திரு. இலங்கரத்ன சார்பாக)*

(Mr. de Zoysa Siriwardena—on behalf of Mr. Ilangaratne)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය (පේරාදෙණිය හා කොළඹ ශාඛාව) මගින් 1967 අවුරුද්දේ පවත්වන ලද ප්‍රථම වර්ෂ පරීක්ෂණයන්ට (i) සිංහල (ii) දෙමළ (iii) ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් අභ්‍යන්තර හා බාහිර වශයෙන් පෙනී සිටියවුන්ගේ සංඛ්‍යාව වෙන වෙනම කොපමණද? (ආ) එක් එක් මාධ්‍යයෙන් මේ විභාගයට පෙනී සිට අසමත් වූවන්ගේ සංඛ්‍යාව වෙන වෙනම කොපමණද? (ඉ) මේ විභාගයෙන් අසමත් වූ අභ්‍යන්තර ශිෂ්‍යයන්ට නැවත විභාගය ගැනීම සඳහා කවර පහසුකම් සලසා තිබේද?

*கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) இலங்கைப் பல்கலைக்கழக (பேராதனை, கொழும்புக் கிளை) மூலம் 1967ஆம் ஆண்டு நடாத்தப்பெற்ற முதல்*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ஆண்டுத் தேர்வுக்கு (i) சிங்களம். (ii) தமிழ், (iii) ஆங்கில மொழிமூலம் வெளிவாரி, உள்வாரி மாணவர்களாகத் தோற்றியவர்களின் எண்ணிக்கையை அவர் வெவ்வேறாகக் குறிப்பிடுவாரா? (ஆ) ஒவ்வொரு மொழிமூலமும் இத்தேர்வுக்குத் தோற்றிச் சித்தியடையாதவர்களின் எண்ணிக்கையை வெவ்வேறாக அவர் குறிப்பிடுவாரா? (இ) இத்தேர்வில் சித்தியடையாத உள்வாரி மாணவர்கள் மீண்டும் தேர்வுக்குத் தோற்றுவதற்கு என்ன ஏற்பாடுகள் செய்யப்பட்டுள்ளன:

asked the Minister of Education and Cultural Affairs: (*a*) Will he state the number of internal and external candidates who sat for the first year examination conducted in 1967 by the Ceylon University (Peradeniya and Colombo) in the (i) Sinhala, (ii) Tamil, and (iii) English media, separately? (*b*) Will he state the number who failed in each medium? (*c*) What arrangements have been made for those internal students who failed, to take up the examination again?

**ජයසූරිය මයා.**

*(திரு. ஜயசூரிய)*

(Mr. Jayasuriya)

* (*a*) The lists are tabled. * (*b*) The lists are tabled. (*c*) Although facilities for internal studies to Arts students who failed this examination cannot be provided, they can pay the examination fees and sit the examination on any number of occasions. Facilities have been provided for Science students to attend lectures.

*** සභාමේසය මත තබන ලද ලැයිස්තු මෙසේයි :**

*சபாபீடத்தில் வைக்கப்பட்ட நிரல்கள் வருமாறு :*

*The lists tabled are as follows :*

1967 දී ලංකා විශ්ව විද්‍යාලය මගින් පවත්වන ලද ප්‍රථම පරීක්ෂණයට පෙනීසිටි අපේක්ෂකයන්

| විභාගය | කොළඹ අභ්‍යන්තර | | | කොළඹ බාහිර | | | පේරාදෙණිය අභ්‍යන්තර | | | පේරාදෙණිය බාහිර | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | සිංහල | දෙමළ | ඉංග්‍රීසි |
| ප්‍රථම-කලා | 1240 | 409 | — | 837 | 205 | 19 | 792 | 4 | 22 | 498 | 14 | 37 |
| ප්‍රථම-විද්‍යා | — | — | 212 | — | — | 1 | 30 | — | 243 | — | — | — |
| ප්‍රථම-ඉංජිනේරු | — | — | 80 | — | — | — | 1 | — | 16 | — | — | — |
| ප්‍රථම-නීති | — | — | 57 | — | — | 145 | — | — | — | — | — | — |
| ප්‍රථම-කෘෂිකර්ම | — | — | — | — | — | — | 1 | — | 25 | — | — | — |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

இலங்கை சர்வகலாசாலை 1967 ம் வருடம் நடாத்திய முதல் வருடப்பரீட்சைக்குத் தோன்றிய உள்வாரி, வெளிவாரி மாணவர் தொகை

| பரீட்சை | கொழும்பு | | | | | | பேராதனை | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | உள்வாரி | | | வெளிவாரி | | | உள்வாரி | | | வெளிவாரி | | |
| | சிங்களம் | தமிழ் | ஆங்கிலம் | சிங்களம் | தமிழ் | ஆங்கிலம் | சிங்களம் | தமிழ் | ஆங்கிலம் | சிங்களம் | தமிழ் | ஆங்கிலம் |
| கலை—முதல் வருடம் .. | 1240 | 409 | — | 837 | 205 | 19 | 792 | 4 | 22 | 498 | 14 | 37 |
| விஞ்ஞானம்—முதல் வருடம் | — | — | 212 | — | — | 1 | 30 | — | 243 | — | — | — |
| பொறியியல்—முதல் வருடம் | — | — | 80 | — | — | — | 1 | — | 16 | — | — | — |
| சட்டம் முதல் வருடம் .. | — | — | 57 | — | — | 145 | — | — | — | — | — | — |
| விவசாயம்—முதல் வருடம் .. | — | — | — | — | — | — | 1 | — | 25 | — | — | — |

THE NUMBER OF INTERNAL AND EXTERNAL CANDIDATES WHO *SAT* FOR THE FIRST EXAMINATION CONDUCTED IN 1967 BY THE UNIVERSITY OF CEYLON

| Examination | COLOMBO | | | | | | PERADENIYA | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | Internal | | | External | | | nternal | | | External | | |
| | Sin. | Ta. | En. | Sin. | Ta. | En. | Sin. | Ta. | En. | Sin. | Ta. | En. |
| First in Arts .. .. | 1240 | 409 | — | 837 | 205 | 19 | 792 | 4 | 22 | 498 | 14 | 37 |
| First in Science .. | — | — | 212 | — | — | 1 | 30 | — | 243 | — | — | — |
| First in Engineering .. | — | — | 80 | — | — | — | 1 | — | 16 | — | — | — |
| First in Laws .. .. | — | — | 57 | — | — | 145 | — | — | — | — | — | — |
| First in Agriculture .. | — | — | — | — | — | — | 1 | — | 25 | — | — | — |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

1967 දී ලංකා විශ්ව විද්‍යාලය මගින් පවත්වන ලද ප්‍රථම පරීක්ෂණයෙන් අසාමාර්ථ්‍ය ලත් අය

| විභාගය | කොළඹ | | | | | | පේරාදෙණිය | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අභ්‍යන්තර | | | බාහිර | | | අභ්‍යන්තර | | | බාහිර | | |
| | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | සිංහල | දෙමළ | ඉංග්‍රීසි |
| ප්‍රථම–කලා | 348 | 98 | — | 684 | 175 | 17 | 178 | — | 3 | 436 | 12 | 36 |
| ප්‍රථම–විද්‍යා | — | — | 88 | — | — | 1 | 9 | — | 89 | — | — | — |
| ප්‍රථම–ඉංජිනේරු | — | — | 18 | — | — | — | — | — | 1 | — | — | — |
| ප්‍රථම–නීති | — | — | 18 | — | — | 99 | — | — | — | — | — | — |
| ප්‍රථම–කෘෂිකර්ම | — | — | — | — | — | — | 1 | — | 5 | — | — | — |

இலங்கை சர்வகலாசாலை 1967 ம் வருடம் நடாத்திய முதல் வருட பரீட்சையில் தேருத உள்வாரி, வெளிவாரி மாணவர் தொகை

| பரீட்சை | கொழும்பு | | | | | | பேராதனை | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | உள்வாரி | | | வெளிவாரி | | | உள்வாரி | | | வெளிவாரி | | |
| | சிங்களம் | தமிழ் | ஆங்கிலம் | சிங்களம் | தமிழ் | ஆங்கிலம் | சிங்களம் | தமிழ் | ஆங்கிலம் | சிங்களம் | தமிழ் | ஆங்கிலம் |
| கலை-முதல்வருடம் | 348 | 98 | — | 684 | 175 | 17 | 178 | — | 3 | 436 | 12 | 36 |
| விஞ்ஞானம்—முதல் வருடம் | — | — | 88 | — | — | 1 | 9 | — | 89 | — | — | — |
| பொறியியல்—முதல் வருடம் | — | — | 18 | — | — | — | — | — | 1 | — | — | — |
| சட்டம்—முதல் வருடம் | — | — | 18 | — | — | 99 | — | — | — | — | — | — |
| விவசாயம்-முதல் வருடம் | — | — | — | — | — | — | 1 | — | 5 | — | — | — |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

THE NUMBER OF INTERNAL AND EXTERNAL CANDIDATES WHO *FAILED* THE FIRST EXAMINATION CONDUCTED IN 1967, BY THE UNIVERSITY OF CEYLON

| Examination | COLOMBO | | | | | | PERADENIYA | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | Internal | | | External | | | Internal | | | External | | |
| | Sinhalese | Tamil | English | Sinhalese | Tamil | English | Sinhalese | Tamil | English | Sinhalese | Tamil | English |
| First in Arts .. .. | 348 | 98 | — | 684 | 175 | 17 | 178 | — | 3 | 436 | 12 | 36 |
| First in Science .. | — | — | 88 | — | — | 1 | 9 | — | 89 | — | — | — |
| First in Engineering .. | — | — | 18 | — | — | — | — | — | 1 | — | — | — |
| First in Laws .. .. | — | — | 18 | — | — | 99 | — | — | — | — | — | — |
| First in Agriculture .. | — | — | — | — | — | — | 1 | — | 5 | — | — | — |

### ලං. ග. ම. : දෙහිඕවිට ආසනයෙන් බඳවාගත් බස් කොන්දොස්තරවරු

இ. போ. ச. :தெஹியோவிட்டத் தொகுதி பஸ் நடத்துநர்

### C. T. B. BUS CONDUCTORS FROM DEHIOWITA ELECTORATE

9. ලෙස්ලි ගුණවර්ධන මයා. (පානදුර—ඩී. පී. ආර්. වීරසේකර මයා—දෙහිඕවිට—වෙනුවට)

(திரு. லெஸ்லி குணவர்தன—பாணந்துறை—திரு. டீ. பீ. ஆர். வீரசேக்கர—தெகியோவிற்ற—சார்பாக)

(Mr. Leslie Goonewardene—Panadura on behalf of Mr. D. P. R. Weerasekera—Dehiowita)

ජනසතු සේවා ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) 1966 වර්ෂයේදී ලංගමයට බස් කොන්දොස්තරවරුන් බඳවා ගැනීම සඳහා අනුගමනය කළ සුදුසුකම් එතුමා සඳහන් කරනවාද? (ආ) දෙහිඕවිට පාර්ලිමේන්තු කොට්ඨාශයෙන් බඳවා ගත්තෝ කවරහුද? (ඉ) ඔවුන්ගේ සුදුසුකම් මොනවාද? (ඊ) ඉල්ලුම් පත් එවූ අය අතරින් පනාවල, සෝමසිරි ගුණරත්නගේ සුදුසුකම් එතුමා සඳහන් කරනවාද? (උ) ඔහුට පත්වීමක් දී තිබේද? නොඑසේ නම් ඒ මන්ද?

தேசியமயச் சேவை அமைச்சரைக் கேட்ட வினா: (அ) 1966 ஆம் ஆண்டில் இ. போ. ச. இல் பஸ் நடத்துநர்களைச் சேர்ப்பதற்கு ஏற்றுக்கொள்ளப்பட்ட தகைமைகள்பற்றி அவர் குறிப்பிடுவாரா? (ஆ) தெஹியோவிட்ட தேர்தல் தொகுதியிலிருந்து சேர்க்கப்பட்டோர் யாவர்? (இ) அவர்களின் தகைமைகள் யாவை? (ஈ) விண்ணப்பம் அனுப்பியவர்களில் ஒருவரான பனுவல, சோமசிறீ குணரத்ன அவர்களின் தகைமையை அவர் குறிப்பிடுவாரா? (உ) அவருக்கு நியமனம் கொடுக்கப்பட்டுள்ளதா? அன்றேல் ஏன்?

asked the Minister of Nationalized Services: (*a*) Will he state the qualifications recognized in the recruitment of bus conductors to the C. T. B. in 1966? (*b*) Who were the persons recruited from the Dehiowita electorate? (*c*) What are their qualifications? (*d*) Will he state the qualifications of Somasiri Gunaratne of Panawala, who was one of the applicants? (*e*) Has he been appointed? If not, why?

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

**ඩී. බී. වෙලගෙදර මයා. (ජනසතු සේවා ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. டீ. பி. வெலகெதர—தேசிய மய சேவை அமைச்சரின் பாராளுமன்றக் காரிய தரிசி)*

(Mr. D. B. Welagedera—Parliamentary Secretary to the Minister of Nationalized Services)

(අ) ඔව්. නියමිත සුදුසුකම් පහත සඳහන් වේ: (1) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය (සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි), හෝ (2) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයෙන් විෂයයන් 6 ක් (සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි), නැතහොත් (3) කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය (සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි) සමග කොන්දොස්තර බලපත්‍රයක් හෝ ටිකට් පරීක්ෂක බලපත්‍රයක්. වයස: අවුරුදු 20 ට අඩු හෝ 35 ට වැඩි හෝ නොවිය යුතුයි. උස: අඩි 5 යි. බර: රාත්තල් 90 යි. (ආ) පී. ඇම්. පුංචි බණ්ඩාර, පී. ගුණවර්ධන, ආර්. ඒ. සියානන්ද, එච්. කේ. ගුණදාස, බී. පී. ඕ. ප්‍රනාන්දු, ජී. ඒ. එස්. විජේරත්න, අමරතුංග දියෝනිස්, එන්. කේ. ගුණසේන, පී. එල්. පිලෝරිස්, ඩී. වී. විජේවර්ධන. (ඉ) ඔවුන් සියළු දෙනාම (අ) කොටසෙහි සඳහන් සුදුසුකම් ලබා ඇත. (ඊ) සෝම සිරි ගුණරත්න නමැති අයෙක් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නැත. (උ) (ඊ) අනුව පැන නොනඟී.

**එල්. සී. ද සිල්වා මයා.**

*(திரு. எல். சீ. டி சில்வா)*

(Mr. L. C. de Silva)

ගරු කථානායකතුමනි, දැන් ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා සඳහන් කළ සුදුසුකම් නොමැතිව පසුගිය කාලය තුළදී බස් කොන්දොස්තරවරුන් බඳවාගෙන සිටිනවා නම් ඔවුන්ගේ නම් ඉදිරිපත් කළොත් ඔවුන් සේවයෙන් පහ කිරීමට ක්‍රියා කරනවාද?

**වෙලගෙදර මයා.**

*(திரு. வெலகெதர)*

(Mr. Welagedera)

එක්කෙනෙක්වත් එහෙම බඳවා ගන්නෙ නැහැ.

**එල්. සී. ද සිල්වා මයා.**

*(திரு. எல். சீ. டி சில்வா)*

(Mr. L. C. de Silva)

බඳවාගෙන තිබෙනවා නම්—

**වෙලගෙදර මයා.**

*(திரு. வெலகெதர)*

(Mr. Welagedera)

ඔව්. දෙන්න.

**එල්. සී. ද සිල්වා මයා.**

*(திரு. எல். சீ. டி சில்வா)*

(Mr. L. C. de Silva)

ඔවුන්ගේ නම් දුන්නොත් ඒ උදවිය සේවයෙන් පහ කරනවාද?

**වෙලගෙදර මයා.**

*(திரு. வெலகெதர)*

(Mr. Welagedera)

ඔව්. පහ කරනව.

**ටී. බී. එම්. හේරත් මයා. (වලපනේ)**

*(திரு. ரி. பி. எம். ஹேரத்—வலப்பனை)*

(Mr. T. B. M. Herath—Walapane)

ගරු කථානායකතුමනි, වලපනේ පන්නල කුඹල්ගමුවෙ ඊ. ඩබ්ලිව්. ආරියසේන කියන තැනැත්තා අටවෙනි පන්තියවත් සමර්ථ නැති කෙනෙක් වුණත් ඔහු බඳවාගෙන තිබෙනව. ඇමතිතුමා දුන් පිළිතුර අනුව අටවෙනි පන්තිය අසමර්ථ ඔහු සේවයෙන් පහ කිරීමට ක්‍රියා කරනවාද?

**වෙලගෙදර මයා.**

*(திரு. வெலகெதர)*

(Mr. Welagedera)

ඒ ගැන සොයා බලා එහෙම නම් ක්‍රියා කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## පෞද්ගලික මන්ත්‍රීන්ගේ කෙටුම්පත් පණත්

### *தனி அங்கத்தவர் மசோதா*

### PRIVATE MEMBER'S BILL

KATARAGAMA BAUDDHA-SEVA MANDALAYA

**එම්. එස්. අමරසිරි මයා.** (හිනිදුම)
*(திரு. எம். எஸ். அமரசிறி—ஹினிதும)*
(Mr. M. S. Amarasiri—Hiniduma)
I move,

"That leave be granted to introduce a 'Bill to incorporate the Kataragama Bauddha-Seva Mandalaya'".

**සුගතදාස අරඹවල මයා.** (අක්මීමන)
*(திரு. சுகததாச அரம்பவல—அக்மீமன)*
(Mr. Sugathadasa Arambewela—Akmeemana)

විසින් සථිර කරන ලදී.

*அனுவதித்தார்.*

*Seconded.*

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

කෙටුම්පත් පනත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

වාර්තා කිරීම සඳහා 51 (4) වන ස්ථාවර නියෝගය යටතේ කෙටුම්පත් පනත අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති වෙත පවරන ලදී.

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*இதன்படி, மசோதா முதன்முறை மதிப்பிடப்பட்டு அச்சிடப்படப் பணிக்கப்பட்டது.*

*மசோதா, நிலையற்கட்டளை இல. 51 (4) இன்படி கல்வி, கலாசார விவகார அமைச்சருக்கு, அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*

*Question put, and agreed to.*

*Bill accordingly read the First time, and ordered to be printed.*

*The Bill stood referred, under Standing Order No. 51 (4), to the Minister of Education and Cultural Affairs, for report.*

## වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්නය: 1968 පෙබරවාරි 9 වන ද "ඩේලිනිවුස්" පත්‍රයේ පළවූ වාර්තාව

### *சிறப்புரிமை விடயம்: 1968, பெப்ரவரி 9 "டெயிலி நியூஸ்" பத்திரிகை அறிக்கை*

### QUESTION OF PRIVILEGE: REPORT IN DAILY NEWS OF 9TH FEBRUARY 1968

**ආර්. ජේ. ජී. ද මැල් මයා.** (දෙවිනුවර)
*(திரு. ஆர். ஜே. ஜீ. டி மெல்—தெவிநுவர)*
(Mr. R. J. G. de Mel—Devinuwara)

ගරු කථානායකතුමනි, තමුන්නාන්සේගේ අවසරය ඇතිව මේ ගරු සභාවේ වරප්‍රසාද කඩ කිරීමේ ප්‍රශ්නයක් මම ඉදිරිපත් කරනව. 1968 පෙබරවාරි 8 වෙනිදා රබර් පාලන අරමුදලේ වියදම් සහ අයවැය ලේඛනය ඉදිරිපත් කළ අවස්ථාවේ මා කළ කථාවේ සාරාංශයක් 1968 පෙබරවාරි 9 වැනිදා "ඩේලි නිවුස්" පත්‍රයේ 3 වෙනි පිටුවේ පළ වී තිබෙනව. එහි සඳහන් වෙන්නෙ මෙහෙමයි:

"The Director of the Institute——"

ඒ කියන්නේ "රිසර්ච් ඉන්ස්ටිටියුට්"—

"——worked according to his own whims and fancies and was hardly concerned about the interests of the industry."

මෙය සම්පූර්ණයෙන්ම අසත්‍ය වාර්තාවක්. එය ඔප්පු කිරීම සඳහා, රබර් පර්යේෂණාගාරයේ අධ්‍යක්ෂතුමාත්, එහි වැඩ කරන අනෙක් පිරිසත් සම්බන්ධයෙන් මා සඳහන් කළ කොටස් 1968 පෙබරවාරි 8 වැනි දින හැන්සාඩ් වාර්තාවේ 84 වැනි තීරුවෙන් උපුටා දක්වන්නට කැමැතියි:

"අපේ රබර් පර්යේෂණායතනයේ සිටින අධ්‍යක්ෂතුමා ගැන මගේ පෞද්ගලික විරුද්ධත්වයක් නැහැ. මා මේ කරන්නේ පෞද්ගලික විවේචනයක් නොවෙයි. එතුමා හොඳින් වැඩ කරනවා විය හැකියි. ඒ වාගේම අනෙක් මහතුනුත් උනන්දුවෙන් වැඩ කරනවා විය හැකියි."

මා තවතැනෙක මෙසේ සඳහන් කර තිබෙනවා:

"රබර් පර්යේෂණාගාරයේ ඉතුරු වී සිටින පිරිසත් ඉතා හොඳින් වැඩ කරගෙන යනවා."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ කියන්නේ, අස් වූ පිරිස හැරෙන්න ට දැනට ඉතුරු වී සිටින පිරිස ගැනයි.

"හැබැයි ක්‍රමය වෙනස් කරන්නට ඕනෑ."

මා කීවේ මෙයයි : රබර් පර්යේෂණාගාර යේ පර්යේෂණ සැලැස්මක් නැහැ. පර්යේෂණ කටයුතු සඳහා මුදල් නැහැ. රබර් පර්යේෂණාගාර ආඥා පනත සංශෝධනය කළ යුතුයි. ඒ වාගේම, රබර් පර්යේෂණාගාරයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ඉන්න සමහර කොටස් තුළ ජාත්‍යාලයක්, ජාතික හැඟීමක් නැති බව මා කීවා. දැන් සිටින අධ්‍යක්ෂතුමා—ආචාර්ය රොනී විජේවන්ත මහතා—කෙරෙහි මා සම්පූර්ණ විශ්වාසය තබනවා. එතුමා ඉතා හොඳින් වැඩ කරන අවංක නිලධාරියකු ලෙස මා සලකනවා. එම නිසා, මෙම පත්‍ර වාර්තාව මෙම ගරු සභාවේ ගරුත්වයට පමණක් නොව, මෙතැන පිළිතුරු දෙන්නට බැරි රජයේ නිලධාරීන්ගේ ආත්ම ගෞරවයට පවා හානිකරයි. එම නිසා මේ ගරු සභාවේ මෙන්ම එම නිලධාරීන්ගේද ගෞරවය ආරක්ෂා කරන ලෙස මා ඉල්ලා සිටිනවා. මෙවැනි බොරු වාර්තා පළ කොට, අපේ කටින් පිට වන වචන වෙනස් කර රජයේ නිලධාරීන්ට පහර ගහන්නට එපා යැයි මා ඉතා ආදරයෙන් හා කරුණාවෙන් ඉල්ලා සිටිනවා. එම නිසා මේ වාර්තාවේ නිවැරදි කිරීමක් හෙටම පළ කරවීමට කටයුතු සලස්වන ලෙස ගරු කථානායකතුමාගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

I shall certainly take action on the complaint of the hon. Member. I find that there is considerable misreporting and misrepresentation in the press. The other day one of the journals announced the "appoint ment of a Deputy Speaker" when the one and only duly elected Deputy Speaker is still functioning. I also find that some remarks of mine made during yesterday's Debate have been misreported. I do trust that those responsible will be more careful because these things cause great embarrassment to Members and to the general public.



I shall take action on the complaint of the hon. Member.

## ඉන්දු-ලංකා ගිවිසුම (ක්‍රියාවට නැගීමේ) පනත : නියෝග

*இந்திய—இலங்கை ஒப்பந்தம் (செயற்படுத்தல்) சட்டம் : பிரமாணங்கள்*

## INDO-CEYLON AGREEMENT (IMPLEMENTATION) ACT : REGULATIONS

**ගරු ඩඩ්ලි සේනානායක (අග්‍රාමාත්‍ය, ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති, ක්‍රම සම්පාදක හා ආර්ථික කට යුතු පිළිබඳ ඇමති සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමති)**

*(கௌரவ டட்லி சேனநாயக்க—பிரதம அமைச்சரும் பாதுகாப்பு, வெளி விவகார அமைச்சரும் திட்ட அமைப்பு, பொருளாதார விவகார அமைச்சரும் தகவல், ஒலிபரப்பு அமைச்சரும்)*

(The Hon. Dudley Senanayake—Prime Minister, Minister of Defence & External Affairs, Minister of Planning & Economic Affairs and Minister of Information and Broadcasting)

I move,

"That the Regulations made by the Prime Minister and Minister of Defence and External Affairs by virtue of the powers vested in him by Section 26 of the Indo-Ceylon Agreement (Implementation) Act, No. 14 of 1967, which were presented on January 26, 1968, be approved."

Mr. Speaker, hon. Members are aware of the fact that the Indo-Ceylon Agreement (Implementation) Bill went through a very prolonged Second Reading Debate when it was discussed in this House. It was also referred to a Standing Committee before which many deputations were able to express their views, and finally it was passed by this House.

Under Section 26, sub-section (1) of the Act, "the Minister may make Regulations for the purpose of carrying out or giving effect to the principles and provisions of the Act", and the general subjects on which the Minister may make regulations are enumerated there. Under that regulation-making power,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඩඩ්ලි සේනානායක]

these regulations have been duly made, and I am presenting them for the approval of the House.

Regulation 1 is merely the title of the regulations. Regulations 2, 3 and 4 prescribe the form of the three registers that have to be maintained : the Ceylon Citizenship Register which has to be maintained under Section 5, sub-section 1 ; the Indian Citizenship Register which has to be maintained under Section 5, sub-section 2 ; and the Repatriation Register which has to be maintained under Section 5, sub-section 3.

Regulation 5 prescribes the form of publication in the gazette of the particulars of persons registered under the Agreement.

Regulation 6 prescribes the form of the application to be used for the grant of Ceylon citizenship.

Regulation 7 prescribes the form of the citizenship certificate.

Regulation 8 prescribes the form of notification in the gazette of persons granted Ceylon citizenship.

Regulation 9 prescribes the period—three months— within which a person registered as a citizen of Ceylon should subscribe the oath or affirmation.

Regulation 10 prescribes the form of the oath or affirmation.

Regulation 11 prescribes the period—two months—within which a person liable to repatriation should apply to the Commissioner for a residence permit.

Regulation 12 prescribes the form to be used for applying for the issue or extension of a residence permit.

Regulation 13 enables a parent or guardian to apply for a residence permit for his child or dependant under 16 years of age.

Regulation 14 enables the commissioner to ask an applicant for a residence permit to submit three copies of his photograph and three impressions of his fingerprints. These are to be certified or taken in the presence of an officer generally or specially authorized by the commissioner.

Regulation 15 enables the commissioner to call for information or documents to consider the issue or extension of a residence permit.

Regulation 16 enables the commissioner in his absolute discretion to cancel or vary or amend any condition in the permit ; notice of cancellation or variation or amendment has to be served on the person concerned.

Regulation 17 enables the commissioner in his absolute discretion to extend the period of a residence permit or to cancel or vary the permit thus extended.

Regulation 18 enables the commissioner to specify the number of occasions that a residence permit can be used for entry into Ceylon.

Regulation 19 prescribes the form of the residence permit.

Regulation 20 requires the residence visa holder to produce his permit and passport when required to do so.

Regulation 21 specifies that a permit ceases to be valid on expiry, or on the cessation of the purpose for which it was issued, or on the non-fulfilment of any of the conditions in the permit.

Regulation 22 specifies that when a permit issued to a person ceases to be valid, a permit issued to his spouse or dependant also ceases to be valid if such permit was issued to such

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

person solely by virtue of his being the spouse or dependant of such person.

Regulation 23 prescribes the officers who can execute removal orders.

Regulation 24 requires a parent or guardian to apply for a separate certificate of citizenship for a child included in the citizenship certificate of the parent within six months of his becoming 14 years of age, and to transit the original certificate so that the entry relating to the child in the certificate may be deleted with the issue of the new certificate; it also prescribes the form to be used when applying for a new certificate, and imposes a penalty of Rs. 50 for non-compliance with its provisions.

Regulation 25 prescribes the person who can administer the oath and affirmation.

Regulation 26 prescribes the form to be used by superintendents of estates when reporting to the commissioner whether documents addressed to estate residents had been duly handed to him or not.

Regulation 27 gives certain definitions.

**ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.**

வினா எடுத்தியம்பப்பெற்றது.

*Question proposed.*

අ. භා. 2.25

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ගරු කථානායකතුමනි, සිරිමා-ශාස්ත්‍රී ගිවිසුම ක්‍රියාවට නැඟීම සඳහා, එසේ නැත් නම් මෙම ගරු සභාව විසින් සම්මත කරන ලද ඉන්දු-ලංකා පුරවැසි පනත ක්‍රියාවට නැඟීම සඳහා රෙගුලාසි මාලාවක් ඉදිරිපත් කිරීමෙන්, එම ගිවිසුමේ සඳහන් පරමාර්ථ ඉෂ්ට කර ගැනීමට තවත් පියවරක් ඉදිරියට තැබීම ගැන මේ අවස්ථාවේදී ප්‍රථමයෙන්ම අපේ සතුට ප්‍රකාශ කළ යුතුව තිබෙනවා. මෙම කාර්යය ඉක්මනින් ඉෂ්ට නොකිරීමෙන් නැත්නම් ප්‍රමාද වීමෙන් විශාල පාඩුවක් විඳින පිරිසක් නියෝජනය කරන කෙනකු හැටියට මෙම රෙගුලාසි ඉදිරිපත් කිරීම ගැන මා ගරු අගමැතිතුමාට ස්තුතිවන්ත වෙනවා. තව දුරටත් සිදුවන ප්‍රමාදය වැළැක්වීම සඳහා මෙම රෙගුලාසි ඉදිරිපත් කිරීම ගැන ස්තුතිවන්ත වෙනවා.

එදා මෙම ගරු සභාව විසින් සම්මත කරන ලද පනත අනුව මේ රටේ පුරවැසිකම් ලැබෙන පිරිසක්, ඒ වාගේම මේ රටේ පුරවැසිකම් නොලැබෙන නිසා ඉන්දියාවට යවන පිරිසක් ගැන නීත්‍යනුකූලව ක්‍රියා කිරීම පිණිස බලය පැවරෙන නියෝග මාලාවක් හැටියටයි, අප මේ රෙගුලාසි මාලාව භාර ගන්නේ. මෙම රෙගුලාසි මාලාව අනුව, ලංකා පුරවැසිකම් ඉල්ලා සිටින උදවියගේ ලැයිස්තුවක් සකස් කර, ඒ ලැයිස්තුවෙන් පුරවැසිකම් දීමට සුදුස්සන් තෝරාගෙන ඔවුන්ට පුරවැසිකම් දීමටත්, ඒ වාගේම ඉන්දියාවට යැවිය යුතු උදවිය පිළිබඳව තීරණයක් ගන්නටත් මේ කට යුතු භාරව සිටින දෙපාර්තමේන්තුවට අවස්ථාව සැලසෙනවා. මීට පෙර කීවාක් මෙන් අප අදත් කියන්නේ දැනටමත් මෙම කාර්යය ප්‍රමාද වී වැඩි බවයි. 1948 දී සම්මත වූ ඒ පරණ පුරවැසි පනත අනුව පුරවැසියන් ලියාපදිංචි කිරීමෙන් පසුව මේ රටේ ඇති වූ අවුල් සහගත ව්‍යාකූල තත්ත්වයෙන් මේ රට මුදා ගැනීම සඳහා, විශේෂයෙන් රටවැසිකම් නැති උදවියගෙන් අහිංසක උඩරට ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීම සඳහා මෙම පනත ඉක්මනින්ම ක්‍රියාත්මක කළ යුතුය යන අදහස උඩරට හැම කෙනකුම දරන බව අපේ විශ්වාසයයි. එසේ හෙයින් උඩ රට ප්‍රදේශයේ පීඩාවට පත් වූවන් හැටියට මෙතෙක් කල් උද්ඝෝෂණය කෙළේ මෙම කටයුතු ප්‍රමාද වීම පිළිබඳවයි. ඉන්දියානුවන් කී දෙනකුට ලංකා පුරවැසිකම් දී තිබෙනවාද, කී දෙනකු ඉන්දියාවට පිට කර යවා තිබෙනවාද, කී දෙනකුට ඉන්දියානු පුරවැසිකම් දී තිබෙනවාදැයි සොරණාතොට ගරු මන්ත්‍රීතුමා (කේ. වයි. එම්. විජේරත්න බණ්ඩා මයා.) පසුගියදා මෙම ගරු සභාවේදී ගරු අගමැතිතුමාගෙන් ප්‍රශ්න කෙළේත් මෙම කාරණය පිළිබඳව දක්වන උනන්දුව නිසා තත්ත්වය කෙබඳු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වී. බී. එම්. හේරත් මයා.]

දැයි දැන ගැනීම පිණිසයි. එදා ඇසූ එම ප්‍රශ්නයේ සියලුම කොටස්වලට "නැත" යන පිළිතුර ගරු අගමැතිතුමාගෙන් ලැබුණා. ඊට හේතුව කුමක්දැයි විමසූ විට ගරු අගමැතිතුමා කීවේ පනත අනුව රෙගුලාසි සම්මත කිරීමෙන් පසුව පනත ක්‍රියාත්මක කරන බවයි. සොරණාතොට ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුරු දෙන දිනයේදී මෙම ගරු සභාවට රෙගුලාසි ඉදිරිපත් කර තිබුණේ නැහැ.

ප්‍රමාද වී හෝ මෙම රෙගුලාසි මෙම ගරු සභාවට ඉදිරිපත් කොට අද දින සම්මත කර ගැනීමට බලාපොරොත්තු වන බව පෙනෙනවා. හදිසියේ මෙම රෙගුලාසි සම්මත කර ගැනීමට බලාපොරොත්තු වන බව පෙනෙනවා. මෙම විෂය ගැන අද දින සාකච්ඡා වන බව අප දැනගෙන සිටියේ නැහැ. අපට ලැබුණු න්‍යාය පුස්තකවල හැටියට අපට එහෙම හිතන්නට පුළුවන්කමක් තිබුණේ නැහැ. කොහොම වුවත් හදිසියේ හෝ මෙම රෙගුලාසි සම්මත කර ගැනීම ගැන අප විරුද්ධ වන්නේ නැහැ. අපට වුවමනා වී තිබෙන්නේ මේ වැඩේ ඉක්මන් කරවීමටයි. මෙම රෙගුලාසි මාලාව සම්මත කරවාගෙන පුළුවන් තරම් ඉක්මනින් මෙම ප්‍රශ්නය බේරුම් කර ගැනීමට ගරු අගමැතිතුමා ඉදිරිපත් වීම ගැන අප එතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු කථානායකතුමනි, වෙනත් කෙනකු විසින් කරන ලද කොතරම් හොඳ වැඩක් වුණත් අහක දැමීම බොහෝ විට මේ රටේ සමහර පුද්ගලයන්ගේ සිරිතයි. අපේ ආණ්ඩු බොහෝ විට ක්‍රියා කරන්නේත් ඒ විධියටයි. කලින් පැවති ආණ්ඩුව කළ හොඳ වැඩ වුණත් සමහර විට අලුතෙන් පත් වන ආණ්ඩුව ප්‍රතික්ෂේප කර දමනවා. මේ ආණ්ඩුව විසින් කර ගෙන යන යම් යම් දේවල් පවත්වාගෙන යාමට සමහර විට අනාගතයේදී ඇති වන ආණ්ඩුවක් සූදානම් නැති වෙන්න පුළුවනි. කොයි තරම් හොඳ එකක් වුණත් නරකයි කියා පැත්තකට දැමීමට කල්පනා කරන්න පුළුවනි. නමුත් ඉන්දු-ලංකා ප්‍රශ්නය විසඳීම සඳහා ඇති කර ගත් සිරිමා-ශාස්ත්‍රී ගිවිසුම මුළු රටටම ප්‍රයෝජනවත් එකක් හැටියට කල්පනා කර ඒ ගිවිසුම හැකි තාක් ඉක්මණින් ක්‍රියාත්මක කරනු ඇත යන්නයි රටේ ජනතාවගේ බලාපොරොත්තුව. දැනටත් අවුරුදු 3 ක් පමණ ගත වී තිබෙනවා. ඒ නිසා පනත සම්මත කර රෙගුලාසි පාර්ලිමේන්තුවට ගෙන ඒමට ගත වුණ කාලය දෙස බලන විට අපට සතුටු වෙන්න පුළුවන්කමක් නැහැ. ඕනෑවට වැඩියෙන් ටිකක් කාලය ගත වී තිබෙනවා. ඒ නිසා මේ රෙගුලාසි සම්මත වුණ වහාම, අද හෙටම වාගේ, මේවා ක්‍රියාත්මක කරන්න පටන් ගන්නා ලෙස උඩරටින් පැමිණි පුද්ගලයෙකු වශයෙන් මා තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා.

සමහර විට ගරු කථානායකතුමනි, ඉල්ලුම් පත්‍ර කැඳවා පුරවැසිකම් දීමට යාමේදී පෞද්ගලිකව උඩරට ජනතාව නියෝජනය කරන මන්ත්‍රීවරුන්ට පාඩු සිදු වන්නට පුළුවනි. මේ පිළිබඳව ගරු අගමැතිතුමා කාරක සභා අවස්ථාවේදීත් කෙළින්ම අපට ප්‍රකාශ කළා. ඒ නිසා වැඩිපුර පුරවැසියන් ඇතිවීමේදී බහුතර ජනතාව නියෝජනය කරන සිංහල මන්ත්‍රීවරුන්ට යම්කිසි අවාසියක් ඇති නොවන අන්දමට යම්කිසි වැඩපිළිවෙළක් යොදන්නට පුළුවන්කමක් තිබෙනවා නම් එවැනි වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන ලෙස මා ගරු අගමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

එවැනි වැඩ පිළිවෙළක් යෙදවිය යුතු බව මීට ප්‍රථමයෙන් ගරු අගමැතිතුමා හා විරුද්ධ පක්ෂය විසින් කියා තිබෙනවා. ඒ නිසා අපි විශේෂයෙන් මේ අවස්ථාවේදී ඉල්ලා සිටින්වා ගරු අගමැතිතුමා විසින් මේ ව්‍යවස්ථාවන් ඉදිරිපත් කර පුරවැසිකම් දී අවසන් වන තෙක් නොසිට, ඒ සමගම බහු ජනතාව නියෝජනය කරන මන්ත්‍රීවරුන්ට පාඩුවක් සිදු නොවන අන්දමේ වැඩපිළිවෙළකුත් මේ ගරු සභාවට ඉදිරිපත් කරන ලෙස. යම්කිසි නීති කෙටුම්පතක් හෝ මේ සභාවට ඉදිරිපත් කර, වැඩිපුර ඇති වන පුරවැසියන් නිසා බහුතර ජනතාව නියෝජනය කරන මන්ත්‍රීවරුන්ට යම්කිසි පහරක් වැදෙන්නට ඉඩ තිබේ නම් එය වැළැක්වීමට වග බලා ගන්නා ලෙස මා ගරු අගමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ මක් නිසාද කියනවා නම් උඩරට ජනතාව සාමාන්‍යයෙන් පහර පිට පහර කෑ පිරිසක්. 1818 සිටම ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රදේශවල සිටින ජනතාවට පහර පිට පහර කන්න සිදු වුණා. ඔවුන් ඒ වැටුණු වළෙන් යම්තම් ගොඩ එන්න මහන්සි ගන්න මේ අවස්ථාවේදී නැවතත් ඔවුන්ට පහර වැදුණොත්, කවදාවත් ඔවුන්ට ගොඩ එන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. උඩරට පීඩා විඳින ජනතාවගේ නියෝජිතයෙක් හැටියට ඉතාමත් ඕනෑකමින් මේ ගරු සභාවෙනුත්, ගරු අගමැතිතුමාගෙනුත්, ආණ්ඩුවෙනුත් මා ඉල්ලා සිටිනවා එක් පිරිසකට මනුෂ්‍ය අයිතිවාසිකම් ලබා දීමෙන් තවත් පිරිසකට පහරක් වදිනවා නම් ඒ වැදීම නැවැත්වීම සඳහා අප්‍රමාදව යම්කිසි වැඩපිළිවෙළක් ආරම්භ කරන්නය කියා.

මා එසේ කියන්නේ මෙන්න මේ නිසයි. අපි දන්නේ නැහැ කොයි වේලේ මේ රටේ මැතිවරණයක් ඇති වේවිද කියා. නොයෙක් විධියේ කථා රටේ පැතිර තිබෙනවා. මැතිවරණයක් ඇති වේවිද දන්නෙත් නැහැ; නැති වේවිද දන්නෙත් නැහැ. 1970 දී මැතිවරණයක් පවත්වන බව ගරු අගමැතිතුමා විසින් නම් මෙහිදී ප්‍රකාශ කර තිබෙනවා. තවත් සමහරු කියනවා මේ රටේ තවත් මැතිවරණයක් පවත්වන්නේ නැත කියා. අපේ සමාජයේ නොයෙක් විධියේ විවිධ විෂම මත තිබෙනවා. ඒ ගැන අපි පුදුම වන්නේ නැහැ. විවිධ මත විවිධ අදහස් අපේ රටේ ජනතාව අතර පමණක් නොව, ලෝකයේ හැම රටකම වසන ජනතාව අතරේ පවතිනවා. ප්‍රජාතන්ත්‍රවාදී රටක ඕනෑම කෙනෙකුට ඕනෑම දෙයක් කියන්න නිදහස තිබෙනවා. නමුත් ප්‍රජාතන්ත්‍රවාදයට පහර වදින නැත්නම් ප්‍රජාතන්ත්‍රවාදය නැති කිරීමේ ක්‍රියා මාර්ගයක් ගැනීමට කවුරු හෝ මහන්සි ගන්න බවක් පෙනී ගියොත් අන්න එදාට මේ රටේ ජනතාව මොන විධියකටවත් එයට ඉඩ නොදෙන බව ස්ථිරව මට කියන්න පුළුවනි. ඒ නිසා තමුන්නාන්සේ එදා කාරක සභා අවස්ථාවේදී කී අන්දමට, වතුවලට වෙනම ආසන ඇති කිරීමේ මාර්ගයෙන් හෝ වෙනත් මාර්ගයකින් හෝ මේ ප්‍රශ්නයත් මේ සමග විසඳීමට යම් කිසි වැඩ පිළිවෙළක් ඇති කරන ලෙස, මේ රටේ පීඩා විඳින කොටසක් වූ ඒ උඩරට සිංහල ජනතාව නියෝජනය කරන මන්ත්‍රීවරයකු හැටියට මා ඉල්ලා සිටිනවා.

ඒ වැඩ පිළිවෙළ ඇති කරන්නට මේ පනත ක්‍රියාත්මක වී අවසාන වන තෙක් සිටින්නේ නැතිව කරුණාකර පුළුවන් තරම් ඉක්මණින් එය කරන ලෙස ඉල්ලා සිටිනවා. පනත ගැනවත්, මේ ව්‍යවස්ථාවල තිබෙන නීත්‍යනුකූල තත්ත්වය ගැනවත් මේ අවස්ථාවේදී කථා කරන්නට මා අදහස් කරන්නෙ නැහැ. පනතක් සම්මත කර ඒ පනත ක්‍රියාවට නගන මේ අවස්ථාවේදී, මේ රෙගුලාසි යම් විධියකින් පනතට විරුද්ධ නම් ඒ පිළිබඳව කරුණු දක්වන්නට නීතිය පිළිබඳ දැනීමක් ඇති නීතිඥ මන්ත්‍රීවරුන් මේ ගරු සභාවේදී ඉදිරිපත් වෙනවා ඇති. එහෙත් ප්‍රතිපත්ති වශයෙන් ඉදිරිපත් කළ යුතු කරුණු ගැනයි, මා කථා කරන්නේ.

වතුකරය නියෝජනය කරන මන්ත්‍රීවරුන් හැටියට අපට දෙපැත්තෙන්ම පැමිණිලි ලැබෙනවා. ඒ නිසා දෙපැත්තම කල්පනා කර බලන්නට අපට සිදු වී තිබෙනවා. එක් අතකින් මේ පුරවැසිකම් දීමේදී වතුකරයේ සිංහල ජනතාවට ඇති වන පාඩු ගැනත්, ඒවා මග හැරවීමට ගත යුතු ක්‍රියා මාර්ග ගැනත් අප කල්පනා කරන්නට ඕනෑ. එසේම වතුකරයේ සිටින ඉන්දියානු ජනතාවගෙනුත් අපට පැමිණිලි ලැබෙනවා. ගරු අගමැතිතුමනි, ඉන්දියානු ජනතාවගෙන් වැඩි කොටසක් කැමැත්ත දක්වන්නේ මෙහි සිටින්නට නොව ඉන්දියාවට යන්නට බව වතුකරය නිතර ආශ්‍රය කරන මන්ත්‍රීවරයකු හැටියට මට තමුන්නාන්සේට කියන්නට පුළුවන්. ඒ අය හැම විටම කියන්නේ අපට යන්න ඕනෑ, යන්න ඕනෑ කියායි. එහෙත් ඒ අයගේ යාමට බාධා කරන බලවේග මේ රටේ තිබෙනවා. තමුන්නාන්සේලා අප එකතු වී මේ පනත, මේ ව්‍යවස්ථා කොයි විධියට සම්මත කර ගත්තත් අර බලවේග යන්න එපා, යන්න එපා, එක් කෙනෙක්වත් යන්න එපා කියනවා. ඒ නිසා ඒ බලවේග මාර්ගයෙන් මේ අයගේ යාම සම්පූර්ණයෙන්ම නතර වන අන්දමේ ක්‍රියාමාර්ග ඇති වන්නට ඉඩ තිබෙනවා.

ගරු කථානායකතුමනි, මට කණගාටු වෙන් වුනත් එක චෝදනාවක් කරන්නට සිදු වී තිබෙනවා. සමහරවිට එය වැරදි වන්නට පුළුවන්. එහෙත් කරන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නට දෙයක් නැහැ. මේ වාගේ වැඩකට ඉන්දියානු ජනයා ඉන්දියානු තානාපති කාර්යාලයට ගියාම එළවා දමනවාය කියා සමහර ඉන්දියානු කම්කරුවන් කියනවා. ඒක රටකට කරන චෝදනාවක් වශයෙන් වැරදි චෝදනාවක් හැටියට තර්ක කරන්නට පුළුවන්. එහෙත් කම්කරුවන් අපට කරන පැමිණිලියි, අප ඉදිරිපත් කරන්නේ. "ඉන්දියාවට යන්නට ඉඩ දෙන්නය කියා ඉල්ලන්නට අප ඉන්දියානු තානාපති කාර්යාලයට ගියා; තානාපති කාර්යාලය අපට යන්නට ඉඩ දෙන්නෙ නැහැ" කියා සමහර ඉන්දියානු කම්කරුවන් කියනවා.

තවත් පැත්තක් තියෙනවා. යම් යම් වෘත්තීය සමිති, යම් යම් ජාතිවල නායකයන්, ඉන්දියාවට යාමට කැමැත්ත පළ කරන අය මෙහි නවත්වා ගන්නට මහන්සි ගන්නවාය කියා රාවයක් තිබෙනවා. ඒ නිසයි, අප ඉල්ලා සිටින්නේ ඒ වාගෙ බලවේග වලට ක්‍රියා කරන්නට ඉඩ නොදී යන්නට කැමති අයට යන්නට පුළුවන් වන අන්දමේ යුක්ති සහගත ක්‍රියා මාර්ගයක් ඇති කරන්නටය කියා. ඒ සමගම අප විසින් කල්පනා කළ යුතු තවත් පැත්තක් තිබෙනවා. වතු අයිතිකාරයන්—වතු පාලකයන්—ඉන්දියානු කම්කරුවන් වතුවලින් එළියට යවන්නට බොහොම අකැමතියි. ඒ අයගෙන් තව දුරටත් වැඩ ගැනීම සඳහා ඒ අය වතුවල නවත්වා ගැනීමට ඒ වතු අයිතිකාරයන් පුළුවන් තරම් මහන්සි ගන්නවා. සිංහලයන් වතුවල වැඩට ගන්නට ඒ වතු අයිතිකාරයන් කොහොමටවත් කැමති නැහැ. ඒ ඇයි? අපේ සිංහල උදවිය කම්කරු වෘත්තියට ගියත් තමන්ගේ ආත්ම ගෞරවය ආරක්ෂා කරගෙන, වුවමනාවට වඩා වහල් නොවී තමන්ගේ සේවය පමණක් කරන්නටයි, පුරුදු වී සිටින්නෙ. ආත්ම ශක්තියක්, කොඳු ඇටයක් තිබෙන ඒ සිංහලයන්ට වහල්කම් කරන්නට පුරුද්දක් නැහැ. වහල්කම් නොකරන නිසා—සැම දෙනාම නොවෙයි—සමහර වතු පාලකයන් සිංහලයන් වතුවල වැඩට ගන්නට අකමැතියි.

දැනට වතුවල සේවය කරන ඉන්දියානු කම්කරුවන් පිට වී ගියොත් සමහරවිට වතු වහන්නට සිදු වෙනවාය කියන අන්දමේ තර්ජනයක් ඇති වන්නට බැරිකමක් නැහැ. එවැනි තර්ජනයක් ඉදිරිපත් වුනොත් ආණ්ඩුවට වැඩිපුරම ආදායම ලැබෙන තේ කර්මාන්තය අඩපණ වී යන්නට ඉඩ තිබෙනවාය, ඒ නිසා ඉන්දියානුන් ආපසු යවන්නට බැරිය කියා, මේ පනත ක්‍රියාවේ යෙදීමේ වේගය ටිකක් බාල කරන්නට බැරිකමක් නැහැ. එමනිසා, ඒ දවස්වල අපේ ආණ්ඩුව තිබුණු කාලයේදී යෝජනාවක් කළා, කම්කරු දෙපාර්තමේන්තුව මගින් හෝ වෙනත් දෙපාර්තමේන්තුවක් මගින් හෝ උඩරට ප්‍රදේශවල පදිංචිව සිටින තරුණ තරුණියන්ට තේ කර්මාන්තය පිළිබඳව පුහුණුවක් හැකි තරම් ඉක්මනට ලබාදීම සඳහා තේ කර්මාන්තය පුහුණු කිරීමේ මධ්‍යස්ථාන ආරම්භ කරන ලෙස. තේ නෙළන සැටි, තේ කර්මාන්ත ශාලාවක වැඩ කරන සැටි, මේ ආදි කටයුතු ගැන සිංහල තරුණ තරුණියන්ට පුහුණුවක් ලබා දුන්නොත් වතු කම්කරුවන් මෙරටින් පිට වී ගිය විට තේ කර්මාන්තය එලෙසින්ම පවත්වා ගෙන යන්න පුළුවනි.

හැබැයි, එහෙම යමක් නොකර ඉන්දියානු කම්කරුවන් පිටව ගියොත් වතු පාලකයින් කියන පරිදි තේ කර්මාන්තයෙහි අඩුපාඩුකම් ඇති වන්න ඉඩ තිබෙනවා. අවුරුදු ගණනාවක්ම වතුවල වැඩ කළ පුහුණු කම්කරුවන් ඉවත්ව යන විට ඒ වෙනුවට පුහුණු කම්කරුවන් වතුවල සේවයේ නොයෙදුවොත් නිෂ්පාදනයෙහි අඩුවක් ඇති වන්න පුළුවනි; අලාභ ඇති වෙන්න පුළුවනි. ඒ නිසා, වතු පාලකයින්ගේ බලපෑම උඩ මෙම පනත ක්‍රියාත්මක කිරීමේ දුෂ්කරතාවන් ඇති වන්න ඉඩ තිබෙනවා. එම නිසා, මා අගමැතිතුමාගෙන් මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා, කම්කරු ඇමතිතුමා ලවා, තේ කර්මාන්තය පිළිබඳ පුහුණුවක් දෙන ආයතන උඩරට ඇති කරන ලෙස. එසේ පිහිටුවනු ලැබුවහොත් සති දෙකක පමණ කාලයක් තුළදී සිංහල තරුණ තරුණියන්ට තේ කර්මාන්තය පිළිබඳව සෑහෙන පුහුණුවක් ලබාදෙන්න පුළුවනි. එසේ පුහුණුවක් ලබා දී පුහුණු කම්කරුවන් වශයෙන් වතුවල සේවයට යෙදුවොත් අර තර්ජනයෙන් මිදෙන්නට පුළුවන්කම ලැබෙනවා. එමෙන්ම ඉදිරියට යන වේගය බාල කිරීමටත් ඉඩකඩ නැති වෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු කථානායකතුමනි, මෙය පුරවැසිකම් ලබාදීමේ ප්‍රශ්නයක් පමණක් නොවෙයි. මෙය වැදගත් ජාතික ප්‍රශ්නයක් පමණක්ද නොවෙයි. මෙය රැකී රක්ෂා විසඳීමේ මාර්ගයක්ද වෙනවා. විශාල වශයෙන් වතු කම්කරුවන් ඉවත්ව යන විට ඒ වෙනුවට මේ රටේ තරුණ තරුණියන් වතුවල සේවයෙහි යොදවන්න පුළුවනි. ඒ අයට රැකී රක්ෂා ලබාගැනීමට ඉඩකඩ සැලසෙනවා. එම නිසා මේ කාරණය ගැන ගරු අගමැතිතුමාගේත් ආණ්ඩුවේත් විශේෂ සැලකිල්ල යොමු කරන ලෙස ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමනි, අපේ සිංහල වතු කම්කරුවන්ට දැනටමත් විශාල දුෂ්කරතාවනට මුහුණ දෙන්න සිදු වී තිබෙනවා. මේ පනතට අදාළ වුණත්, නොවුණත් ඒ සිංහල කම්කරුවන්ට මුහුණ පාන්න වී ඇති අමාරුකම් රාශියක්ම තිබෙනවා; විශාල ලෙස බලපෑම් ඇති වී තිබෙනවා. අද මෙන්න මේ විධියෙ තර්ජනයක් ඇති වී තිබෙනවා. සමහර වෙලාවට වත්තක් අයිතේ ඇති රජයේ ඉඩම් කැබැල්ලක්—අක්කර කාලක් පමණ—දෙනවා කම්කරුවකුට ගෙයක් සාදා ගන්න. ගේ සාදා ගෙන අවසාන වුණු ගමන්ම ඒ මනුෂ්‍යයා ඒ ගෙදරට පදිංචියට යන්නටත් පෙර ලයිමෙන් එලවා දමනවා. වත්තෙන් දෙන සහල් සලාකය, පරිප්පු සලාකය නවත්වා දමනවා. කම්කරුවකු හැටියට ඔහුට ඇති ස්ථිර භාවය නැති වෙනවා. මගේ කොට්ඨාශයේ පදිංචි විශාල පිරිසකට මෙවැනි තත්ත්වයක් අද ඇති වී තිබෙනවා. පසුගිය හය මාසය තුළ විශාල පිරිසක් ඒ අන්දමට ලයින්වලින් ඉවත් කර ඔවුන්ට වත්තෙන් දුන් සහනයන් නවත්වා තිබෙනවා. ඉඩම් ඇමතිතුමා දුන් අක්කර කාලෙ පොඩි පැලක් සාදා ගත්තාට පස්සෙ අර පහසුකම් නැති කර දමනවා. එදා සිට ස්ථිර කම්කරුවකු වශයෙන් සේවය කළ සිංහල කම්කරුවා අස්ථිර කම්කරුවකුගේ තත්ත්වයට වැටෙනවා. ඔහුට ලයිමේ පදිංචියක් නැති වෙනවා පමණක් නොවෙයි, වත්තෙන් දුන් සහල් සලාකය, පරිප්පු සලාකය ඔය ආදී පහසුකම් සම්පූර්ණයෙන්ම නැති වී තාවකාලික කම්කරුවකුගේ තත්ත්වයට ඔහු වැටෙනවා.

ඒ ගැන ප්‍රශ්න කළාම කියන්නෙ මොකක්ද? ආහාර පාලක ආඥා පනත යටතේ එහෙම කරන්න ඉඩකඩ තිබෙන බව වතු පාලකයින් කියනවා. පනතෙන් ඉඩකඩ සැලසෙන බව ඇත්ත. එහෙම වුණත් අවුරුදු ගණනාවක් තිස්සෙ වත්තෙන් දුන් සහල් සලාකය, පරිප්පු සලාකය, වෙනත් පහසුකම් එක් වරටම නැති කළ විට ඒ අය වැටෙන තත්ත්වය කුමක්ද? දැන් සිදු වී තිබෙන්නෙ වත්තෙන් එන සිංහල මිනිහාට වත්තෙ පදිංචිව සිටින කම්කරුවන්ට ලැබෙන සහනයන් ලැබෙන්නෙ නැහැ. ස්ථිර තත්ත්වයෙන් අස්ථිර තත්වයට පත් කර තිබෙනවා පමණක් නොවෙයි, හාල් සලාකය පවා නොදෙන නිසා සති පතා හාල් සලාකය මිලදී ලබාගැනීමට—මාසයෙ අවසානයේදී ලැබෙන පඩියෙන් ගෙවීම පිණිස—මුදල් ණයට ලබා ගන්න සිදු වී තිබෙනවා. ඔවැනි තත්ත්වයකට අද අපේ සිංහල කම්කරුවා පත් වී තිබෙනවා. සිංහල කම්කරුවන්ට ඔවුන්ගේ සේවය එපා කරවන්නට අද වතු පාලකයන් මහන්සි ගන්නවා. නුවරඑළි කොට්ඨාශයේත් වලපනේ කොට්ඨාශයේත් එවැනි වතු පාලකයින් රාශියක් සිටින බව අපට පැහැදිලි වී තිබෙනවා. අප දැන් ඒ සම්බන්ධව පරීක්ෂණත් පවත්වාගෙන යනවා. දැනට වතුවල සිටින සිංහල කම්කරුවන් ආරක්ෂා කිරීමේ වැඩ පිළිවෙළක් අවශ්‍ය බව මේ අවස්ථාවේදී ගරු අගමැතිතුමාට මා විශේෂයෙන් මතක් කරන්නට කැමතියි.

එපමණකුත් නොවෙයි. ඉදිරියට වතුවල ඇතිවන පුරප්පාඩුවලට සිංහලයන් ඇතුළත් කර ගන්නට වතු පාලකයින්ට බල කිරීමේ වැඩ පිළිවෙළකුත් තිබිය යුතුයි. දෙමළ කම්කරුවන් යම් කිසි ප්‍රමාණයක් ඉන්දියාවට යවතොත්, එයින් වතුවල ඇතිවන පුරප්පාඩු සඳහා මේ රටේ පුරවැසියන්—සිංහල හෝ වේවා, දෙමළ හෝ වේවා—මේ රටේ උදවිය බඳවා ගැනීම සඳහා වතු පාලකයින්ට බල කිරීමක් තිබෙන්නට ඕනෑ. එසේ නොකළොත් එයින් විශාල වාසියක් ලැබෙන්නේ, ඉන්දියාවේ පුරවැසිකම ලබාගෙන ඉන්දියාවට නොගොස් මෙහි නතර වී සිටින පිරිසටයි. ඉන්දියාවේ පුරවැසිකම් ලබාගෙන එහි නොගොස් මේ රටේම නතර වන පිරිසක් සිටිනවා. අප

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එදා, එවැනි තත්ත්වයකට ඉඩ තැබීම ගැන තරයේ විරුද්ධ වුණා. ඉන්දියාවේ පුරවැසිකම් ලබා ගන්නා අයට එහි යාමට බල කළ යුතුයයි අප එදා කිව්වා. එහෙත් අප එයින් පරාද වුණා. එහි ප්‍රතිවිපාකයක් වශයෙන් හැම වතු පාලකයෙක්ම මහන්සි ගනියි, ඉන්දියාවේ පුරවැසිකම් ලබා ගෙන මෙහි නතර වී සිටින කම්කරුවන් ලවාම කටයුතු කරවා ගන්නට. එහෙම වුණොත් අපේ ගම්බද සිංහල කම්කරුවා සම්බන්ධයෙන් ඇති වන තත්ත්වය කුමක් දැයි මා මේ අවසථාවේදී තමුන්නාන්සේගෙන් අහනවා.

රටක තිබෙන අයිතිවාසිකම් ඒ රටේම පුරවැසියන්ට පළමුවෙන් ලැබිය යුතුයි. ජනතාවට අයිතිවාසිකම් දීමේදී ප්‍රමුඛතාව ලැබිය යුත්තේ ඒ රටේම පුරවැසියනුයි. වෙනත් රටක පුරවැසියන් මෙහි සිටිනවා නම් ඔවුන්ට ලැබිය යුත්තේ දෙවැනි තැනයි. මේ ප්‍රතිපත්තිය අප හැමදෙනාම බාර ගත යුතුයි. එහෙත්, අද ඇති වී තිබෙන මේ තත්ත්වය අනුව සිදු වන්නේ, ඉන්දියාවේ පුරවැසිකම් ලබාගෙන එහි නොගොස් මේ රටේ නතරව සිටින උදවියට ප්‍රමුඛතාව ලැබීමයි. අපගේ විරුද්ධත්වය ඒ ගැනයි. මේ විධියට ක්‍රියා කළොත් මේ රටේ උදවියට ප්‍රමුඛතාව ලැබෙන්නේ නැහැ.

මා මේ ගැන දීර්ඝ වශයෙන් කථා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. වතුවල සිංහල කම්කරුවන්ට ඔවුන්ගේ සේවය එපා කරවීමට වතු පාලකයින් නීතියට මුවා වී ගෙන යන වැඩ පිළිවෙල ගැන පුළුවන් තරම් ඉක්මණින් පරීක්ෂණයක් පවත්වා දැනට සිටින සිංහල කම්කරුවන් ආරක්ෂා කිරීමට වහාම ක්‍රියා කළ යුතු බව ගරු අගමැතිතුමාට විශේෂයෙන් මතක් කරන අතර ඉදිරියට වතුවල ඇති වන පුරප්පාඩුවලට මේ රටේ පුරවැසියන් ඇතුළත් කිරීම සඳහා ඔවුන්ට ප්‍රමුඛතාව දිය යුතුයයි මා යෝජනා කරනවා. එසේ කිරීමේදී, එම සේවය පිළිබඳව මොකවත්ම නොදන්නා හිස් උදවිය තේ වතුවල කම්කරුවන් වශයෙන් ඇතුළත් කරන්නට බැහැ. එම නිසා, කම්කරු දෙපාර්තමේන්තුව ලවා ඔවුන් පුහුණු කර විය යුතුයි. සති දෙකක පුහුණුවක් ලබා නොත් අපේ සිංහල උදවිය එම සේවය ඉතා හොඳින් ඉගෙන ගන්නවා ඇතැයි මා විශ්වාස කරනවා. එවිට වතුවල ඇති වන පුරප්පාඩුව සඳහා අපේ තරුණ තරුණියන් ඇතුළත් කරන්නට පුළුවනි. එයින් ඒ කර්මාන්තයත් ආරක්ෂා වන අතර, අපේ මිනිසුන්ගේ රැකිරක්ෂා ප්‍රශ්න යත් හුඟක් දුරට විසඳෙනවා ඇති. මේ වැඩේ හරියාකාර ඉෂ්ට කරන්නට අපට පුළුවන් වන්නේ මා කී විධියේ නියම සැලැස්මක් උඩ පමණයි.

එක් පැත්තකින් ඉන්දියාවට යා යුතු අය යවන අතරම, අනෙක් පැත්තෙන් මේ රටේ උදවියගේ ප්‍රශ්න විසඳෙන්නට ඕනෑ. එක් පැත්තකින් මේ රටේ පුරවැසිකම් ලබාගෙන මෙහි නතර වන අයට අයිතිවාසිකම් ලැබිය යුතු අතර, අනෙක් පැත්තෙන් මේ රටේ බහුතර ජනතාවට මොනම විධියකින්වත් පහර නොවැදීමට වග බලා ගන්නට ඕනෑ. ඉන්දියානුන්ට මෙහි පුරවැසිකම් දීමෙන් පසුව එන මහ මැතිවරණය කවදා හෝ වේවා, එදාට උඩරට ජනතාවගේ අයිතිවාසිකම්වලට අබමල් රේණුවක් තරමවත් පහරක් වදින අන්දමට කටයුතු කරන්නට එපායයි උඩරට ජනතාව වෙනුවෙන් මා මේ අවසථාවේදී ගරු අගමැතිතුමාගෙන් මෙම ගරු සභාව තුළදී තරයේ ඉල්ලා සිටිනවා. එහෙම වුණොත්, මෙම පනත සම්මත කිරීමෙන් තුන් ලක්ෂයක් පරිස්සම් කරන්නට ගොස් මේ රටේ බහුතර ජනතාව අනාථ වීමටත් කාලකන්නි වීමටත් පුළුවනි. 1818 සිටම අධිරාජ්‍යවාදීන්ට විරුඬව සටන් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන් සැමදම පහතට තල්ලු කර දමා තිබෙනවා. ඔවුන්ට අධ්‍යාපනයක් දුන්නේ නැහැ; පාරවල් දුන්නේ නැහැ; මොනම සංවර්ධන ක්‍රමයක් වත් දුන්නේ නැහැ. හැම අතින්ම පෑගී පෑගී අද ඒ උඩරට ගැමි ජනතාව හප බවට පත් වී සිටිනවා. එම නිසා එදත් පාඩු වින්ද, අද තවමත් පාඩු විඳිමින් සිටින උඩරට ගැමියකු වශයෙන් මා ඉල්ලා සිටිනවා අලුතෙන් ඇති වන ඒ පුරවැසියන්ගේ වහළුන් බවට උඩ රට ගැමි ජනතාවට පත් වන්නට ඉඩ තබන්න එපාය කියා. ඒ ගැන විශේෂ සැලකිල්ල යොමු කරන ලෙස මා ගරු අගමැතිතුමා ගෙන් ඉල්ලා සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මා එසේ කීමෙන් කිසිම විධියකින් අදහස් කරන්න එපා ඒ අයට පුරවැසිකම් ලැබෙනවාට අප විරුද්ධයි කියා. තර්කය ඒක නොවෙයි. තර්කය නම් දැනට තිබෙන අයිතිවාසිකම් නැති වන්නට ඉඩ නොලැබෙන සේ ක්‍රියා කිරීමයි. එනිසා, එදා කාරක සභා අවස්ථාවේදී ගරු අගමැතිතුමා දුන් පොරොන්දු කෙරෙහි මා නැවතත් එතුමාගේ කල්පනාව යොමු කරවනවා.

එක්කෝ වෙනම ඡන්ද කොට්ඨාශ ඇති කිරීම නැත්නම් බහු ආසන ඇති කිරීම යන අදහස් දෙකයි එදා අගමැතිතුමා ප්‍රකාශ කෙළේ. ක්‍රමය කොයි එක වුණත් කමක් නැහැ. සමහර විට එක එක්කෙනා යම් යම් දේ ගැන සිතන මතන ක්‍රමයේ යම් යම් වෙනස්කම් තිබෙන්නට පුළුවනි. ඒක වෙනම ප්‍රශ්නයක්. එහෙත් මේ ප්‍රශ්නය කෙසේ හෝ විසඳිය යුතුයි. ඒකයි අපේ තර්කය. වෙනම ලැයිස්තුවක් සෑදීමෙන් මේ ප්‍රශ්නය විසඳන්නට පුළුවන්ය කියා තර්ක කරන්නටත් කෙනෙකුට ඉඩ තිබෙනවා. බහු ආසන ඇති කිරීමෙන් මේ ප්‍රශ්නය විසඳන්නට පුළුවන් කියා තවත් කෙනෙකුට තර්ක කරන්න ඉඩ තිබෙනවා. වතුවලට පමණක් සීමා කර වෙනම ආසන ඇති කිරීමෙන් මේ ප්‍රශ්නය විසඳන්නට පුළුවන්ය කියා තව තර්කයක් ඉදිරිපත් කරන්න පුළුවනි. මා කියන්නේ මෙයින් එකක් පමණක් අරගෙන මෙය විසඳන්න කියා නොවෙයි. එකකින් පුළුවන් නම් එකකින් විසඳමු. දෙකකින් පුළුවන් නම් දෙකකින් විසඳමු. ඒ දෙකෙන්ම බැරි නම් තවත් තුන් වෙනි ක්‍රියා මාර්ගයකුත් අර ගනිමු. ඒත් බැරි නම් තවත් එකක් සොයමු. මොන ක්‍රමයකින් හෝ වේවා, අපට වුවමනා කරන්නේ ප්‍රශ්නය නිසි පරිදි විසඳන්නයි.

එම නිසා මා කථානායකතුමාගේ මාර්ගයෙන් අගමැතිතුමාගෙනුත් ආණ්ඩුවෙනුත් ඉල්ලා සිටිනවා, මේ ප්‍රශ්නය කෙරෙහි හැකි පමණ ඉක්මන් අවධානය යොමු කර— පුරවැසියන් කවුද කියා තෝරා අවසන් වන තුරු ඉන්න ඕනෑ නැහැ—අද හෙටම හැකි පමණ ඉක්මණින් අවධානය යොමු කර, උඩරට ගැමි ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට කටයුතු කරන්නය කියා. ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වන පරිදි ආණ්ඩුව ක්‍රියා කරන බවට ඒ ජනතාවට විශ්වාසයක් දෙන ලෙස මා අගමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. එවිට තමයි මෙම පනත ක්‍රියාත්මක කිරීමට ඒ ජනතාවගේ සහයෝගය සහ ආධාරය ලැබෙන්නේ. එසේ කළොත් ඔවුන්ට විශ්වාසයක් ඇති කරගන්න පුළුවන්, "ඔව්, අප ගැනත් සිතා තිබෙනවා, අපේ අයිතිවාසිකම් ආරක්ෂා වන විධියට මේ ආණ්ඩුව ක්‍රියා කරනවා " කියා.

සිරිමා-ශාස්ත්‍රී ගිවිසුම අනුව පුරවැසිකම් දීම පමණක් නොව, එයින් ඇති වන්නට ඉඩ තිබෙන ප්‍රතිවිපාක මැඩලීම සඳහා, ඒවායින් උඩරට ජනතාව බේරාගැනීම සඳහා, යම් යම් උපක්‍රමත් යොදනවාය කියන විශ්වාසය රටට ලැබෙන්නට ඕනෑ. එසේ ඒ විශ්වාසය රටවැසියන් තුළ ඇති වුණොත් තමයි, මේ සඳහා රටේ ජනතාවගේ සහයෝගය ලැබෙන්නේ. මෙය පාක්ෂික ප්‍රශ්නයක් නොවෙයි. කාගේත් සහයෝගය ලැබිය යුතු ප්‍රශ්නයක්. මේ ගැන අප තුළ නොයෙකුත් දර්ශන තිබෙනවා. අප වාද විවාද කළා; තර්ක විතර්ක කළා; ඡන්දය විමසුවා. දැන් පනත සම්මත වී අවසානයි. දැන් එය මේ රටේ නීතියයි. ඒ නීතිය අප දැන් ක්‍රියාත්මක කරන්න ඕනෑ. ක්‍රියාත්මක කිරීමේදී අපි අපේ උස්-මිටිකම් ගැන කථා කර සිටීමෙන් වැඩක් නැහැ. හැබැයි, පනත ක්‍රියාත්මක කිරීමේදී ඇති වන යම් ගැටලුවක් වොතොත් ඒවා සකස් කරගන්න සිද්ධ වේවි.

මේ පනත සර්වතෝභද්‍රය කියා මා කියන්නේ නැහැ. මෙය සර්ව සම්පූර්ණයි, මෙහි කිසිම වරදක් නැත, කියන තර්කයට කවුරුවත් බසිනවා නම් එය වැරදියි. මොන ආණ්ඩුවකින් කළත් තත්ත්වය ඒකයි. එනිසා පනත ක්‍රියාත්මක කරගෙන යැමේදී යම් යම් අඩුලුහුඩුකම් සහ ගැටලු ඇති වේවි. ඒවා ඒ ඒ අවස්ථාවලදී සංශෝධනය කිරීමට අපට සිද්ධ වෙනවා. එනිසා මෙය ජාතික ප්‍රශ්නයක් වශයෙන් සලකා සැම දෙනාකුම එකතු වී මේ ප්‍රශ්නය විසඳමු. එසේ ප්‍රශ්නය විසඳන අවස්ථාවේදී යම් යම් පහරවල් අපේ ගැමි ජනතාවට වදින්නට යනවා නම්, ඒවායින් ඒ ජනතාව බේරනවය කියන විශ්වාසය ඒ ජනතාව තුළ ඇති කළ යුතුයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වී. බී. එම්. හේරත් මයා.]

ගරු කථානායකතුමනි, ශී හාන කොට කක්කුට්ටොත් අමතක කරන්නට එපාය කියා ගමේ ගොඩේ කථාවක් තිබෙනවා. මේක ජාතික ප්‍රශ්නයක් තමයි. ඉතින් මේක ජාතික ප්‍රශ්නයක්ය කියා ඒ ගැනම කල්පනා කරනවා නම්, හිය ගැනම කල්පනා කරනවා නම්, අර සතා මැරිලා යනවා නොවැ. ඒ ගැනත් ටිකක් බලන්නට ඕනෑ. උඩරට ජනතාවගේ අයිතිවාසිකම් සම්පූර්ණයෙන් වැළලී යනවාය, නැතිවී යනවාය කියා පෙනෙනවා නම් උඩ රට ජනතාවගේ ඒ නැතිවන අයිතිවාසිකම් පිළිබඳ ප්‍රශ්නය විසඳන්නට මා මෙන්න මේ ක්‍රියා මාර්ගය අනුගමනය කරනවාය කියා මේ රෙගුලාසිවලටත් ප්‍රථමයෙන් ගරු අගමැතිතුමා යම් රෙගුලාසි මාලාවක් ඉදිරිපත් කළා නම් මීටත් වඩා ප්‍රශංසනීයයි. එමනිසා මේ තත්ත්වයෙන් උඩරට පීඩිත පන්තියේ ජනතාව බේරා ගැනීම සඳහාත් ඒ වාගේම උඩරට වතුකරයේ දැනට සිටින සිංහල කම්කරුවන්ගේ තත්ත්වය ආරක්ෂා කිරීම සඳහාත් ඒ වාගේම උඩ රට වතුවල ඇතිවන ඒ පුරප්පාඩුවලට කම්කරුවන් පුහුණු කර පුහුණු කම්කරුවන් ඇතුළු කිරීම සඳහාත් සුදුසු ක්‍රියා මාර්ග ගන්නය කියා ආණ්ඩුවෙනුත් ගරු අගමැතිතුමාගෙනුත් ඉල්ලා සිටින අතරම ඒ වීඩියේ විශ්වාසයක් ඇතිව—උඩරට ජනතාවගේ අයිතිවාසිකම් රැකෙනවාය යන විශ්වාසයක් ඇතිව—මේ පනත ක්‍රියාවේ යෙදීමට සහයෝගය දෙන්නට අපට අවස්ථාවක් දෙන මෙන් මතක් කරමින් මගේ කථාව මෙයින් අවසාන කරනවා.

අ. භා. 2.58

ප්‍රින්ස් ගුණසේකර මයා.

*(திரு. பிறின்ஸ் குணசேக்கர)*

(Mr. Prins Gunasekera)

ගරු කථානායකතුමනි, ඉතාමත් වැදගත් රෙගුලාසි පද්ධතියක් ගරු අගමැතිතුමා විසින් ඉදිරිපත් කර තිබෙනවා. ඊයේ ඔබතුමා හමුවේ පැවති නායක සාකච්ඡාවේදී ගරු අගමැතිතුමා මේ රෙගුලාසි අද සාකච්ඡාවට ගතයුතුය යන අදහස බලවත් ලෙස ඉදිරිපත් කළ නිසා විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් එතැන සිටි සෙසු නායකවරුන් එම ඉල්ලීමට ගරු කිරීමක් වශ



යෙන් මෙම රෙගුලාසි පිළිබඳ විවාදය අද ඇරඹීමට කැමැත්ත පළ කළා. අගමැතිතුමාගේ ඉල්ලීමට ඒ අවස්ථාවේදී විරුද්ධ පක්ෂයේ අය සැලකිල්ලක් දැක්වූවා වාගේම මේ රෙගුලාසි පිළිබඳව විරුද්ධ පක්ෂයෙන් ඉදිරිපත් කරන යම් යම් අදහස්වලට ගරු අගමැතිතුමාගෙනුත් එවැනිම සැලකිල්ලක් ලැබෙනවා ඇත කියා අප බලාපොරොත්තු වෙනවා.

මේ තරම් වැදගත් රෙගුලාසි මාලාවක් පැය කිහිපයක් ඇතුළත විවාද කරන බව දන්වා මේ ගරු සභාවට ඉදිරිපත් කිරීමෙන් සමහර විට ඒවා පිළිබඳව අංග සම්පූර්ණ විග්‍රහයක් කිරීමට අවස්ථාවක් නොලැබී යන්නට පුළුවනි. මීට සති දෙකකට තුනකට ප්‍රථමයෙන් මෙම රෙගුලාසි මන්ත්‍රී මණ්ඩලය හමුවේ තැබූ බව ඇත්තයි. නමුත් දැනටත් න්‍යාය පත්‍රයට සලකා බැලීමට කරුණු පනහක් හැටක් පමණ ඇතුළු කර තිබෙනවා. මේ කරුණු අතරින් මෙම රෙගුලාසි අංක 1 ට අද න්‍යාය පත්‍රයට වැටේවිය කියා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් තුළවත් විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් තුළවත් බලාපොරොත්තුවක් තිබුණේ නැහැ. එම නිසා මේ රෙගුලාසි ගැන මුළු කාලය යොදා සෑහෙන තරම් පරීක්ෂාවෙන් මේවා විභාග කර බලන්නට අවස්ථාවක් නොලැබී යන්නට ඇති. එමනිසා විරුද්ධ පක්ෂය වෙනුවෙන් පොදුවේ කිසියම් ඉල්ලීමක් කරන්නට තරම් අයිතියක් හෝ තත්ත්වයක් මට නැහැ. මක්නිසාද ? මා කියන දේ අනුමත කරන්නට පක්ෂයක්වත් වෘත්තීය සමිතියක්වත් වෙන කිසිම ආයතනයක්වත් මා පසුපස නැහැ. එනමුත් මා කරන ඉල්ලීම සාධාරණ මනුෂ්‍යයකු කරන ඉල්ලීමක් හැටියට, මේ රෙගුලාසි ක්‍රියාත්මක කරන්නට යාමෙන් ජාතිය කෙරෙහි එය කෙසේ බලපාන්නේද යන ප්‍රශ්නය ගැන අපක්ෂපාතව, උපේක්ෂාසහගතව කල්පනා කරන මනුෂ්‍යයකු කරන ඉල්ලීමක් හැටියට සලකා ක්‍රියා කරනු ඇත කියා මා විශ්වාස කරනවා.

ගරු කථානායකතුමනි, අගමැතිතුමා විසින් ඉදිරිපත් කරන්නට යෙදුණු රෙගුලාසි මාලාව පිළිබඳව මා ප්‍රථමකොටම මගේ කනගාටුව ප්‍රකාශ කරන්නේ, එතුමා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මෙය ඉංග්‍රීසියෙන් හා සිංහලෙන් පමණක් ඉදිරිපත් කිරීම නිසායි. මෙම රෙගුලාසි වැඩිවශයෙන්ම බලපාන්නේ—සියයට 98 ක් පමණම බලපාන්නේ—සිංහලත් බැරි ඉංග්‍රීසිත් බැරි දෙමළ ජාතිකයන් කෙරෙහියි. මේ රටේ පුරවැසිකම ලබා දෙන්නට හෝ මේ රටේ ජීවත් වීමේ අයිතිය නැතිකර ඉන්දියාවට යවන්නට හෝ තීරණය කළයුතු මෙම පුද්ගලයන්ට සිදුවී තිබෙන්නේ තමන්ට නොතේරෙන භාෂාවක රෙගුලාසි මාලාවකට අනුව ක්‍රියා කරන්නටයි. අප ඉදිරියේ අද තිබෙන්නේ එම රෙගුලාසිවල ආකෘතිපත්‍රයි.

තමුන්නාන්සේලා දෙමළ ජනතාව ඉදිරියට ගොස් කියනවා, දෙමළ භාෂාවට සාධාරණ තැනක් දෙනවාය කියා. එහෙත් පෙඩරල් පක්ෂයට රහසිගතව දී තිබෙන පොරොන්දු මොනවාදැයි කියන්නට මා දන්නේ නැහැ. කියනකොට එහෙමයි, කරනකොට මෙහෙමයි. තුන් ලක්ෂයක් දෙමළ ජනතාවට ලංකාවේ පුරවැසිකම ලබා දී ඔවුන් ලංකාවේ වැසියන් හැටියට ඇතුළත් කර ගන්නට යනවා. එහෙත් ඒ තුන් ලක්ෂයක ජනතාව දන්නවාද, තමුන්නාන්සේ ගෙනැවිත් තිබෙන රෙගුලාසි මොනවාද කියන්න? ඒ හැරෙන්න පන් ලක්ෂ විසිපන්දහසක් දෙමළ ජනතාව ඉන්දියාවට යවන්නට රෙගුලාසි පනවනවා. ඒ අයගෙන් සමහරවිට සියයට හැටක් පමණ දෙනා මේ රටේම උපන් ජනතාව වන්නට පුළුවනි. ඔවුන්ගේ දූ දරුවන් මේ රටේම උපන් අය වන්නට පුළුවනි. එතරම් ජනතාවක් තමයි, තමන් උපන් දේශයෙන් පිටමංකොට ඉන්දියාවට යවන්නට වුවමනාය කියා රෙගුලාසි පනවන්නේ. ඒ පන්ලක්ෂ විසිපන් දහසක් ජනතාව දන්නා භාෂාවෙන් එම රෙගුලාසි සකස් කර නැහැ. මොකක්ද මෙහි ඇති සාධාරණත්වය කියා මා ප්‍රශ්න කරනවා. තමුන්නාන්සේලා වැඩ පටන් ගත්තේ දශරාජ ධර්මයෙන් රට පාලනය කරනවාය කියායි. මොකක්ද මෙහි ඇති රාජධර්මය?

මිනිසුන්ට නොතේරෙන භාෂාවලින් නීති පාස් කර ඔවුන් ඉපදුණු රටින් ඔවුන්ව උගුල්ලා වෙන රටකට ගෙනියන්නට හදනවා. ඔවුන්ට රටවැසිකම ලැබෙන්නේ යම් යම් කොන්දේසි පිට බව කියනවා. ඒ මිනිසුන්ට යම් යම් කොන්දේසි පිට රටවැසිකම ලැබෙනවාය කියන කාරණා ගැන අවබෝධයක් ලබා ගන්නට ඉඩ ලබා නොදී මේ අන්දමට ක්‍රියා කරනවා. මොකක්ද මෙහි තිබෙන යුක්තිසහගතකම? මොකක්ද මෙහි තිබෙන සාධාරණකම?

ගරු කථානායකතුමනි, මා කරන හැම කතාවකදීම සඳහන් කරන දෙයක් තමයි, භාෂා ප්‍රශ්නය කුමන විධියකින් හෝ ඔළුව ඔසවාගෙන එනවාය යන්න. රටවැසිකම දීම පිළිබඳ ප්‍රශ්නයත් මේ එකම කාසියේ අනික් පැත්තයි. රටසභා පනත තමුන්නාන්සේ අතින් මේ මන්ත්‍රී මණ්ඩලය ඉදිරියට පැමිණෙන්නට පුළුවනි. සමහර විට තව සතියකින් දෙකකින් පමණ. එසේ ඉදිරිපත් කරන්නට යන රටසභා පනතත් භාෂා ප්‍රශ්නයත් එකම කාසියක දෙපැත්තයි. මෙම ප්‍රශ්න දෙකින් එකක් වෙන් කරන්නට බැහැ. ඒ දෙකම එකටයි යන්නේ. අද මෙම රෙගුලාසි 27, ආකෘති පත්‍ර 15 සහ උප ලේඛන 2 ඉදිරිපත් කර තිබෙන්නේ ඉංග්‍රීසියෙන් හා සිංහලෙන් පමණයි. මේ කාරණය අවධාරණයෙන් මා කියන්නේ සමහරවිට මේ පිළිබඳ මගේ විග්‍රහය අනුමත නොකරන ආණ්ඩු පක්ෂයේ ඇතැම් උදවිය මා ජාති භේද වාදය අවුස්සන පුද්ගලයකු වන්නට තැත් කරන කෙනෙකැයි කියන්නට පුළුවන් නිසයි. එම නිසා දෙමළ ජනතාවට කර තිබෙන අසාධාරණත්වය වෙනුවෙන් මා යළිත් වරක් මගේ කනගාටුව ප්‍රකාශ කරනවා.

මෙම රෙගුලාසි ක්‍රියාත්මක කරන්නට යාමේදී ඔබතුමාගේත් මගේත් මාතෘ භූමිය වූ මේ සිංහල දේශයේ ඓතිහාසික ස්වරූපය යම් ආකාරයකින් වෙනස් වන්නට ඉඩ තිබෙනවා නම් ඒ බව මේ වර්තමාන රජය පිළි ගත්තා හෝ පිළි නොගත්තා හෝ මේ රටේ ශ්‍රේෂ්ඨතම ව්‍යවස්ථාදායක මණ්ඩලයේදී ඔබතුමා හමුවේ ලේඛනාරූඪ වීම සඳහා මෙහිලා සඳහන් කිරීම අපේ ජාතික යුතුකමක් වශයෙන් අප සලකනවා. සමහරවිට අප මේ කියන කරුණු එක්සත් ජාතික පක්ෂය රුස්සන්නේ නැති මන්ත්‍රීවරයකු විසින් එක්සත් ජාතික පක්ෂයට පහර ගැසීම සඳහා කියන බැදගැම්මකට නැති කරුණු හැටියට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

නිකම් පැත්තකට විසිකර දමන්නට පුළුවන්. එහෙත් ඒවායේ නියම වටිනාකම අනාගතය විසින් විසඳනවා ඇත කියා අපි බලාපොරොත්තු වෙනවා.

මීට කලින් මේ කරුණ ගැන කථා කළ වලපනේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. එම්. හේරත මයා.) එක්තරා වේගයකින් හා එක්තරා වේදනාවකින් කථා කළා. මේ රෙගුලාසි යටතේ රටවැසිකම ලැබෙන ඉන්දියානු ජනතාවගේ ඡන්දය නිසා සමහර විට එක්තරා බලපෑමකට ගොදුරු වන උඩ රට ප්‍රදේශයේ ආසනයක් නියෝජනය කරන මන්ත්‍රීවරයකු හැටියට එතුමා එක්තරා වේදනාවකින් කථා කළා. එහෙත් මගේ කථාවේදී මා කියන කරුණු එබඳු පෞද්ගලික වේදනාවක් ඇතිව කියන කරුණු නොවෙයි. වලපනේ ගරු මන්ත්‍රීතුමා නියෝජනය කරන ප්‍රදේශය වැනි ප්‍රදේශයක් නොවෙයි මා නියෝජනය කරන්නේ. වලපනේ ගරු මන්ත්‍රීතුමාගේ ආසනයේ වතුවල පදිංචිව සිටින, දැනට ජීවත් වන, මේ රෙගුලාසි යටතේ රටවැසිකම ලැබෙන, ඉන්දියානු ජනතාව ඡන්දය දෙන්නේ කොයි අන්දමටද කියන කරුණ උඩ එතුමාට ලබන වාරයේත් ඒ ආසනය නියෝජනය කරන්න ලැබෙනවාද නැද්ද කියන ප්‍රශ්නය එතුමා තුළ බලපවත්වනවා. එතුමා බලන්නේ ඒ අන්දමටයි.

එබඳු පෞද්ගලික දෘෂ්ටි කෝනයකින් තොරව, වතුකරයේ වැඩ කරන ඉන්දියානු ජනයාගෙන් වැඩි පිරිසක් ඡන්ද බලය ලැබුණොත් මගේ ආසනය මට අහිමි වෙනවා ඇත කියන බියකට ගොදුරු නොවී, එබඳු වේදනාවක් නැතිව, මට මේ ප්‍රශ්නය දෙස අපක්ෂපාතව බලන්නට පුළුවන්. මගේ ආසනයේ නම් ඡන්ද ප්‍රතිඵල කෙරෙහි බලපෑ හැකි එකද ඉන්දියානු දෙමළ ඡන්ද දායකයකු නැති නිසා මට එසේ බලන්නට පුළුවන්කම තිබෙනවා. ඒ නිසා දෙමළ වැඩි පිරිසකට ඡන්ද බලය ලැබෙන්නට යන නිසා එයට බියෙන් කරන ප්‍රකාශයක් යයි මට චෝදනාවක් නඟන්නට ද්‍රවිඩ රාජ්‍ය පක්ෂයේ නියෝජිතයින්ටවත් එක්සත් ජාතික පක්ෂයේ හවුල්කාරයින්ටවත් පුළුවන්කමක් නැහැ. ද්‍රවිඩ රාජ්‍ය පක්ෂයේ නියෝජිතයින්ට හෝ එක්සත් ජාතික පක්ෂයේ හවුල්කාරයින්ට මා ජාති භේද වාදය අවුස්සන්න තැත් කළාය කියලත් චෝදනා කරන්න අවස්ථාවක් නැහැ. පෞද්ගලිකව මා කෙරෙහි බලපාන්නේ නැතිවා මෙන්ම පොදුවේ පරදින්නට පක්ෂයකුත් මට නැහැ.

මගේ විග්‍රහය අනුව සිරිමා-ශාස්ත්‍රී ගිවිසුම ක්‍රියාත්මක කරන්නය කියා ඉදිරිපත් කළ ඉන්දු-ලංකා ගිවිසුම (ක්‍රියාවට නැඟීමේ) පනත පිළිබඳ විවාදයේ දී එදා මා කීවාක් මෙන්ම අදත් මා කියන්නේ රජය වැඩිපුර ආසන සංඛ්‍යාවක් දිනා ගැනීමේ එකම චේතනාවෙන් මෙය ක්‍රියාත්මක කරන්න හදනවාය කියන එකයි. මට පක්ෂයක් නැති නිසා මෙය මගේ පක්ෂයේ ජය ග්‍රහණය සඳහා කරන කථාවක්ය කියලත් මට චෝදනා කරන්න බැහැ. මට මේ පනත නිසා හෝ මේ රෙගුලාසි නිසා හෝ පෞද්ගලිකව හානියකුත් නැහැ. එහෙනම් මේ රෙගුලාසිවලට මා විරුද්ධත්වය දක්වන්නේ ඇයි? අන්න ඒ කරුණ මේ රටේ සිටින සිංහලයා කැමති, සිංහල රටට ආදරය ඇති, සිංහල ජනතාව කෙරෙහි වේදනාවක් දක්වන ආදරයක් ඇති මිනිසුන් විසින් කවදා හෝ විසඳනවා ඇති.

විවාදයට භාජන වන මේ රෙගුලාසි ඉදිරිපත් කෙරෙන පනත් කෙටුම්පත පිළිබඳ විවාදයේදී-මට මතක හැටියට නම් තුන් වැනි වර කියවන අවස්ථාවේදී-විරුද්ධ පාර්ශ්වයේ බලවත් විවේචනයන්ට මුහුණ දෙමින් අගමැතිතුමා එක්තරා දෙයක් පිළිගත්තා. එනම්, 1964 රේ ගිවිසුම් ආවලියේ අංක 5 දරන සිරිමා-ශාස්ත්‍රී ගිවිසුම එම පනත යටතේ සියයට සියයක් ක්‍රියාත්මක නොවන බවයි. සිරිමා-ශාස්ත්‍රී ගිවිසුමෙන් ප්‍රධාන වශයෙන්, මූලික වශයෙන්, මුඛ්‍ය වශයෙන් පිළිගත්තේ මොකක්ද? මේ රටේ පුරවැසියන් නොවේ යැයි කියන, නොරටුන් හැටියට හැඳින්වෙන, දළ වශයෙන් ගණන් බලා තිබෙන විධියට 9,75,000 ක් පමණ වූ පිරිසකගෙන් 5,25,000 කට ඉන්දියානු පුරවැසිකම ලබා දී ඉන්දියාවට පිටත් කර යැවීම හා 3,00,000 කට ලංකා පුරවැසිකම පැවරීමත් යන කරුණු දෙකයි. ඒ අනුව 1,50,000 ක් ඉතිරි වෙනවා. ඔවුන්ගේ ප්‍රශ්නය අනාගතයේදී සලකා බැලීමට එම ගිවිසුමෙන් පිළිගෙන තිබෙනවා. එහෙත් ගිවිසුමේ ප්‍රධාන තම අදහස 3,00,000 කට ලංකා පුරවැසිකම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දීම හා සමගම 5,25,000 ක් දෙනා මේ රටින් බැහැරට—ඉන්දියාවට—යැවිය යුතුය යන්නයි.

එම ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා යැයි ඉදිරිපත් කළ පනතේ කොතැනක වත් එම 5,25,000 ක් දෙනා මෙරටින් පිට කරනවා යැයි සඳහන් වී තිබෙනවා දැයි මා කෙළින්ම අගමැතිතුමාගෙන් අහනවා. 3,00,000 කට ලංකා පුරවැසිකම දීම ගැන විනා 5,25,000 ක් දෙනා ඉන්දියාවට යවන බවක් එම පනතේ අසුවල් තැන තිබෙනවා යැයි පෙන්වා දීමට අගමැතිතුමාට පුළුවන් ද ? ගිවිසුමේ සම්පූර්ණ හරය එහෙමපිටින්ම දුර්මුඛ කර, මේ රට මත පැටවී තිබෙන ලොකුම බරකින් නිදහස් වීම සඳහා සකස් කර ගත් ගිවිසුමෙන් බලාපොරොත්තු වූ ප්‍රධානතම කාරණය ඉෂ්ට වීමට ඉඩක් නොතබා, දේශපාලන වශයෙන් තම පක්ෂයේ ජයග්‍රහණය ලබා ගැනීමේ ප්‍රයෝජනය පමණක් සලකා එම පනතින් විධිවිධාන යොදා තිබෙනවා. එයයි, මා නගන චෝදනාව.

මේ රෙගුලාසි එකින් එක ගෙන විග්‍රහ කර දැක්වීමට කථානායකතුමාගෙන් මා අවසර ඉල්ලා සිටිනවා. මගේ ස්වරය කන්කළු නොවුණත්, මිහිරි නොවුණත්, ටික වේලාවකට ඊට ඇහුම්කන් දෙන්නට මේ ගරු සභාවට සිදු වෙයි.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
මේ නියෝග ගැන නම් ඕනෑ තරම් කථා කරන්න.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
සිරිමා-ශාස්ත්‍රී ගිවිසුමෙන් අප මුලින්ම අදහස් කළේ මොකක්ද යන කාරණයට අදාළ ඡේදය මම කියවන්නම් :

"1964 ඊ ගිවිසුම් ආවලියේ අංක 5 දරන ගිවිසුමේ 3 වැනි ඡේදය : මෙයින් 3,00,000 කට සහ ඔවුන්ගෙන් බිහි වන්නන්වද ලංකා පුරවැසි භාවය ලංකාණ්ඩුව විසින් පිරිනමනු ලැබේ."

බොහොම හොඳයි. 1967 තේ අංක 14 දරන පනතින් ඇත්ත වශයෙන්ම සිදු වී තිබෙන්නේ එයයි. එහෙත් ගිවිසුම එයම නොවෙයි. එයින් 3 වැනි ඡේදය සම්පූර්ණ වන්නේ නැහැ. ඉන්දියානුවන් 3,00,000 කට සහ ඔවුන්ගේ අඹු දරුවන්ටත් ලංකා පුරවැසිකම පිරිනැමීමෙන් ඉන්දු-ලංකා ගිවිසුම නැත්නම් සිරිමා-ශාස්ත්‍රී ගිවිසුම ක්‍රියාත්මක වුණේ නැහැ.

තව දුරටත් කියවාගෙන යන්නට ඕනෑ. 3 වැනි වගන්තියේ තිබෙන්නේ මෙහෙමයි :

"මෙයින් 3,00,000ට සහ ඔවුන්ගෙන් බිහිවන්නන්වද ලංකා පුරවැසි භාවය ලංකාණ්ඩුව විසින් පිරිනමනු ලැබේ. මෙයින් 5,25,000ක් සහ ඔවුන්ගෙන් බිහිවන්නන් ආපසු ඉන්දියාවට කැඳවා ගැනීම ඉන්දියා ආණ්ඩුව භාරගනු ලැබේ. ඔවුන්ට ඉන්දියාණ්ඩුව පුරවැසි භාවය පිරිනමනු ඇත."

මම ඊළඟට 5 වැනි ඡේදය කියවන්නම්. එය මෙසේයි :

"මේ ගිවිසුමේ දින සිට අවුරුදු 15ක කාලයක් ඇතුළත හැකිතරම් දුරට සමව පැතිර යන සේ පිළියෙල කළ සැලැස්මක් අනුව ඉන්දියාවට යැවීමට ඇති සංඛ්‍යාව ඉන්දියාණ්ඩුව විසින් භාරගැනීමට බැඳී සිටී."

6 වැනි වගන්තියේ තිබෙන්නේ මෙහෙමයි :

"තුන්වැනි ඡේදය අනුව ලංකාවේ පුරවැසි භාවය ප්‍රදානය කිරීමත් පස් වැනි ඡේදය අනුව ඉන්දියාවට ආපසු කැඳවා ගන්නා අයවලුන් එසේ කැඳවා ගැනීමත් යන මේ කරුණු දෙකම සමසේ පැතිර යන ලෙස ඉටු කළයුතු අතර හැකි තරම් දුරට මේ දෙකොටසේ සංඛ්‍යා, එනම් ලංකා පුරවැසි භාවය ලබන අය සහ ආපසු යවන අයවලුන්ගේ සංඛ්‍යා එකිනෙකට අනුපාතව සමාන විය යුතුය."

සම සේ පැතිර යන ලෙස ඉටු කළ යුතු වන අතර—

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
I rise to a point of Order. The hon. Member for Habaraduwa is canvassing the Act. In fact, if we go on in this way, we will have the same debate as we had on the legislation. The Regulations that are before this House have been framed under that

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

legislation. What the hon. Member is referring to was canvassed and discussed during the Second Reading Debate.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

The hon. Member is entitled to state that the Regulatiions do not implement the provisions of the Act. But apart from that he cannot canvass what has already been passed by the House. Otherwise there will be a repetition of the Second Reading Debate.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ගරු අගමැතිතුමාට තිබෙන අමාරුව මට තේරෙනවා.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

මට අමාරුවක් නැහැ.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

නැත්නම් අහගෙන ඉන්න.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

නිකම් කාලය ගත කරන්නට වුවමනාවක් නැහැ.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

මා කියන්නේ මේ රෙගුලාසි ඉදිරිපත් කර තිබෙන්නේ පණතේ තිබෙන දේවල් ඒ විධියට ක්‍රියාත්මක කරන්නට නොවේය යන්නයි.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

එහෙම නම් ඒක කියන්නටයි තියෙන්නේ.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ඒකට එන්නට ඉස්සරවෙලා පසුබිමට එන්නට එපායැ. පසුබිමට එන්නට ඉස්සරවෙලා කෑ ගහනවා. සිරිමා-ශාස්ත්‍රී ගිවිසුම ක්‍රියාත්මක කරන්නට පනතක් ඉදිරිපත් කළා. ඒ පනත යටතේ රෙගුලාසි ගෙනාවා. රෙගුලාසි සාකච්ඡා කරද්දී පනත ගැනත් මතක් කරන්නට ඕනෑ.

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන**
*(கௌரவ டி. பீ. ஆர். குணவர்தன)*
(The Hon. D. P. R. Gunawardena)

මොකද තමුසේ කියන්නෙ ?

**ටී. බී. තෙන්නකෝන් මයා.** (දඹුල්ල)
*(திரு. ரீ. பி. தென்னகோன்—தம்புள்ள)*
(Mr. T. B. Tennekoon—Dambulla)

ගෝළයා හදලා නැහැ.

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන**
*(கௌரவ டி. பீ. ஆர். குணவர்தன)*
(The Hon. D. P. R. Gunawardena)

ඔහොම මිනිසුන් හදන්නට පුළුවන්ද ? [බාධා කිරීම්]

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

කොහේ කොහේදෝ යන කුණුකන්දල් මේකට ඇදලා ගන්නට මා කැමති නැහැ.

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන**
*(கௌரவ டி. பீ. ஆர். குணவர்தன)*
(The Hon. D. P. R. Gunawardena)

කුණුකන්දල් මොනවාද ?

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ඔන්න අගමතිතුමා නැගිටලා යනවා. නායකයා නැගිටලා යනවා. ඉතින්, තමුන්නාන්සේත් නැගිටලා යනවාද ?

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Kindly go on with your speech and ignore these interruptions. I must also remind the hon. Member that

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

he is entitled to refer to the Act under which these Regulations have been framed. He must not, however, make another Second Reading Debate Speech. He has already stated during his speech in the Second Reading Debate most of the things he is saying now.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

මා කියන්නේ දැනට තිබෙන රෙගුලාසි වලින් පනතවත් හරියාකාර ක්‍රියාත්මක නොවන බවයි.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

ඒ සම්බන්ධයෙන් කථා කරන්නට පුළුවනි.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

එය වඩාත් පැහැදිලිව තහවුරු කිරීමට පනත ගැන සඳහන් කරන්නට සිදු වෙනවා. ගිවිසුම ගැනත් සඳහන් කරන්නට සිදු වෙනවා. ඒවා පාවිච්චි කරන්නට සිදු වෙනවා. ගිවිසුම දියාරු කර පනතක් හැදුවා; පනත දියාරු කර රෙගුලාසි හැදුවාය යන්න කියන්නට මට සිදු වෙනවා. මේක සම්පූර්ණයෙන් දේශපාලන ප්‍රශ්නයක්. ගරු කථානායකතුමනි, ඒ නිසා ඔබතුමා ඉවසා වදාරළ මේ කියන දෙයට ඇහුම්කන් දෙනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනව. වෙන කෙනෙක් අත්සන් කරන ලද ගිවිසුමක් අරගෙන එය ක්‍රියාත්මක කරන්ටය කියා එක්සත් ජාතික පක්ෂය වැරදි පනතක් ගෙනත් ඒ පනත ක්‍රියාත්මක කරන්ටය කියා වැරදි රෙගුලාසියක් ගෙනෙන විට——

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

දැන් ඒ පනත වැරදියි කියල කියන්ට වෙලාව නොවෙයිනෙ. ඒ සිද්ධිය වෙලා දැන් ඉවරයි.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

මම මේ පනත වැරදියි කියනවා නොවෙයි. රෙගුලාසියෙන් පනතවත් ක්‍රියාත්මක නොවන බව පෙන්වන්නට මා ඉදිරිපත් කරන එක්තරා තර්කයක් තමයි පනත ගිවිසුමවත් ක්‍රියාත්මක නොකරන එකක් බව සඳහන් කිරීම. එපමණයි. ඒ පනත දෙවෙනි වර කියවීමේ විවාදයේදී මා ඊට ඔනෑ තරම් කරුණු ඉදිරිපත් කළා. ඒ කිව්ව දේවල් මේ හැන්සාඩ් වාර්තාවෙන් නැවත වරක් කියෙව්වත් එක්සත් ජාතික පක්ෂය හදන්ට පුළුවන්ද? කවදාවත් ඔය පක්ෂය හදන්ට බැහැ, මොනව කිව්වත්.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

අපි මොනව කිව්වත් තමුන්නාන්සෙත් ඒවට ඇහුම්කන් දෙන්නෙ නැහැ.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ඔව්, ඉතින් අපේ ඉස්සර යාළු මිත්‍රයන් එක්සත් ජාතික පක්ෂයට ගිහින් එතැන බැලමෙහෙවරකම් කරන්නා වගේ මොනව කිව්වත් මම නම් ඒ පැත්තට යන්නේ නැහැ.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

යාළු මිත්‍රයෙක් නොවෙයි, ගුරුවරයා.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

මගේ දේශපාලන ගුරුවරයා යයි කියන්න. එහෙත් ගුරුවරු හිටගෙන කරන මෝඩකම් මේ ගෝලය කවදාවත් දුව-දුව වත් කරන්නෙ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

දැන් අපට ඒ ගුරුවරයා ගැන ඕනෑ නැහැනෙ.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

සිරිමා-ශාස්ත්‍රී ගිවිසුමේ ක්‍රියාත්මක කළ යුතු තැන කියන විට ගරු අගමැතිතුමා නැඟිට ගියා. මම මේ කියන්නෙ උන්නැහේගේ අගුවල ලැගල ඉන්න අනිකුත් අන්තේවාසිකයන්ටයි. ගිවිසුමේ සඳහන් වන, ඉන්දියාවට ආපසු යවන පන් ලක්ෂය ගැන පනතේ කිසිවක් සඳහන් කර නැතුවා වගේම, ඉන්දියාවට යැවූ මිනිසුන්ගේ නම් ලැයිස්තුවක් සකස් කරන්වය කියන ආකෘති පත්‍රයක් හැරුණු විට වෙන කිසිම සඳහනක් මේ රෙගුලාසි 27 න් එකකවත් නැහැ. "Removal Orders, liability for repatriation and removal from India to Ceylon." ආදි වශයෙන් සඳහන් වන පනතේ 16 වෙනි වගන්තියේ 3 වෙනි 4 වෙනි ඡේද ක්‍රියාත්මක කිරීමට මේ ආණ්ඩුව හීනයකින්වත් හිතල නැහැ. පනතේ ඒ හරියට එනතුරු පෙරළලාවත් නැති බවයි මේ රෙගුලාසි මාලාවෙන් පෙනී යන්නෙ. රජයට වුවමනා කරන්නෙ පනතේ මුල් හරියේ තිබෙන 3,60,000 කට පමණ ලබන මැතිවරණයට පෙර ලංකා රට වැසිකම දීල ඔවුන්ට ඡන්ද බලය පැවරීමට විතරයි. අපරාදෙ කියන්ට ඕනෑ නැහැ, ඒ සඳහා වුවමනා රෙගුලාසි රාශියක් ඉදිරිපත් කර තිබෙනව. ඒව හරියට හරි. ඒවායේ සුළු සුළු අඩුපාඩු හැර සැලකිය යුතු අඩුපාඩුවක් තිබෙනවා යයි මම කියන්නෙ නැහැ. සමහර තැන්වල සුළු අඩුපාඩු තිබෙනව. මම ඒව පෙන්වා දෙන්නම්. කැමති නම් පිළිගත්තාවෙ, නැත්නම් ඔහේ හුළඟෙ ගියාවෙ.

රටවැසිකම දීම පිළිබඳව පනවා තිබෙන රෙගුලාසි, සකස් කර තිබෙන ආකෘති පත්‍ර, පළ කර තිබෙන උප ලේඛන එමටයි. ඒව බොහොම හොඳයි. ඒවායේ තිබෙන්නෙ සුළු සුළු අඩුපාඩුකම් විතරයි. එහෙත් 5,25,000 ක් පිටත් කර යැවීම සම්බන්ධයෙන් යොදා තිබෙන්නෙ—පිටත් කර යවන අයගේ ලැයිස්තු සකස් කරන්න කියා—එකම එක ආකෘති පත්‍රයයි. මතුවන ප්‍රශ්න එපමණද ? මට මතකයි මේ පිළිබඳ මුල් විවාදය පැවති අවසථාවෙදි කියා සිටියා නැව් පිළිබඳ ප්‍රශ්නයක් ඇති වුණොත්, කෝච්චි පිළිබඳ ප්‍රශ්නයක් ඇති වුණොත් මේ 5,25,000 ඉන්දියාවට පටවා යැවීම කතරගම වන්දනා කාලයට බස් එකක මිනිසුන් දෙතුන් සියයක් ගෙන යන්න වගේ හෝ මඩු දේවස්ථානයට මිනිසුන් තුන් හාර දාහක් ගිහින් පූජාවක් පවත්වා එනවා වගේ පහසු වැඩක් නොවන බව. පන් ලක්ෂයක් මිනිසුන් තමන්ගේ දරු මල්ලන් සමග බඩු මුට්ටු සමග රටකින් රටකට යාමෙදි කොයිතරම් බරපතළ වාහන ප්‍රශ්නවලට මුහුණ පාන්ට සිද්ධ වෙනවද ? ගරු අගමැතිතුමනි, ඒ තත්ත්වයට මුහුණ දෙන්ට ඔබතුමා සූදනම් වී සිටින්නෙ මේ රෙගුලාසිවලින් කොයි රෙගුලාසියෙන්ද කියා කරුණාකර පෙන්වා දෙන්න.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

ඒවාට මුහුණ දෙන්නේ රෙගුලාසිවලින්ද ?

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ඒ අය පිටරට පටවා හරින්නේ මේ රටේ සිට නොවන බවද අගමැතිතුමා කියන්නේ ?

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

ඒකට රෙගුලාසි ඕනෑද ?

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ගරු අගමැතිතුමා ඉන්දු-ලංකා පුරවැසි පනත දෙවන වර කියැවීමේ විවාදයේදී කී දේවල් එතුමාටම අමතක වෙලා. ඕවා රෙගුලාසි පනවා ක්‍රියාත්මක කරන්නට පුළුවනැයි එදා එතුමා කීවා. ඉන්දියාවට යවන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මිනිසුන්ගේ දේපල පිළිබඳ ප්‍රශ්නය ගැන, ඔවුන්ගේ අඑසාධක අරමුදල් පිළිබඳ ප්‍රශ්නය ගැන විමසූ විට අගමැතිතුමා කීවේ "ඕවා රෙගුලාසි මගින් බේරා ගන්නට පුළුවනි" යන්නයි. එහෙත් දැන් ඉදිරිපත් කර ඇති රෙගුලාසි අතර ඒ කාරණා ගැන සඳහන් වන එක රෙගුලාසියක්වත් තිබෙනවා ද? එවැනි රෙගුලාසි ගැන හිතලාවත් නැහැ. එක කාරණයක් ගැන පමණයි, හිතා තිබෙන්නේ. පුළුවන් තරම් දුරට ඉන්දියානුවන් අල්ලාගෙන ඔවුන්ට ඡන්ද බලය දී තමන්ගේ සාක්කුවට ඡන්දය ලබා ගැනීම ගැන පමණයි, හිතා තිබෙන්නේ. මෙම ජාති ද්‍රෝහි ක්‍රියාවේ මූලිකයා හැටියට වග කියන්නට ගරු අගමැතිතුමාට සිදු වේවි.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
මම වග කියන්නම්.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
සමහර විට වගකීම පිණිස තමුන්නාන්සේ ලංකාවේ නැති වන්නට පුළුවනි.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
තමුන්නාන්සේ නැති වුණත් මා නම් ඉන්නවා.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
අගමැතිතුමාගේ කල්පනාව සදාකාලික වන්නටද? මේ වාගේ රෙගුලාසි ඉදිරිපත් කරන්නේ ඒ විධියේ සිහින දකින නිසා විය හැකියි. අප කවුරුනුත් මැරෙනවා. අප මැරී යා යුත්තේ ජීවත් වන අයට අයුත්තක් කර නොවෙයි. උපන් අයට අයුත්තක් කර අප මැරී යා යුතු නැහැ. මේ විධියේ ජාති ද්‍රෝහී රෙගුලාසි ගේන්නේ සදාකාලික යැයි සිතමින් සිට මැරී යන අයයි. පළමුවැනි රෙගුලාසිය පනවා තිබෙන්නේ පනතේ 11 (1) වන වගන්තිය යටතේයි. ඉදිරිපත් කර තිබෙන ඇතැම් ආකෘති පත්‍රයක සඳහන් වන්නේ, ඒ ආකෘති පත්‍රය පුරවන ඉල්ලුම්කරු කොයි විධියේ මනුෂ්‍යයෙක්ද යන්න ගැනයි.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
I am sorry to disturb the hon. Member, but I am given to understand that the Tamil translations have also been distributed.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
මට නම් මේ දක්වා ලැබුණේ නැහැ.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
You may not have got it, but that is the position. As a matter of fact, the translation has been distributed on the same day that the Regulations were tabled.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
That is why the hon. Member has not understood the Regulations.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
මට නම් මේ දක්වා ලැබුණේ නැහැ.

මෙම රෙගුලාසි මාලාවේ "ඉ" ආකෘති පත්‍රයේ දෙවන ඡේදයේ මේ විධියට තිබෙනවා:

"2. මම 1964 ඔක්තෝබර් මස 30 වන දින දරන ඉන්දු-ලංකා ගිවිසුමට අදාළ මත නැනැත්තකු වෙමි."

ගරු කථානායකතුමනි, පනතේ වගන්තිවලිනුත් ගිවිසුම් ගැන සඳහන් වෙනවා. මේ රෙගුලාසිවල වගන්තිවලිනුත් ගිවිසුම් ගැන සඳහන් වෙනවා. ලක්ෂ සංඛ්‍යාත ජනකාය කම රටවැසිකම් දෙන්නටත්, ඒ වාගේම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

තවත් ලක්‍ෂ සංඛ්‍යාත ජනකායකට රට වැසිකම් නොදී ඉන්දියාවට පටවා යවන්නටත් පියවර ගන්නා අවස්ථාවේදී බොහෝ විට අධිකරණය ඉදිරිපිටට යන්නට ඉඩ තිබෙනවා. දැනට බල පවත්වන ලංකා පුරවැසි පනත ඉදිරිපත් කළ අවස්ථාව ගැන ඔබතුමා දන්නවා ඇති. ඒ එක්කම ඉදිරිපත් කළ අනික් පුරවැසි පනත නම් ඉන්දියානු හා පාකිස්තානු පුරවැසි පනතයි. ඒ පනත් දෙක ක්‍රියාත්මක වන අවස්ථාවේදී නඩු කී දහසක් ලංකාවේ අධිකරණය ඉදිරියට ආවාද යන්න නීතිඥයෙක් හැටියට තමුන්නාන්සේ හොඳට දන්නවා ඇති. එදා එවැනි තත්ත්වයක් පැන නැගුනා නම් මේ පනත ක්‍රියාත්මක කිරීමේදීත් සැහෙන නඩු ගණනක් අධිකරණය ඉදිරියට එන බවට කිසිම සැකයක් නැහැ. සමහර විට මේ රෙගුලාසිවලට විරුද්ධව මේ රෙගුලාසි වැරදිය, පනතට අදාළ වන්නේ නැත, පනතට පටහැනිය, පනත ගිවිසුමට පටහැනිය ආදී වශයෙන් තර්ක උසාවියට —අධිකරණය ඉදිරියට— එන්න පුළුවනි. එවැනි අවස්ථාවකදී අධිකරණයට සිදු වෙනවා ගිවිසුම මොකක්ද, පණත මොකක්ද, රෙගුලාසි මොනවාද කියන කාරණා ගැන සොයා බලා විග්‍රහ කරන්න. නමුත් සිරිමා-ශාස්ත්‍රී ගිවිසුම කුමක්දැයි කියා තවමත් නීතියට ඇතුළත් කර ඇත්තේ නැහැ. එම අඩුපාඩුව පනත දෙවැනි වර කියවීමේ විවාදයෙදීත් අපි හොඳහැටි පහදා දුන්නා. නැවත වරක් මේ රෙගුලාසිවලත් ඉන්දු-ලංකා ගිවිසුම ගැන සඳහන් වෙන නිසා අපට සිදු වී තිබෙනවා මේ අවස්ථාවේදීවත් මේ අඩුපාඩුව සපුරාලන හැටියට ගරු අගමැතිතුමාගෙන් ඉල්ලා සිටීමට.

අපේ අගමැතිතුමා සදාකාලික නැහැ. විරුද්ධ පක්ෂයේ නායිකාවත් සදාකාලිකව මෙහි ඉන්නේ නැහැ. "සබ්බෙ සංඛාරා අනිච්චා" යන ප්‍රකාශයට යටත් කෙනෙක් තමයි විරුද්ධ පක්ෂයේ නායිකාවත්. ඒ නිසා මෙය නීති ගත කළේ නැත්නම් කවදාවත් සිරිමා-ශාස්ත්‍රී ගිවිසුම උසාවියක් ඉදිරියට ගෙන යන්න පුළුවන්කමක් ඇත්තෙ නැහැ. යම්කිසි විධියකින් කිසියම් කෙනෙකු විසින් මේ පනත ගිවිසුමට අදාළ නොවේය කියා තර්කයක් ඉදිරිපත් කළ අවස්ථාවේදී උසාවිය ප්‍රශ්නයක් මතු කරන්නට පුළුවන් මොකක්ද මේ ගිවිසුම, මෙය නීති ගත කර නැහැ නේද කියා. මෙය නීති මගින් උසාවියට ඉදිරිපත් කරන්නට පුළුවන්කමක් නැති වෙන්න ඉඩ තිබෙනවා. දැනට මෙය අධිකරණය ඉදිරියට ගෙන එන්න පුළුවන් වන එකම ක්‍රමය නම් විරුද්ධ පක්ෂයේ නායිකාව සාක්ෂිකරුවෙක් වශයෙන් ඉදිරිපත් කර වීම පමණයි. නමුත් එතුමිය සදාකාලික නැහැ. එතුමියට දීර්ඝායුෂ ලැබේවායි කියා මා ප්‍රාර්ථනය කරනවා. නමුත් එතුමිය සදාකාලික නැහැ. එතුමිය නැති කාලයකදී අපි කොහොමද එතුමිය අධිකරණය ඉදිරියට කැඳවන්නෙ? දැන් එතුමිය ජීවමානව සිටින නිසා සාක්ෂිකරුවෙක් වශයෙන් අධිකරණය ඉදිරියට කැඳවන්න පුළුවන් වුණත් එතුමිය නැති යුගයකදී නම් මොකද කරන්නේ? මෙය බරපතල ජාතික ප්‍රශ්නයක්. මේ පිළිබඳව ප්‍රශ්නයක් අධිකරණය ඉදිරියේදී පැන නැගුණොත් මොකද කරන්නේ? මේ ගිවිසුම මොකක්ද කියන එක පෙන්වා දෙන්න ගිවිසුමේ පිටපතක් උසාවියට ඉදිරිපත් කරන්න පුළුවන් වෙන්න ඕනැ.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
මොකක්ද කරන්න කියන්නෙ?

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
සිරිමා-ශාස්ත්‍රී ගිවිසුමේ ඇතුළත් කරුණු මේ රෙගුලාසිවලට ඇතුළත් කරන්න. මුල් පනතට ඒවා ඇතුළත් කළේත් නැහැ. එසේ ඇතුළත් නොකිරීමට කිසිම හේතුවක් ඔබතුමා විසින් ඉදිරිපත් කළේ නැහැ. සැතපුම් දහස් ගණනක් ගෙවා ගොස් ආසියානු සංවර්ධන බැංකු සමග ඇති කර ගත් ගිවිසුම මෙහිදී සම්මත කර ගන්න පුළුවන් වුණා. මට මතකයි පසුගිය වර්ෂයේදී ආසියානු සංවර්ධන බැංකුව සමග ගිවිසුමක් ඇති කර ගෙන එයත් මෙහිදී සම්මත කර ගත්තා. මා හිතන පිළිවෙළට ගරු මුදල් ඇමතිතුමා ගිහින් අත්සන් කළ එකක්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

It is now too late to canvass the fact that the pact is not included in the Act. What we have before the House now are the Regulations formulated under the Act and we have to examine whether the Regulations are in accordance with the Act and whether the Act is being implemented through these Regulations.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ගරු කථානායකතුමනි, ටිකක් ඉවසීමෙන් මා කියන්න දේ අසන්න. රෙගුලාසියේ සඳහන් වී තිබෙනවා, මේ කාරණය ගැන.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

That is not the point. The hon. Member is arguing on the ground that the Sirima-Shastri Pact has not been included in the Act. That stage has passed.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

නැහැ, ඒක ඇතුළත් කර නැති බවයි, මා කියන්නේ.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Yes. So what is the use of saying that the pact has not been included in the Act?

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

පනතේ කොටසක් හැටියට එය නීතිගත වී නැහැ. එහෙත් නීතිගත නොවූ ඒ ගිවිසුම රෙගුලාසිවල නැවත සඳහන් වී තිබෙනවා. මේ රෙගුලාසි හරියට ක්‍රියාත්මක කිරීම සඳහා, ඉන්දියානු අගමැතිවරයාත්, ලංකා අගමැතිවරියත් අත්සන් කළ ඒ සිරිමා-ශාස්ත්‍රී ගිවිසුම කරුණාකර මේ රෙගුලාසියේ කොටසක් කරන්න. යම් යම් කරුණු සඳහන් කර ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන්නය කියා "ඉ" ආකෘති පත්‍රයෙහි සඳහන් කර තිබෙනවා. එයට විරුද්ධත්වය දක්වන කෙනකු කරුණු ඉදිරිපත් කරන්නේ කොහොමද, මේ ඉල්ලුම්කරු අසවල් ගිවිසුමට අදාළ නොවන කෙනෙක්ය කියා? ඒ ගිවිසුම අධිකරණය ඉදිරියේ තබන්නට ඕනෑ. එක්තරා කාලයකදී එය අධිකරණය හමුවට පත් කරන්නට තිබෙන මාර්ගය නැති වන්නට පුළුවන්. එසේ වුවහොත් ඔබතුමාගේ න්‍යායකත්වයෙන් අප සම්මත කරන්නෙ අංග සම්පූර්ණ නොවූ නීතියක්ද නැද්ද කියායි මා ප්‍රශ්න කරන්නේ.

එක්සත් ජාතික පක්ෂයට මේක ගැන ඕනෑකමක් නැති වන්නට පුළුවන්. මේකත් නීතිගත වුනොත්, උන්නැහෙලා වසන්නට සූදානම් වන සමහර අමාරුකම් මතු වන්නට පුළුවනි. එය නොවෙයි, මගේ ප්‍රශ්නය. පක්ෂයකට ලැබෙන්නට පුළුවන් යහපත, ඔවුන් බලාපොරොත්තු වන සුළු ප්‍රයෝජනය මේ නිසා වැළකී ගියත් පොදුවේ ජාතියකට සිදු වන විපත ගැන අප සලකා බලන්නට ඕනෑ. මේ ගිවිසුමට අදාළ නොවන මිනිසුන් යම්කිසි හේතුවක් නිසා "ඉ" ආකෘති පත්‍රය යටතේ ඉල්ලුම් පත්‍ර යවා පුරවැසිකම ලබා ගන්නට තැත් කළොත් අධිකරණයක් හමුවේ අපට තිබෙන සහනය කුමක්ද? රටවැසිකම දෙන්නට හෝ ඉන්දියාවට යවන්නට හෝ පුළුවන් මේ විධියේ මිනිසුන්ය කියා ගිවිසුම යටතේ විස්තර කර තිබෙනවා. ඒ මිනිසුන් කව්ද කියා තෝරා ගන්නට අපට නීත්‍යනුකූල ලේඛනයක් නැහැ. ඒක සාක්කුවේ. පනතයි, රෙගුලාසියයි පමණයි තිබෙන්නේ. ගිවිසුම ගැන පනතෙන් සඳහන් වෙනවා, රෙගුලාසිවලත් සඳහන් වෙනවා. එහෙත් ගිවිසුම තිබෙන්නේ වෙන කොහේවත්. උසාවියක ඉදිරියට එය ගෙන යන්නට බැහැ. ඒ අඩුපාඩුව සකස් කර දෙන්නට ඕනෑ. ඒ මක්නිසාද? මේ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කිරීමේදී බරපතළ දූෂණ ක්‍රියාවන් සිදු වන්නට ඉඩ තිබෙනවා. ඉන්දු-ලංකා ගිවිසුම බලපවත්වන්නේ කොයි පිටියේ මිනිසුන්ටද කියා ඒ ගිවිසුමේ සඳ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හත් වී තිබෙනවා. සමහරවිට ලංකා රට වැසිකමට අයිතිය ඇති මිනිසුන් යළිත් වරක් රටවාසීන් හැටියට ලියාපදිංචි වුනොත් අපට ඔය කියන බරෙන් මිදෙන්නට කවදාවත් ලැබෙන්නෙ නැහැ. අනික් සෑම නීතියකදීම අනුගමනය කරන ප්‍රතිපත්තියක් මෙතැනදී අනුගමනය කරන්නට අකැමති ඇයි ?

අගමැතිතුමාගේ අවංක භාවය ඔප්පු කිරීමට දෙවැනි අවස්ථාවක් ලැබී තිබෙනවා. ගරු කථානායකතුමනි, අප මෙයින් උත්සාහ කරන්නේ පක්ෂයට ප්‍රයෝජනයක් ගන්නට නොවේය, සිරිමා-ශාස්ත්‍රී ගිවිසුම ඇත්ත වශයෙන්ම ක්‍රියාත්මක කරන්නටය කියා අගමැතිතුමා කියනවා. එසේ නම් අගමැතිතුමනි, මේ ගිවිසුම මේ රෙගුලාසිවලට ඇඳා අධිකරණය ඉදිරියට පත් කරන්නට පුළුවන් අන්දමට එය ලේඛනගත කර තබන්න. මගේ ප්‍රධාන ඉල්ලීම එයයි. එහෙත් ඒ ඉල්ලීමත්, මා කරන්නට යන අනික් ඉල්ලීමුත් නිකම් උඩු සුළඟේ ගසාගෙන යන බව මා දන්නවා. එසේ ගියත් ඒ ඉල්ලීම් කළ යුතුයි. ඉන්දු-ලංකා ගිවිසුම ක්‍රියාවට නැඟීමේ පනත දෙවන වර කියවීමේ විවාදයේදී මා වර්තමාන රජයට චෝදනා කළා, එම පනත ඉදිරිපත් කිරීමෙන් බලාපොරොත්තු වන්නෙ, ඉන්දියානු ජාතිකයින් සෑහෙන සංඛ්‍යාවකට මැතිවරණ ඡන්ද බලය ලබා දී ඔවුන්ගෙන් එක්තරා දේශපාලන ප්‍රයෝජනයක් ලබාගැනීමට විනා ඉන්දියානු ජාතිකයින් මෙරටින් යැවීමට නොවේය කියා. ඔබතුමාට ඒ කාරණය මතක ඇති. මා කළ එම චෝදනාව සත්‍ය කිරීමට හෝ අසත්‍ය කිරීමට හොඳම අවස්ථාව තමයි, ඉන්දු-ලංකා ගිවිසුම ක්‍රියාවට නැඟීමේ නියෝග යටතේ සකස් කරනු ලබන ඉන්දු-ලංකා ගිවිසුම් ලංකා පුරවැසි නාම ලේඛනයේ "අ" ආකෘති පත්‍රයේ උප ලේඛනයට තවත් එක්තරා වගන්තියක් එකතු කිරීම. එසේ කළොත් පමණයි එය අංග සම්පූර්ණ වන්නෙ.

දැනට එම ආකෘති පත්‍රයෙ මේ අන්දමට කොටස් වෙන් කර තිබෙනවා. පළමු වැන්න අනුක්‍රමික අංකය. දෙවැන්න ලියාපදිංචි කළ දිනය. තුන්වැන්න, ඉල්ලුම් පත්‍රයේ අංකය. හතර වැන්න නම. පස්වැන්න ලිපිනය. මා ඇ[illegible] අගමැතිතුමාගෙන් ඉල්ලා සිටින්නෙ, පස්වන තීරුවටත් හයවන තීරුවටත් අතර "ඉල්ලුම් කරු පදිංචි මැතිවරණ දිස්ත්‍රික්කය කුමක්ද " කියන වගන්තිය ඇතුළත් කරන ලෙසටයි. එසේ ඇතුළත් කළොත් එක්තරා කරුණක් පැහැදිලිවම සොයා ගන්න පුළුවන් වෙනවා, වැඩි දුර අවුස්සන්නෙ නැතුව. එම කාරණය මොකක්ද ? රටවැසිකම ලැබීමෙන් පසුව ඉල්ලුම්කරු මොන මැතිවරණ දිස්ත්‍රික්කයේද ලියාපදිංචිවී, ඡන්ද බලය ලබා සිටින්නෙ කියන් කාරණය පැහැදිලි ලෙසම එමගින් දැනගන්න පුළුවන්කම ලැබෙනවා.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

මනුෂ්‍යයෙක් සඳහටම එක තැනෙක සිටිනවාද, හැම තැනම යනවා නේද ?

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

මා දන්නවා, මේ අන්දමට ලියාපදිංචි කරන අය ඔවුන් දෙන ලිපිනයට නොවෙයි, ඡන්ද දායකයින් හැටියට බව ලියාපදිංචි වෙන්නේ. සමහර විට ඔබතුමාට වුවමනා හැටියට, වතුකාරයින් සමග රහස් ගිවිසුම් ඇති කරගෙන ඔවුන් ඉත්තන් මෙන් පාවිච්චි කරන්න පුළුවනි. එයින් සිද්ධ වෙන්නෙ මොකක්ද ? අද, මැද පළාත, සබරගමුව, ඌව ආදී පළාත්වල ඇති තේ වතු වල, රබර් වතුවල කම්කරුවන්, තමුන්නාන්සේලාට මැතිවරණයෙදි අහිමිවුණු ආසනවලට ඡන්ද දායකයින් ලෙස යවන්න පුළුවනි, ඉත්තන් මෙන් එහාම මෙහාට තල්ලු කරන්න පුළුවනි, ඒ ආසන දිනා ගැනීමේ බලාපොරොත්තුවෙන්. එය වැළැක්වීමට මාර්ගයක් වශයෙන්වත් එසේ ලකුණු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

සඳහටම එකම වත්තක ඉන්න ඕනෑයයි කියන්න බැහැ. ඒ ගොල්ලන් කොහේට යාවිද කියා කාට කියන්න පුළුවන්ද ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேகரா)*
(Mr. Prins Gunasekera)

එක් වත්තක ලයිමක පදිංචිව සිටි කම්කරුවෙක් ඊට සැතපුම් සියයකට එහා ඇති වත්තක වැඩ කරන්න, ලයිමක පදිංචි වන්න, යනවාය කියා අප නම් අද වන තුරුවත් අසා නැහැ. එහෙම දෙයක් අද වනතුරු සිද්ධ වී නැහැ; ඉදිරියට සිද්ධ වන්නේත් නැහැ. එමනිසා තමුන්නාන්සේලාගේ බලාපොරොත්තුව ඉන්දු-ලංකා ගිවිසුම ක්‍රියාවට නැඟීමේ මෙම පනත යටතේ වතු කම්කරුවන් ප්‍රයෝජනයට ගෙන එක්තරා කාල සීමාවක සිට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට හිමිව තිබෙන ආසන, කම්කරු ඡන්ද මාර්ගයෙන් ලබා ගැනීමටයි. මෙම ෆෙඩරල් පක්ෂය ඇතුළු හත් හවුල් ආණ්ඩුව රහසිගතව කර ගෙන යන වැඩ පිළිවෙළ එයයි. යම් ලෙසකින් එම කොටස ඇතුළත් කළොත් ඒ රහස එළිදරව් වෙනවා. ඇත්ත වශයෙන්ම මා කියන එම කොටස ඇතුළත් කිරීමට අමුතුවෙන් පත්‍රිකා මුද්‍රණය කරන්න වවුමනා නැහැ. අමුතුවෙන් වියදමක් යන්නෙත් නැහැ, අඟල් භාගයක පමණ තීරුවකුයි අවශ්‍ය වෙන්නෙ. ලිපිනය කියන තීරුව ළඟට "ඉල්ලුම්කරු පදිංචි මැතිවරණ දිස්ත්‍රික්කය කුමක්ද" කියා ඇතුළත් කිරීම පමණයි කරන්න තිබෙන්නෙ. මෙය එතරම් අමාරු කටයුත්තක් නොවෙයි. එහෙම නම් මෙය ඇතුළත් කරන්න තිබෙන අමාරුව මොකක්ද? හැබැයි, ඔය කාරණය එළිදරව් කළොත් තමුන්නාන්සේලා හංගා ගෙන ඉන්න මී පැටව් එළියට පනිනවා.

මෙම නියෝගවල සඳහන් "ආ" ආකෘති පත්‍රය සකස් වී තිබෙන්නේ අංක 3 දරන රෙගුලාසිය යටතේයි. ඉන්දියාව මේ මිනිසුන් වෙනුවෙන් මොන විධියේ ලේඛනයක් සකස් කරනවාද, ඔවුන්ට දෙන අංක මොනවාද යන විස්තර මෙම රෙගුලාසිවලට ඇතුළත් වී තිබෙන තොරතුරු අනුව අපට දැන ගන්නට බැහැ. "ඉන්දියානු පුරවැසියකු වශයෙන් පිළිගනු ලැබූ දිනය" යනුවෙන් ඡේදයක් "ආ" ආකෘතියෙහි සඳහන් වෙනවා. එය සමහර විට ලංකාවේ ඉන්දියානු තානාපති කාර්යාලය විසින් කරන වැඩක් වන්නට පුළුවනි. එහෙම නම්, අපට තවත් අතිරේක තොරතුරක් දැන ගන්නට වුවමනා වෙනවා. එනම්, පිටත් කර හරිනු ලැබීමට තෝරා ගත් ඉන්දියානු ජාතිකයාගේ අනුක්‍රමික අංකය කුමක්ද යන්නයි. සමහර අවසථාවලදී එය ප්‍රයෝජනවත් වන්නට පුළුවනි. එම නිසා, "ආ" ආකෘති පත්‍රයෙහි 14 වන කරුණ හැටියට සඳහන් වන "ඉන්දියානු පුරවැසියකු වශයෙන් පිළිගනු ලැබූ දිනය" යන තොරතුර ළඟට, 15 වැනි කාරණය වශයෙන්, "ඉන්දියානු රජය විසින් පවරා ඇති—අනුක්‍රමික හෝ වෙනත්—අංකය" යන තොරතුරුත් සැපයීමට සලස්වන ලෙස මා ඉල්ලා සිටිනවා.

මෙය ඊළඟ "ඇ" ආකෘති පත්‍රයටත් ඒ විධියටම ඇතුළත් කරන්නට පුළුවනි. මක් නිසාදයත්, මෙකී ආකෘති පත්‍ර දෙකම එකම විධියේ කරුණු සඳහායි සකස් වී තිබෙන්නේ මින් එකක් ඉන්දියානු පුරවැසි නාම ලේඛන යයි. අනෙක සියරටට පෙරළා යැවීමේ නාම ලේඛනයයි. ඉන්දියානු පුරවැසිකම දෙන ලද අයගේ නම් පළමුවන ලේඛනයට ඇතුළත් වෙනවා ඇති. එහි නම, ලිපිනය ආදිය පමණක් නොව අනුක්‍රමික අංකයත් ඇතුළත් විය යුතුයි. ඊට කිසිවකුට විරුද්ධ වීමට හේතුවක් නැහැ. පුරවැසිකම් දෙන නාම ලේඛනයේ අඩංගු වන තොරතුරුම, පෙරළා සිය රට යැවීමේ නාම ලේඛනයටත් ඇතුළත් කිරීමේ කිසිම වරදක් අපට පෙනෙන්නේ නැහැ.

ඒ සමගම, "ඇ" ආකෘති පයත්‍රට තවත් අතිරේක තොරතුරක් ඇතුළත් කරන ලෙසත් මා ඉල්ලා සිටිනවා. එය මා මුලින් එළිදරවු කරන ලද රීතියටත් අදාළ කාරණයක්. යම් කිසි මැතිවරණ දිස්ත්‍රික්කයකින් ඉන්දියානු ජාතිකයින් 1,000ක් ඉන්දියාවට පිටත් කර හැරියේයයි අපි සිතමු. දහසක් දෙනා ඒ ප්‍රදේශයෙන් ගිය නිසා, ඒ වෙනුවට, වෙනත් ප්‍රදේශයකින්, රට වැසි කම ලැබූ ඡන්ද දායකයින් දහසක් හෝ ඊට වැඩි ගණනක් ගෙනැවිත් මෙහි පදිංචි කරවා ගත්තායයි වතු පාලකයින්ට කියන්නට පුළුවනි. වත්තේ වැඩ කටයුතු හරියාකාර කර ගන්නට ඕනෑ නිසාත් කර්මාන්තයට අවහිරයක් නොවනු පිණිසත් වෙනත් ප්‍රදේශයකින්, මෙහි රටවැසිකම ලැබූ ඉන්දියානුන් දාහක් ගෙනත් පදිංචි කරවා ගත්තායයි ඔවුන්ට කියන්නට පුළුවනි. මේ අවස්ථාවේදී, එක් පළාතකින් යැවූ ඉන්දියානු ජාතිකයින් ගණනට වැඩි ගණනක් වෙනත් පළාත

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

කින් ගෙනැවිත් එහි පදිංචි කරවා ගන්නට ඔවුන්ට ඉඩ ලැබෙනවා. දේශපාලන ඵල ප්‍රයෝජන තකා එසේ කරන්නට පුළුවන්කම ලැබෙනවා. ඒ නිසා යම් කිසි මැතිවරණ කොට්ඨාශයකින් ඉවත් කර ලංකාවෙන් බැහැර කරන ඉන්දියානු ජාතිකයන්ගේ සංඛ්‍යාව අසුවල් ගණනය කියා "ඇ" ආකෘතියේ ඇතුළත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

"ඇ" ආකෘති පත්‍රයේ 1, 2, 3 යන මුල් කොටු තුනේ පිළිවෙළින් තිබෙනවා, "අනුක්‍රමික අංකය", "ඉන්දු-ලංකා ගිවිසුම ඉන්දියානු පුරවැසි නාම ලේඛනයේ වූ අංකය" සහ "ඉන්දු-ලංකා ගිවිසුම පිටරට යැවීමේ නාම ලේඛනයේ වූ අංකය" කියා. ඒ තුනට පසුව "පදිංචිව සිටි මැතිවරණ දිස්ත්‍රික්කය" යනුවෙන් ඊ ළඟට ඇතුළත් කරන්න පුළුවන්. එතකොට අපට කෙළින්ම දැන ගන්න පුළුවන් අසුවල් සංඛ්‍යාවක් අසුවල් මැතිවරණ කොට්ඨාශයෙන් බැහැර ගොස් තිබෙනවාය කියා. අපි හිතමු එක් මැතිවරණ කොට්ඨාශයකින් 750 ක් ඉන්දියාවට ගොස් තිබෙනවාය කියා. එහෙත් 2,750 ක් ආපසු ගෙනවිත් පදිංචි කළහොත් අපට පැහැදිලි වෙනවා මොන හේතුවක් උඩද එසේ කර තිබෙන්නේ කියා. යම් පරිද්දෙකින් දේශපාලන පලප්‍රයෝජන ගැනීමට ඉඩ නොතැබෙන සේ නීතිය සකස් කළ යුතුයි. සර්ව සම්පූර්ණයෙන්ම ඉඩ නොතබා කටයුතු කිරීමට බැරි වුණත් මෙවැනි ක්‍රමයක් ඇති කළොත්, මේ විධියේ තොරතුරක් මේ ආකෘති පත්‍රයට ඇතුළු කළහොත්, එවැනි හොර මැර අල්ලාගන්න පුළුවන් වෙනවා.

"අ" සිට "ඇ" දක්වා ඇති ආකෘති 4ට, ලංකා පුරවැසිකම දෙන, ඉන්දියානු පුරවැසිකම දෙන, සිය රටට පෙරළා යවන සහ ඇන්න වශයෙන් පිට රට යවනු ලබන්නන් යන 4 කොට්ඨාශයේ නම් ඇතුළත් වෙනවා. "අ", "ආ" සහ "ඇ" යන ආකෘති පත්‍ර තුනේ ඇතුළත් කරන්නට යයි මා විසින් ඉල්ලා සිටි ඒ තොරතුරු "ඇ" යන ආකෘති පත්‍රයේද ඇතුළත් කළොත් මෙය අංග සම්පූර්ණ වෙනවා. යම් කිසි දේශපාලන පක්ෂයක් විසින් මේ රෙගුලාසිය අනුව තමන්ට යම් කිසි අයුතු ප්‍රයෝජනයක් ලබා ගැනීමට උත්සාහ කළොත් එය අල්ලා ගැනීමට තමයි අද මෙවැනි තොරතුරු සඳහන් කිරීමක් මේ රෙගුලාසියට ඇතුළත් කර තැබීමට අදහස් කරන්නේ.

ඊ ළඟට කථානායකතුමනි, මේ විධියේ ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර, ඒ ගැන පරීක්ෂණ පවත්වා, සමහර විට ඉල්ලුම්පත්‍රවලට විරුද්ධත්වය දැක්වීම උඩ උසාවි මගින් නඩු තීන්දුත් අරගෙන අවසානයේදී ලංකාවේ රටවැසිකම ලබන අය එසේ ලැබූ එක්තරා කාල සීමාවක් තුළ ලංකාවට පක්ෂපාතිත්වය දැක්වීමේ දිවුරුමක්, ගිවිසුමක්, ප්‍රතිඥාවක්, පොරොන්දුවක් දෙන්න තිබෙනවා. ඒ ප්‍රතිඥාව, ඒ ගිවිසුම, ඒ පොරොන්දුව මොකක්ද කියන එක මෙම රෙගුලාසියේ සඳහන් වෙනවා. ලංකාවේ රටවැසිකම ගන්නට ඉදිරිපත් වී සිටින මේ ජනතාවගෙන්, දැනට මේ යෝජනා කර තිබෙනවාට වඩා දේශප්‍රේමී, දේශානුරාගී, රටට හිතවත් කමක් දක්වෙන ප්‍රතිඥාවක් ලබා ගන්නට අපේ වර්තමාන ආණ්ඩුවට පුළුවනි. මේ රටේ නොරටුන් හැටියට මෙතෙක් හැඳින්වූ ලක්ෂ ගණනක්, අපේ රටේ අපේ ජන ජීවිතයේ අපේ සමාජයේ කොටස් කාරයන් හැටියට බඳවාගන්න කොට එය සෙල්ලමට ආවට ගියාට ඕනෑවට එපාවට කළයුතු දෙයක් නොවෙයි. මක්නිසාද? එය මේ රටේ මේ සමාජයේ අනාගත සංවර්ධනය කෙරෙහි අනාගත ස්වරූපය කෙරෙහි අනාගත පැවැත්ම කෙරෙහි බෙහෙවින් බල පැවැත්වියහැකි ප්‍රශ්නයක් වන නිසයි.

ආවාට ගියාට තමන්ට ලැබෙන දේශපාලන පල ප්‍රයෝජන නිසා වැඩි දුර කල්පනා නොකර ඒ මිනිසුන්ගෙන් මොන වාක්‍යයකට හෝ ඇඟිලි සලකුණක් හෝ අත්සනක් අරගෙන රටවැසිකම පිරිනමා අවුරුදු 5කින් 10කින් බරපතළ ජාතික ආපදාවකට මේ රටට මුහුණ දෙන්නට සිදු වුණොත් ඒ සඳහා වගකිය යුතු වන්නේ කවුද? අර සර්වකාලික අගමැතිතුමා සමහර විට එදා අප අතර නැතිව ඇති. එම නිසා මෙවැනි අනාගත උවදුරකින් රට බේරා ගැනීම සඳහා ගතයුතු සෑම පියවරක්ම වර්තමාන පාලකයින් ගතයුතුය කියා ඔවුනට කරුණු පැහැදිලිවම පෙන්වා දීමට අපට යුතුකමක් තිබෙනවා. ලක්ෂ සංඛ්‍යාත ඉන්දියානුවන් පිරිසකට අපේ රටේ රටවැසිකම පවරා දී අපේ සහෝදර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජනතාවක් හැටියට එකතු කර ගැනීමට යන මේ අවස්ථාවේදී අප ඔවුන්ගෙන් ගත යුතු ප්‍රතිඥාව කුමක් විය යුතුද? මේ රෙගුලාසිවල තිබෙන හැටියට අවුරුදු විස්සක් පැරණි, ආණ්ඩුවම කියන විධියට සංශෝධනය කර අළුතින් හරිගස්සා ගන්නට වුවමනා කරන ආණ්ඩු ක්‍රම පනත කෙරෙහි පක්ෂපාතිත්වය දක්වීමට ගන්නා ප්‍රතිඥාවට පමණක් මෙය සීමා කිරීම හරිද? මොකක්ද මේ රටවැසිකම ලබන ඉන්දියානු ජාතිකයින් විසින් පක්ෂපාතීත්වය පළ කළයුතු ආණ්ඩු ක්‍රම පනත? ඇත්ත වශයෙන්ම මේ ආණ්ඩු ක්‍රම පනතට පක්ෂපාතීත්වය දැක්වීමෙන් තමන් නියම ලංකා රටවැසියකුය, ලංකාවට හිතවත්කම දක්වන රටවැසියකුය, යන හැඟීමක් ඔවුන් තුළ ඇති වෙනවාද? අප කළ යුත්තේ එංගලන්තයේදී හරිගස්සා අපට ගෙනැවිත් දී තිබෙන මේ කටු ඔටුන්නක් හා සමාන ආණ්ඩු ක්‍රම පනතට පක්ෂපාතිත්වය ප්‍රකාශ කරවා ගැනීම නොවෙයි. මේ රටවැසිකම ලබන අය තුළ ඊට වඩා උද්වේගකර හැඟීම් ඇති කරවන, ඊට වඩා ජාතිකාභිමානයක් ඇති කරවන, ඊට වඩා ස්වදේශානුරාගයක් ඇති කරවන යම්කිසි ප්‍රතිඥාවක් ලබා ගැනීමයි. නමුත් මේ රෙගුලාසියේ තිබෙන්නේ මොකක්ද? මා කියවන්නම් එය:

'ඌ' ආකෘති පත්‍රය

මා යටත් වැසියකුව හෝ පුරවැසියකුව සිටි යම් විදේශීය රාජ්‍යයකට ඇති සියලුම පක්ෂපාතකම් නියත වශයෙන්ම හා සම්පූර්ණයෙන්ම මා අත් හරින හා දිවුරා අත්හරින බවත්, ලංකාවේ ආණ්ඩු ක්‍රමය කෙරෙහි විශ්වාසය හා සැබෑ පක්ෂපාතිත්වය දක්වන බවත්, ලංකාවේ නීති අවංකව පිළිපදමින්, ලංකාවේ පුරවැසියකු වශයෙන් මා සතු යුතුකම් ඉටු කරන බවත් .............................. වන මම අවංකව පොරොන්දුවී දිවුරමි."

පක්ෂපාතීත්වය දක්වන එකම එක මේ අවුරුදු විස්සක් පව්ට ගහපු තමුන්නාන්සේලාගේ ආණ්ඩුවටත් එපා වූ මේ ආණ්ඩු ක්‍රම පනතයි. මේ ආණ්ඩු ක්‍රම පනතට ලංකාවේ ඉපදී, සැදී, වැඩී ලංකාවේම ජීවත් වන අප තුළවත් කිසියම් පක්ෂපාතීත්වයක් තිබෙනවාය කියා මා සිතන්නේ නැහැ. මේ ආණ්ඩු ක්‍රම පනත අහක දැමිය යුතුය, ප්‍රතික්ෂේප කළ යුතුය යන්නයි මේ රටේ වැඩි දෙනා කියන්නෙ. එසේ නම් මේ ආණ්ඩු ක්‍රම පනතට අළුත් රටවැසියන්ගෙන් පක්ෂපාතීත්වය ප්‍රකාශ කරවා ගැනීමෙහි හරයක්, තේරුමක්, ප්‍රයෝජනයක් තිබෙනවාද? රටවැසිකම පිළිබඳ ප්‍රශ්නය මතු වූ මුල් කාලයේ සිටම නැමදාම කියා සිටියේ මේ රටේ වතුකරයේ සිටින ඉන්දියානු ජනතාව මේ රටට ආදරය ඇති අය නොවේය, ඔවුන් ඉන්දියාවට පක්ෂපාතීත්වය දක්වන ඉන්දියාව තම මාතෘ භූමිය හැටියට සලකන මිනිසුන් කොටසක්ය, යන කථාවයි.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Order, please! The Sitting is suspended for half an hour. On resumption the Hon. Deputy Speaker will take the Chair.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින්, අ. භා. 4.30 ට නියෝජ්‍ය කථානායකතුමාගේ [ශ්‍රීමත් රසීක් ෆරීඩ්, ඕ.බී.ඊ.] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.**

*இதன்படி அமர்வு பி. ப. 4.30 மணிவரை இடை நிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று. உப சபாநாயகர் [ஸ்ரீமான் ருசிக் பரீத், ஓ.பி.ஈ.] தலைமை தாங்கினார்.*

*Sitting accordingly suspended till* 4.30 P.M. *and then resumed,* MR. DEPUTY SPEAKER [SIR RAZIK FAREED, O.B.E.] *in the Chair.*

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Hon. Member for Habarana—[*Interruption*]—Habaraduwa.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேகரா)*
(Mr. Prins Gunasekera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සේ මාව හබරණට යවන්න වාගෙයි හදන්නේ. හබරණ කිව්වත් හබරාදුව කිව්වත් අපේ රටේ හිටපු පැරණි මිනිසුන් වගයක් ගැනයි, ඒ වචන දෙකෙන්ම පැහැදිලි වන්නේ. එකක්, හබරුන් සිටි ප්‍රදේශය. අනික, හබරුන් සිටි දූව. ඒ දෙකේ එතරම් වෙනසක් නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

තේ පානය සඳහා අප විසිර යන අවස්ථාවේදී මා සඳහන් කරමින් සිටියේ රටවැසිකම ලබන ඉන්දියානු ජාතිකයන් නියම වශයෙන්ම ලංකා රටවැසියන් හැටියට භාර ගන්නට පෙර ඔවුන් විසින් දිවුරා අත්සන් කළ යුතු ප්‍රකාශය ගැනයි. එම ප්‍රකාශයට අඩංගු විය යුතු කරුණු මොනවාද යන්න "උ" ආකෘති පත්‍රයෙහි සඳහන්ව තිබෙනවා. එබඳු ප්‍රකාශයක් අවශ්‍ය වුණේ කුමන හේතුවක් නිසාද යන්න මෙම අවස්ථාවේදී විපරම් කර බැලීම උචිතය කියායි මගේ කල්පනාව.

වතුකරයේ ඉන්දියානු ජාතිකයන් පිළිබඳ ප්‍රශ්නය පැනනැඟුණු හැම අවස්ථාවක දීම කියා සිටියේ, ඔවුන් මේ රටට පක්ෂපාතිත්වය දක්වන පිරිසක් නොවන බවයි. ඔවුන් සිය මාතෘභූමිය හැටියට සලකන්නේ ඉන්දියාව බවයි. ඔවුන් ගරු කරන්නේත් පිළිගන්නේත් ආදරය කරන්නේත් ලෙන්ගතුකමක් දක්වන්නේත් තමන් ජීවත් වන තමන් රක්ෂාව කරන තමන් පදිංචිව සිටින මේ රටට නොව, තමන්ගේ මුතුන් මිත්තන් පදිංචිව සිටි, ඔවුන්ගේ ජන්ම භූමිය වූ ඉන්දියාවටය කියන කාරණය කවදත් පැහැදිලි වුණා. මෙන්න මේ චෝදනාව නිසා මෙම ප්‍රශ්නය විසඳා ගැනීම බොහෝම අමාරු වී තිබෙනවා. ඇත්ත වශයෙන්ම පසුගිය කාලය තුළ ඔවුන් හැසිරුණු පිළිවෙළ දෙස ටිකක් සොයා බැලුවෙහොත්, මෙම චෝදනාව එක්තරා විධියක පදනම් සහිත එකක් බව පෙනෙනවා. මේ වතුකරයේ ඉන්දියානු ජනතාව අතර වැඩිපුරම ජනප්‍රිය වූ දේශපාලන නායකයන් හැටියට පිළිගැනුණේ ලංකාවේ සිටින දේශපාලන නායකයන් නොව ඉන්දියානු දේශපාලන නායකයනුයි.

ඊයෙ පෙරේදා ඇති වුණු නොයෙකුත් දේශපාලන හේතූන් නිසා පෙඩරල් පක්ෂය වතුකරයේ දෙමළ ජනතාව කෙරෙහි එක්තරා හිතවත්කමක් දක්වන්නට පටන් ගත් බව අප දන්නවා. එහෙත් ඊට ප්‍රථම ඔවුන්ද ඒ වතුකරයේ ජනතාව කෙරෙහි කිසිම විශ්වාසයක් නොතිබුණු කොටසක් හැටියටයි කටයුතු කළේ. ඔවුන් එකම භාෂාවක් කථා කළත් එහෙමයි වුණේ. මේ වතුකරයේ ජනතාව ඔවුන්ගේ දේශපාලන කටයුතුවලදී ඉන්දියානු දේශපාලන නායකයන් අනුගමනය කරමින්



ඔවුන්ගේ ඡායාරූපවලට ගරු කරමින් ඔවුන්ගේ පොත්පත් කියවමින් තමන්ගේ ජීවිතවල එක්තරා අංගයක් හැටියට ඉන්දියානු ජන ජීවිතය අනුගමනය කළ නිසා, ලංකාවේ උපත ලැබුවත්, ලංකාවේ අවුරුදු ගණනක් ජීවත් වුණත්, ලංකාවේ රක්ෂාව කළත්, ඔවුන්ට ලංකා ජනගහනයෙන් කොටසක් හැටියට—ලාංකිකයන් කොටසක් හැටියට—එක්කාසු වී වැඩ කරන්නට බැරිකමක් තිබුණා. අහවලුන් නිසා එය සිදු වුණාය කියා ඒ ගැන මා කාටවත් දොස් කියන්න වුවමනාවක් නැහැ. එහෙත් එය සත්‍යයක් හැටියට පිළිගත යුතු කරුණක්.

මෙන්න මේ පසුබිම නිසා, මේ රටේ සිටියත් මේ රටේ ඉපදුණත් මේ රටට දේශමාමකත්වයක් දක්වන්නේ නැති ඉන්දියාවට ලෙන්ගතුකම් දක්වන පිරිසක් හැටියට මේ ඉන්දියානු ජාතිකයින් හැඳින්වුණු නිසා, ඔවුන්ට රටවැසිකම දීමේදී අප විශේෂයෙන්ම පරිස්සම් විය යුතුයි. ඒ නිසා මේ රටේ කොටසක් හැටියට මතුවට ජීවත් වෙන්නට ඕනෑය, අර ඉන්දියානු දේශානුරාගය වෙනුවට මේ සිංහල දේශයේ දේශානුරාගය ඔවුන්ගේ හදවත් තුළ කිති කැවෙන්නට ඕනෑය, ඒ නිසා ඒ පිළිබඳව යම්කිසි පියවරක් ගන්නට ඕනෑය කියන කරුණ උඩ ඔවුන් ලවා ප්‍රතිඥාවක් ගත යුතුව තිබෙනවා.

ඔන්න ඔය දේශපාලන පසුබිම නිසා ලංකාවේ රටවැසි බව ඉල්ලා සිටින ඉන්දියානු ජාතිකයින්ට එය නොදිය යුතුයි කියා බරපතල උද්ඝෝෂණයක් ලංකාවේ ඇති වුණා. ඔය තත්ත්වය වර්තමාන අගමැතිතුමාගේ කාලයේ පමණක් නොවෙයි එතුමාගේ පියා අගමැති වශයෙන් සිටි කාලයේත් පැවැති තත්ත්වයක්. එය මේ රටේ දේශපාලනය කරන හැමදෙනාම දන්නා කරුණක්. එහි දේශපාලන අතීතය ඒකයි. ඉන්දියානුවන්ට මේ රටේ පුරවැසිකම දීමෙන් මේ රටේ අනාගතය මීට වඩා ව්‍යාකූල සංකූල එකක් වන්නට පුළුවන්. මක්නිසාද කියතොත් එදා මේ සිංහල දේශයේ සිංහල ගම් අතර වගා කරන ලද තේ වතුකරයේ පදිංචිව සිටියේ මේ ජාතිකයන් විශේෂය පමණක් වුවත් මතු අනාගතයේදී මේ ප්‍රශ්නය පැන නඟින්නට පුළුවන් වන්නේ වතු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරයේ දෙමළ කථා කරන ජනතාව අතර පමණක් නොවන නිසයි. දෙමළ කථා කරන ජනතාව අතර අද පවතින කිසියම් දේශපාලන ව්‍යාපාරයන් වගයක් ගැන අප ඇස් ඇරගෙන කන් යොමා ගෙන සිටිය යුතුයි.

දකුණු ඉන්දියාවේ දෙමළ කථා කරන ජනතාව අතර අද පැන නැඟී ඇති තත්ත්වය අපේ අගමැතිතුමා දන්නවා ඇති. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ට පින් සිදු වන්නට ඉන්දියාව, පකිස්තානයත් ඉන්දියාවත් වශයෙන් දෙකට කැඩුවා. බ්‍රිතාන්‍ය කාරයින්ටත් අමෙරිකන්කාරයින්ටත් පින් සිදු වන්නට භාෂා ප්‍රශ්නය උඩ ඉන්දියාව නැවත වරක් දෙකට කඩන්නටයි දැන් හදන්නේ. දකුණු ඉන්දියාව ද්‍රවිඩ රාජ්‍ය යක් හැටියට තමන් පැලපදියම්වීමට ගන්නා පළමුවැනි පියවර වශයෙන් හඳුන්වන්නට පුළුවන්, මේ දවස්වල දෙමළ කථා කරන ජනතාව හින්දියට විරුද්ධව ගෙන යන ව්‍යාපාරය. මේ රටේ ජනනායකයා හැටියට ගරු අගමැතිතුමාට මා කියන්නේ මෙයයි: ලංකාවේ සිටින දෙමළ කථා කරන ජනතාවටත් මේ ප්‍රශ්නයෙන් ඈත් වන්නට බැරි වේවි. එතුමාගේම ආණ්ඩුවේ කොටසක් වන ද්‍රවිඩ රාජ්‍ය පක්ෂය දෙමළ කථා කරන ජනයාය කියමින් වතුකරයේ සිටින දෙමළ ජනතාව සමග අත්වැල් බැඳ ගන්නට යන්නේ ඒ නිසා තමයි. මේ දෙමළ කථා කරන ජනතාව දුප්පත් සිංහල මිනිසුන් අතර ජීවත් වෙමින්, අත්වැල් බැඳගන්නට යන්නේ මේ රටේ උතුරේත් නැගෙනහිරේත් අනිකුත් පළාත්වලත් සිටින දෙමළ කථා කරන ජනතාව සමග පමණක් නොවෙයි: සමහරවිට දකුණු ඉන්දියාවේ සිටින දෙමළ කථා කරන ජනතාව සමගත් ඔවුන් අත්වැල් බැඳ ගන්නට උත්සාහ කරාවි.

ගරු අගමැතිතුමා දෙමළ භාෂාව කථා කරන තුන් ලක්ෂයක් ජනයාට සිංහල රටේ රටවැසිකම දීම හරි හැටියට නොකළොත්, ලංකාව තුළ නියම සිංහල දේශානුරාගී ජාතිකාභිමානයක් සහ මාතෘ භූමිය කෙරෙහි නියම ආදරයක් ඇති රට වැසියන් ඇති නොකළොත් මොකක්ද සිදු වන්නේ? කොහේදෝ යන නයි වගයක් අරන් තවත් කොහේදෝ ගහගෙන තව අවුරුදු දහයක් තරම් කල් ගත වුණාම "කනවෝ, කනවෝ" කිය කියා කෑගහනවා ඇති. මේ කාරණය ගැනයි මගේ බිය පළ කළ යුතුව තිබෙන්නේ.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
එහෙම නම් ගිවිසුමට විරුද්ධද?

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
මා ගිවිසුමට විරුද්ධ නැහැ. මා ගිවිසුම ගැන කථා කළේත් නැහැ. ගිවිසුම ගැන කථා කරන්නටත් එපායයි තමුන්නාන්සේ කිව්වා නොවැ. පක්ෂපාත භාවය ලබා ගැනීම සඳහා තමුන්නාන්සේ මේ රෙගුලාසි මගින් ඉදිරිපත් කර තිබෙන මේ පෝරම කොළයේ තිබෙන අසම්පූර්ණත්වය ගැනයි කියන්නේ.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
කොහොමද අසම්පූර්ණ වුණේ? මොකක්ද අසම්පූර්ණ?

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
ඉන්දියාවට අනුරාගය දක්වන, ඉන්දියාවේ අගයෙන් උදම් වන අයට සිංහල දේශයට අනුරාගය ඇති වන විධියේ වාං මාලාවක් ඇතුළත් කරන්නට ඕනෑ. මේ රට දෙකට කඩන්නට, මේ රට දෙකට බෙදන්නට ෆෙඩරල් පක්ෂයට—දෙමළ රාජ්‍ය පක්ෂයට—ඉඩක් නොලැබෙන විධියට වචන මාලාවක් මෙයට ඇතුළත් කරන්නට ඕනෑ. රටට හානිකර දෙයක් කළොත් රටවැසිකම නැති වන බවට අලුත් සංශෝධනයක් ඉදිරිපත් කරන්නට ඕනෑ. පක්ෂපාත භාවය අවශ්‍යයි. ඒ සඳහා කට යුතු කරන්නට ඕනෑ. ඊට ඇතුළත් වන කරුණු කැඩුවොත්, උල්ලංඝණය කළොත්, මොකක්ද කරන්නේ? ඒ ගැන කිසිම දෙයක් මෙහි සඳහන් කර නැහැ. මේ රෙගුලාසි මාලාව අංග සම්පූර්ණ නැතැයි මා කියන්නේ ඒ නිසයි. තුන් ලක්ෂයකට ලංකාවේ පුරවැසිකම් දෙනවා. ඒ අය මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]
රටට පක්ෂපාත විය යුතුයයි සඳහන් වන්නට ඕනෑ. පක්ෂපාත භාවය කැඩුවොත් මොකද කරන්නේ ?

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
නීතියෙන් බලය තිබෙනවා.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
මේ පනතේ තිබෙන යම් යම් නීති කැඩුවොත් දඬුවම් දෙන්නට පුළුවන් බව පිළිගන්නවා. මා නීතිඥ මතයක් දෙන්නට කැමති නැහැ. මා නීතිඥ මතයක් දෙන්නට හදනවායයි කරුණා කර හිතන්නට එපා. මේ ඡේදය අනුව නොයෙක් අතට තර්ක කරන්නට ඉඩ තිබෙනවා. ඔය කියන විධියට දඬුවම් දිය හැකි නීතිය තිබෙන්නේ 12 වැනි ඡේදයට සම්බන්ධවයි. එහි තිබෙන්නේ මෙහෙමයි :

"Every person who, either in his application for the grant of the status of a citizen of Ceylon under this Act or in any proceeding relating to the disposal of such application, makes any false representation or conceals any material fact, shall be guilty of an offence under this Act . . ."

ඊට එහා ගිහිල්ලා නැහැ. මිනිසුන්ට වුවමනා නම්, රටවැසි භාවය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ඉල්ලුම් පත්‍රයේ කරන ප්‍රකාශයේ හෝ වෙනත් ලියකියවිලි වල වැරදි ප්‍රකාශයක් ඉදිරිපත් කර අත්සන් කර රටවැසි භාවය ලබා ගන්නවා ඊට ටික කාලයකට පස්සේ—මාසයකින් පමණ වෙන්නටත් පුළුවනි—ඒ නීතියෙන් කියන දේ උල්ලංඝණය කළොත් මොකක්ද දෙන්නට යන දඬුවම ? වැඩි දෙනා මේ රටට අහිතකර අන්දමට වැඩ කරන්නට ඉඩ තිබෙනවා. මේ රට දෙකට බෙදා, මේ රට දෙකට කඩා මේ රට ඇතුළේ ද්‍රවිඩ රාජ්‍යයක් පිහිටුවන්නට ඇති කරන ව්‍යාපාරයක කොටස්කාරයන් වන්නට ඉදිරිපත් වුණොත් ඔවුන්ගේ රටවැසිකමට යමක් කරන්නට අයිතියක් තිබෙනවාද ? ඔබතුමාගේ මේ රෙගුලාසි යටතේ යමක් කරන්නට අයිතියක් තිබෙනවාද ? ගරු අගමැතිතුමාගෙන් මා එසේ අසනවා. කරුණා කර 12 වැනි ඡේදයට මෙය ඇතුළත් කරන්න. ගිවිසුම උල්ලංඝණය කළොත් කිසියම් දඬුවමකට යටත් කළ හැකියි කියන නීතියක් සම්පාදනය කරන්න.

ගරු අගමැතිතුමා මගෙන් ඇහැව්වා මේ ලංකාණ්ඩු ක්‍රම පනත හැර වෙන මොකක්ද කියන්නේ යන ප්‍රශ්නය. දැනට ඔය ලංකා රටවැසිකම ලබන ඉන්දියානු ජාතිකයන්ගෙන් අත්සන් කර ගන්න ප්‍රකාශය කුමක්දැයි මම කියන්නම්. ඒක මෙහෙමයි :

"මා යටත් වැසියකුව හෝ පුරවැසියකුව සිටි යම් විදේශීය රාජ්‍යයකට ඇති සියළුම පක්ෂපාතකම් නියත වශයෙන්ම හා සම්පූර්ණ වශයෙන්ම මා අත්හරින බව හා දිවුරා අත්හරින බවත් ......"

ඒ මනුෂ්‍යයා මේ වාක්‍යය කියවන්නෙ ඇගේ ගැවිලාවත් නොවෙයි. මෙපමණ කාලයක් තිස්සේ ඉන්දියාවට ලෙන්ගතුකම් දැක්වූ, ද්‍රවිඩ රාජ්‍යයක් පිහිටුවන්ට ඕනෑ යයි සටන් කළ, අපි දෙමළ හා ද්‍රවිඩ මුන්නේත්‍ර කලාගම් ආදි ව්‍යාපාර රාශියක නායකයන් වූ සිනමා චිත්‍රපටි නායකයන් මහා දේවත්වයෙන් සැලකූ මිනිසුන්ට මේ වගේ පාඨයක් කිව්වට ඇගේවත් ගැවෙයිද ? ඒ මිනිසුන් හිතාගෙන ඉන්නෙ "අපි මොකක්ද එකක් අත්සන් කළා, ඒක මොකක්දැයි අපි දන්නෙ නැහැ" කියායි.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
වෙන එකක් ඇම්මත් එහෙමනෙ.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
එහෙම නොවෙයි. "අපි මේ කරන්නෙ මොකක්ද, මොන රටේ කොටස්කාරයන් හැටියටද අපි මේක කරන්නෙ" කියනෙ අදහස් ඒ මිනිසුන්ට තේරෙන විධියට කරුණාකර ඔවුන්ට කියා දෙන්න. "මේක සිංහල දේශය. තමුන්නාන්සේලා මේ රටට ඇවිත් අවුරුදු ගණනාවක් තිස්සේ මේ රටේ දියුණුවට වැඩ කළා. දැන් තමුන්නාන්සේලාට ආපසු යන්ට බැරි නිසා තමුන්නාන්සේලා පිළිගන්න අපි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලැහැස්තියි. අපි අපේ සහෝදර රටවැසියන් හැටියට තමුන්නාන්සේලා පිළිගත්තෙ මෙන්න මේ කොන්දේසි පිටයි. මේ රට දෙකට කඩන නොයෙක් ව්‍යාපාර තිබෙනව, එහි කොටස්කාරයන් වෙන්ට එපා. එහෙම වුණොත් මේ රටවැසිකම් දෙන නිසා අපටත් දෙස් අහන්ට සිද්ධ වෙයි" ආදි වශයෙන් ඔවුන්ට තත්ත්වය පැහැදිලි කර දෙන්ට ඕනෑ.

ද්‍රවිඩ රාජ්‍ය පක්ෂය කියා එකක් තිබෙනව. ඒ පක්ෂයේ නමින්ම තේරෙනව, ඒ පක්ෂය කරන්ට යන්නේ මොකක්ද කියා. ඒ අයගේ ප්‍රතිපත්තිවල කියා තිබෙනව දෙමළ කථා කරන ජනතාව අතර සහයෝගය, සම්මුතිය හා එකගත්වයක් ඇති කරන්ට ඕනෑ බව. මේ මිනිසුන් සදාකාලිකව "දෙමළ කථා කරන ජනතාව" කියන සටන් පාඨයට යටත් වෙලා අපේ මාතෘ භූමිය අමතක කරල, මේ සිංහල දේශයේ අඛණ්ඩ භාවය, අභින්නත්වය අමතක කරල, ඔවුනුත් ඒ ව්‍යාපාරවලට අත්වැල් බැඳ ගන්ට පටන් ගත්තොත් උතුරයි, නැගෙනහිරයි විතරක් නොවෙයි අපට නැතිවෙලා යන්නෙ; දුප්පත් සිංහල ගම් අතරේත් ද්‍රවිඩ රාජ්‍යයක් ඇති වෙනවා නේද? අන්න ඒ තත්ත්වය වළක්වන්ට තමුන්නාන්සේ හැකිතරම් උත්සාහයක් ගන්ට ඕනෑ.

මේ ඉදිරිපත් කර තිබෙන රෙගුලාසි වලින් ඒ මිනිසුන්ට අබමල් රේණුවක තරම්වත් හැඟීමක් ඇති වෙන්නෙ නැහැ. සිංහල මිනිසුන්ටත් එපා වුණු, සිංහල මිනිසුන්වත් අද වන තුරු තේරුම් ගෙන නැති, ඉංග්‍රීසියෙන් සකස් වුණු ආණ්ඩු ක්‍රම පනතක් කෙරෙහි පක්ෂපාතිත්වය දක්වීමෙන් මේ දේශානුරාගය, දේශාභිමානය ඉන්දියානු ජාතිකයන් තුළ ඇති කරන්ට පුළුවන්කමක් නැහැ. ඒ නිසා මා ඉල්ලා සිටිනව, මේ රෙගුලාසිය අඩු ගණනේ මේ විධියටවත් හරි ගස්සන්ට කියා:

"මෑ යටත් වැසියකුව හෝ පුරවැසියකුව සිටි යම් විදේශීය රාජ්‍යයකට ඇති සියළුම පක්ෂපාතකම් නියත වශයෙන්ම හා සම්පූර්ණ වශයෙන්ම අත්හරින බව හා දිවුරා අත්හරින බවත් ලංකා ආණ්ඩු ක්‍රමය කෙරෙහි විශ්වාසය හා සැබෑ පක්ෂපාතීත්වයක් දක්වන බවත් ......:'



ඊළඟට මෙන්න මේ විධියටත් කොටසක් ඇතුළත් කරන්ට ඕනෑ:

"ලංකා රජයේ ඒකීය භාවය හා සිංහල දේශයේ ඓතිහාසික අඛණ්ඩ ස්වරූපයද අභින්නත්වයද සඳහටම ආරක්ෂා කරන බවත්......"

ලංකාවේ නීති අනුගමනය කරනවාය කියා නීති ගැන පොදුවේ සඳහන්ව තිබෙන නිසා ඒ ගැන කියන්ට වුවමනා නැහැ. එහෙත් නීති ගැන විශේෂයෙන් මතක් කළයුතු නම් මේ කාරණයේදී මං හිතනව, මේ අළුත් රටවැසිකම් ලබන අපේ ඉන්දියානු ජාතික සහෝදරයන්ට මතක් කළයුතු විශේෂ නීති 3 ක් තිබෙන බව. මේ රටේ පසුගිය වසර දසකය ඇතුළත බලවත් ආන්දෝලනයක් හා උද්යෝගයක් රට පුරා ඇති කළ භාෂාව පිළිබඳ විශේෂ නීති 3ක් තිබෙනව. 1956 දී ඇති කළ සිංහල පමණක් නීතිය යනුවෙන් සාමාන්‍යයෙන් හඳුන්වන රාජ්‍ය භාෂා පනතත්, 1958 දී කැරලි කෝලාහල මධ්‍යයේ ඇති කළ දෙමළ භාෂා (විශේෂ විධිවිධාන) පනතත්, 1961 දී එළිවෙන තුරු නිදි මරා ගෙන සම්මත කර ගත් උසාවි භාෂා පනත හෙවත් අධිකරණයේ භාෂා පනත ගැනත් විශේෂයෙන් එහි සඳහන් කරන ලෙස මං ඉල්ලා සිටිනව. මෙම භාෂා පනත් තුන ගැන විශේෂයෙන් මතක් කරන්නැයි මං ඉල්ලා සිටිනවා. ද්‍රවිඩ ජාතිකයන් ලක්ෂ සංඛ්‍යාත පිරිසක් මේ රටේ පුරවැසියන් වීම මේ රටේ රාජ්‍යභාෂා ප්‍රශ්නයත් සමග සම්බන්ධ වී තිබෙනවා. ඔය දෙක වෙන් කරන්නට බැහැ. කාටවත් ඔය දෙක කඩන්නට බැහැ. කවදා හෝ නැවත වරක් මේ ප්‍රශ්නය මතු වේවි.

ලක්ෂ සංඛ්‍යාත දෙමළ ජනතාවකට අලුතෙන් මේ රටේ පුරවැසිකම දීමෙන් කාගේ අත ශක්තිමත් වෙනවාද? කාගේ කට සැර වෙනවාද? අත ශක්තිමත් වන්නේත් කට සැර වන්නේත් ද්‍රවිඩ රාජ්‍ය පක්ෂයේයි. ද්‍රවිඩ රාජ්‍ය පක්ෂය ශක්තිමත් වන බව ඇසීම ගැන ද්‍රවිඩ සංගමයේ නායකතුමා නම් අකැමති වන්නට පුළුවනි. එහෙත් ලක්ෂ සංඛ්‍යාත ද්‍රවිඩ ජනතාවකට මේ රටේ පුරවැසිකම් දීමෙන් සිදු වන්නේ දෙමළ කථා කරන මිනිසුන් අතර ද්‍රවිඩ රාජ්‍යයක් ගෙන යා යුතුයයි කියන ද්‍රවිඩ රාජ්‍ය පක්ෂයට තවත් කොටස්කාරයන් පිරිසක් එකතු වීම පමණයි. තත්ත්වය එසේ නම් අප පරෙස්සම් විය යුතුයි. ද්‍රවිඩ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඉන්දු-ලංකා ගිවිසුම (ක්‍රියාවට නැගීමේ) පනත:

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

රාජ්‍ය පක්ෂය රාජ්‍ය භාෂාවට සම්බන්ධ පනත් තුනෙන් දෙකකට සම්පූර්ණයෙන්ම විරුද්ධ වුණා. එවැනි පිරිසක් සහභාගි කර ගෙනයි, මේ ආණ්ඩුව පිහිටුවා තිබෙන්නේ. ඔය ලිහන්නට බැරි දේශපාලන අවුල් ගැන මා කථා කරන්නට වුවමනා නැහැ. "සිංහල භාෂාව මුළු රටම පිළිගනී" යනුවෙන් සඳහන් කරමින් මෙම ආණ්ඩුව පොත් පත් මුද්‍රණය කොට බෙදා හැරියත් රාජ්‍යභාෂා ප්‍රතිපත්තිය පිළිගත නොහැකි යයි කියන පෙඩරල් පක්ෂය මේ ආණ්ඩුවට සම්බන්ධ වී සිටිනවා.

රාජ්‍යභාෂා පනතත් එහි තර්කානුකූල සංවර්ධනයක් වූ අධිකරණයේ භාෂා පනතත් විශේෂයෙන්ම මීට ඇතුළත් කළ යුතුයි. ඒ නිසා "ලංකාවේ නීති" යනුවෙන් සඳහන් කර ඇති ඒ පද මාලාවට අනතුරුව, "විශේෂයෙන් 1956 අංක 33 දරන රාජ්‍යභාෂා පනත, 1958 අංක 28 දරන දෙමළ භාෂා විශේෂ විධිවිධාන පනත, 1961 අංක 3 දරන අධිකරණ භාෂා පනත යන නීති අවංකව පිළිපදිමි" යන වචන ඇතුළත් කළ යුතුයි. මේ ගැන දිගින් දිගට විවාද කරන්නට වුවමනාවක් නැහැ. භාෂා ප්‍රශ්නය මෙයට ඇතුළත් කිරීමට හේතුව කුමක්දැයි පැයක් දෙකක් තිස්සේ වුවද කියන්නට පුළුවනි. එහෙත් මේ අවස්ථාවේදී අදහසක් හැටියට පමණක් මෙය ආණ්ඩුව ඉදිරියේ තබනවා.

ඊළඟට මේ රෙගුලාසි මාලාව සකස් කළ අයගේ අත්වැරදීමක් නිසාදෝ ඇති වූ වරදක් තිබෙනවා. මේක විස්තර කර තිබෙන්නේ දිවිරීමක් සහ සහතික ප්‍රකාශයක් හැටියටයි. මෙය නිලධාරීන් අතින් සිදු වූ සුළු වැරදීමක්ද, එසේ නැත්නම් ඕනෑවට වඩා මතු කර පෙන්වීමක්දැයි මා දන්නේ නැහැ. නිලධාරීන් අතින් වූ අත්වැරැද්දක් නම් මෙය ලේසියෙන් නිවැරදි කර ගන්නට පුළුවනි. "උ" ආකෘති පත්‍රයේත්, "උඋ" ආකෘති පත්‍රයේත්,—සහතික ප්‍රකාශයට ඇතුළත් විය යුතු කරුණු අඩංගු වන ආකෘති පත්‍රයේත්—වරදක් තිබෙනවා. සහතික පත්‍රයක් අත්සන් කිරීමේදී සාමාන්‍යයෙන් භාවිත කරන වාං මාලාවක් තිබෙනවා. දැනට බල පවත්වන අපේ ඉංගිරිසි නීති මාලාවේ 17 වන පරිච්ඡේදයෙහි ඇති "Oath and affirmations" නමැති පනතෙහි එක එක අවස්ථාවේදී මිනිසුන් ප්‍රතිඥා දිය යුතු ආකාරය ගැන, දිවුරුම් ලබාගත යුතු ආකාරය ගැන සඳහන් වෙනවා. යම්කිසි කෙනකු යම්කිසි දෙයක් ගැන දිවුරන්නට පෙර ඉංගිරිසියෙන් නම් මෙසේ කියනවා :

"I do hereby solemnly, sincerely and truly declare and affirm...."

ඒ සහතික කිරීමට සම්බන්ධ වන වාක් මාලාව ලංකා රටවැසිකම ලබන ඉන්දියානුන් විසින් කියවන්නට වුවමනාවක් නැද්දැයි මා ප්‍රශ්න කරනවා. මෙහි කියා තිබෙන්නේ නිකම්ම, පොරොන්දු වී සහතික කරමි කියායි. මීට පෙර මේ රෙගුලාසි මාලාවේම "ඉ" ආකෘති පත්‍රයේ සහතික ප්‍රකාශයේ තිබෙනවා, අර ඉංග්‍රීසි කියමනේ සිංහල පරිවර්තනයක්. මට ලැබී තිබෙන සිංහල පිටපතේ 14 වැනි පිටුවේ තිබෙනවා,

"ගම්භීර පූර්වකවද, අවංකවද, සත්‍ය ලෙස ප්‍රකාශ කොට සහතික කරමි."

කියා. 14 වැනි පිටුවේ තිබෙන්නෙත් සහතිකයක් ; 22 වැනි පිටුවේ තිබෙන්නෙත් සහතිකයක්. 14 වැනි පිටුවේ සහතිකයේදී "ගම්භීර පූර්වකවද, අවංකවද, සත්‍ය ලෙස ප්‍රකාශ කොට සහතික කරමි" කියා තිබෙනවා. ඒ යම්කිසි තොරතුරු වගයක් දෙන ඉල්ලුම් පත්‍රයකට ඇතුළත් කර තිබෙන ප්‍රකාශයක්. රටේ පුරවැසිකම ලබා ගැනීමේදී කරන සහතිකයේ එබඳු ගම්භීරකමක් නැහැ ; අවංකකම තියෙනවා ; එබඳු සත්‍යවාදිකමක් නැහැ. ඉතිරි වී තිබෙන්නේ අවංකකම පමණයි. ඒක වැරදීමක් නම් කරුණා කර හරිගස්සන්න. මේ රෙගුලාසි මාලාවේ ප්‍රධානම රෙගුලාසිය නමයි, මේ රටේ රටවැසිකම ලබන්නට පෙර මේ රටට පක්ෂපාතිත්වය දක්වනවාය, මේ රට ආරක්ෂා කිරීමට බැඳී සිටිනවාය, මේ රටේ ජීවත් වී මේ රටේ මැරෙන්නට අදහස් කරනවාය කියා රටට ආදරය ඇති බව ප්‍රකාශ කරන සහතිකය සම්බන්ධ රෙගුලාසිය. ඒ සහතිකය පුළුවන් තරම් ගම්භීරතා පූර්වකව කළ යුතු ප්‍රකාශයක්. එහෙම නම් 14 වැනි පිටුවේ තිබෙන "ගම්භීර පූර්වකවද, අවංකවද, සත්‍ය ලෙස ප්‍රකාශ කොට සහතික කරමි." කියන පාඨය මේකටත් ඇතුළත් කිරීමෙ කිසිම වැරැද්දක් නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා කරුණු කීපයක් සංක්ෂේපයෙන් ඔබතුමා හමුවේ තැබුවේ, ඇත්තෙන්ම කියනොත්, ඒවා මේ ආණ්ඩුව පිළිගන්නවාය කියන විශ්වාසයක් ඇතිව නොවෙයි. මේ වාගේ වැදගත් විවාද රාශියකට සහභාගි වී නොයෙක් නොයෙක් අවස්ථාවලදී අප නොයෙක් නොයෙක් අදහස් ඉදිරිපත් කර තිබෙනවා. එහෙත් මේ රජය විරුද්ධ පාර්ශ්වයේ අදහස් පිළිගන්නේ බොහොම අඩුවෙන්. මේ ප්‍රශ්නය පිළිබඳව මා අදහස් ප්‍රකාශ කරන්නේ පක්ෂ දේශපාලනයෙන් සම්පූර්ණයෙන්ම තොරව පොදුවේ ජාතියේ ආරක්ෂාව සඳහා බව මා මුලින්ම සඳහන් කළේ, අඩු ගණනේ ඒ විධියට කී විටවත් පිළිගනීදෝ කියා ටිකක් බලන්නටයි. එහෙත් මේ ආණ්ඩුවට තිබෙන වැඩි ඡන්ද වලින් මේ රෙගුලාසි මේ විධියටම අනුමත කර ගන්නා බවට මට නම් කිසිම සැකයක් නැහැ. මා වාඩි වන්නට පෙර අගමැතිතුමාගෙන් එක ප්‍රශ්නයක් අහනවා.

ලංකාවේ ජීවත් වන මේ ඉන්දියන් ජාතිකයන්ට ලංකා රටවැසිකම දීමේ මාර්ගයෙන් ලංකාවේ ඡන්ද බලය දී ඒ ඒ ආසන වල ලියාපදිංචි කිරීමට මේ රෙගුලාසි ප්‍රයෝජනවත් කර ගන්නා අතරම, මුල් ගිවිසුම යටතේ මේ රටින් ගෙන යාමට අදහස් කළ 5,25,000 ක් වූ ඉන්දියානු ජාතිකයන් ඉන්දියාවට ගෙන ගොස් පදිංචි කරවන්නේ කොහේද, ඔවුන්ට කරන්නේ මොනවාද යන්න ගැන, ඉන්දියානු ආණ්ඩුව මේ දක්වා කිසිම රෙගුලාසියක් පනවා තිබෙනවාදැයි සොයා බැලුවාද? අපේ ආකෘති පත්‍ර වල ඇතුළත් කළ යුතු තොරතුරක් වශයෙන් සංශෝධනයක් වශයෙන් මා ඉදිරිපත් කළේ ඒ කාරණයයි. මේ පිළිබඳව ඉන්දියාවේ ලේඛන වගයක් තිබෙනවා නම්, නම් ලැයිස්තු සකස් වෙනවා නම්, ඒ ලැයිස්තුවල ගණන් අංක පිළිවෙළින් අපේ ලැයිස්තුවලටත් ඕංගක් ඇතුළත් කරන්න. ඒ, ඇයි? මේ දෙකම—ලංකා රටවැසිකම දීමත්, ඉන්දියාවට පටවා යැවීමත්—අනුපාත වශයෙන් කළ යුතු යැයි ගිවිසුමේ සඳහන් වී තිබෙනවා. එම නිසා, මේ රෙගුලාසි ක්‍රියාත්මක වන විධියෙන් ඒ අනුපාතය එක පැත්තකට විතරක් බර වී තිබෙනවාද, අපේ ඔළුව උඩ පමණක් බර පැටවුණු අනුපාතයක් වී තිබෙනවාද, ඉන්දියාව ඒ බරෙන් නිදහස් වී තිබෙනවාද කියා ඕංගක් සොයා බලන්න. ගිවිසුමෙන් දක්වෙන විධියට ඒ දෙකටයුත්තම අනුපාතිකව ඉටු නොවී, මේ රෙගුලාසි මාර්ගයෙන් ලංකා රටවැසිකම පිරිනැමුවොත් වැඩි කල් නොගොස් ඉතා භයානක දේශපාලන අර්බුදයකට මුහුණ දෙන්නට අපට සිදු වෙනවා. එහි කොටස්කාරයකු වන්නට මා අකමැති නිසායි, මේ රෙගුලාසිවලට මගේ බලවත් විරෝධය, අප්‍රසාදය හා සංවේගය පළ කරන්නේ. මේ රෙගුලාසි හේතුකොට ගෙන කිසියම් දිනෙක මේ රටේ කිසියම් කලබැගෑනියක් ඇති වුණොත්, මේ රෙගුලාසි අනුමත කරන්නන් පිට ඒ පිළිබඳ සම්පූර්ණ වගකීම පැවරෙන බවට දෝෂාරෝපණයකුත් කරමින් මා අසුන් ගන්නවා.

අ. භා. 5.3

**එම්. සිවසිතම්පරම් මයා.** (උඩුප්පිඩ්ඩි—කාරකසභා නියෝජ්‍ය සභාපති)

(திரு. எம். சிவசிதம்பரம்—உடுப்பிட்டி—குழு உப அக்கிராசனர்)

(Mr. M. Sivasithamparam—Uduppiddi—Deputy Chairman of Committee)

Mr. Deputy Speaker, it was not my intention originally to participate in this Debate, but some of the remarks made by the hon. Member for Habaraduwa (Mr. Prins Gunasekera) constrain me to say a few words.

The hon. Member for Habaraduwa in discussing these Regulations covered a large ground. He referred to the Chief Minister of Madras and he also spoke about the movement for a separate Dravidian state in South India and various other matters.

I had occasion to say this previously, and I want to re-emphasize it today, that so far as the large majority of the Tamil people of this country are concerned, we desire to live in a united Ceylon without any hope of any division at any stage. I said this before and I say it again today, because the hon. Member for Habaraduwa and others of his ilk, like the hon. Member for Dambadeniya (Mr. R. G. Senanayake), have been repeating this canard of

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

the Tamil people of this country wanting a divided Ceylon, over and over again on the Floor of this House. Speaking for myself, for my party and for the very large majority of the Tamil people of this country, we desire to live and work in a united Ceylon.

The hon. Member for Habaraduwa said that he expects a great deal of litigation arising out of the operation of this Act, and one of the difficulties he envisaged was that, as a result of the non-inclusion of the Sirima-Shastri Agreement in the Act itself, it would be difficult for judges to come to a decision in respect of certain matters under the Act. Surely my hon. Friend, the Member for Habaraduwa, as a lawyer himself, knows that in the interpretation of an Act, no court will go outside the provisions of the Act itself when the provisions of the Act are very clear. If occasion should arise for the court to seek assistance outside the provisions of the Indo-Ceylon Agreement (Implementation) Act, what would be the difficulty in placing before the court the Sirima-Shastri Agreement itself which has been published as Treaty Series No. 5 of 1964? Surely it would not be necessary to summon the hon. Leader of the Opposition (Mrs. Sirimavo Bandaranaike) to court to speak to the existence of the Indo-Ceylon Pact? Surely my hon. Friend as a trained and experienced lawyer is aware of these matters?

This is the type of red herring that has been drawn across the track in an attempt to discredit the Regulations that have been presented under the Act.

One of the other matters that the hon. Member for Habaraduwa mentioned was that every person seeking to register himself as a citizen of Ceylon should mention in the application the electorate in which he is residing and that that should find a place in the register. Do I understand the hon. Member for Habaraduwa to be advocating something that finds a place in South Africa? Is he saying that such persons should not be allowed to move from one place to another? Surely the hon. Member for Habaraduwa and people like him have on more than one occasion roundly condemned what is happening in South Africa. If it is bad for the negroes of South Africa, is it good for the persons of Indian origin who will be citizens of Ceylon here? On what grounds does he seek to justify that restriction which he says should be placed on those persons who will be citizens of Ceylon from moving from one area to another, from one electorate to another?

In this connexion it will be remembered that the Hon. Prime Minister during the course of his reply in the Second Reading Debate said that all these new citizens would come under a new voting set-up. Whether it be multi-member constituencies or whether it be shoe-string electorates, some device was going to be adopted for these new citizens to cast their votes.

Then why did the hon. Member for Habaraduwa draw this red herring, when we are all anxious, now that the Act has been passed by Parliament, that it should come into operation so that we will all know who are those who are citizens of Ceylon and who are those who are going across? Why all these red herrings in order to prevent these Regulations being passed? The hon. Member for Habaraduwa further said that these new citizens should be prevented from participating in any move for separation.

Sir, we have today among us a very eminent citizen of this country, Mr. C. Suntheralingam, who advocates the establishment of a separate Tamil Nad. I am glad he has very few followers among the Tamils who think in the same way. What can you do with him? [*Interruption*]. If any hon. learned Friend appears before the District Court and moves that Mr. Suntheralingam be sent to Angoda it is a different matter ; as to

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

who should be sent to Angoda I do not know in that sense. But, we have among us a very eminent citizen of this country, a person who has been a member of this House for so many years, a person who has been an Hon. Minister of State, who is advocating this separation. Surely, there will be such people like Mr. Suntheralingam, like the hon. Member for Habaraduwa, right throughout the history of our country—people who like certain things which the majority do not agree with. Therefore, it is not for such people that we frame regulations.

The hon. Member for Habaraduwa pooh-poohed the whole idea of allegiance to the Constitution. Well, I think, the most sacred document that any Parliament can have, that any country can have, is its Constitution—I am not speaking of the present Constitution—any Constitution that is to come even in the future. Every citizen has to owe allegiance to that Constitution. Therefore, when we mention " Oath and affirmations " what is menat is that every new citizen will be loyal to the supreme document that any legislature can have in a country. He wanted special mention to be made of the three laws I thought the meaning was very clear when you state " I will faithfully observe the rules of Ceylon ". Are these three laws not part of the laws of Ceylon ? What is the special sanctity that he wants in that these three laws should be mentioned ? Why do you not mention the Brothels Ordinance ? It is because we do not like our new citizens to attend the brothels. Why do you not mention the Fire Arms Ordinance ? It is because we do not like our new citizens to have unlicensed fire arms. Why do you not mention the whole number of other Enactments that these citizens should not observe ? Why only these three laws ? Are they not part of the laws of our country.

No, Sir, it is perfectly clear that although these Gentlemen time and again from public platforms ask for the implementation of the Sirima-Shastri Pact, they are not really interested in the implementation of the pact, and therefore the opposition today to these Regulations, the type of specious arguments that have been put forward by my good Friend the hon. Member for Habaraduwa, clearly shows that they are not anxious that we should get a move on with this agreement. I think that more than once on the Floor of this House—at the Second Reading Debate—we said " Let us get a move on. After so many long years we have come to a pact ; after so many long years an Act has been passed by this House ; after so many years the Indian Government has agreed to accept 525,000 persons of Indian origin. Let us not at this stage create trouble. Let us get on with this pact. Let us get to know who our citizens are and who the Indian citizens are ". If in that spirit all of us approach these Regulations under the Act then I think we have done a service to the country.

අ. භා. 5.12

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.** (දොම්පෙ)

*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க—தொம்பே)*

(Mr. F. R. Dias Bandaranaike—Dompe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උඩුප්පිඩ්ඩිහි මන්ත්‍රීතුමාගේ කථාවෙන් පසුව මට කථා කරන්න අවස්ථාවක් ලැබීම මගේ භාග්‍යයක් හැටියට මා කල්පනා කරන්නෙ, විශේෂයෙන් එක් හේතුවක් උඩයි. එතුමා මේ අවසථාවේදී ප්‍රකාශයක් කළා, එතුමාත්, එතුමාගේ පක්ෂයත් අදහස් කරන්නෙ එක්සත් ලංකාවක් ගොඩනැංවීමේ කොටස්කරුවන් වශයෙන් ද්‍රවිඩ ජනතාවත් ෆෙඩරල් වාදයෙන් තොරව මේ රටේ ජීවත්වන්නට බලාපොරොත්තුවන බවට. එහෙත් එතුමා කථා කර ගෙන යද්දී ඒ පිළිබඳව මා විශේෂයෙන් මතු කළ ප්‍රශ්නයට එතුමා යමක් නොකී මෙන් එතුමාත් ෆෙඩරල් වාදීන්ගේ අදහස් අනුමත කරන බවයි මට අවබෝධ වුණේ. කෙසේ වෙතත් නියෝජ්‍ය කථානායකතුමනි, අපට තිබෙන එකම කනගාටුව, උතුරු නැගෙනහිර පළාත්වල ජීවත්වන ද්‍රවිඩ ජනතාවගෙන් වැඩි දෙනකු අහේතුවකට මෙන් උඩුප්පිඩ්ඩිහි ගරු මන්ත්‍රීතුමාගේ පක්ෂයට අයත් නොවීම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.]

ගැනයි. [බාධා කිරීමක්] ඇත්ත වශයෙන්ම උතුරු නැගෙනහිර පළාත්වල වෙසෙන සෑම ද්‍රවිඩ මහත්මයෙක්ම, නෝනා මහත්මයෙක්ම උඩුපිඩ්ඩිහි ගරු මන්ත්‍රීතුමාගේ අදහස් පිළිගෙන ඒ අදහස් ක්‍රියාත්මක කිරීම පිණිස ජාතික රජයට ආධාර දෙන බවට අපට විශ්වාසයක් ඇති කර ගන්න පුළුවන් නම් එය අපට ලොකු ධෛර්යයක් වෙනවා. නමුත් එවැන්නක් අද අපට දකින්න ලැබෙන්නෙ නැහැ. ජාතික රජයේ මුල් පෙළේ සිටි යාපනයෙ මන්ත්‍රීතුමා (ජී. ජී. පොන්නම්බලම් මයා.) රුපියලේ වටිනාකම පහත බැස්සා වාගේ දැන් පළමු වැනි පේළියෙන් තුන්වන පෙළට ගිහින් තිබෙන බවයි පෙනී යන්නෙ.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
දෙන්නම ගිහින්.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)
ඔව්, දෙන්නම ගිහින්. එය මුළු ද්‍රවිඩ ජනතාවම පහත බැස්වීමක් වාගෙයි. ඒකයි පෙනෙන තත්ත්වය. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ වැඩි දෙනකු, තමුන්නාන්සේත් මාත් ගරු අගමැතිතුමාත් මේ අවස්ථාවේදි කල්පනා කරන්නෙ උතුරු පළාත ගැන නොවෙයි; නැගෙනහිර පළාත ගැනයි. මා දන්නවා ඔබතුමා මේ අවස්ථාවේදී ඔය මහ පුටුවේ සිටියත් හිත තිබෙන්නෙ කල්මුණේ බව. ඒ කෙසේ වුණත් අපට දැන් තිබෙන්නෙ මුස්ලිම් ජනතාව පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)
මගේ හිත කල්මුණේ නැහැ.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)
දැනටමත් ආසනය දිනා ඉවරද?

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)
මැදින් ඉඳගෙන වැඩ කරනවා පමණයි.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)
මේ අවස්ථාවේදී මුස්ලිම් ජනතාවට අදාළ ප්‍රශ්නයක් ගැන නොවෙයි, වතු කරයේ ඉන්දියානු ජනතාවට අදාළ රෙගුලාසි ගැනයි අප කථා කරන්නෙ. වලපනේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. එම්. හේරත් මයා.) පළමුවෙන්ම මෙම කාරණය ගැන කථා කරද්දී, ගරු අගමැතිතුමා විශේෂයෙන්ම කියා පෑවේ අද අප කථා කරන්නෙ රෙගුලාසි ගැන මිස මහ පනත ගැන නොවන බවයි. මහ පනත සම්මත වී හමාර බව ඇත්තයි. ඒ ගැන විරුද්ධ පක්ෂයටත් ප්‍රශ්නයක් නැහැ, මහ පනත සම්මත කර දුන් අවසාන නිසා——

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
මුල් පනත.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)
මහ පනත කියා කීවෙ හේතුවක් ඇතුවයි. තමුන්නාන්සේට එය මුල් පනත වුණත් අපට පෙනී යන්නෙ මහ විශාල අපරාධයක් කරන පනතක් හැටියටයි. එනිසයි මහ පනත යනුවෙන් මා හැඳින්වූයේ. මහ පනත සම්මත කර ගෙන අවසාන නිසා ඒ ගැන විවාද කරන්න ඉඩක් නැති බව අප පිළිගන්නවා. එම පනතට අපේ විරුද්ධත්වයත් ප්‍රකාශ කර අවසානයි. ඒ අවස්ථාවේදී අප තදින්ම එයට විරුද්ධ වුණේ එම පනත සිරිමා-ශාස්ත්‍රී ගිවිසුම පදනම් කර ගෙන සකස් කළ පනතක් නොවන නිසයි. එම ගිවිසුම අනුව පන් ලක්ෂ විසි පන්දහසක් ඉන්දියානුවන් ලංකාවෙන් පිටත් කර හරින්න ලංකාණ්ඩුවත් ඉන්දියානු ආණ්ඩුවත් එකඟ වුණා. නමුත් ගරු අගමැතිතුමා මෙම ගරු සභාවෙ කියා පෑවෙ කුමක්ද? අපට මේ උදවිය පිටත් කර හරින්න පුළු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වත්කමක් නැහැ. ඉන්දියානු ආණ්ඩුව පිළිගන්න ලැහැස්ති වුණත් අපට මුදල් ප්‍රශ්නයක් තිබෙනවා. අපට ප්‍රවාහණ පහසුකම් නැහැ මේ අය පිටත් කරන්න. ඔන්න ඔය වාගේ දේවල් නොවෙද එතුමා කීවෙ? එම නිසා මෙයින් පැහැදිලි වෙන්නෙ මෙම පනතින් ඒ ගිවිසුම අකුරටම ක්‍රියාත්මක කරන බව නොවෙයි. එතුමා තවදුරටත් කීවෙ, පන්ලක්ෂ විසිපන්දහසක් පමණ ඉන්දියානුවන්, ඉන්දියානු පුරවැසියන් වශයෙන් ලියාපදිංචි කරන අතර තුන් ලක්ෂයක් පමණ ඉන්දියානුවන්ට මෙරට පුරවැසිකම් දී අංග සම්පූර්ණ පුරවැසියන් වශයෙන් පිළිගෙන—ඔවුන්ට ඡන්ද බලයත් දීමට අදහස් කරන බවයි.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
කව්ද කීවෙ?

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)
එසේ කී බව මොහොතකින් ඔප්පු කර දෙන්නම්. අගමැතිතුමා කීවෙ, පිටත් කර හැරීමට නියමිත පන් ලක්ෂ විසි පන්දහසක් පමණ වන ඉන්දියානුවන් එසේ පිටත් කර හරිනතුරු තුන් ලක්ෂයක් පමණ වන ඉන්දියානුවන්ට මෙරට පුරවැසිභාවය දීම කල් දමන්නෙ නැති බවයි. 525 දෙනකු ඉන්දියාවට පිටත් වී යන විට 300 දෙනකුට මෙහි පුරවැසිකම් දීමයි සිරිමා-ශාස්ත්‍රී ගිවිසුම අනුව නියම වී තිබුණේ. ලංකාවේ එවකට සිටි අගමැතිණී සිරිමා බණ්ඩාරනායක මැතිණියත් ඉන්දියාවේ එදා අගමැතිව සිටි දිවංගත ගරු ලාල් බහදූර් ශාස්ත්‍රීතුමාත් ඇති කර ගත් සම්මුතිය ඒකයි. දැන් සිටින අපේ ගරු අගමැතිතුමා ඒ පිළිවෙළ වෙනස් කළා. එසේ වෙනස් කිරීම ගැන එතුමා කරුණු කියා සිටියා. එතුමා විශේෂයෙන්ම පෙන්වා දුන්නේ ඉන්දියානුවන් පිටත් කර හැරීමට විදේශ විනිමය මදි බවත් ප්‍රවාහණ පහසුකම් නැතිකමත් යන කරුණුයි.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
ඒක මා කිව්වේ නැහැ.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)
තමුන්නාන්සේ එදා මා සමග තරහ වෙලා බොහොම තදින් කතා කළා. මගේ පෞද්ගලික රහස් පවා හෙළි කරනවායයි මට තර්ජනය කළා. එහෙත් මා එදා කථා කෙළේ ගරු අගමැතිතුමා තරහ කරන්නට නොවෙයි. මා ඒ අවස්ථාවේදී කථා කරමින් සිටියේ, සිරිමා-ශාස්ත්‍රී අගමැතිවරුන් අතර ඇති වුණු ගිවිසුම වර්තමාන අගමැතිතුමා විසින් වෙනස් කළ පිළිවෙළ මේ ගරු සභාවට පෙන්වා දීමටයි. ඒ පිළිබඳ ප්‍රශ්නයක් අද නැහැ. අප එදා ඒ වැඩ පිළිවෙළට විරුද්ධ වුණා. අප අදත් ඊට විරුද්ධයි. එහෙත් දැන් විරුද්ධ වීමෙන් වැඩක් නැහැ. ගරු අගමැතිතුමාගේ ඒ තර්කයට මා එකඟයි. නැවත වරක් එය ගෙනත් පටලවා ඒ ගැන විස්තර සහිතව කථා කිරීමෙන් දැන් වැඩක් නැහැ. තමුන්නාන්සේලා ක්‍රියා කරන අන්දම වැරදි නම් දැන් ඒ ගැන අපට කරන්නට දෙයක් නැහැ. විරුද්ධ පක්ෂයේ අපට නැවත වරක් ආණ්ඩු බලය ලැබුණොත් ඒ වැඩ පිළිවෙළෙහි සංශෝධනයක් ඇති කොට ඒ වැරදි අප හරිගස්සනවා. එය වෙනම කරුණක්.

අප මෙම ගරු සභාවෙහි නැගිට වචන කිපයක් **කථා** කරන විට, ආණ්ඩුවට අකුල් හෙළන්නට අප එසේ කරනවායයි ගරු අගමැතිතුමාත් උඩුප්පිඩ්ඩි ගරු මන්ත්‍රීතුමාත් (එම්. සිවසිතම්පරම් මයා.) සමහර විට කල්පනා කරනවා ඇති. ඇත්ත වශයෙන්ම එය එසේ නොවෙයි. අපට හිමි ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් අනුව අප කවුරුනුත් බලාපොරොත්තු වන්නේ, මෙම පණත මේ ආකාරයෙන් ක්‍රියාත්මක කිරීමෙන් රටට සිදුවන තරක, ගරු අගමැතිතුමාටත් මේ ගරු සභාවටත් මුළු රටටත් පෙන්වා දීමටයි. අපේ අදහස ඒකයි. මෙයින් රටට තරකක් වන්නේ නැතැයි ආණ්ඩුව කල්පනා කරන නිසා, තමුන්නාන්සේලාගේ වැඩි ඡන්ද බලය අනුව, ටැමිල් කොන්ග්‍රස් එකත් ෆෙඩරල් පක්ෂයත් පමණක් නොව අන්නමලේ, තොණ්ඩමන් ආදී ගරු මන්ත්‍රීවරුනුත් සමග එක් වී කටයුතු කරගෙන යනවා. විරුද්ධ පක්ෂ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඒෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.]
යේ මන්ත්‍රීවරුන් වශයෙන් අප දැන් කථා කරන්නේ ඒ මුල් කාරණය ගැන නිතර නිතර කරුණු කීමට නොවෙයි. දැන් අප කථා කරන්නේ මේ ඉදිරිපත් කොට තිබෙන රෙගුලාසි ගැනයි.

මේ රෙගුලාසිවලට අප විරුද්ධ වන්නේ ඇයි? කොටින්ම කියතොත් මහ පණත හෙවත් මුල් පණත යටතේ අද හස් කර තිබුණේ ඉන්දියානුවන් 5,25,000 ක් මේ රටින් පිට කිරීමයි. එසේ කරන ගමන්ම, පුරවැසිකම් නැතිව මෙහි සිටින ඉන්දියානු ජාතිකයින් 3 ලක්ෂයකට මේ රටේ පුරවැසිකම් දී ඔවුන් මේ රටේ වැසියන් ලෙස පිළිගැනීමටත් සිරිමා-ශාස්ත්‍රී අගමැතිවරුන් එකඟ වුණා. එසේ එකඟ වුණේ, එසේ පිළිගත්තේ, අර 5,25,000 පිට කිරීමේ පරමාර්ථය උඩ මිස ඔවුන් ලංකාවෙහි නතර කර ගැනීමේ පරමාර්ථය උඩ නොවෙයි. ඇත්ත වශයෙන්ම මේ පිළිබඳව පළමුවැනි ප්‍රශ්නය මතු වුණේ මේ කට යුත්ත බලහත්කාරකමින් කරනවාද, දෙපක්ෂයේ කැමැත්තෙන් කරනවාද යන්න ගැනයි. බලහත්කාරකමින් මෙය කිරීම තමා පිළිගන්නේ නැති බව ගරු අගමැතිතුමා මීට ඉහත ප්‍රසිද්ධියේ කියා තිබෙනවා. හොඳයි, ඒ අදහසත් අපි පිළිගනිමු. ඒ කියන්නේ යම් කිසි පුද්ගලයෙක් ඉන්දියාවට යන්න කැමති නම් ඒ මනුස්සයට නිදහස තිබෙන්න ඕනෑ ඉන්දියාවට යන්න. ඉන්දියාවෙ පුරවැසිකමක් ලබාගත්තට පස්සෙ හෝ වේවා, ඊට කලින් හෝ වේවා, අද වතුකරයේ පුරවැසිභාවය නොමැත්තන් අතරේ—අපේ හැඟීමේ හැටියට, ලංකාවේ හැඟීමේ හැටියට පුරවැසිභාවය නොමැති කෙනකු යනුවෙන් අපි මොහොතකට හංවඩු ගසමු—යම් ඉන්දියානුවකු සිටිනවා නම් ඉන්දියාවට ආපසු යාමට ඒ මනුස්සයාට නිදහස දිය යුතුයි. ගරු අගමැතිතුමා බල කරන්න කැමති නැත් නම් ඒක වෙනම ප්‍රශ්නයක්. ගරු අගමැතිතුමා තමයි මේ නීති ක්‍රියාත්මක කරන්නේ, අප නොවෙයි. අගමැතිතුමා කියනවා නම් බලහත්කාරයෙන් කාටවත් යන්න කියන්නෙ නැත කියා, රටේ පාලනය අගමැතිතුමාට භාර නිසා එතුමාගේ හැඟීම අනුව ක්‍රියා කරන්න ඕනෑ.

මා පෙන්වා දෙන්නේ මෙන්න මේ කාරණයයි. මෙම රෙගුලාසි මාලාවේ හරි පුදුම වගන්තියක් තිබෙනවා. එනම් 11 වෙනි වගන්තියයි. අපි එය කියවා බලමු:

"11. පනතේ 15 (1) වන වගන්තියේ කාර්යයන් සඳහා සිය රටට පෙරළා යැවීමට යටත් තැනැත්තකු විසින්, පනතෙහි 13 (2) වන වගන්තිය යටතේ වූ දැන්වීම තමා වෙත භාර කරනු ලැබූ දිනයේ සිට මාස දෙකක් ඇතුළත පදිංචිවීමේ අවසර පත්‍රයක් ලබාගැනීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය කොමසාරිස් වෙත ලැබෙන සේ ඔහු වෙත ඉදිරිපත් කළ යුතුය."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වගන්තිය තවදුරටත් පැහැදිලි කර ගැනීම පිණිස ඉංගිරිසියෙන් තිබෙන්නේ කෙසේද කියා මා ඉංගිරිසි වගන්තියත් බැලුවා. අපි ඒ වගන්තියත් කියවා බලමු:

"For the purposes of section 15 (1) of the Act, a person liable to repatriation shall apply to the Commissioner for the issue of a residence permit, so that such application reaches the Commissioner within two months of the date on which the notice under section 13 (2) of the Act is served on him."

මා දන්නේ නැහැ, නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සේටත් අවබෝධ වන්නේ මට අවබෝධ වන දේමද කියා. මේ වගන්තියෙන් මට පෙනී යන්නේ මේ රටේ පුරවැසිභාවය නොමැති වතුකරයේ සිටින යම් කිසි පුද්ගලයෙක් ඉන්දියානුවකු වශයෙන් පුරවැසි බව ලැබුවාට පස්සේ—ඒ කියන්නේ ඉන්දියාවට පිට කළ යුතු කෙනකු හැටියට "බී" ලැයිස්තුවට වැටුණාට පස්සේ—ඉන්දියානු පුරවැසිභාවයත් සහිතව ඒ පුද්ගලයාට 11 වෙනි වගන්තිය යටතේ අයිතියක් යුතුකමක් තිබෙනවා ලංකාවේ නැවතීම පිණිස බලපත්‍රයක් ඉල්ලන්න. නීතියෙන්ම එය බල කර තිබෙනවා. නීතියෙන් කියනවා, ඔබ යන්න කැමති වුණත්, නැවතීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ යුතුමයි කියා.

ගරු ඩඩ්ලි සේනානායක
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
නැහැ, නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

නැවත කියවා බලන්න. මම ඒ කොටස නැවත කියවා පෙන්වන්නම්:

"For the purposes of section 15 (1) of the Act, a person liable to repatriation shall apply to the Commissioner for the issue of a residence permit ......"

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

Because a person cannot stay a day here without a T.R.P. The moment he becomes an Indian citizen he must have a T.R.P.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

ගරු අගමැතිතුමාට නොයෙක් හේතු කියන්න පුළුවන්. මා මෙය පෙන්වා දෙන්නේ තර්කානුකූලවයි; නීත්‍යානුකූලවයි. එතකොට අගමැතිතුමා කියන විධියට එහෙම නම් මාස දෙකක් ඉන්න පුළුවන්. තමුන්නාන්සේගේ මේ රෙගුලාසිය යටතේ මාස දෙකක් ඉන්න පුළුවන්. දවසක් නවතින්න බැරි නම් මාස දෙකක් දී තිබෙන්නේ ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කරන්නද?

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

He has sent an application!

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

මේ රෙගුලාසිය යටතේ, නියෝජ්‍ය කථානායකතුමනි, යන්න කැමති උදවියටත් අපි නීතියෙන් බල කර කියනවා "තමුසේලා ඉල්ලුම්පත්‍රයක් දාන්න ඕනෑ, ඉල්ලුම් පත්‍රයක් දාන්නේ නැතුව ඉන්න බැහැ කියා. එවැනි කෙනෙක් ඉන්නවා නම්, බල කිරීමෙන්, තුවක්කුව එල්ල කර වෙඩි තැබීමෙන් ලංකාවෙන් පිට කිරීමට අගමැතිතුමා අකමැති බව පැහැදිලියි; අපි එය තේරුම් ගෙන අවසානයි. ඒ අදහස් හරි හෝ වේවා වැරදි හෝ වේවා දැනට සම්මත වී තිබෙනවා. අගමැතිතුමාටයි ආණ්ඩුවටයි ඒක භාර. ඇයි අපි එසේ නම් මේ රෙගුලාසි මාලාව යටතේ "කළ හැකිය" කියා නොදමන්නෙ? ඕනෑම ඉන්දියානු පුරවැසිභාවය ලැබූවකුට මාස දෙකක් ඇතුළත ලංකාවේ පදිංචිවී සිටීමට බලපත්‍රයක් ලබා ගැනීම සඳහා කොමසාරිස් වරයාට ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ හැකිය කියා නොදමන්නෙ ඇයි? එහෙම නොවෙයි මෙතැන සඳහන් කර තිබෙන්නෙ. මෙතැන තිබෙන්නෙ "කළ යුතුයි" කියායි. දැන් මේ නීති සාදන උදවිය හොඳට දැනගෙනයි නීති සාදන්නෙ. තොන්ඩමන් ගරු මන්ත්‍රීතුමාත් අන්නමලේ ගරු මන්ත්‍රීතුමාත් කෙරෙහි අගමැතිතුමා තුළත් එතුමාගේ ජාතික රජය තුළත් එතුමාගේ පක්ෂය තුළත් ලොකු බලාපොරොත්තුවක් තිබෙන බවයි අපේ හැඟීම. ඒ කියන්නේ මේ රජයේ වැදගත් කොටස්කරුවන් වශයෙන් තොන්ඩමන් ගරු මන්ත්‍රීතුමාත් අන්නමලේ ගරු මන්ත්‍රීතුමාත් සිටිනවා. ජාතික රජයට ඒ අයගේ ඡන්ද බලය ඉතාමත්ම වැදගත්.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

මේ අයට ඡන්දයක් නැහැ.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

මේ අයට ඡන්දයක් නැහැ. නමුත් තොන්ඩමන් ගරු මන්ත්‍රීතුමාගේත් අන්නමලේ ගරු මන්ත්‍රීතුමාගේත් ඡන්දය ලබා ගැනීමට මේ අය කෙසේ හෝ ලංකාවේ රඳවා ගත යුතුයි. ඒකයි වෙලා තියෙන්නෙ. ඒකයි තිබෙන කරදරය. ඒ අපේ හැඟීමයි. අපේ හැඟීම වැරදි වෙන්නට පුළුවනි. තුන් ලක්ෂයකට ඡන්ද බලය දීමේ පරමාර්ථය උඩ ක්‍රියා කර අනිත් පන් ලක්ෂ විසි පන් දහස පිට කළොත් තොන්ඩමන් ගරු මන්ත්‍රීතුමාත් අන්නමලේ ගරු මන්ත්‍රීතුමාත් විරුද්ධ වී ආපසු යනවා. එමනිසා පන් ලක්ෂ විසි පන් දහස කෙසේ හෝ ලංකාවේ ඉතිරි කර ගත යුතුයි. එසේ ඉතිරි කර ගැනීමට අගමැතිතුමා අපට කියනවා "මට ප්‍රවාහණ පහසුකම් නැහැ, විදේශීය විනිමය නැහැ" කියා.


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

ප්‍රවාහණ පහසුකම් ගැන මා වචනයක් වත් කිව්වේ නැහැ.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

බැරිවීමකින් වෙන්නට පුළුවනි, තමුන්නාන්සේ එහෙම කිව්වා. මමත් සිටි අවස්ථාවක පාර්ලිමේන්තුවේදී එහෙම කිව්වා. ඒ ගැන දැන් ගහගැනීමෙන් වැඩක් නැහැ. මට මතක හැටියට තමුන්නාන්සේ එහෙම කිව්වා. තමුන්නාන්සේ එහෙම කිව්වේ නැත කියනවා නම් මා ඒකත් භාර ගන්නට ලෑස්තියි. එමනිසා ඒ ගැන තර්කයක් ගහගැනීමක් වුවමනා කරන්නේ නැහැ. මා කියන්නේ මේකයි. එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්තිත් අපේ ප්‍රතිපත්තිත් ටිකක් වෙනස්. අප කල්පනා කළේ පන් ලක්ෂ විසිපන් දහස පිට කරන්නටයි. තුන් ලක්ෂයක් පිළිගන්නවයි. නමුත් එක්සත් ජාතික පක්ෂය කියන්නේ නොයෙක් හේතූන් උඩ—ඒ හේතූන් කෙසේ වෙතත්—ප්‍රවාහණ පහසුකම් නොවේය කියා ගරු අගමැතිතුමා දැන් කියනවා—හේතුව විදේශීය විනිමය හිඟය පමණලු. හොඳයි, ඒකත් පිළිඅරගෙන මා කියන්නේ මේකයි. අගමැතිතුමා කියන්නේ මම තුන් ලක්ෂයක් ගන්නවා, අනික් පන් ලක්ෂ විසි පන් දහස ඉන්දියානුකාරයින් හැටියට ලියා පදිංචි කරනවා, ඒත් ඔවුන්ට ලංකාවේ රැඳෙන්නට ඉඩ දෙනවාය යන්නයි. ඉඩ දෙනවා පමණක් නොවෙයි, මේ රෙගුලාසිය යටතේ බලපත්‍රයක් ලබා ගැනීමට යුතුකමකුත් ඇති කරනවා. මුල් පනතේ 15(1) වගන්තිය යටතේ එවැනි ඉල්ලුම් පත්‍රයක් දැමූ වහාම බලපත්‍රයක් දෙන්නට කොමසාරිස් වරයාට යුතුකමක් තිබෙනවා. බලපත්‍රය නොදී සිටීමට බැරි බවයි අපට පෙනෙන්නෙ. ඉංගිරිසි පිටපතක් පමණයි මා ළඟ තිබෙන්නෙ. මා එයින් කියවන්නම්:

" ...... Upon the receipt of such application, the Commissioner shall issue such permit to such person authorizing him to remain in Ceylon for such period and subject to such conditions (if any) as the Commissioner may, in his absolute discretion, determine. "



ඒ කියන්නෙ කොන්දේසි දමා තිබෙනවා. මේ ඉල්ලුම්කරුට ලංකාවේ සිටීමට බලපත්‍රයක් දෙන්නට කොමසාරිස් වරයාට යුතුකමක් තිබෙනවා.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

What is he staying as ? If he has a T. R. P. what is he staying as ?

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

මාස දෙකකට කොහොමද ඉන්නෙ ?

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

He has made his application.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

ඒක හරි. නමුත් මාස දෙක අවසාන වන විට ඉල්ලුම් පත්‍රය දමන්නට පුළුවනි.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

As a Stateless man he now becomes an Indian citizen ; so he must have some document such as a T.R.P.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

ඉතින් මේ මනුෂ්‍යයා කඩදාසි කෑල්ලක් නැතිව කොහොමද මාස දෙකක් ඉන්නෙ ? අගමැතිතුමාගේ තර්කය උඩම මාස දෙකකට ඉඩ දෙනවා නොවැ, බලපත්‍රය ලබා ගැනීමට ඔය ඉල්ලුම් පත්‍රය දමන්නට. ඒ මාස දෙක කොහොමද ඉන්නෙ ? ඒ මාස දෙක ඉන්නෙ මොන බලපත්‍රයක් උඩද ? මේක නීති ප්‍රශ්නයක් නොවෙයි. ඇයි අපට මේ රෙගුලාසියේ දමන්නට බැරි, ඕනෑම ඉන්දියානුකාරයකුට, ඉන්දියානුකාරයකු හැටියට ලියාපදිංචි වූවාට පසු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මාස දෙකක් ඇතුළත ඉල්ලුම් පත්‍රයක් දමීම කළ හැකිය කියා? ඇයි කළ යුතුයි කියා දමන්නෙ? ඒකයි අපේ ප්‍රශ්නය.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
**(The Hon. Dudley Senanayake)**
ටී. ආර්. පී. එක උඩ තමයි අපට යවන්නට පුළුවන් වෙන්නෙ.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
**(Mr. F. R. Dias Bandaranaike)**
ටී. ආර්. පී. එකක් නැතුව සිටිනවා නම් කෙසේද යවන්නේ ?—[බාධාකිරීමක්] එසේ නම් ඇයි බලපත්‍රයක් නැතුව මාස 6 ක් ඉන්න බැරි? නීතියෙන් ලබාගත් කඩදාසියක් පෙන්වන්නේ නැතුව එක් දවසක්වත්, එක් විනාඩියක්වත්, එක් මොහොතක්වත්, ලංකාවේ සිටින්නට බැරිය කියනවා. ඇයි ගරු අගමැතිතුමා මාස දෙකකට ඉඩ දෙන්නේ ?

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
**(The Hon. Dudley Senanayake)**
ඒක ප්‍රශ්නයක්ද ?

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
**(Mr. F. R. Dias Bandaranaike)**
මම තමුන්නාන්සේගෙන් ගෞරවයෙන්, ආදරයෙන්, ඉල්ලා සිටින්නේ මෙයයි: ඇයි තමුන්නාන්සේ "කළයුතු" කියන වචනය දන්වත් වෙනස් නොකරන්නේ ? එතැනට "කළහැකි" කියා යොදන්න. මෙම උදවියට බලපත්‍රයක් ඉල්ලන්න ඉඩ දීමට තමුන්නාන්සේ අදහස් කරනවා නම් අප ඒකටත් විරුද්ධ වන්නේ නැහැ. මුල් පනතට විරුද්ධ වුණා වාගේම එම ප්‍රශ්නය උඩ අපි මේ රෙගුලාසිවලටත් විරුද්ධයි. මේ රෙගුලාසි තව දුරටත් යනවා. විශේෂයෙන්ම නීතියෙන් බල කරනවා, මේ උදවියට බලපත්‍ර ලබා ගැනීමට. බලපත්‍රයක් වුවමනා කරන්නේ නැති කෙනෙකුට වුවත් මේ අනුව බලපත්‍රයක් ඉල්ලන්න යුතුකමක් තිබෙනවා. යමෙකුගේ නම ඉන්දියානු පනතට අනුව වැටුණාම ඒ තැනැත්තා කල්පනා කරන්නේ කුමක්ද? "අගමැතිතුමා තලේ මන්නාරම් දුම්රියෙන් මාව පිටත් කරාවිය" කියන එකයි, ඔහු බලාපොරොත්තුවෙන් සිටින්නේ. එවැනි කෙනෙක් සිටිනවා නම් ඒ මනුෂ්‍යයාටත් යුතුකමක් තිබෙනවා බලපත්‍රයක් ඉල්ලන්න, මාස දෙකකට. එවැනි කෙනෙක් ඇවිත් ගරු අගමැතිතුමාට වැඳ නමස්කාර කර ඉල්ලීමක් කළොත් මොකද කරන්නේ ? එවැනි කෙනෙක් දෙමළෙන් ඒ ඉල්ලීම කරාවි. හබරාදූවේ ගරු මන්ත්‍රීතුමා (ප්‍රින්ස් ගුණසේකර මයා.) ඒ ඉල්ලීම දෙමළෙන් කියන්නට දැනගත්තත්, මා නම් ඒ ඉල්ලීම දෙමළෙන් කියන්නට දන්නේ නැහැ. "අනේ ගරු අගමැතිතුමනි, මාව පිට කරන්න; මට බලපත්‍රයක් ලබා ගන්නට වුවමනා නැහැ; මේ රටේ මට විනාඩියක් හෙයින් කරුණා කර මාව පිට කරනු මැනවි" යනුවෙන් කියන්නට පුළුවනි. එසේ කිව්වත්, අගමැතිතුමාගේ නීතිය යටතේ කොමසාරිස්වරයා කියන්නේ කුමක්ද ? "එහෙම කරන්නේ කොහොමද ? තමුසේ පළමුවෙන්ම බලපත්‍රයක් ඉල්ලන්න, මාස දෙකක් ඇතුළත" යනුවෙන් ඔහු කියන්නට පුළුවනි. ඔහුට යුතුකමක් තිබෙනවා, බලපත්‍රයක් ඉල්ලන්න. එතකොට තත්ත්වය කෙසේද? මේ මනුෂ්‍යයාට බලපත්‍රයක් නොමැතිව මොහොතකටවත් ලංකාවේ සිටින්නට බැරිය කියා අගමැතිතුමා කියනවා. එහෙත් ඔහු කියනවා, මම බලපත්‍රයක් ඉල්ලන්නේ නැත, කියා. ඒ අනුව ඔහු නීතිය කඩනවා. ඔහු නීතියට විරුද්ධවයි ක්‍රියා කරන්නේ. මේ රෙගුලාසිය පාර්ලිමේන්තුවේදී සම්මත වුණායින් පස්සේ යුතුකමක් තිබෙනවා, ඒ බලපත්‍රය ලබා ගන්නට. එහෙත් ඔහුට වුවමනා කරන්නේ ඉන්නට නොවෙයි. ඔහුට වුවමනා කරන්නේ යන්නටයි. ඒකෙන් වන දේ බලන්න.

වර්තමාන ආණ්ඩුව මේ නීති මාලාව මගින් අපට කියන්නේ කුමක්ද? අපි හැමදාම කිව්වේ තමුන්නාන්සේලා මේ පත්ලක්ෂ විසිපත් දහස පිට කරන්නේ නැති බවයි. එසේ කරන්නට අදහසක් තිබුණත්, මේ විධියට නීතිගත කිරීම අනවශ්‍යයි නේද? "කළහැකි" කිව්වොත් වැඩේ හරි නේද? මොකටද "කළයුතු" යනුවෙන් කියන්නේ ? ඒකයි අපේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රශ්නය අප කතා කරන්නේ රෙගුලාසි අනුවයි. පනතට අපේ විරුද්ධත්වය අදත් පවතිනවා. ඒක අඩු වන්නේ නැහැ. පනත පාර්ලිමේන්තුවේදී සම්මත වුණු පලියට අපි එය හොඳයි කියන්නේ නැහැ. සිරිමා බණ්ඩාරනායක මැතිණියත් ලාල් බහදූර් ශාස්ත්‍රී මැතිතුමාත් අතර සම්මත කරගත් නීතිය නැති නම් සම්මුතිය නොවෙයි මෙය. ඒකයි, අපි එදත් කිව්වේ. මෙය දෙපැත්තටම නමින් පමණක් පුරවැසි භාවය දීමක් පමණයි. පන්ලක්‍ෂ විසිපන් දහසක් ඒ පැත්තට. තුන් ලක්‍ෂයක් මේ පැත්තට. එහෙත් අටලක්‍ෂ විසිපන් දහසම පදිංචි ලංකාවේ.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
ඒක නම් බොරුව.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)
එසේ නම් පිට කරන්නට ඕනෑ නේද? මේ රෙගුලාසි මාලාවේ පිට කිරීම ගැන වචනයක්වත් නැහැ.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
ක්‍රියාවේ යෙදෙන විට ඒ වචන බොරු වෙනවා.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)
"ඉන්දු-ලංකා ගිවිසුම ක්‍රියාවට නැගීමේ නියෝග" යනුවෙන් මෙහි සඳහන් වෙනවා. අපේ මුල් පනතේ නැති නම් මහ පනතේ වැදගත් කොටසක් මා කියවන්නට කැමතියි. ඒ මෙසේයි:

"Part iv—Removal of Persons to India from Ceylon."

මෙය සඳහන් වන්නේ මහ පනතේ 9 වන පිටුවේයි. ගරු නියෝජ්‍ය කථානායක තුමනි, එහෙම එකක් තිබෙනවා නම් ඒකත් මහ පනතේ කොටසක් හැටියට ක්‍රියාත්මක කිරීම අවශ්‍ය නේද? එයත් ක්‍රියාවට නැගීමට සුදුසු දෙයක් නොවේද? මෙහි "Part IV" වලට අදාළව වචනයක්වත් නැහැ. අනික් කොටස් සියල්ලම ක්‍රියාවට නැංවීම සඳහා මෙම පනතේ මේ රෙගුලාසි මාලාවේ යම් යම් කොටස් තිබෙනවා.

එහෙත් පිට කිරීම ගැන නම් වචනයක්වත් නැහැ.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
එයට රෙගුලාසි වුවමනා නැහැ. බලය සම්පූර්ණයි.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)
ඒක තමයි මාත් කියන්නේ. රෙගුලාසි වුවමනා නැහැ. තිබෙන එකම එක රෙගුලාසිය නම් පිට කළ යුතු උදවියට යුතුකමක් තිබෙනවා ලංකාවේ සිටීමට බලපත්‍රයක් ලබා ගැනීමට. ඒකයි අපේ විරුද්ධත්වය. ඒ කියන්නෙ, දමා තිබෙන කොටස කැල්ල ඉතිරි කරගෙනයි දමා තිබෙන්නේ. ඔය ගිවිසුම ඔප්පු කිරීම පිණිස සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට හැම අවස්ථාවකදීම උසාවියට යන්නට සිදු වේය කියන එකයි ගරු හබරාදුව මන්ත්‍රීතුමාගේ අදහස. අධිනීතිඥයකු වශයෙන් එතුමා යම් අදහසක් ඉදිරිපත් කළා. තවත් අධිනීතිඥයකු වන උඩුප්පිඩ්ඩි මන්ත්‍රීතුමා (එම්. සිවසිතම්පරම් මයා.) තවත් අදහසක් ඉදිරිපත් කළා. මා දන්නා හැටියට නම් මරණයට පත්වූ කෙනෙක් කළ ගිවිසුමක් හෝ අදාළ කඩදාසියක් උසාවියකට ඉදිරිපත් කරන්නට අදහසක් තිබෙනවා නම් එය ඉදිරිපත් කරන්නට පුළුවන් වන්නේ සාක්‍ෂි ආඥා පනතේ 32 (3) වගන්තිය යටතේ පමණයි. ඒ කියන්නේ ඒ මරණයට පත්වූ පුද්ගලයාට විරුද්ධව ඔහුගේ අයිතිවාසිකම් වලට හෝ ප්‍රයෝජනයට හෝ විරුද්ධව කරන ප්‍රකාශනය උසාවියකට ඉදිරිපත් කළ හැකියි. ඇත්ත වශයෙන්ම ඒ ගිවිසුම ඉන්දියාවේ අගමැති හැටියට ශාස්ත්‍රී අගමැතිතුමාගේ ප්‍රයෝජනයට හෝ අයිතිවාසි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කම්වලට විරුද්ධයි. පන් ලක්ෂ විසිපන් දහසක් පිළිගන්න උන්නැහේට සිදු වුණා. ඒ නිසා ඕනෑම අවස්ථාවක එය ඒ වගන්තිය යටතේ ඉදිරිපත් කරන්නට පුළුවන්. මගේ හැඟීමේ හැටියට ගරු හබරාදුව මන්ත්‍රීතුමාගේ අදහස වැරදියි. මේ දැන් තිබෙන පනත යටතේ නම් අවාසියක් නැහැ. සම්පූර්ණයෙන්ම ඉන්දියාවේ වාසි යටයි පෙරළී තිබෙන්නේ. එක්කෙනෙක් වත් ආපසු යැවීමේ ලකුණක්වත් තවම පෙනෙන්නට නැහැ. යුතුකමක් වශයෙන් අපි ඒ අයට නීතියෙන් බල කරනවා යන්න ඕනෑ වුණත් මෙහි නවතින්නය කියා. යන්නම බැහැ. මෙහි ඉන්න අපි බලපත්‍රයක් දෙනවාමයි. මාස 2 ක් ඇතුළත බලපත්‍රයක් ඉල්ලන්නම ඕනෑ කියා කියනවා. එපමණක් නොවෙයි 15 (1) වගන්තිය යටතේ බලපත්‍රයක් දෙනවාමයි. කොන්දේසියක් ඇතුළත් කර පිටවී යෑම නවත්වනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Does not "liable to repatriation" help?

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

"Liable to repatriation" does not help one wav or another.

ගරු නියෝජ්‍ය කථානායකතුමාට ඉංග්‍රීසියෙන් පිළිතුරු ඕනෑ නිසා මා ඉංගිරිසියෙන් පිළිතුරු දෙන්නට ඕනෑ. එයට සමා වෙන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමාට එක්තරා ප්‍රශ්නයක් ඉංගිරිසියෙන් පැහැදිලි කර දෙන්නට ඕනෑ. එතුමාට ලෙහෙසියෙන් අවබෝධ කර ගන්නට පුළුවන් භාෂාව වන ඉංගිරිසියෙන් එතුමා හට එය පැහැදිලි කර දෙන්නට ඕනෑ.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමාටත් ඉංගිරිසියෙන් හොඳට කියන්න පුළුවන් නිසයි මා ඉංගිරිසියෙන් ඇසුවේ.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

මා හිතන හැටියට භාෂා දෙකෙන්ම මට සැහෙන ප්‍රමාණයකට පුළුවන්.

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන**
*(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன)*
(The Hon. D. P. R. Gunawardena)

පැහැදිලි නැහැ.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

තමුන්නාන්සේට නම් කිසිම දෙයක් පැහැදිලි නැති බව අපි දන්නවා. මොනවා කරන්නද? [බාධාකිරීමක්] මා තමුන්නාන්සේගේ ගෝලයෙක් නොවෙයි.

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන**
*(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன)*
(The Hon. D. P. R. Gunawardena)

ගෝලයෙක් නොවෙයි. හොඳ ගුරුන්නාන්සේ කෙනෙක් සොයාගෙන සිංහල ඉගෙන ගන්න.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

මොනවා කළත් ගුරුවරයා හැටියට මා තමුන්නාන්සේ නම් තෝරා ගන්නේ නැහැ. [බාධාකිරීමක්] ගරු අගමැතිතුමා ගැන ගරු රාජ්‍ය ඇමතිතුමා ගැන තමුන්නාන්සේ පාවිච්චි කරන වචන මා නම් කවදාවත් පාවිච්චි කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම තමුන්නාන්සේට ඉංගිරිසි භාෂාවෙන් පැහැදිලි කරන්නම්:

The term "liable to repatriation" is used in Part III of the Indo-Ceylon Agreement (Implementation) Act, No. 14 of 1967. There are two terms used there. "Liable to repatriation" is one and "liable to removal" the other. You will find that term "liable to removal" in sub-sections (3) and (4) of

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Section 15. They are two different things—"liable to removal" and "liable to repatriation". "Liable to repatriation" is only a concept in words. It relates to a man whose name is entered on a register, a man picked out of the stateless group who, by the *fiat* of the Prime Minister, becomes an Indian citizen registered in Block B in the documents; and having been so registered he then becomes a person liable to repatriation in name.

But in certain eventualities under sections 15 (3) and 15 (4) he becomes a person liable to removal. Now he becomes liable to removal only if the residence permit we are talking about has expired or if the conditions have been violated. In other words, he remains a person liable to repatriation, in suspended animation as it were, living in Ceylon on a residence permit but not actually liable to go in spite of his name being registered. He is liable to be kept behind as a person liable to repatriation. That is the legal position. But he becomes liable to removal under sections 15 (3) and 15 (4) the moment the residence permit expires or is cancelled or where he has violated the conditions, I suppose, by being a naughty boy and violating the Brothels Ordinance or something, like that, as the hon. Member for Uduppiddi (Mr. M. Sivasithamparam) said. Unless he does one of those things, he does not become liable to removal.

Now when a person is liable to removal a different situation arises. That person then becomes liable to go physically. He becomes liable to be taken to the Slave Island Camp or something like that, put on a train and taken to Talaimannar and shipped bodily across the Palk Strait to the southern shores of India. Now that is "liable to removal" as distinct from "liable to repatriation".

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒකයි මගේ අදහස.

What I am trying to show you is that "liable to repatriation" in this Act is only a concept in words. It does not have anything to do with physical repatriation in that sense. It is a liability on paper the moment he acquires Indian citizenship. The repatriation certainly will depend on the length of period mentioned in the residence permit. If he has a residence permit for 25 years, then he will not be repatriated for 25 years.

ගරු ඩඩ්ලි සේනානායක
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

Why give him a residence permit for 25 years? In the first instance, you cannot give a temporary residence permit for 25 years.

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

There is nothing in this law which says that the residence permit is for any time limit. It is subject to any conditions which the Commisssioner may nominate under Section 15 (1).

ගරු ඩඩ්ලි සේනානායක
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

A temporary residence permit is given under another law.

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

It is under this law that he has got to apply and not under any other law.

Where the Indo-Ceylon Agreement (Implementation) Act is concerned, we are told that he must apply to the Commissioner. The Commissioner is defined as whom? "Commissioner for the purposes of this Act"—not any other Commissioner. The law requires that he must apply for a residence permit under this law and the permit is to be subject to such

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

conditions as the Commissioner may see fit to name. Under the laws so far introduced in Parliament, there are no limitations on the conditions that the Commissioner may put in. The Commissioner can give you a permit theoretically—I do not know whether he will—to stay here for a lifetime. He can do that under the law as it stands. There is nothing in this law which says that a person must apply for a residence permit under some other Act. He is told to apply for a permit under Section 15 (1), and Section 15 (1) talks not about a temporary residence permit but a residence permit.

15 (1) වගන්තිය යටතේ තාවකාලික ලෙස පදිංචි වීමේ බලපත්‍රයක් ගැන වචන යක්වත් නැහැ. 15 (1) වගන්තිය යටතේ ඇති බලපත්‍රය පදිංචිවීමේ බලපත්‍රයක් පමණක් හැටියටයි තිබෙන්නේ. වෙන කිසිම නීතියක් යටතේ මේ බලපත්‍රයක් ගැන වචනයක්වත් නැහැ. ඒ නීතිය යටතේ, කොමසාරිස්වරයාට ඕනෑම කොන් දේසියක් ඇතුළත් කරන්නට පුළුවනි. එහි කිසිම සීමාවක් නැහැ. වුවමනා නම්, කෙනෙකුට අවුරුදු 25ක් නැත්නම් 30ක් පදිංචි වීමට බලපත්‍රයක් දෙන්නට බලයක් කොමසාරිස්වරයාට තිබෙනවා. ඒ සම්බන්ධව කිසිම තහනමක් නැහැ.

මොහොතකට පෙර මේ සභා ගර්භයෙන් පිට වී යෑමට පෙර ගරු අගමැතිතුමා කථා කළ අවස්ථාවේදී එතුමා කියා සිටියේ ඒ බලපත්‍රය ලබා ගන්නට තිබෙන්නේ වෙනත් නීතියක් යටතේ බවයි. එය තාවකාලිකව පදිංචි වීමේ බලපත්‍රයකැයිද ගරු අගමැතිතුමා කිව්වා. එහෙත් ගරු අග මැතිතුමා පැහැදිලි ලෙස එතුමාම ක්‍රියාත් මක කරවන්නට බලාපොරොත්තු වන නීති යම එතුමා කියවා නැහැ. වෙනත් නීතියක් යටතේ බලපත්‍රයක් ලබා ගන්නට තිබෙන වා නම් ඒ කවර පනතක්ද යන්න මේ නීතියෙහිම සඳහන් වන්නට ඕනෑ. වෙන පනතක් ගැන මේ පනතේ වචනයක්වත් නැහැ. 15 (1) වගන්තිය යටතේ කවුරු වත් කියා නැහැ, Immigrants and Emigrants Act of 1948 නමින් කියෑ වෙන නීතිය යටතේ තාවකාලික බල පත්‍රයක් ලබා ගත යුතු බවක්. ප්‍රශ්නයක් නැහැ. එහි තිබෙන්නේ බලපත්‍රය ගැන පමණයි.

මේ රෙගුලාසි මාලාව යටතේ මේ අය අපේ රටේ රඳවා ගන්නවා මදිවාට "තමුසේලා මේ රටේ නවතින්නටම ඕනෑ" යනුවෙන් ඒ අයට බල කරනවා. ගරු අග මැතිතුමා මේ කොටස ඉවත් කරන්නට අකැමැතියි කියනවා නම්, කරුණා කර සංශෝධනයක්වත් ඉදිරිපත් කරන්න. බලපත්‍රයක් ලබා ගත හැකියි යනුවෙන් සඳහන් කරන්න. "යුතුය" යන්න වෙනු වට "හැකිය" යනුවෙන් සංශෝධනයක් ඇති කරන්න. මේ ආකාරයට තිබුණොත් අපේ සිංහල ජනතාවට අවබෝධ වන්නේ එකයි. ඒ මොකක්ද? මේ රටින් පිට වී යන්නට කැමැති උදවියටවත් පිට වී යෑමට ඉඩ නොදෙන බවයි. මොනවාටද එවැනි නක් තිබෙන්නේ ?

මගේ කල්පනාවේ හැටියට නම් මේ පනත සකස් කර තිබෙන්නේ නීති උප දේශක මහත්වරුන්ගේ අදහස් පමණක් විමසීමෙන් පසු නොවෙයි. එය සකස් කිරීමේදී දේශපාලන බලපෑම්ද ඇති වන්නට ඉඩ තිබෙනවා. එසේම සිදුවන්න ටත් ඇතැයි මා කල්පනා කරනවා. දේශ පාලනඥයන් සමග මෙවැනි නීතියක් සකස් කිරීමේදී සාකච්ඡාවල් කරන්නට ඇති. ශාඛා සමිති සමගත් සාකච්ඡා පවත් වන්නට ඇති. අපේ පක්ෂයේත් ශාඛා සමිති තිබෙනවා. ඒවාත් එක්කත් සාකච්ඡා කරන්නට ඇති. අනෙක් පක්ෂ නායකයනුත් සමගත් සාකචඡා කරන්නට ඇතැයි මා කල්පනා කරනවා. ගරු අග මැතිතුමා අනෙක් පක්ෂ නායකයන් සමග මෙය සාකච්ඡා කරන්නට ඇති. ළඟදී අපට ආරංචියක් ලැබුණා, පළාත් පාලන නීති සම්පාදනය කරන විට ජාතික අණ්ඩුවට අයත් පක්ෂවල නායකයන් සමග ගරු අගමැතිතුමාගේ "වුඩ්ලන්ඩ්ස්" නිවසේදී —වුඩ්ලන්ඩ්ස් මන්දිරයේදී—ඒ ගැන සාකච්ඡා ඇති වුණාය කියා. ඒ වාගේම මේ ගැනත් සාකච්ඡා ඇති වන්නට ඇති. විශේෂයෙන්ම ඉන්දියානුවන්—වතුකර යේ සිටින උදවිය—කෙරෙහි බලපාන නීති යක් හැටියට පිළිගනු ලබන මේ නීතිය වැනි නීතියක් සකස් කරන විට සාකච්ඡා ඇති වන්නට ඇති. එහෙම සාකච්ඡා ඇති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වුණාය කියන්නට පුළුවනි. විශේෂයෙන් තොන්ඩමන් මන්ත්‍රීතුමාත්, අන්නාමලෙයි මන්ත්‍රීතුමාත් ඊට එක් වන්නට ඇති. ඒ ගරු මන්ත්‍රීන්ගේත් අදහස් විමසන්නට ඇති.

පසුගිය මහා මැතිවරණ කාලයේදී වතු කරයේ ඡන්දදායකයන් වෙත කරුණු ඉදිරිපත් කළ ආකාරය ගැන අප දන්නවා. තොන්ඩමන් මන්ත්‍රීතුමා දුන් පොරොන්දුත් මේ රටේ ජනතාව දන්නවා. එතුමා ඒ දවස්වල නැවක පින්තූරයක් පෙන්වා ඡන්දදායකයන්ට කිව්වේ මොකක්ද? අතට ඡන්දය දෙනවා නම් මේ නැවයි ලැබෙන්නේ අලියාට ඡන්දය දෙනවා නම් ලංකාවයි ලැබෙන්නේ යනුවෙන් නොවෙයිද? ඒ කියන්නේ මේ ගිවිසුම හංවඩු ගැහැව්වේ කොයි විධියටද? රක්ෂාවල් ඇති අය වුවත්, රක්ෂාවල් නැති අය වුවත්, ඒ කොයි කවුරුන්ගෙන් වුවත් එක් කෙනෙක්වත් මේ රටෙන් පිට කරන්නේ නැහැ කියායි එදා කිව්වේ. තොන්ඩමන් මන්ත්‍රීතුමා එදා එහෙමයි කිව්වෙ. මේ ගිවිසුම තෝරා දුන්නේ එහෙමයි. එදා මේ රෙගුලාසිවලට පසුබිම වූ ගිවිසුම මේ රටේ ජනයාට පැහැදිලි කර දුන්නේ එහෙමයි. එදා දුන් අර්ථය එයයි.

ගරු අගමැතිතුමා කියන්නේ මේ රෙගුලාසි මාලාව සකස් කර තිබෙන්නේ මේ නීතිය අනුව බවයි. ඇත්ත වශයෙන්ම ඒවා සකස් කර තිබෙන්නේ මේ නීතිය අනුව නම් අප ඒ නීතියටත් විරුද්ධයි, රෙගුලාසිවලටත් විරුද්ධයි. ඒ නීතිය සම්මත කර ගත් පලියටම මේ රෙගුලාසි හොඳ ඒවායයි කියන්නේ නැහැ. පනතත් හොඳ නැහැ, නීතියත් හොඳ නැහැ, රෙගුලාසිත් හොඳ නැහැ. 11 වන වගන්තිය නිසා තත්ත්වය වඩාත් නරක් වෙනවා. අප විසින් මේ රෙගුලාසි මාලාවෙන් කරන්නේ මොකක්ද? ලංකාවෙන් පිට වී යන්නට කැමැති අයටත්, "බැහැ, නවතින්නට ඕනෑ" යි බල කරන්නට—බලහත්කාරයෙන් නතර කරවා ගන්නට—වැඩ පිළිවෙළක් මේ රෙගුලාසි මාලාවෙන් ඇති වෙනවා. ඒ විධියේ තත්ත්වයක් මතු වන ආකාරයට දෙයක් මේ වගන්තියෙන් කෙරෙන බව පැහැදිලි නම් මා එක් ඉල්ලීමක් කරන්නට කැමතියි. හිතාමතාම එහෙම

විරුද්ධ පාර්ශ්වය මේ ප්‍රශ්නය ඉදිරිපත් කළ නිසා එය පිළිගැනීම විරුද්ධ පාර්ශ්වයට යටත් වීමක්ය කියා. ඒ නිසාම මෙහි වචනයක්වත් වෙනස් කිරීම සුදුසු නැතැයි කල්පනා කරන්නට එපා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වශයෙන් පනතේ අදහසට අපි සම්පූර්ණයෙන් විරුද්ධයි. කවදා හරි අපි බලයට ආවොත් මේක වෙනස් කරන්ට සිද්ධ වෙනව. ඒක වෙනම ප්‍රශ්නයක්. අපි බලයට එනවද නැද්ද කියන එක ගැනත් අපට පස්සෙ සාකච්ඡා කරන්ට පුළුවන්. ඒවයින් වැඩක් නැහැ; කල්මුණේදි සාකච්ඡා කරමු. මේ රෙගුලාසිවල වරදක් තිබේ නම් අපි අගමැතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ කිපෙන්නෙ නැතුව, තරහ ගන්නෙ නැතුව, පාර්ලිමේන්තුවට ඇවිල්ල මට බැණල කෑ ගහල රහස් එළි කරනවාය කියන්නෙ නැතුව, මේවා ගැන කල්පනා කරල බලල ඒ වැරදි හරි ගස්සන්ට කියායි.

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන**
*(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன)*
(The Hon. D. P. R. Gunawardena)
රහස් එළි නොකරන එකයි, වරද.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)
රහස් තියෙන ඒව අපි එළි කර ගනිමුකො, තමුන්නාන්සෙයි, මමයි.

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන**
*(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன)*
(The Hon. D. P. R. Gunawardena)
අපි දෙන්නට ගනුදෙනුවක් නැහැනෙ. වුවමනා නැන කළේ නැහැ.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)
මම එළි කරන්නම්: අප අතරෙත් තියෙනව.

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන**
*(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன)*
(The Hon. D. P. R. Gunawardena)
නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)
අප අතරෙ තියෙන රහස් අපි එළි කරමු. තමුන්නාන්සෙ කිව්වෙ, මැරුණයින් පසුව පොතක් ලියනව කියල.

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන**
(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன)
(The Hon. D. P. R. Gunawardena)
ඔව්. ඒක මම මැරුණයින් පස්සෙ—
[බාධාකිරීමක්]

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)
තමුන්නාන්සේ ඒක දන් පළ කළොත් මට පුළුවන් තමුන්නාන්සේට විරුද්ධව දැන් නඩුවක් දාන්න. නැත්නම් මැරුණ යින් පස්සෙ මට සිද්ධ වෙන්නෙ තමුන් නාන්සේගේ බූදලයේ බලකාරයන්ට විරුද්ධව නඩු දාන්නයි. ඒකයි, වෙනස.

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන**
(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன)
(The Hon. D. P. R. Gunawardena)
කවුදෝ ඔත්තුවක් දුන්නයි කියල නම එළි නොකර ඉන්න එකයි වරද.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)
දැන් කියනව නම්, මට තමුන්නාන්සේ ට විරුද්ධව නඩු දාන්න පුළුවන්. නැත් නම් බූදලයෙ බලකාරයන්ට විරුද්ධවයි නඩු දාන්න සිද්ධ වෙන්නෙ.

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන**
(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன)
(The Hon. D. P. R. Gunawardena)
මම නඩුවලට පෙනී ඉඳල පුරුදුයි.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)
මටත් හොඳට පුරුදුයි.

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන**
(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன)
(The Hon. D. P. R. Gunawardena)
අබ්බගාත් කෙනෙකු හැටියට නොවෙ යි ; විත්තිකරුවකු හැටියට.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)
මම අබ්බගාත් කෙනෙකු හැටියට පම ණක් නොවෙයි, විත්තිකරුවකු හැටියටත් අද දක්වා සෑම නඩුවකින්ම මමත් දිනුම්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)
Please come to the Regulations now.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)
දැන් අපි මේ නීතිය ගැන කථා කරමු. ගරු කර්මාන්ත ඇමතිතුමා මේ අවසථාවේ දී කථා කළේ මේ නීතිය ගැන නොවෙයි, වෙන නීතියක් ගැනයි. අපි මේ නීතියට ආපසු එමු. අපි කෙලින්ම අගමැතිතුමාට කියන්නෙ මේක අපි එතුමාට පුද්ගලිකව කරන පහර ගැසීමක් හැටියට සලකන්ට එපා කියායි. ගරු නියෝජ්‍ය කථානායක තුමනි, පාර්ලිමේන්තුවේ නීතියක් සම්පාද නය කරන කොට ඒ නීතියේ මූලික ප්‍රති පත්තියට අපි විරුද්ධ වුණත් ඒ නීතිය හරියාකාරව සාදා ගැනීමට අපට යුතුකමක් තිබෙනව. ඇත්ත වශයෙන්ම මේ මූළු රටේම සිංහල ජනයාගේ අයිතිවාසිකම් රැක ගැනීමට අපට යුතුකමක් තිබෙනව. අපි කල්පනා කරන්නෙ මේ අන්දමට නීතිය හැදීම අපට මදිකමක් කියායි. සමහර විට මේක වැරදීමක් වෙන්ටත් පුළුවනි. බාග වෙලාවට මේක අගමැතිතුමා නොදැක්ක දෙයක් වෙන්ට පුළුවනි. අර පෙට්ටියේ සිටින නිලධාරී මහත්වරුන්ගේ සුළු වර දක් වෙන්ටත් පුළුවනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පෙට් ටිය ගැන සඳහන් කිරීම සම්ප්‍රදාය විරෝධී බව අපේ සංවිධායකතුමා කියනව. ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නිසා මම පෙට්ටිය ගැන කිව්ව දේ අස් කර ගන්නව. පෙට්ටියේ සිටින නිළධාරීන්ගේ වරදක් නිසා නොවෙයි, පෙට්ටියේ නැති නිලධාරීන්ගේ වරදක් නිසාත් වෙන්ට පුළුවන්.

ඒ නිසා අපි මේ අවස්ථාවේදී ඉල්ලා සිටින්නේ මේ නීතිය සුදුසු විධියට සකස් කරන්න කියායි. මෙහි මූලික ප්‍රතිපත්තියට අපි විරුද්ධයි. අපි ඡන්දය පාවිච්චි කරන්නෙත් විරුද්ධ පාර්ශ්වය හැටියට මේ රෙගුලාසිවලට විරුද්ධවයි. කෙසේ වෙතත් අපි අවධාරණයෙන්ම මේ අවස්ථාවේදී ගරු අගමැතිතුමාගෙන් ඉල්ලා සිටිනව, මේ "කළයුතු" කියන වචන ඉවත් කරල තමුන්නාන්සේගේ අදහස අනුව "කළහැකි" කියන වචන ඇතුළත් කරන්ට කියා. එසේ ඉල්ලමින් මගේ වචන සවල්පය මෙයින් හමාර කරනව.

අ. භා. 5.55

**ආර්. ජී. සේනානායක මයා.** (දඹදෙණිය)
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க—தம்பதெனிய)*
(Mr. R. G. Senanayake—Dambadeniya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නය ගැන මමත් කැමතියි වචන සවල්පයක් කථා කරන්න. මේ ගැන නද ලෙස අදහස් මතු වන විට හැප්පිලි ඇති වන්ට ඉඩ තිබෙන බව මම දන්නව. එහෙත් හැප්පිලි නොවන ආකාරයට ඉතා සන්සුන්ව මේ ප්‍රශ්නය ගැන කථා කරන්ට අවස්ථාව ලැබෙයි කියා මා විශ්වාස කරනව.

මේ ප්‍රශ්නය විසඳන්ට ඕනෑ කියන කැක්කුම කාලයක සිට අපට තිබුණා. දේශපාලනඥයන් වශයෙන් පාර්ලිමේන්තුවේ සිටින අපට වඩා ගම්බදව සිටින ජනතාවටයි මේ පිළිබඳව වැඩිපුර කැක්කුමක් තිබුණේ. මේ රෙගුලාසි, ගම්බද සාමාන්‍ය ජනතාව තුළ ඇති ඒ භය නැති කිරීමට අසමත් බව පළල් වශයෙන් කල්පනා කරන විට අපට පෙනී යනවා. අපේ ඉතිහාසය දෙස බලන විට අපට පෙනී යනවා, හැම කාලයකම පාහේ ඉන්දියානුවන්ගෙන් නැත්නම් ඉන්දියාවෙන් අපට යම් යම් කරදර තිබුණු බව. එවැනි කරදර නැවත වරක් ඇති වේය කියන භය ඉහළ පැළැන්තියේ දේශපාලනඥයන්ට වඩා සාමාන්‍ය ගම්බද ජනතාව තුළ ඇති වී තිබෙනවා. සිංහලයේ ඉතිහාසය පිළිබඳව අපට වඩා ගැඹුරු දැනීමක් සාමාන්‍ය ගැමියන් තුළ තිබෙන බව අප පිළිගත යුතුයි. අපේ ඉතිහාසයේ සඳහන් යම් යම් සිද්ධීන් හා වර්තමාන තත්ත්වය සසඳන ඒ ගැමියන් තුළ "අපේ මුතුන් මිත්තන්ගේ කාලයේත් මේ විධියේ හිරිහැර තිබුණා නේද" කියන භය ඇති වෙනවා. ගම්බද ජනතාව තුළ එම හැඟීම කා වැදී තිබුණු නිසායි, ඉන්දියානු ප්‍රශ්නය විසඳිය යුතුය කියන හැඟීම අපේ දේශපාලනය තුළ බල පෑවේ.

අභාවප්‍රාප්ත ඩී. එස්. සේනානායක අගමැතිතුමාගේ හිතට ඉතා තදින් කාවැදුණු ප්‍රශ්නයක්, මේ ඉන්දියානු ප්‍රශ්නය. මේ ප්‍රශ්නය විසඳීම සඳහා එතුමා පුදුම විධියේ සටනක් ගෙන ගියා. එතුමා මින්නේරිය, පොළොන්නරුව වැනි පළාත්වල වැඩ කළා වාගේම, ඉන්දියානු ප්‍රශ්නය විසඳීම සඳහා සටන් කළ වීරයකු වශයෙන් ගම්බද ජනතාවගේ ගෞරවයට පාත්‍ර වී සිටින කෙනෙක්. මා එතුමාගේ පාර්ලිමේන්තු ලේකම් වශයෙන් එවකට කටයුතු කළ නිසායි, මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් එතුමා තුළ තිබුණු කැක්කුම මා හොඳාකාර දන්නේ.

යුද්ධ කාලයේදී අපේ රටේ හාල් හිඟයක් ඇති වුණා. ඒ කාලයේ මේ රටේ තිබුණේත් යුද්ධ ආණ්ඩුවක්; ඉන්දියාවේ තිබුණේත් යුද්ධ ආණ්ඩුවක්. ඒ කාලයේදී, ඉන්දියාවෙන් හාල් ණයට ගැනීම සඳහා සර් ඔලිවර් ගුණතිලක මහතා ඉන්දියාවට යැව්වා. "ලංකාවේ ඉන්නා ඉන්දියානුවන්ට ලංකා පුරවැසිකම දුන්නොත්, උඹලාට හාල් දෙනවා" කියා ඉන්දියාව කීවාලු. ඒ කාලයේ ඩී. එස්. සේනානායක අගමැතිතුමා රට හැම තැනම ගිහින් අත්පොළසන් මධ්‍යයේ කී දෙයක් මට මතකයි. "මගේ ජාතියෙන් අඩකටම නොකා නොබී මැරෙන්නට සිදු වුණත් බත් පතට රට පාවා දෙන්නේ නැහැ" කියා එතුමා කීවා. ඉන්දියානු ප්‍රශ්නය සම්බන්ධයෙන් එතුමා තුළ ඒ තරම් කැක්කුමක් තිබුණා. එසේ ඉන්දියානුවන්ට ලංකා පුරවැසිකම පිරිනැමීමෙන් මේ රටට මොන තරම් හානියක් සිදු වේදැයි එතුමා තුළ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හොඳ අවබෝධයක් තිබුණා. රට පාවා දී ලබන බත් පත ප්‍රතික්ෂේප කිරීම නිසා අපේ ජාතියෙන් භාගයකටම මිය යන්නට සිදු වුණත්, ඉතිරි වන අයගෙන් මේ රට ජාතිය නැවතත් ගොඩනඟනවා කියන හැඟීමකුත්, ජාතිය එතුමා කෙරෙහි සම්පූර්ණ විශ්වාසය තබාවිය කියන දැඩි විශ්වාසයකුත් එතුමා තුළ තිබුණා.

එම නිසා, මේ ඉන්දියානු ප්‍රශ්නය ආසනයක් දෙකක් බේරන සුළු ප්‍රශ්නයක් නොවෙයි. මෙය සිංහල ඉතිහාසයේ ආරම්භයේ සිට අද වන තුරු සිංහලයන්ට තදින් බලපාන ප්‍රශ්නයක්. එම නිසාම මෙය භයානක ප්‍රශ්නයක්. ඩී. එස්. සේනානායක තුමා තමන්ගේ කාලයේදී පුළුවන් තරම් දිරි දැරුවා මේ ප්‍රශ්නය විසඳීමට. ලංකා පුරවැසි පනත අනුව 2,80,000 ක් පමණ වන ඉන්දියානුවන් පිරිසකගේ නම් ඡන්ද ලැයිස්තුවලින් කපා හැරියේ එතුමායි. රාමනුජන්ලා මෝතලා, වේලුපිල්ලෙලා, තොන්ඩමන්ලා, පාර්ලිමේන්තුවට පත් වී ඒම වැළැක්වීම සඳහා ක්‍රියා කළේ එතුමායි.

**ගරු සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති හා සභානායක)**

*(கௌரவ சி. பி. டி சில்வா—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரும் சபை முதல்வரும்)*

(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)

පාර්ලිමේන්තුවේ 2/3 ක කැමැත්තෙන්; එහෙම නැත්නම් කරන්නට බෑ.

**ආර්. ජී. සේනානායක මයා.**

*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*

(Mr. R. G. Senanayake)

එදා කපා හැරියේ 2,80,000ක් පමණක් නමුත් දැන් 3,00,000කට පුරවැසිකම් දෙන්නට යනවා. මෝතලාට, වේලුපිල්ලෙලාට, තොන්ඩමන්ලාට නැවතත් පාර්ලිමේන්තුවට එන්නට දැන් මඟ කැපෙනවා.

**ගරු ඩඩ්ලි සේනානායක**

*(கௌரவ டட்லி சேனநாயக்க)*

(The Hon. Dudley Senanayake)

කථා කරන්නේ, ගිවිසුම ගැනද?

**ආර්. ජී. සේනානායක මයා.**

*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*

(Mr. R. G. Senanayake)

මේ ප්‍රශ්නය විසඳන්නට වුවමනා නිසායි( සිරිමා බණ්ඩාරනායක මැතිණිය ඉන්දියාවට ගියේ. බණ්ඩාරනායක මැතිණිය මෙම ප්‍රශ්නය ගැන සාකච්ඡා කරන්නට ඉන්දියාවට ගොස් මුලින්ම කල්පනා කළේ කී දාහක් ලංකාවෙන් පන්නා ගන්නට පුළුවන්ද කියායි. මූලික ප්‍රශ්නය ඒකයි. පන් ලක්ෂ විසි පන් දාහක් එගොඩ කරන්නට නම් තුන් ලක්ෂයක් මේ රටට භාර ගන්නට සිදු විය හැකි බව එතුමිය කල්පනා කළා. ඩී. එස්. සේනානායක අගමැතිතුමා කල්පනා කළාක් මෙන්, ජාතිය රැක ගන්නට ඕනෑ නම් ඔය විධියට කළයුතු බව එතුමිය කල්පනා කළා. පන් ලක්ෂ විසි පන් දාහක් එගොඩ කරන කොට තුන් ලක්ෂයක් භාර ගන්නට ඕනෑ. ඒ පරමාර්ථය ඇතිවයි, ගිවිසුම සකස් කළේ. එතකොට ඉන්දියානුවන් පන් ලක්ෂ විසි පන් දාහක් පිට කිරීම මෙහි ඇති මූලික ප්‍රශ්නයයි.

ඉන්දු ලංකා ගිවිසුම සකස් කෙළේ මේ අදහස අනුව බව එදා මෙම ආණ්ඩුව ප්‍රකාශ කළා. එදා අපත් ඒ කියමන එක්තරා විධියකට පිළිගත්තා. එදා මෙම ප්‍රශ්නය ගැන ආණ්ඩුව කල්පනා කරන නියම ආකාරය කැපී පෙනුණේ නැහැ. එහෙත් මේ රෙගුලාසිවලින් නියම තත්ත්වය කැපී පෙනෙනවා. රෙගුලාසි සකස් කර තිබෙන්නේ ලංකාවේ රඳවා ගන්නා අය සම්බන්ධවයි. පිට යන අය ගැන නොව ලංකාවේ නවතින අය ගැන රෙගුලාසි සකස් කර තිබීම භයානක කාරණයක් බව මතක් කරන්නට ඕනෑ. අපට වුවමනා කරන්නේ ඉන්දියානුවන් ඉන්දියාවට යැවිය යුත්තේ කෙසේද යන්න ගැන රෙගුලාසි සකස් කරන්නටයි. ගිවිසුම අත්සන් කෙළේ ඉන්දියානුවන් ඉන්දියාවට යැවීම පිණිසයි. කොටින්ම මූලික ප්‍රශ්නය ඉන්දියානුවන් ලංකාවෙන් යැවීමයි. එහෙත් රෙගුලාසිවල ඒ ගැන සඳහන් වන්නේ නැහැ. රෙගුලාසිවල සඳහන් වන්නේ මෙහි තබා ගන්නා පිරිස ගැන පමණයි. "මට විනිමය නැහැ. ඒ නිසා ඔය කියන ආකාරයට ඒ අය යවන්නට බැහැ. රේල්ලු, බෝක්කු, පාලම් පිළි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ජී. සේනානායක මයා.]

බඳ කරදර, එසේ නැත්නම් ප්‍රවාහණ කරදර මට නැහැ. මට තියෙන්නේ මේ උදවිය යැවීම සඳහා සල්ලි නැතිකමයි.'' යනුවෙන් ගරු අගමැතිතුමා කියන්නට පුළුවනි. හොඳයි, සල්ලි නැත්නම් හෙමින් සීරුවේ පිටකරමු. යවන අය හෙමින් සීරුවේ යැවීමටත් භාර ගන්නා අය වේගයෙන් භාර ගැනීමටත් හේතුව මොකක්ද? යවන ප්‍රමාණයේ වේගයෙන්ම භාර ගනිමු. යවන අය හෙමින් සීරුවේ යවන අතර මෙහි නවත්වා ගන්නා අය පුදුම අන්දමේ වේගයකින් ඡන්ද ලැයිස්තුවලට ඇතුළත් කරනවා.

මෙම රෙගුලාසි ඉදිරිපත් කොට වැඩි දවසක් ගත වී නැහැ. මෙම රෙගුලාසි පිළිබඳව න්‍යාය පත්‍රයේ සඳහන්ව තිබුණා. එහෙත් හිටපු හැටියේ අද මෙම සාකච්ඡාව මුලට දමාගෙන තිබෙනවා.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

කවදද පනත ඉදිරිපත් කොට සම්මත කෙළේ?

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

මෙම රෙගුලාසි සාකච්ඡාවට ගත්තේ හදිසියේ නේද?

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

මේක න්‍යාය පත්‍රයේ තිබුණා.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

එහෙත් අද මේ ගැන සාකච්ඡාව නියම කෙළේ ඇයි? ලංකාවේ සිටින හැම කෙනෙකුටම මේ සඳහා සාක්ෂි දීමට හැකි වන පරිද්දෙන් කාරක සභාවක් පත් කරන බව එක්තරා අවස්ථාවකදී ගරු අගමැතිතුමා ප්‍රකාශ කළා. කාරක සභාවක් පත් කළායින් පසුව භික්ෂු නියෝජිතයින් කීප දෙනකුගෙන් සහ පක්ෂ නියෝජිතයන් කීප දෙනකුගෙන් පමණක් සාක්ෂි විමසුවා. පෙත්සම් නම් සිය ගණනක් ලැබී තිබුණා. එහෙත් සාක්ෂි දීම සඳහා කැඳෙව්වේ ඉතාමත් ටික දෙනයි.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

සාක්ෂි දිය යුතු අයවලුන් තේරුවේ කවුද? නියෝජිත පිරිස් තේරූ මණ්ඩලයට තමුන්නාන්සේත් ඇතුළත් වුණා.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

මමත් ඉන්දියාවට පටවන්නට යන මිනිහෙක් ද?

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

නියෝජිතයන් ස්වල්ප දෙනකු තෝරා ගන්නට තමුන්නාන්සේත් හවුල් වුණා.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

මාද පෙත්සම් එවීම සඳහා සිය ගණනක් තෝරා ගත්තේ?

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

සාක්ෂි දීම සඳහා ගෙන්විය යුතු උදවිය තෝරන්නට ඒ ස්ථාවර කාරක සභාව විසින් තවත් කාරක සභාවක් පත් කරන්නට යෙදුණා. ඔය මන්ත්‍රීතුමාත් ඒ කාරක සභාවේ සිටි එක සාමාජිකයෙක්. ස්වල්ප දෙනා තේරූ කාරක සභාවේ සිටි එක් පුද්ගලයෙක් තමුන්නාන්සේ.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

මා ඒ කාරක සභාවට පත් කර තිබුණාට මා එන්නට පළමු නියෝජිතයන් තෝරාගෙන ඉවරයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

මට ඕනෑ හැටියට මාද තෝරුවේ? මා ඒ කාරක සභාවේ සිටියේවත් නැහැ. හිටියේ තමුන්නාන්සේයි.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

කොමිටියක් පත් කර තිබෙනවා නම් තෝරන්න තවත් කෙනෙක් පත් කරන්නේ මොකටද? කොමිටියක් පත් කළා නම් ඒ කොමිටිය ඉදිරියේ සාක්ෂි ඉදිරිපත් කිරීමට හැම දෙනාටම අවස්ථාව දෙන්න ඕනෑ. ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් කාටවත් නැති කරන්න බැහැ.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

ඒ කොටසට තමුන්නාන්සේත් ඇතුළත් වුණේ ඇයි?

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

තෝරුවා නම් තමයි මම වැරදිකරු වන්නෙ. මම එක් කෙනෙක්වත් තෝරුවේ නැහැ.

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන**
*(கௌரவ டி. பீ. ஆர். குணவர்தன)*
(The Hon. D. P. R. Gunawardena)

එදා තමුන්නාන්සේ පැමිණියේ නැහැ.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

ඔව්, මම ආවේ නැහැ. මට එන්න යුතු කමක් නැහැ. මා ඒ නිසා ආවේ නැහැ. මහජන අයිතිවාසිකම් ආරක්ෂා කරනවා නම්, ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරනවා නම්, ඒ පත් කරන ලද කාරක සභාව ඉදිරියේ සාක්ෂි දීමට ඉදිරිපත් වූ හැම දෙනාටම සාක්ෂි දෙන්න අවස්ථාව සලසා දෙන්න ඕනෑ.

නියෝග

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

නියෝජිතයන් 1,000 ක් ඉන්නවා නම් ඒ හැම දෙනාටම අවස්ථාව දෙන්න පුළුවනිද?

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

එහෙම නම් කාරක සභාවක් පත් කරන්න ඕනෑ නැහැ.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

ස්ථාවර කාරක සභාවක කටයුතු කෙරෙන හැටි තමුන්නාන්සේ දන්නේ නැහැ.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

කටයුතු කෙරෙන ක්‍රමය මම දන්නවා. එක් පිරිසක් ආවා. කෑම වෙලාව එන විට අවසාන කරන්න ඕනෑය කියා ඒ අයට පැයකට දෙකකට වඩා සාක්ෂි දෙන්න කාලය දුන්නේ නැහැ. ඒ අයට ඕනෑ හැටියට සාක්ෂි දෙන්න අවස්ථාවක් දුන්නේ නැහැ. ඊළඟට තවත් පිරිස් කණ්ඩායම් 5 ක් එක් වරම කැඳෙව්වා. ඔන්න ඔය විධියටයි සාක්ෂි ඇසුවේ. මේකද ප්‍රජාතන්ත්‍රවාදය කියන්නෙ? මේ විධියටද ප්‍රජාතන්ත්‍රවාදය කර ගෙන යන්නෙ? මෙය හෙට අනිද්දා වන විට කර අවසාන කළ යුතු දෙයක්ද? ඒ තරම් ඉක්මනට ඉන්දියානු කාරයන් මේ රටින් යන්න දඟලනවාද? අන්න ඒ විධියට ඒ අය යන්න දඟලනවා නම් මේ විධියට ඉක්මන් කළාට කමක් නැහැ. තමුන්නාන්සේලා කියනවා යවන්න සල්ලි නැතිලු. එහෙම නම් ඇයි ලැයිස්තු හදන්න මේ තරම් කලබල වන්නෙ? හදිස්සි වී තිබෙන්නේ මේ නම් ටික ඡන්ද ලැයිස්තුවලට ඇතුළත් කර ගැනීමටයි. ඔන්න ඔයයි තිබෙන ප්‍රශ්නය. ඉන්දියානු ප්‍රශ්නය විසඳීමේ පරමාර්ථය මේ රටේ ඉන්න ඉන්දියානුවන් මෙරටින් පිට කිරීම නොවෙයි. මේ රටේ ඉන්දියානු පුරවැසියන් ඡන්ද ලැයිස්තුවලට දමා ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මගින් ඡන්දය ලබා ගැනීමයි පරමාර්ථය වී තිබෙන්නෙ. අන්න එතැනයි වැරදෙන තැන. රටට හානි වන තැන එතැනයි. මේ කටයුතු ඉක්මන් කරන්න හේතුව දැන් පෙනෙනවා නේද?

තොන්ඩමන් මන්ත්‍රීතුමාගේ මහා සම්මේලනයක් තිබෙනවා. ඩී. එම්. කේ. නියෝජිතයෙක් එයට සහභාගි වීම සඳහා මෙහි එනවා. "මගේ කාලයේදී කෙරුම් මෙන්න මේවාය" කියා ඔහුට පෙන්වා දෙන්නයි තොන්ඩමන් මහතාට වුවමනා වී තිබෙන්නෙ. අන්න ඒ අදහසට සහාය දීම පිණිසයි මේ රෙගුලාසි ඉක්මණින් සම්මත කර ගන්න සූදානම් වන්නෙ. මොකක්ද මේ ඩී. එම්. කේ. පක්ෂය කියන්නෙ? ද්‍රවිඩ මුන්නේත්‍ර කසාගම් පක්ෂයටයි. ඔවුන්ගේ අදහසට ඉඩ නො ලැබෙන අන්දමට නේරු තුමා විසින් ආ ආණ්ඩු ක්‍රමය වෙනස් කළා. ද්‍රවිඩ මුන්නේත්‍ර කසාගම් පක්ෂයට වුවමනා කළේ වෙනම දෙමළ රාජ්‍යයක් ඇති කිරීමටයි. ඔන්න ඔය අදහස රට හැම තැනම පතුරාගෙන යන විට ඒ රටේ එවකට සිටි අගමැතිවරයා "රට බෙදන්න උත්සාහ කරන පක්ෂය මම තහනම් කරනවාය" කියා ආණ්ඩු ක්‍රමය වෙනස් කළා. ඊට පසු ඩී. එම්. කේ. පාක්ෂිකයන් රට බෙදන්න උත්සාහ කිරීමේ ප්‍රති පත්තිය වෙනස් කර ගත්තා. ඔය විධියට ඉන්දියාව දෙකට බෙදා වෙනම දෙමළ රාජ්‍යයක් බිහි කිරීමේ අදහස මුලින්ම ඇති කර ගත් පක්ෂයේ නියෝජිතයෙක් මෙහි එන විට ඔහුව පිළිගන්න මේ රටේ ඉන්දියානු සහාව සූදානම් වී සිටිනවා. අන්න ඒ නිසයි මේ රෙගුලාසි ඉක්මණින්ම සම්මත කර ගන්න සූදානම් වන්නෙ. එහෙම නැත්නම් මේ විධියට කලබල වෙන්න හේතුවක් නැහැ නේ.

අපේ දොම්පේ මන්ත්‍රීතුමා මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කළ තර්කය ඉතාම වැදගත්. මෙහි තිබෙනවා Indo-Ceylon Agreement Ceylon Citizenship Register කියා. එතකොට අපේ පුරවැසිකම ලැබුණොත් තමයි මේ ලේඛනයට වැටෙන්නෙ. ඊළඟට "C" අකුර යටතේ දැක්වෙනවා. Indo-Ceylon Agreement Repatriation Register කියා. මේක "රිපැට්‍රියේෂන් රෙජිස්ටර්" එකක්. ඊට පස්සෙ තියෙන් නෙ, "පර්සන්ස් රිපැට්‍රියේටඩ් අන්ඩර් ද ඉන්ඩු-සිලෝන් එග්‍රීමන්ට් රෙජිස්ටර්" එක. ඉන්දියානු පුරවැසිකම ලබන අය පිළිබඳ එකම වාර්තාවක්වත්, එක පෝර්ම කොළයක්වත් නැහැ. මෙතැන තිබෙන් නේ ලංකා පුරවැසිකම් ලබන උදවියගේ ලැයිස්තුවත්, ඒ රටට යවන අයගේ ලැයිස්තු වත්, අවසානයේදී, ගිය උදවිය ගේ ලැයිස්තුවත් පමණයි.

ඒ මන්ත්‍රීතුමාගේ තර්කය වුනේ, මේ උදවියට 11 වැනි වගන්තිය යටතේ මේ රටේ තාවකාලිකව නැවතී සිටීම සඳහා බල පත්‍රයක් දෙන්නට හේතුව කුමක්ද යන්නයි.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
"බී" ෆේජ්ම් එක මොකක්ද?

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)
"ඉන්ඩු-සිලෝන් එග්‍රීමන්ට් ඉන්ඩියන් සිටිසන්ෂිප් රෙජිස්ටර්".

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
එහෙම එකක් නැහැ කිව්ව නේද දැන්? එහෙම එකක් තියෙනවා නේද? එහෙම නම් නැහැ කිව්ව එක බොරුවක්.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)
හොඳයි, මා අහන්නට කැමතියි, ඒ අයට ඉන්දියාවෙන් පාස්පෝට් ලැබෙන වාද කියා.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
ඒ අය ඉන්දියානු පුරවැසියන් නිසා ඉන්දියානු පාස්පෝට් දෙන්නට සිදු වෙයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

ඒ සඳහා ඒ රටේ විශේෂ පනතක් සම්මත කරගෙන තිබෙනවද?

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

ඒ රටේ තිබෙන ආණ්ඩුක්‍රම පනත යටතේ ඒක කරන්නට පුළුවන්. ඒ සඳහා විශේෂ පනතක් වුවමනා නැහැ.

**ආර්. ජී සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

එතකොට ඒ විධියට තමයි, "ටෙම්පරරි රෙසිඩන්ස් පර්මිට්" එක දෙන්නෙ. එහෙමද?

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

කථාව කරගෙන යන්න, මා කථා කරන අවස්ථාවෙදි කියන්නම්.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

මා යම් රටකට යනවා නම් වීසා එකක් ගන්නට ඕනෑ. ලංකාවට යම් කෙනකු එනවා නම් ඒ අයට දෙන වීසා එකට අප කියන්නේ "ටෙම්පරරි රෙසිඩන්ස් පර්මිට්" කියායි. එහෙම නම් "ටෙම්පරරි රෙසිඩන්ස් පර්මිට්" එකක් දෙන්නට පුළුවන් වන්නේ පාස්පෝට් බලපත්‍රයකට පමණයි. වෙන කඩදාසියකින් එය දෙන්නට බැහැ. ඒ නිසා මේ රටෙන් පිටරට යා යුතු පිරිසගේ ලැයිස්තුවට යම් කොටසකගේ නම් ඇතුළත් කළා නම්, කොමසාරිස්තුමා ඒ උදවියට, "ටෙම්පරරි රෙසිඩන්ස් පර්මිට්" කියා වෙනම බල පත්‍රයක් දිය යුතුයයි කීමේ තේරුමක් නැහැ. පාස්පෝට් බල පත්‍රයක් ලැබුනම ඒ පාස්පෝට් එකේ සීල් එක ගහනවා මිස සීල් එක ගහන්නට වෙන කොලයක් නැහැ. මා මේ රටින් පිටරටකට යනවා නම් මගේ පාස්පෝට් එකේ තමයි, වීසා එක ගහන්නේ. එහෙත් මේකෙ එහෙම එකක් නැහැ. ඉන්දියාවට පටවනවාය කියා වෙන් කළ උදවියට මේ රටේ සිටීම සඳහා විශේෂ බල පත්‍රයක් දිය යුතුය කියා මෙතැන කොමසාරිස්තුමාට බල කරනවා. ඒ විධියට කරන්නට හේතුව කුමක්ද? පිට කරන්නට බැරි වීමයි, හේතුව. පිට කරන්නට බැරි නිසා ඒ උදවියගේ නම් ලැයිස්තුවට ඇතුළත් කර නිකම් සිටියා නම් කමක් නැහැ. එහෙත් ඔවුන්ට මේ රටේ ඉන්නට බල පත්‍රයක් දුන්නොත් ඔවුන් මේ රටේ ඉන්නේ යන්නට අමාරු නිසා නොවෙයි, බල පත්‍රයේ තිබෙන බලය උඩයි. අවුරුදු දෙක තුනක් යයි; සමහරවිට අවුරුදු පහක් යයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැනටමත් තාවකාලික වීසා බලපත්‍ර ලබා ගත් ඉන්දියානුවන් කොපමණ සංඛ්‍යාවක් එම බලපත්‍රවලින් රැඳී සිටිය යුතු කාලය අවසන්වී හැංගී සිටිනවාද? කොපමණ සංඛ්‍යාවක් බලපත්‍ර ලබාගෙන මේ රටේ සිටිනවාද? මේ අන්දමේ බලපත්‍රයක් දෙන විට ඒ උදවිය ලැයිස්තුවකට පමණක් ඇතුළත් කළාට මදි. බලපත්‍රයක් ලබාගෙන මේ රටේ ඉන්නට අවසර දෙන විට බල පත්‍රයෙ නියමිත කාලය අවසන් වුණාම රටින් පිටව යනවායයි කොහොමද අප පිළිගන්නෙ? බල පත්‍රයක් දුන් පළියට ඒ උදවිය පිටව යනවායයි විශ්වාසයක් තබන්න එපා. මෙපමණ කලක් මේ රටේ ඒ අය රැඳී සිටියෙ කිසිම බලපත්‍රයක් නැතුව නම්, බලපත්‍රයක් ලබා ගත්තාය කියා වෙනසක් වෙනවාද? ඔවුන් වෙන් කළාට පසු විශේෂ බලපත්‍රයක් දීමෙන් පමණක් ඇති ප්‍රයෝජනය කුමක් ද කියා මා අහන්න කැමතියි. හැබැයි, ඉන්දියානු ආණ්ඩුවෙන් එරට පුරවැසියකු වශයෙන් පිළිගත් බලපත්‍රයක් දෙනවා නම් ඊට පසු එවැනි බලපත්‍රයක් මෙරටින් නිකුත් කළාට වරදක් නැහැ. නමුත් මෙහි දී එවැන්නක් කෙරෙන්නෙ නැහැ. ඉන්දියානු පුරවැසියන් වශයෙන් කොටසක් වෙන් කර ඒ අයට විශේෂ බලපත්‍රයක් දීම පමණයි කරන්නෙ.

අනික් කාරණය, උඩුප්පිඩ්ඩි මන්ත්‍රීතුමා කීවා මේ ප්‍රශ්නය විසඳන්න මෙපමණ කාලයක් ඉතා මහන්සි වුණාය, දැන් අන්තිම ගිවිසුම අත්සන් කර තිබෙනවාය, මෙය ක්‍රියාත්මක කරන්න සහයෝගය දීම යුක්ති සහගතය කියා. සමහර විට එතුමාට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඉන්දු-ලංකා ගිවිසුම (ක්‍රියාවට නැඟීමේ) පනත:

[ආර්. ජී. සේනානායක මයා.]

මෙහි ඉතිහාසය ගැන අමතක වී වෙන්න ඇති මෙබඳු ප්‍රකාශයක් කළේ. මෙය පටන් ගත්තෙ කොයි කාලයේද? බාජ්පායි ගිවිසුමක් අත්සන් කළා. ක්‍රියාත්මක වුණාද? නැවත වරක් ගිවිසුමක් අත්සන් කළා. ක්‍රියාත්මක වුණාද? ඊට පස්සෙ ඩී. එස්. සේනානායක-නේරු ගිවිසුමක් අත්සන් කළා. එයත් ක්‍රියාත්මක වුණාද? ඊට පස්සෙ ඩඩ්ලි සේනානායක-දේසායි සාකච්ඡාවක් ඇති වුණා. එයත් ක්‍රියාත්මක කළාද? නේරු-කොතලාවල ගිවිසුමක් අත්සන් කළා. නමුත් ක්‍රියාත්මක වුණාද? ඔය අන්දමට අත්සන් කළ හැම ගිවිසුමක්ම කැඩුවා. අන්තිමට ඇති කර ගෙන තිබෙන්නෙ මේ ගිවිසුමයි.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඒක තමයි ක්‍රියාත්මක කරන්න හදන්නෙ.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

ඒවාත් ක්‍රියාත්මක කරන්න හැදුවා, නමුත් අසාර්ථක වුණා. කරන්න හැදුව, බැරි වුණා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

මේක ක්‍රියාත්මක කරනවා.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

හැම ගිවිසුමක්ම ඉන්දියානු ආණ්ඩුව කඩාකප්පල් කර දැමුවා. බාජ්පායි ගිවිසුම ප්‍රතික්ෂේප කළේ කව්ද? ඉන්දියානු ආණ්ඩුව නේද? නේරු-සේනානායක ගිවිසුම කඩාකප්පල් කළේ කව්ද? ඩඩ්ලි සේනානායක මහතා සමග පැවැත්වූ සාකච්ඡාවෙන් පසු ඇති කරගත් ගිවිසුම කඩාකප්පල් වීමෙන් පසු, ඉන්දියානු ආණ්ඩුව බොරු ප්‍රකාශ කර ප්‍රයෝගයෙන් එය කඩාකප්පල් කර දැමූ බව එතුමා ප්‍රකාශ කළා නොවෙද? කොතලාවල-නේරු ගිවිසුම කඩාකප්පල්



වීමෙන් පසුව නේරු තුමා කළ වංචාව නිසා ජාත්‍යන්තර සභාවල ඔහුගේ ක්‍රියා කලාපය හෙළා දකින බවට කොතලාවල මහතා කළ ප්‍රකාශය ලොකු අකුරෙන් "ඔබ්සර්වර්" පත්‍රයේ පළ කර තිබුණා නේද? මේ ගිවිසුමක් ඇතිකර ගත් පස්වන අවස්ථාවයි. මැතිණිය ඇති කර ගත් ගිවිසුමත් දැන් කඩාකප්පල් කර දැමීමේ තැනට කට යුතු යෙදී තිබෙනවා. ඒ ගැන මෙවර ඉන්දියානු ආණ්ඩුවට දොස් කියන්න හේතුවක් පෙනෙන්නෙ නැහැ. අපේ වර්තමාන ආණ්ඩුවයි ගිවිසුම කඩාකප්පල් කර දැමුවෙ.

හබරාදුවෙ ගරු මන්ත්‍රීතුමා වැදගත් කාරණයක් ගැන සඳහන් කළා. ඉන්දියානුවන්ගෙන් කොටසකට මේ රටේ පුරවැසිකම් ලැබෙතත්, ඒ අය මෙපමණ කලක් ජීවත් වුණේ ඉන්දියානු පරිසරය අනුවයි. ඉන්දියානු පන්නය අනුවයි; පාවිච්චි කළේ ඉන්දියානු භාෂාවයි. එම නිසා මෙරට පුරවැසිකම් දෙන විට, ඒ අයටත් මේ රට තමන්ගේය යන හැඟීමක් ඇති වන අන්දමට ඔවුන් අත්සන් තබන ප්‍රකාශන සකස් වන්න ඕනෑ. එසේ නැතුව සාමදාන විනිශ්චයකාරවරයකු ඉදිරිපිටට ගොස් ප්‍රකාශනයකට අත්සන් තැබූ පමණින් ඔවුන් තුළ අමුතු පරිවර්තනයක් ඇති වේයයි කිසි විටෙක විශ්වාස කරන්න අමාරුයි. එම නිසා මෙරට පුරවැසිකම් දෙනු ලබන ඒ උදවියට මේ රට තමන්ගේ රටය යන හැඟීමක් ඇති කිරීමෙන් පසු, මෙම පරිසරය අනුව සකස් වීමට අනුබල දීම වැදගත් බව මතක් කරන්න ඕනෑ. එවැනි කිසිම වගන්තියක් මේ රෙගුලාසිවලට ඇතුළත් වී නැහැ. මෙහි සඳහන් වන්නේ නිකම්ම අත්සන් කිරීම පමණයි. මේ විධියට කටයුතු කළොත් ඔවුන් මෙහි පුරවැසියන් වුණාට පසුත් ඉන්දියානු පරිසරයෙහිම ජීවත් වීමට උත්සාහ කරනවා ඇති. එවිට ඔවුන් මේ රටේ නිදහස් උත්සවයේදී කළු කොඩි ඔසවයි; ඉන්දියාවේ නායකයින් ඔවුන්ගේ නායකයින් වශයෙන් පිළිගනියි; ඉන්දියාවේ "මුන්නේත්‍ර කලගම්" පක්ෂය දිනන විට කොඩි ඔසවා රතිඤ්ඤා පත්තු කරයි. මේ රට ගැන හැඟීමක් හෝ ලාංකික ජනතාව ගැන හැඟීමක් හෝ ඔවුන් තුළ ඇති වන්නේ නැහැ. අප්‍රිකාවේ වැනි තත්ත්වයක් ඇති කොට ඔවුන් සම්පූර්ණයෙන් වෙන් කළ යුතුයයි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මා කියන්නේ නැහැ. අපගේ අමුත්තන් වශයෙන් නුඹලා බාර ගන්නට නම් නුඹලා අප සමග එක්ව කටයුතු කළ යුතුයි, අප සමග ජීවත් විය යුතුයි, අප සමග එක්ව සටන් කළ යුතුයි යන හැඟීම ඔවුන්ට දෙන්නට ඕනෑ.

මෙහි සිටින ඉන්දියානුවන් මේ රටේ පුර වැසියන් වශයෙන් බාර ගන්නේ අපේ භාෂාව ඉගෙන ගත්තාට පසුව බව කියැවෙන කොන්දේසියක් ඉදිරිපත් කරන්නට සර් ජෝන් කොතලාවල අග මැතිතුමා එතුමාගේ කාලයේදී උත්සාහ කළ බව අප දන්නවා. ඔවුන් අපේ භාෂාව ඉගෙන ගෙන අප සමග කතාබහ කරමින් අප සමග ජීවත් වන විට මේ රට ජාතිය ගැන කැක්කුමක් ඔවුන් තුළත් ඇති වෙනවා. ඒ අදහස අනුවයි එවැනි කොන්දේසියක් ඉදිරිපත් කරන්නට එදා අදහස් කෙළේ. පණතකින් එවැනි අදහස් ඉදිරිපත් කළත් ඒවා ක්‍රියාත්මක කරන්නට මාර්ග නැත්නම් එයින් වැඩක් වන්නෙ නැහැ. එය ක්‍රියාත්මක කිරීමට රෙගුලාසි තිබිය යුතුයි. මේ පිරිස අපේ පැත්තට හැඩ ගස්වා ගන්නට පුළුවන් වන්නේ ඒ විධියටයි. එවැනි වගන්තියක්, කොන්දේසියක් මෙම රෙගුලාසිවල තිබෙන්නේ කොහේද?

මේ රටේ අඛණ්ඩභාවය රකින්නටත් එකමුතුකම ආරක්ෂා කරනන්ටත් හැම විටම තමන් සටන් කරනවායයි උඩුප්පිඩ්ඩිහි ගරු මන්ත්‍රීතුමා නම් කියනවා. ඒ සම්බන්ධයෙන් මම එතුමාගෙන් එකම ප්‍රශ්නයක් අහන්නම්. පෙඩරල් පක්ෂයේ දෙමළ නම මොකක්ද? එපමණයි මා අහන ප්‍රශ්නය. ඒකේ නම "තමල් අරසු කච්චි". එහි අර්ථය කුමක්ද? "දෙමළ රාජ්‍ය පක්ෂය" යන්නයි. ඉතින් ඔය අඛණ්ඩභාවය රකින මිනිසුන්ද? මේ රටේ එකමුතුභාවය රකින්නට ඕනෑය යන අදහස ඒ ගරු මන්ත්‍රීතුමාට නම් ඇති. එහෙත්, අප බාර ගන්නට යන අය දෙමළ රාජ්‍ය පක්ෂයට උදවු දෙන පිරිසක් වුණොත් අපගේ ප්‍රශ්නය තවත් උග්‍ර වෙනවා නොවේද? රට සභා පණත ආදී දේවල් අප හිතන තරම් භයානක නැතැයි ගරු අගමැතිතුමා හේමත් කියනවා.

**ගරු ඩඞ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
පණත ඇහැටවත් දකින්නෙ නැතුව ඒ ගැන කථා කරන්නේ කොහොමද?

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)
සමා වන්න. තමුන්නාන්සේ කලබල වන්නට වුවමනා නැහැ; තමුන්නාන්සේට කථා කරන්නට අවස්ථාව ලැබෙනවානේ. නිළධාරි බලය බිඳින්නට නම් රට සභා අවශ්‍ය බව ගරු ඉඩම් ඇමතිතුමාත් කියනවා. ඒක ඇත්ත. එහෙත්, ඉල්ලන මිනිසුන් ඔක ඉල්ලන්නේ මොනවාටද? එසේ ඉල්ලන්නේ දෙමළ රාජ්‍ය පක්ෂයක් පිහිටුවන්නට බව සමහරුන් ප්‍රසිද්ධියේ කියනවා.

**ගරු ඩඞ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
කවුද කියන්නේ?

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)
පෙඩරල් පක්ෂය.

**ගරු ඩඞ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
කවදාද කිව්වේ?

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)
ඒ අයගේ පරමාර්ථය ඒකයි.

**ගරු ඩඞ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
කවුද එහෙම කියන්නේ?

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)
ගෙයක් බිඳින්නට යන හොරුන් ඒ බව ප්‍රසිද්ධියේ කිය කියා යන්නේ නැහැ. ගේ බිඳලා බඩුත් අරගෙන ගිහින් තියෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ජී. සේනානායක මයා.]

කොට තමයි දන්නේ ගේ බිඳලා බව. ඒවා ගේම, අඛණ්ඩභාවය බිඳින්නට යන අය තමයි ඕවා ඉල්ලන්නේ. ඒ අයගේ පර මාර්ථය ඒකයි. මේ එහි පළමුවැනි පිය වරයි. උඩුප්පිඩ්ඩි ගරු මන්ත්‍රීතුමා ඒවාට හවුල් නැති බව මා පිළිගන්නවා. එහෙත් නොයෙක් විධියට රටවල් බෙදන්නට කැමැති අය මේ රටේ පමණක් නොව ඉන්දියාවේත් සිටියා; අදත් සිටිනවා. ඉන්දියාවෙ අදත් ඉන්නවා. මදුරාසි ප්‍රදේශයේ බලවත් පක්ෂයක් ඒ අනුව වැඩ කරන්නට සිටින බව නේරුතුමාට එදා දැන්නුවා. නේරුතුමා නීති සකස් කළා එය නවත්වන්න. එම නිසා එවැනි පිරිසක් ඉන්න බව අප පිළිගන්න ඕනෑ. මේ උදවිය මෙහෙම තුන් ලක්ෂයක් භාර ගන්න විට එසේ භාරගන්නේ මොකටද කියා අපි බලන්න ඕනෑ. මේ රෙගුලාසිවලින් ඒ අදහස් තවත් දියුණු කර ගැනීමට ඉඩ තිබෙනවා නම් ඒවා නැවැත්වීමට අපි උත්සාහ කරන්න ඕනෑ. එහි ඇති භයානකකමයි මා මතක් කර දෙන්නේ.

අනික් කාරණය නියෝජ්‍ය කථානායකතුමනි, පැරණි අධිරාජ්‍ය යුගයේදී මේ රටේ වතුකාරයන්ට ප්‍රභූකාර බලතල දී තිබුණ බව තමුන්නාන්සේ දන්නවා ඇති. 1915දී, තමන් සාමදාන විනිශ්චයකාරවරුන්ය කියා තුවක්කුව එල්ල කර මිනිසුන්ට වෙඩි තැබූ ආකාරය අප දන්නවා. එහි ප්‍රතිඵලයක් වශයෙන් එදා කීප දෙනකු මරුමුවට පත් වුණා. ඒ වතුකාරයන්ට එදා තිබුණ තත්ත්වයෙන් වැඩි හරියක් අද සේදී අවසානයි. එහෙත් මේ පනත යටතේ නැවත වරක් ඒ වතුකාරයන්ට යම් බලතල වගයක් දී තිබෙනවා; සහතික කිරීමේ බලය දී තිබෙනවා. වතු ටිකක් තිබෙන පලියට, ඉඩම් ටිකක් තිබෙන පලියට තමන්ගේ කම්කරුවන්ට පුරවැසිකම් ලබා දෙන්නට මෙසේ විශේෂ අයිතිවාසිකමක් දෙන්නේ මොකටද? ඒ උදවියට සහතික කිරීමට බලයක් දෙනවා අසුවල් පුද්ගලයා සුදුසුය, වත්තේ මෙපමණ දිගු කාලයක් පදිංචිව සිටියාය, එමනිසා පුරවැසිකම දිය යුතුය කියා.

අපි හිතමු යම් කිසි ඉන්දියානු වතු හිමියෙක් ඉන්නවාය කියා. ඔහුගේ වත්තේ කල්ලතෝනීන් දහස් ගණනක් ඉන්නවා නම්, ඔවුන් බොහෝම හොඳය, වත්තේ මෙපමණ අවුරුදු ගණනක් සිටියාය. ඔවුන් සුදුස්සන්ය කියා ඒ සියලු දෙනා සම්බන්ධයෙන්ම එම වතුහිමියා සහතික කරන්නේ නැද්ද? ඇයි මෙවැනි කාර්‍යයක් සඳහා අපේ වෙනත් නිලධාරීන් නැද්ද? අපේ ග්‍රාම සේවකයන් ඉන්නවා. පොලිස් නිලධාරීන් ඉන්නවා. ගම් කාර්ය සභාපතිවරුන් ඉන්නවා. මොන වටද මේ වතු හිමි වතු පාලකයන්ට බලය දෙන්නේ? ඔව්වා හොඳයි සුද්දන්ගේ කාලයේ නම්.

**නියෝජ්‍ය කථානායකතුමා,**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Is not the hon. Member going outside the regulations?

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

No, Sir. The Regulations specify that the superintendents of estates have certain powers.—[*Interruption*] I cannot trace that now.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

That is right. He is in order—for once!

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

අපේ හබරාදුවේ ගරු මන්ත්‍රීතුමා පෙන්වා දුන්නා, මේ උදවිය පුරවැසියන් වශයෙන් අප විසින් භාරගන්නා විට ඡන්ද බලය ලැබීම නිසා මෙහි දේශපාලන වශයෙන් තිබෙන භයානකකම ගැන. මේ ප්‍රශ්නය සම්පූර්ණයෙන්ම රඳා තිබෙන්නේ ඒ ප්‍රශ්නය උඩයි. ඒ මොකද? දැනට ඒ වැසියන්ටත් අපේ වැසියන්ට වාගේම—අපේ පුරවැසියන්ට වාගේම—හාල් පොත් ලැබෙනවා, බඩු මුද්දරවු ලැබෙනවා, අනිකුත් දේවලුත් අපට ලැබෙන ප්‍රමාණයටම ලැබෙනවා. බාග වේලාවට වතු කම්කරුවන් වශයෙන් ඊටත් වඩා ලැබෙනවා වෙන්න පුළුවන්; අපට වඩා පහසුකම් තිබෙනවා වෙන්න පුළුවන්. ඒ නිසා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විශේෂ අමාරුවක් හෝ කරදරයක් උඩ හෝ නොවෙයි මේ පුරවැසිකම දෙන්නට යන්නේ. ඔවුන්ට දැනට ඡන්ද බලය නැති නිසා පුරවැසි භාවය ලබාගත් දවසේ සිට ඔවුන්ට ඡන්ද බලය ලැබෙනවා.

ඒ නිසා මේ සම්පූර්ණ ප්‍රශ්නය රැඳී තිබෙන්නේ ඡන්ද බලය උඩයි. එසේ නැතිව අපට මෙන් ඒ අයට වෙනත් ආර්ථික පීඩාවක් ඇති නිසා නොවෙයි. ඡන්ද බලය උඩ මේ ප්‍රශ්නය රැඳී තිබෙනවා නම් තුන් ලක්ෂයක් මේ රටට ගන්නා විට මොන ඡන්ද කොට්ඨාශවලටට ඒ පහර වදිනවාද කියා අප විසින් අසන ප්‍රශ්නය අයුතු ප්‍රශ්නයක්ද? මොකටද ඒ ප්‍රශ්නය වැසීමට හදන්නේ? මෙසේ ඒ ගැන නොකියන විට මෙහි අවුලක් ඇති කරන්න යනවාය කියන බයක් විශ්වාසයක් අප තුළ ඇති වෙනවා. එසේ නොකියනවා නම් ඔහුගේ ලිපිනය අසන්නේ මොකටද කියා අපි අහනවා. දැන් බලමු මේ කොටස:

Form E on page 12:
"6. Place of birth:
If born in Ceylon, give names of town, village or estate:
If born in India, give name of village or town, taluk and district, as far as you know:"

එතකොට උපන් රට, උපන් නගරය, උපන් ගම, තලුකය හා දිස්ත්‍රික්කයත් අසනවා. නමුත් පුරවැසිභාවය ලබා ගන්නා මේ අය කුමන ඡන්දදායක කොට්ඨාශයකට වැටෙනවාද යන ප්‍රශ්නය අසන්නට බැරිලු. මේක අප්‍රිකාව වැනි රටක කරන දෙයක් නම් අර්ථයක් තිබෙනවා. සම්පූර්ණ විස්තර සහිතව ලිපිනය ඉල්ලනවා නම් මේ අය කුමක ඡන්දදායක කොට්ඨාශයකට වැටෙනවාද යන්න කියන්නට බැරි ඇයි? ඡන්දය උඩම මේ ප්‍රශ්නය රඳා තිබෙන නිසා මේ අය කුමන ඡන්ද කොට්ඨාශවලට වැටෙනවාද යන්න අප විශේෂයෙන් ම දැන ගත යුතුයි. මේ අළුතින් පුරවැසිකම් ලබන උදවිය නිසා පාරම්පරික උරුමයක් ඇති අයගේ ඡන්ද බලය කොයි තරම් දුරට අහිමි වෙනවාද කියා පරීක්ෂණයක් පවත්වන්නට පුළුවන් වන්නේ ඒ අය කුමන ඡන්දදායක කොට්ඨාශවලට වැටෙනවාද කියා දැනගත්තායින් පසුවයි. එම නිසා ඒක අත්‍යවශ්‍යයෙන්ම දැනගත යුතු කාරණයක්. ඔහු උපන් කුඩා ගම, නැත් නම් මුඩුක්කුව කුමක්ද කියා [illegible] අපට අවශ්‍ය නැහැ. අපට අවශ්‍ය වන්නේ මේ අය කුමන ඡන්ද කොට්ඨශවලට වැටෙනවාද යන්න දැන ගැනීමයි. ඒක ඉතාමත්ම වැදගත් දෙයක්.

සියලු දෙනාම බොහොම සාධාරණව නීති ගරුකව යුතුකම් ඉෂ්ට කරන පිරිසක්ය කියා ගරු අගමැතිතුමා කල්පනා කරනවා. නමුත් ඒ කල්පනාව වැරදියි. හොර මැර වංචා කරන උදවිය අනන්ත සිටිනවා. නීතිය තමාගේ ප්‍රයෝජනයට පාවිච්චි කරන අය අනන්ත සිටිනවා. නුවර එළියේ සිදුවූ දෙයක් ගැන මා දන්නවා. මේ වාරයේ ජන ලේඛනය සකස් කළ අවස්ථාවේදී නුවරඑළියේ සිටින පුරවැසියන් කීප දෙනෙකු ඒ අවට කොට්ඨාශයකට ගියා. නුවරඑළියෙන් පිටත වතුවල වැඩ කරන පුරවැසියන් ජන ලේඛනය සාදන ටික දවසට නුවරඑළියේ ලයින්ස්වල පදිංචි කරවා ඒ අයගේ නම් ටික නුවර එළියේ නාම ලැයිස්තුවට ඇතුළු කළා. ඉන්පසු නැවතත් ඒ අය කලින් වැඩ කළ වතුවලටම දක්කා ගෙන ගියා. මොකටද එහෙම කළේ? නුවරඑළියේ ඉන්දියානු පුරවැසියන්ගේ ඡන්ද සංඛ්‍යාව වැඩි කරන්නටයි. ඉතින් මේ තුන් ලක්ෂයත් කොහේ වැටෙනවාද කියා නොදන්නවා නම් කුමන තත්ත්වයක් ඇති වේවිද කියා අපට සිතා ගන්නට පුළුවනි. ජන ලේඛන, මැතිවරණ නාම ලේඛන සාදන අවස්ථාවලදී ඒ අය කණ්ඩායම් වශයෙන් වත්තෙන් වත්තට පැන ගිහින් නම් ඇතුළු කර ගත්තාට පසුව නැවතත් පළමු සිටි ස්ථානවලටම යන්නට බැරි නැහැ. නුවරඑළියේ සිදුවූ දෙයක් ගැනයි මා දැන් සඳහන් කළේ. එමනිසා මේ කාරණය ගැන ටිකක් පරීක්ෂා කර බලන්න.

මේ පුරවැසිකම ලබා ගන්නා උදවියට අංකයක් තිබෙනවා. ඡන්ද ලැයිස්තුවලට ඒ උදවියගේ නම් ඇතුළු කරන විට නමට ප්‍රථමයෙන් හරියට වාසගම සඳහන් කරනවා වාගේ ඒ අංකයත් ඇතුළු කළ යුතුය කියා මා කලිනුත් ඉල්ලීමක් කළා. දැන් සිංහල කෙනෙකුගේ නම් අසුවල් ගමේ වික්‍රමාරච්චිගේ කිරිබණ්ඩා කියනවා වාගේ සියලුම විස්තර සහිතව වාසගමත් වැටෙනවා නොවැ. ඒ ආකාරයටම අසුවල් අංකය තිබෙන පලනියන්ඩි කියා නම ඇතුළු කරන්නට බැරි ඇයි? අසුවල් අංකය තිබෙන මුනියන්ඩි කියා නම ඇතුළු කරන්නට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ජී. සේනානායක මයා.]

බැරි ඇයි? ඒ අයගේ වාසගමක් වාගේ අංකය දමන්නට බැරි ඇයි? අංකය දැමිය යුතුය කියා මා කියන්නේ මේ නිසයි. නල්ලයියා කියා නමක් තිබෙනවාය කියමු. මේ නල්ලයියා කවදාවත් මැරෙන්නෙ නැහැ. ඒවාගේම සැම ලැයිස්තුවකම නල්ලයියා සිටිනවා. එක නල්ලයියා කෙනෙක් මැරුණොත් ඒ නම පාවිච්චි කරන්නට නව නල්ලයිය කෙනෙක් එනවා. මැරෙන උදවියගේ නම් ලැයිස්තුවලින් ඉවත් කිරීමක් වෙන්නෙ නැහැ. සැමදාම ඒ උදවිය නාම ලැයිස්තුවල සිටිනවා. එමනිසා අංකයත් ඇතුළු කළයුතුය කියායි මා කියන්නෙ. සිංහල ඡන්දදායකයකු හඳුනා ගන්නට වාසගමක් තිබෙනවා. ඒ විධියට මේ පුරවැසිකම ලබන උදවිය හඳුනා ගන්නට ඔවුන්ගේ අංකයත් දමන්නට බැරි ඇයි? ඒකට තමුන්නාන්සේලා විරුද්ධයි. ඒක සාධාරණද? මොකද විරුද්ධ? අද කරන ජාවාරම් කරන්නට බැරි නිසයි. මේ කොට්ඨාශයේත් ඡන්දය දීලා අනික් කොට්ඨාශයේත් ඡන්දය දීලා තවත් කොට්ඨාශයකත් ඡන්දය දෙන්න විදියක් ඇත්තේ නැහැ, එහෙම කළාම. එහෙම කළාම ඡන්ද ලැයිස්තුවල නොම්මරය වැටෙනවා. එසේ නැතුව මේකෙත් පලනියන්ඩි අරකෙත් පලනියන්ඩි කියා සඳහන් වන විට තේරුම් ගන්නට අමාරුයි. මේ නම්වලට මුලින් අකුරු ඇත්තේත් නැහැ. එසේ හෙයින් නොම්මරය දෙන එක ඉතාම අවශ්‍යයි. එහෙත් මේ ක්‍රමයට විරුද්ධ වන්නට හේතුව, කට්ට ප්‍රයෝග ගැට ක්‍රියාවට යෙදවෙන හෙයිනුයි. අයුක්තියට වැඩ කරන නිසායි. මේ කියන අන්දමට ක්‍රියා කළොත් එසේ කටයුතු කරන්නට බැරි වෙනවා. එසේ හෙයින් මෙම කරුණු මතක් කර දීම අපේ යුතුකමයි.

මේ ආණ්ඩුවට තිබෙන බලය උඩ කුමන ආකාරයකින් නැව් සම්බන්ධව ක්‍රියා කරන්නට පුළුවන්ද කියන කාරණය පිළිබඳව සාකච්ඡා කර තිබෙනවා. ඒ ගැන සාක්ෂි දී තිබෙනවා. නැව් කොම්පැනි කීපයක්ම ඇවිත් ප්‍රකාශ කළා, ඒ අන්දමට කටයුතු කරන්නට බලයක් නැතෙයි කියා. මේ නීතිය පැනවූ පමණටම නැව් ගමනාගමනය තහනම් කරන්නටවත් නැව් සිරබාරයට ගන්නටවත් බලයක් නැතැයි කියමින් නැව් කොම්පැනිකාරයන් ඇවිත් සාක්ෂි දුන්නා. ඇමතිතුමා ඉදිරිපිටදීම එසේ කිව්වා. එවැනි බලයක් නොමැති නම් අපි ඒ සඳහා වෙනම පනතක් ගෙනෙන්නට ඕනෑ නේද? ඉන්දියානු ප්‍රශ්නයේ ප්‍රධානම ගැටළුව වන්නේ පිට කිරීම වන හෙයිනුයි, මා එසේ කියන්නේ. පිට කරන මාර්ගය සකස් කර ගැනීම සඳහා නැව්වලට, අහස් යාත්‍රාවලට, රේල්ලුවලට බල කිරීමට අයිතියක් නොමැති නම් ඒ සඳහා බලයක් හදා ගන්නට ඕනෑ. "ආණ්ඩුවට අපේ නැව්වලට අත තියන්න මේ නීතියට අනුව විධියක් නැහැ" යනුවෙන් නැව් කොම්පැනිකාරයන් සාක්ෂි දෙමින් කිව්වා. එසේ නම් ඒ සඳහා වෙනත් නීති රෙගුලාසි සකස් කළ යුතුයි නේද? ඒ ගැන ක්‍රියා කරන්නේ නැත්තේ ඇයි? රෙගුලාසිවලින් කරන්නට බැරි නම් ඒ සඳහා පනතකින්වත් කටයුතු කළ යුතුයි නේද?

රක්ෂා නැති ප්‍රශ්නය ගරු අගමැතිතුමාට බොහොම තදින්ම වැදී තිබෙන බව පෙනෙනවා. රක්ෂා සඳහා දහස් ගණන් බලා සිටිනවා. රක්ෂා ලබා දෙනවා නම් විශේෂයෙන් උඩරට තේ වතුවල රක්ෂා කීපයක්වත් අපේ රටවැසියන්ට ලබා දීමේ මාර්ග සකස් කරන්නට ඕනෑ. දුක් සහිත කම්කරු ජීවිතයක් ගෙවන්නට අපේ උදවිය කැමති නැති බව කියන අය තවත් සිටිනවා. ඒ කෙසේ වෙතත් පරිපාලන අංශයේත් රක්ෂා තිබෙනවා. තේ ෆැක්ටරිවල රක්ෂා තිබෙනවා. කන්තෝරුවල රක්ෂා තිබෙනවා. පාලන අංශයේ රක්ෂා තිබෙනවා. ඇයි එම රක්ෂා සඳහා අපේ උදවියට අවස්ථාවක් සලසා නොදෙන්නේ? විශ්ව විද්‍යාලවලින් අනන්තවත් අපේ උදවිය පිට වෙනවා. ඒ උදවියට රක්ෂා ලබා දෙන අවස්ථාවේදී කළයුතු දේ බොහෝයි. පනතට අනුව රටින් පිට කරන්නට පුළුවන් බවට සම්මත වුණු උදවිය තව දුරටත් තියාගන්නේ නැතුව ඒ උදවියට ගෙවන්නට තිබෙන දේ ගෙවා දමා පිටත් කළොත් අපේ විශ්ව විද්‍යාලවලින් පිට වන දරුවන්ට රක්ෂා ලබා දිය හැකියි නේද? ලිපිකරුවන් වශයෙන් වතුවල රක්ෂා ලබා ගන්නට සිංහලයනට පුළුවන්කමක් තිබෙනවාද? දෙමළ කෙනෙක්ම ගන්නට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඕනෑ. කම්කරු අංශයේ පමණක් නොව පාලන අංශයේ රක්ෂා ගැනත් එහෙමයි. එපමණක් නොවෙයි, වතුවල සුපිරින්ටෙන් ඩන්ට් පදවි පවා සිංහලයනට කරන්නට බැරි තත්ත්වයකට කටයුතු කරන අවසථා අනන්තයි. සිංහල ළමයින්ට සුද්දන් කරපු වැඩේ කරන්නට ඉඩ නොදෙන විධියට සංවිධානය වී යම් යම් කටයුතු කරගෙන යනවා නම් එය වැළැක්වීම සඳහා මේ පනත පාවිච්චි කරන්නට ඕනෑ නේද? එහෙම වැඩ කටයුතු කරන උදවිය පන්නන්නට වුවමනා නේද? පිට කරන්න වෙන් කර තිබෙනවා නම් ඒ අය වහාම පිට කරන්නට ඕනෑ නේද? කලින්ම අල්ලා ගන්නට ඕනෑ මේ කරදර කරන අයයි. ඔවුන්ට ගෙවන්න තිබෙන මුදලක් ගෙවා ඔවුන් වහාම පිට කරන්නට ඕනෑ. එසේ නොකර අප තබාගන්නා අය අපේ ඡන්ද ලැයිස්තුවලට පටවනවා. යන අයට කොමසාරිස්වරයා බල කරනවා පිට කරන තුරුම හිතූ කාලයක් මේ රටේ ඉන්නට බල පත්‍ර ලබා ගන්නට. ඒ අන්දමේ රෙගුලාසි පනවන එක සුදුසුද කියා මා අහනවා.

මේ රෙගුලාසි දැන් පළ කර අවසානයි. මේවා ක්‍රියාත්මක කරන්න දැන් අවසථාව ලැබී තිබෙනවා. එක්තරා අදහසකින් ගිවිසුම අත්සන් කළා. ඒ අදහස ක්‍රියාත්මක කරනවාය කියා මූලික පනතක් සම්මත වුණා. ඒ පනත සම්මත කළ අවසථාවේ ඒ පනතේ ආකාරය ගැන අපට එක්තරා අවිශ්වාසයක් ඇති වුණා. ඒ පනත ක්‍රියාත්මක කරන්න හදා තිබෙන රෙගුලාසි කෙළින්ම හදා තිබෙන්නේ ලංකාව බාර ගත යුතු කොටස එසේ බාරගන්නා අතර ඉතිරි අය මෙහි හිටියාට අපට කමක් නැහැ කියන අදහස උඩයි. ඒ බව පෙන්වා දෙන්නට ඕනෑ. මේ කරුණුවල භයානකකම පෙන්වා දෙන්නට ඕනෑ. ඉඩ තිබෙනවා නම් මේ ගැන කථා කරන්න තව කාලය දෙන්න. තව උපදේශ ලබා ගන්න කාලය දෙන්න. ක්‍රියාත්මක වන ආකාරය පෙන්වන්නට කාලය දෙන්නට ඕනෑ. ඒ අය ඊයේ පෙරේදා වැඩ වර්ජනයක් ඇති කළා. එමෙන්ම ලබා ගන්නට ඕනෑවුණු දේවල් ලබා ගත්තා. එහෙත් වැඩ වර්ජනය කළ අනික් අය ගැන කිසිම කරුණාවක් පෙන්නුවේ නැහැ. ඒ අය හැම අංශයකින්ම ලබා ගන්නට ඕනෑ දේවල් ලබාගෙන වැඩ කර

ගෙන යනවා. ඒ කටයුතු කරන අය ඒවා කිරීමෙන් නවත්වන්නටයි අපි කටයුතු පිළියෙළ කරන්නට ඕනෑ. අපේ තොන්ඩමන් මන්ත්‍රීතුමාගේ ප්‍රධානත්ව යෙනුත් මේ ව්‍යාපාර ගෙන යනවා.

මේ රටට විශාල වශයෙන් කල්ලතෝනීන් එන බවක් මේ රෙගුලාසිවලින් පිළිගෙන නැහැ. ගියොත් ගියාමයි, නැවත එන්නේ නැත කියලයි හිතන්නේ. එහෙත් සිදුවන්නේ මොකක්ද? එහාට යනවා, ආපසු එනවා; නැවත යනවා, ආපසු එනවා. එක මිනිහාම එසේ කැර කෙන්නට ගියොත් අපේ ලැයිස්තු නම් පිරේවි. වී.ආර්.පී. අවලංගු කර පිට කළ අය අනන්ත වාරවල නැවත අසු වී තිබෙනවා. පිට කරන හැම වරකටම ලංකා පුරවැසියෙක් ඇති වෙනවා නම් එකම මිනිහා කීප වරක් පිට කරන විට 5,25,000 ම යැවේද? එක්කෙනා දහ පහළොස් ගමන යන්නට පටන් ගත්තොත් අපේ ලැයිස්තු පිරෙනවා. එහෙත් ඒ අය ගේ ලැයිස්තු සම්පූර්ණ වන්නේ නැහැ. ඒ නිසා තමයි මැතිනියගේ ගිවිසුමේ කියා තිබෙන්නේ මේ ගිවිසුමෙන් ඉන්දියානු ප්‍රශ්නය අපි සම්පූර්ණයෙන්ම විසඳන්නේ නැත, අපි එයින් එක්තරා කොටසක් පමණක් අර ගෙන විසඳන්නට උත්සාහ කරනවාය කියා. තුන් ලක්ෂයක් බාරගන්න අතර පන් ලක්ෂ විසිපන්දාහක් පිට කරනවා. මේ ගිවිසුම බලපාන්නේ නව ලක්ෂ ගණනකට පමණයි කියා තීරණය කළා. ඒ නිසා ප්‍රධාන වශයෙන් කළ යුත්තේ ගිවිසුමට අදාළ වන අයගේ නම් ලැයිස්තුවක් හදා ගැනීමයි. ඒ නව ලක්ෂ ගණනින් තුන් ලක්ෂයක් මෙන්න අපි බාර ගත්තා, පන් ලක්ෂ ගණන මෙන්න බාර ගන්න කියා අපි බාරදෙන්නට ඕනෑ. එවිට ගිය කෙනෙකුට නැවත එන්න බැහැ. ගොඩවල් දෙකට බෙදුවේ අර නව ලක්ෂ ගණන නිසා ගිය කෙනෙකුට ආපසු එන්න බැහැ. ගිය කෙනෙක් නැවත පැමිණියත් අර පිට කරන ගොඩට ඔහු වැටෙන්නේ නැහැ. ඒ නිසා එවැනි ලැයිස්තුවක් හදා තිබෙනවාද? එවැන්නක් නැහැ. ඉන්දියාවට යැවෙන උදවිය එන්නේ කොහෙන්ද කියා සොයා තිබෙනවාද? අපේ ලංකාවේ පුරවැසියන් වන අය එන්නේ කොහෙන්ද කියා සොයා තිබෙනවාද? එයත් නැහැ. මූලික ලැයිස්තු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වක් තිබෙනවා නම් සැක නැතිව කියන්න පුළුවන් මේ මූලික ලැයිස්තුව තමයි අපේ ගිවිසුමට බලපාන්නේ කියා.

මෙය තමා අපේ බෙදිල්ල. එහෙත් දැන් එහෙම බෙදීමක් කරන්නට විධියක් නැහැ. ගණන් දන්නේ නැහැ. අද යම් කෙනෙක් මිලිටරියෙන් වාර්තා ඉල්ලුවොත් ලැබෙන්නේ මොනවාද? වාර්තාවක් ඉල්ලා බලන්න. පොලිසියෙන් වාර්තාවක් ඉල්ලා බලන්න. ඒ අය අපට දෙන්නේ වෙනස් තත්ත්වයක් පෙන්වන වාර්තාවක් බව එවිට පෙනී යනු ඇති. ගරු අගමැතිතුමා වාර්තාවක් ඉල්ලන විට කිසිම කරදරයක් දැන් නැතැයි දැක්වෙන වාර්තාවක් එතුමාට ඉදිරිපත් කරනවා ඇති. කල්ලතෝනින් නැහැ, අපට දැන් කල්ලතෝනීන්ගෙන් කරදරයකුත් නැහැ යනුවෙන් වාර්තා කරනවා ඇති. එහෙත් තිරිකුණාමළයේ සිදු වන දේවල් මොනවාදැයි මා දන්නවා. වරායේ වැඩ කරන අය ගැනත් මා දන්නවා. එතැන වැඩ කරන අයගෙන් වැඩි දෙනා කල්ලතෝනීන් බව කියන්නට පුළුවනි. ඒජන්තතුමාගෙන් වාර්තාවක් ඉල්ලුවාම, මේ රටේ පුරවැසි ලයිස්තුවල සටහන් වූ නම් ඇතිව ඉන්න අයගෙන් හුඟ හරියකගේ නම් කැපිලාය කියාවි. මෙහි ඉන්න අය අතර වැඩ වර්ජනයකුත් ඇති වුණා. දෙපාර්තමේන්තුවෙන් ඇහුවොත්, එහෙම කිසිම දෙයක් නැතැයි කියාවි. ඉතින් කොයි විධියට වැඩ කරන්නටද? ඔහොම වැඩ කරන්නට පුළුවන්ද?

වැඩිදුර යන්නට වුවමනාවක් ඇත්තේ නැහැ. මා කියන කාරණය බොහොම පහසුවෙන් තේරුම් ගන්නට පුළුවනි. පැලියගොඩට යන්න. දවල් කාලයේ නොවෙයි සවස් කාලයේ යන්න. ළිඳ ළඟ නැත්නම් පයිප්පය—පොම්පේ—වටේ ඉන්න දෙමළ ගැහැණුන් සොයා බලන්න. මේ පැත්තේ කොපමණ දෙමළ ගැහැණුන් සිටිත්දැයි පැලියගොඩ පැත්තට ගිහිල්ලා බැලුවොත් පෙනී යනවා ඇති. දොළහට විතර ගියොත් හුඟ දෙනකු සිටින බව දකින්නට ලැබෙන්නෙ නැහැ. කොහේද මේ උදවිය දවල් කාලයේ ඉන්නේ? දවල් කාලයට එළියට එන්නේ නැහැ. මෝල්වල, වැඩ පොළවල් ඇතුළේ ඉන්නවා. රෑට තමයි වතුර ගන්නට එන්නේ. මා දඹදෙණි කොට්ඨාශයට



රැස්වීම් සඳහා ගොස් ආපසු එන විට පැලියගොඩ පැත්තේ මොවුන් පිරිලා ඉන්න හැටි දැකලා තිබෙනවා. ඒ පළාතේ මන්ත්‍රීවරයා කියන්නේ කොයි තරම් විශාල පිරිසක් සිටිනවාද කීවොත් දැන් ඒ ප්‍රදේශය දෙමළ කොට්ඨාශයක් වෙලා තිබෙනවාය යන්නයි. කන්තෝරුවෙන් ඇහැව්වොත් එහෙම දෙයක් නැතැයි කියාවි. මෝලක්, කඩයක්, වරායක් වැනි ස්ථානයක් තිබෙනවා නම් එතැන ඉන්දියානු කල්ලතෝනීන් තමයි වැඩි වශයෙන් වැඩ කරන්නේ. මොවුන්ගෙන් මෝල්වල, කඩවල, වැඩ ගන්න උදවිය නියම පඩියක් වත් ගෙවන්නේ නැහැ. අඩු පඩියට වැඩ කරවා ගන්නට පුළුවන් නිසා ඒ විධියේ උදවිය යොදා ගන්නවා. වහලුන්ගෙන් වැඩ ගන්නා ආකාරයට වැඩ ගන්නවා. ලැයිස්තුවලින් සොයා ගන්ට ගියොත් ලැබෙන්නේ නැහැ. කල්ලතෝනීනුත් ගලාගෙන එනවා, ගලාගෙන යනවා. හිතු මතයට එනවා, හිතු මතයට යනවා, ඔහොම කරද්දී අපි රෙගුලාසියක් හදාගෙන ප්‍රශ්නය විසඳන්නට උත්සාහ කරනවා. අප අතින් මූලික යුතුකම් ඉටු විය යුත්තේ කා කෙරෙහිද යන්න ගැන අප කල්පනා කරන්නට ඕනෑ. අපි, අපේ රටේ වැසියාගේ නියම අයිතිවාසිකම් ලබා දීමට වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවාද?

හාල් පොතක් නැත්නම් ඒ මිනිහාට මොනම අයිතියක්වත් නැති තැනටයි දැන් වැඩ කටයුතු සැලසී තිබෙන්නේ. අපේ රටේ සිටින අපේම මිනිහාට එවැනි තත්ත්වයක් ඇති වී තිබෙනවා. තැපැල් කන්තෝරුවට ගිහිල්ලා මනි ඕඩරයක් ඉල්ලන්නට පුළුවන්ද? සමුපකාර සමිතියකට වත් ගිහිල්ලා බඩුවක් ගන්නට පුළුවන්ද? බැංකුවකට ගිහිල්ලා බඩුවක් උගස් කර මුදලක් ලබා ගන්නට පුළුවන්ද? කෙහෙන් ආවාදැයි අපි දන්නේ නැහැයි කියනවා. ඔවුන්ට හඳුනා ගැනීමේ බලපත්‍රයක් දීලා නැහැ. ඒ ගැන තවම කල්පනා කරලාවත් නැහැ. අපේ මිනිහාට යුතුකම් ඉෂ්ට කරන්නට මොනවාද කර තිබෙන්නේ? මේ රටේ ඉන්න රටක් නැති, රට සූරාගෙන කන අයටයි ඔක්කොම කර දෙන්නේ. එතැනටයි යුතුකම් ඉෂ්ට කරන්නට විශාලම වැඩ පිළිවෙළ ඇති කර තිබෙන්නේ, මේ රටේ ජනතාව ගැන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සොයා බැලුවාම අපේ මිනිසුන්ට හඳුනා ගැනීමේ බලපත්‍රයක් හෙවත් කාඩ් එකක් දෙන බවක් හැමදම කියතත් තවම දීලා තිබෙනවාද? අද වනතුරු එය කර තිබෙනවාද? අපේ රටවාසීන්, අපේ ඡන්දදායකයන්, අපේ මිනිසුන්, අපේ මහජනයා හඳුනා ගැනීමයි පළමුවෙන්ම කළ යුත්තේ. එතකොට පිටස්තර උදවිය කවුරුන්දැයි අපට පහසුවෙන් හඳුනා ගන්නට පුළුවනි. අපේ ජනතාව හඳුනා ගන්නේ නැතිව—ඒ සඳහා වැඩ පිළිවෙළක් වහාම ඇති නොකර—රටක් නැති, ජාතියක් නැති පිරිස කවුරුන්දැයි හඳුනා ගන්නේත් නැතිව මේ විධියට රෙගුලාසි මාලාවක් ඉදිරිපත් කිරීමෙන් පමණක් මේ ප්‍රශ්නය අපට විසඳන්නට පුළුවන්ද?

මෙහෙම කරල මේ ප්‍රශ්නය කවදාවත් විසඳන්නට බැහැ. තමුන්නාන්සේ සොයා බලන්න කී දහකට වී. ආර්. පී. නිකුත් කර තිබෙනවාද, ඒ උදවියගෙන් කී දෙනෙකු කාලය අවසාන වීම නිසා පිටවී ගොස් තිබෙනවාද, කී දාහක් තවම මේ රටේ නැවතී සිටිනවාද කියා. ඒ උදවිය පිට කරන්ට තව කොපමණ කලක් ගත වෙයිද කියා අහන්න. වී. ආර්. පී. ප්‍රශ්නය පාලනය කරන්ට බැරුව මේ පනතෙන් කොමසාරිස්තුමාට අණ කරනව, "තුන් ලක්ෂයකට මේ රටේ ඉන්න තවත් බලපත්‍ර වර්ගයක් නිකුත් කර පන්" කියා. මම කලින් කිව්ව අන්දමට වී. ආර්. පී. කියන්නෙ "පාස්පෝට්" එකක් තිබෙන මිනිහෙකුගේ ඒ පාස්පෝට් එකේ සීල් එකක් ගහනවටයි. ඒ උදවිය පාලනය කරන්ට බැරි නම් "පාස්පෝට්" නැති උදවියටත් මේ රටේ ඉන්න බලපත්‍රයක් නිකුත් කළොත් කොහොම අවුලක් ඇති වෙයිද? මෙතරම් කලක් මේ ප්‍රශ්නය අවුල් වෙලා කුණුවෙලා අනන්ත වේදනාවකින් සිටින මේ අවස්ථාවේ මම අහන්ට කැමතියි අද මේ රටට එන විදේශිකයින්ගේ ලැයිස්තුවක් මේ රටේ තිබෙනවාද, මේ රටෙන් පිට වී යන විදේශිකයන්ගේ ලැයිස්තුවක් මේ රටේ තිබෙනවාද කියා. අපි එංගලන්තයට ගිහින් ගොඩ බහින කොටම පෝරමයක් පුරවා භාර දෙන්ට ඕනෑ. සමහර රටවල කාඩ් එකක් දෙනව ඒක ගිහින් දෙන්ට ඕනෑ තමන් නවතින හෝටලයට. අසුවල් විදේශිකයා ඇත් ඉන්නෙ අසුවල් ස්ථානයේ කියා ඕනෑම වෙලාවක ඒ රටේ පොලීසියෙන් ඇහුවොත් දැන ගන්න පුළුවනි. සෑම රටේම එහෙමයි. අද වන තුරු අපේ රටේ විදේශිකයන් පිළිබඳ ලැයිස්තුවක් නැහැ. එන්නෙ කවුද, යන්නෙ කවුද කියා දන්නෙ නැහැ. මෙතැන හොරෙන් එන්ට දෙයකුත් නැහැ. තිකම් බෝට්ටුවක් ගත්ත, ආව. කවුද තහනම් කරන්නෙ? කෙනෙක් නැහැ. මේක විවෘත රටක්. එංගලන්තයේ නම් පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල විදේශිකයන්ගෙ ලැයිස්තුවකුත්, "ඒලියන් රෙජිස්ටර්" නමින් තවත් ලැයිස්තුවකුත් වශයෙන් ලැයිස්තු දෙකක් තිබෙනව. "ඒලියන් රෙජිස්ටර්" කියන ලැයිස්තුවත් මේ රටේ තිබෙනවද? ඒවා අවශ්‍ය දේවල්.

ඉතාම අවශ්‍ය අංග කීපයක් භාරව තිබෙන්නේ විදේශ කටයුතු අමාත්‍යාංශයටයි. අද රටේ කිසිම ආරක්ෂාවක් නැහැ. මේ රටේ යුද්ධ හමුදාවත්, නාවුක හමුදාවත් අනිකුත් හමුදාත් සකස් කරන්නේ රට වැසියන් වැඩ වර්ජනයක් කළොත් ඔවුන්ට වෙඩි තබන්ට පමණයි. ඒකටයි ඒ හමුදා ලැහැස්ති කර තිබෙන්නෙ. ඉතාම දුර්වල අංශය ඒකයි. මේ රට ආරක්ෂා කරන්ට කිසිම වැටක් බැඳල නැහැ. මේ රටට නීති විරෝධී ලෙස ඇතුළු වන අයට වෙඩි තියන්න යයි මා කිව්වොත්, "අපොයි මේ ආර්. ජී. වෙඩි තියන්න කියනව නේද?" කියා මවිත වෙනව. වෙඩි තියනවා කියන එක පුදුම දෙයක්. පාකිස්ථානයේ පළවන පත්‍රයක් අරගෙන බැලුවොත් පෙනී යනව, ඉන්දියාවෙන් පාකිස්ථානයට පැන ගිය කල්ලතෝනීන්ට වෙඩි තැබූ ගණන කොපමණද කියා. ඉන්දියාවෙ පළවන පත්‍රයක් අරගෙන බැලුවොත් පෙනී යනව, වෙඩි තිබ්බ පාකිස්ථානුන්ගෙ ගණන කොපමණද කියා. බර්ලිනයේ තාප්පයෙන් එහා මෙහා පැනීම නිසා වෙඩි තැබූ අයගේ ගණන් නිතර පත්‍රවල පළ වෙනව. මෙක්සිකෝවලින් ඇමෙරිකාවට පණින උදවියට වෙඩි තබන අන්දම ඒ රටේ නානාපති කාර්යාලයෙන් ඇසුවොත් දැන ගන්න පුළුවන්. මේ රටේ මායිම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ජී. සේනානායක මයා.]

රැකීමට තුවක්කු පාවිච්චි කරන්නට බැරි නම් මේ රටේ ආණ්ඩුවේ වගකීම මොකක්දැයි මා අහගන්නට කැමැතියි. රට රකින්නට යුද්ධයක් එන තුරුම ඉන්නවාද? ඊට කලින් රට ආරක්ෂා කළ යුතු නැද්ද? මේ රටේ මායිම් රකින්නේ කම්බි වැටවල් ගැසීමෙන් පමණක්ද? කම්බි වැටවල් ගැසීමෙන් පමණක් මේ රටට හොරෙන් එන කල්ලතෝනීන් මැඩ පැවැත්විය හැකිද? බලපත්‍ර පාවිච්චි කරන්නේ ඇයිදැයි මා අහනවා. බලපත්‍රයක් නැතිව එක රටකින් තව රටකට යන්නට බැරි ඇයි? රට වටා වැට බැඳ වැට මුර කරන්නට භටයන් යොදනවා. ඒ වැටෙන් පැන්නොත් වෙඩි තබන නිසා නියම තොටුපොළවල්වලිනුයි, රට ඇතුළට එන්නේ. අනෙක් හැම රටකම තත්ත්වය ඒකයි. ඒ වැට පැන්නොත් තුවක්කු පාවිච්චි කරනවා. එහෙත් අපේ රටේ? වැට පැන්නත් තුවක්කු පාවිච්චි කරන්නෙ නැහැ.

නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සේත් ලෝකයේ හැම තැනකම වාගේ ඇවිද්ද කෙනෙක්. මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් මේ විධියට ක්‍රියා කරන රටක් ලෝකයේ වෙන කොහේවත් තිබෙනවාදැයි මා තමුන්නාන්සේගෙන් අහන්ට කැමතියි. ආරක්ෂාව සඳහා බැඳි වැටක් නැති රටක් තිබෙනවාද? ඒ වැට නොරකින රටක් තිබෙනවාද? එහෙත් මේ රටටි වඩා රට ඇතුළේ තිබෙන පොල් වත්ත, තේ වත්ත, රබර් වත්ත වටිනවා! පොල් වත්තට පනින මිනිසුන්ට වෙඩි තබන්නට මුරකාරයන් ඉන්නවා. ඒ වෙඩි තැබීම සාධාරණ යැයි නීතියෙනුත් පිළිගන්නවා. හැම පොල් වත්තකම, තේ වත්තකම, රබර් වත්තකම පාහේ මුරකාරයන් ඉන්නවා. ඔවුන්ට තුවක්කු දී තිබෙනවා. ඔවුන් ඒවා පාවිච්චිකර වත්තට හොරෙන් පනින අයට වෙඩි තබනවා. අවසර නැතිව හේනකට පැන්නොත් ඔහුටත් වෙඩි තබනවා. එහෙත් රට වට කොට ඇති වැට පැන්නොත් පමණක් "වෙඩි තබන්නට එපාය" යනුවෙන් තහනමක් තිබෙනවා. ඒ කියන්නේ පොල් වත්ත රටට වඩා වටිනවා! ඒ විධියටයි මේ රටේ විදේශීය අංශය පාලනය කෙරෙන්නේ. මේ රටේම තිබෙන පොල් වතු, තේ වතු, රබර් වතු රැකීම සඳහා තුවක්කු දී මුරකරුවන් දමා සිටිනවා නම්, ඒ විධියට රට රකින්නට බැරි ඇයි? මේ රටට නියම විධියට ඇතුළු වන අයගේ ලැයිස්තු හදාගෙන, මේ රටට හොරෙන් එන්නට බැරි වන ආකාරයට මේ රට ආරක්ෂා කිරීම සඳහා යුද්ධ හමුදාව පාවිච්චි කරන්නට අපට බැරි නම් මෙය අපේ රට යැයි කියන්නට පුළුවන්ද? ඕනෑම කෙනකුට මේ රටට එන්නට පුළුවනි, මේ රටින් යන්නට පුළුවනි. පාස්පෝට් ඇතුවත් මෙරටට එනවා, නැතුවත් එනවා. මේ රටේ මිශ්‍ර ජනතාවක් වාසය කරන නිසා, මේ රෙගුලාසි නියම විධියට ක්‍රියාත්මක වන්නට නම් මේ රෙගුලාසි සම්මත කරන්නට කලින් හඳුනා ගැනීමේ බලපත්‍ර දෙන්නට ඕනෑ. ඊට පසුව, මේ රටට ඇතුළු වන අයගේ ලැයිස්තු තබා ගන්නට ඕනෑ; අනවසරයෙන් මෙරටට ඒම නවත්වන්නට ඕනෑ. එවිටයි, මේ රෙගුලාසි නියම විධියට ක්‍රියාත්මක කරන්නට පුළුවන් වන්නේ. එවිට දැනගන්නට පුළුවනි, "අසුවලා ඇවිත් තිබෙන්නේ බලපත්‍ර ඇතිවද, හොරෙන් වැට පැනලාද" කියා.

**එකල්හි වේලාව අ. භා. 7 වූයෙන් කටයුතු අත්සිටුවා විවාදය කල් තබන ලදී.**

**එතැන් සිට විවාදය 1968 පෙබරවාරි 11 වන ඉරිදා පවත්වනු ලැබේ.**

அப்போது பி. ப. 7 மணியாகிவிடவே சபையின் நடவடிக்கைகள் இடைநிறுத்தப்பட்டு, விவாதம் ஒத்திவைக்கப்பெற்றது.

1968 பெப்ரவரி 11, ஞாயிற்றுக்கிழமை விவாதம் மீள ஆரம்பமாகும்.

*It being 7 P.M., Business was interrupted, and the Debate stood adjourned.*

*Debate to be resumed on Sunday, 11th February 1968.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# කල් තැබීම

## ஒத்திவைப்பு

## ADJOURNMENT

**යෝජනාව ඉදිරිපත් කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදි:**

"මන්ත්‍රී මණ්ඩලය දැන් කල් තැබිය යුතුය".—[ගරු සී. පී. ද සිල්වා].

"சபை இப்பொழுது ஒத்திவைக்கப் பெறுமாக".—[கௌரவ சீ. பீ. டி சில்வா] எனும் பிரேரணை பிரேரிக்கப்பட்டு, வினா எடுத்தியம்பப் பெற்றது.

*Motion made, and Question proposed,*

"That the House do now adjourn".—[*The Hon. C. P. de Silva*].

**එම්. තෙන්නකෝන් මයා.** (නිකවැරටිය)

(*திரு. எம். தென்னக்கோன்—நிக்கவரட்டிய*)

(Mr. M. Tennakoon—Nikaweratiya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද උදේ ප්‍රවෘත්ති පත්‍ර කියැවූ අප කාටත් කනගාටුවට පත් වන්නට සිදු වුණා. බණ්ඩාරවෙල ප්‍රදේශයේ ඇති වූ ඛේදජනක බස් රිය අනතුර ගැන අප කවුරුනුත් අද පත්‍රවලින් කියෙව්වා. අද දවල් 12 වන විට ජීවිත 24 ක් පමණ නැති වී ගොස් තිබෙනවා. මේ මොහොත වන විට තවත් අයගේ ජීවිත හානි වී තිබෙන්නට පුළුවනි. ඊයේ බණ්ඩාරවෙල බස් රිය අනතුර ඇති වන්නට පෙර පසුගිය සති අන්තයේදී එසේ නැත්නම් පසුගිය සතියේ පෙර පෝයට පෙර දා දෝ කොළඹ-රත්නපුර පාරේ වැලිවිටදී බස් රථ දෙකක් එකට හැප්පීම නිසා මරණ තුනක් සිදු වුණා. මේ විධියට බස් රිය අනතුරු සිදු වෙනවා නම් බස් රියවල ගමන් කරන පොදු මහජනයාට එය විශාල අවහිරයක් බව අපට හිතන්නට සිදු වෙනවා.

බස් රථ ධාවනය කරන රියැදුරු මහතුන් ගැන මේ අවස්ථාවේදී වචනයක් සඳහන් කරන්නට ඕනෑ. නියම බස් රියැදුරන් නොවන උදවිය බස් රිය ධාවනය සඳහා යොදවා ඇති බව පසුගිය කාලවල අපට දකින්නට ලැබුණා. මේ අයවලුන් මොන ආකාරයට සේවයට බඳවා ගත්තා දැයි දන්නේ නැහැ. ඒ වාගේම මොන ආකාරයට මේ අයට බස් රියැදුරු බලපත්‍ර ලබා ගන්නට පුළුවන් වුණාදැයි අප දන්නේ නැහැ. කෙසේ වුවත් ඒ තරම් දුරට වගකීමක් දරන්නට බැරි පුද්ගලයන්ට මෙම භාරදූර කාර්යය භාර දී තිබෙන බව නම් අපට දකින්නට තිබෙනවා. මගීන් හැටක් හැත්තෑවක් ගමන් කරන බස් රියක ඇති නියම වගකීම දරාගෙන කටයුතු කරන්නට සමහරුන්ට පුළුවන් බවක් ඇකීමෙන් පවා පෙනෙන්නේ නැහැ. වගකීමෙන් තොරව බස් රථ ධාවනය කරවන රියැදුරන්, බස් රථවල ගමන් කරන කෙනකු හැටියට නොයෙක් වතාවල මා දැක තිබෙනවා. තමන් භාරයේ ජීවිත ගණනාවක වගකීම තිබෙන බව අවබෝධ නොකර හිතුවක්කාර අන්දමට බස් රථ ධාවනය කරවන බස්රියැදුරන් අපට දකින්නට ලැබී තිබෙනවා. ඒ අය ඒ විධියට හිතුවක්කාර අන්දමට බස් රථ ධාවනය කරවන්නේ ඒ අය හිතුවක්කාර අන්දමට සේවයට බඳවා ගැනීම නිසාදැයි අප තුළ සැකයක් ඇති වෙනවා. දවසින් දවස අලුතෙන් පුහුණු වන, පුහුණු කරවනු ලබන, බස් රියැදුරන් එමට සිටිනවා. අද මේ වාගේ දුඃඛිත තත්ත්වයන් ඇති වන්නේ ඒ අය නිසයි.

බස් රිය අනතුරකින් 24 දෙනකු මරුමුවට පත් වීම මෙරට බස් රථ ගමනාගමන ඉතිහාසයේ ඉතාමත්ම දරුණුම ඛේදවාචකය බව කියන්නට පුළුවනි. මේ වාගේ දරුණු විපත්තියක් මීට පෙර ඇති වී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]

නැහැ. අපේ කාලයේදී නම් අපට දැන ගන්නට ලැබී නැහැ. ඊට කලින් සිදු වෙලා තිබෙනවාද කියා මා දන්නේ නැහැ. අර තරම් භයානක අන්දමට සිදුවුණු මීරිගම දුම්රිය ගැටුමෙන් මරණයට පත් වුණේත් විසි ගණනක් පමණයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

කවුකුරුන්දෙ?

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

ඔව්, එයින් කී දෙනෙක් අන්තරා වුණාද? මා හරියටම දන්නේ නැහැ. කෙසේ වෙතත් අද තත්ත්වය බොහොම භයානකයි. අද බසයකට නගින කෙනෙක් සිතන්නේ ගමන අවසාන කර බස් එකෙන් බහින්න අවස්ථාව ලැබේදෝ නොලැබේදෝ කියායි. එවැනි සැකයක් අද බස් එකකට නගින විට ඇති වෙනවා. ඒ තත්ත්වය බොහොම භයානකයි. ඒ නිසා අපට වුවමනා කරනවා මේ සම්බන්ධයෙන් කරුණු කිහිපයක් ඇමතිතුමාගෙන් හා රජයෙන් ඉටු කරවා ගන්න. පසුගිය දා වැලිවිට ප්‍රදේශයේ රිය අනතුරක් සිදු වුණා. ඒ රිය අනතුරට සම්බන්ධ රියැදුරු කොයි ආකාරයට සේවයට බඳවා ගෙන සිටි කෙනෙක්ද, ඔහු සේවයට පළ පුරුදු කෙනෙක්ද, එවැනි වගකීමක් භාර දීමට පුළුවන් කෙනෙක්ද, එම වගකීම දැරීමට ඔහුට ශක්තියක් තිබුණාද, ඔහුට ඒ තනතුර දීම සඳහා තිබුණු සුදුසුකම් මොනවාද, ඔහුට ඒ විධියේ වගකීමක් භාර දී ගමනාගමන මණ්ඩලය කර තිබෙන්නේ පොදු ජන යහපතට අදාළ දෙයක්ද, යන කරුණු ගැන අපට පැහැදිලි කර ගන්න ඕනෑ.

ඊළඟට බණ්ඩාරවෙල රිය අනතුර ගැන බලමු. අහිංසක ජීවිත 24 ක් දැනටමත් අවසානයි. මේ වන විට සමහර විට තවත් ජීවිත ගණනක් අවසාන වී තිබෙන්න පුළුවනි. මෙය සිදුවී තිබෙන්නේ සම්පූර්ණයෙන්ම මේ රජයේ ඒ අංශය භාර ඇමතිතුමාගේ අදූරදර්ශී ක්‍රියා කලාපය නිසා බව මා නිර්භයව කියනවා. බස්වල රියැදුරන් වගකීමක් භාර දෙන්න තරම් සුදුසු පුද්ගලයන්ද කියා හරියාකාර තෝරා බලා නියම විධියට එම තනතුරු භාර නොදුන් නිසයි අද ඔය විධියට ජීවිත 24ක් විනාශ වී තිබෙන්නෙ. ඒ වගේම තව කී දෙනෙකුට අංග විකලයන් වී දුක් විඳිමින් ජීවත් වීමට සිදු වේද කියා අපි දන්නේ නැහැ. අන්න ඒ නිසා මේ රජයෙන් අපි කරුණු කිහිපයක් ඉටු කරවා ගන්න බලාපොරොත්තු වෙනවා. අපේ ඇමතිතුමා බොහොම වැදගත් අදහස් තිබෙන ඇමතිතුමෙක්. ඒ නිසා මේ කාරණය උඩ ඇමතිපදවියෙන් ඉල්ලා අස්වෙන්නය කියා මා කියන්නේ නැහැ. සමහර රටවල නම් ඒ විධියට සිදු වෙනවා. දේශපාලනය අතින් අපි ඒ තරම් ශ්‍රේෂ්ඨ තත්ත්වයකට ගොස් නැහැ. අපි දේශපාලනය අතින් සිටින පහත් තත්ත්වය සලකා ගෙනයි මා එසේ කිව්වෙ. ඒ අනුව මා ඇමතිතුමාට කියන්නේ නැහැ ඉල්ලා අස් වෙන්නය කියා. කෙසේ වුණත් "විළි ලැජ්ජා නැතිකම මහ මුදලිකමටත් වඩා ලොකුය" කියා අපේ කියමනක් තිබෙනවා. එය විග්‍රහ කරන්න මා අදහස් කරන්නේ නැහැ. විළි ලැජ්ජා නැති මනුෂ්‍යයාට කරන්න බැරි දෙයක් නැහැ.

කෙසේ වෙතත් අපට වුවමනා කරන වැදගත් කරුණක් තිබෙනවා. මේ පසුගිය දිනවලදී ඇති වුණ බස් අනතුරු ගැන සම්පූර්ණ පරීක්ෂණයක් කර ඒවාට සම්බන්ධ වුණ පුද්ගලයන් ගැන සුපරීක්ෂාකාරීව සලකා බැලිය යුතුයි. මේ රජය පත් වුණාට පසු ලංකා ගමනාගමන මණ්ඩලයට පත් කරගෙන සිටින සැම සේවකයෙක් ගැනම පරීක්ෂා කර බලා, හොඳ හැටි කරුණු සොයා බලා, ඒ බඳවා ගැනීම් සාධාරණද, අසාධාරණද, මහජන ආරක්ෂාවට සුදුසු පරිදි ඒවා කර තිබෙනවාද නැද්ද කියන එක ගැන අපක්ෂපාත තීරණයක් වුවමනා කරනවා. අනික් කරුණ නම් මේ බස් අනතුරුවලට භාජන වූ අයට වන්දි ගෙවීමයි. ඔවුන්ට යල් පැනල වන්දි ගෙවීමෙන් වැඩක් වන්නේ නැහැ. සමාජ සේවා ඇමතිතුමා නම් මේ අවස්ථාවේ මෙතන නැහැ. ගමනාගමන ඇමතිතුමා කියාවි මෙය මට අයත් වැඩක් නොවේය, සමාජ සේවා ඇමතිතුමාට අයිති වැඩක්ය, කියා. ඒ නිසා සමාජ සේවා ඇමතිතුමා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වේවා, සෞඛ්‍ය ඇමතිතුමා වේවා, ජනසතු සේවා ඇමතිතුමා වේවා, අනතුරට භාජන වී සිටින අයට ගෙවිය යුතු වන්දි අප්‍රමාදව ගෙවීම සඳහා කළ යුතු සෑම දෙයක්ම කරනවා ඇතැයි අප බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් සේවය, අද මහජනයාට ආරක්ෂා සහිතව බස් රියක යන්නට බැරි තත්ත්වයට පත් වී තිබෙනවා. අද ගමනාගමනයට බසුත් නැහැ. ශ්‍රාවස්තිය ළඟ මා පැය බාගයකට වඩා සිටියා, අද බස් එකක් නැතිව. ඒ නිසා ගරු ඇමතිතුමා අපක්ෂපාත නම්, ගරු ඇමතිතුමා කෙරෙහි අපේ විශ්වාසය තවත් සනාථ වීමට නම්, මේ සෑම කාරණයක් සම්බන්ධයෙන්ම අපක්ෂපාත පරීක්ෂණයක් කිරීම සඳහා මණ්ඩලයක් පත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

අ. භා. 7.13

**නීල් ද අල්විස් මයා.** (බද්දේගම)

*(திரு. நீல் டி அல்விஸ்—பத்தேகம)*

(Mr. Nead de Alwis—Baddegama)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අක්මීමන ප්‍රදේශයේ පිලානේ මහා විද්‍යාලයේ දැන් ළමයින්ගේ වැඩ වර්ජනයක් තියෙනවා. දෙමව්පියන්ගේ දැනීමත් ඇතිව ඒ දරුවන් වැඩවර්ජනය ගෙන යන්නේ ඉතාමත් වැදගත් හේතුවක් ඇතිවයි.

1965 දී මගේ බද්දේගම ආසනයේ හපුගොඩ මහා විද්‍යාලයට මුල් ගුරුවරයෙක් පත් වී ආවා. මා හිතන පිළිවෙලට ඔහු පැමිණියේ කුරුණෑගල ප්‍රදේශයේ සිටයි. ඒ මුල්ගුරුවරයා පැමිණි දා සිට ඒ විද්‍යාලයේ ළමයින්ගේ ගණන දවසින් දවසම පහළ බැස්සා. ඒ විදුහල්පතිතුමා වැඩ භාර ගන්න අවස්ථාවේදී ඒ විද්‍යාලයේ ළමයින් 300 ක් පමණ සිටියා. අවුරුද්ද අවසාන වන්නට ප්‍රථම ඒ ගණන 43 ට බැස්සා. ඒ මහත්මයාගේ නම සිරිසේන වැයිහේන යි. ස්කෝල නැති කරන්නට නම් මේ පුද්ගලයා යැවිය යුතුය කියන එක ගාලු දිස්ත්‍රික්කයේ ප්‍රසිද්ධයි.

ඊයේ පෙරේදා මේ පුද්ගලයාගේ ශ්‍රේණිය උසස් කර තිබෙනවා. ඒක පුදුමයක්. "බී" ශ්‍රේඩ් ප්‍රින්සිපල් කෙනකු හැටියට ඒ තැනැත්තාගේ ශ්‍රේණිය උසස් කර තිබෙනවා. මේ ගුරුවරයාගේ ශ්‍රේණිය උසස් කිරීම පිළිබඳව ගාලු දිස්ත්‍රික්කයේ ගුරුවරුන් තුළ පමණක් නොව මුළු ලංකාවේම ගුරුවරුන් තුළ—එක්සත් ජාතික පක්ෂයට වැඩ කළ ගුරුවරුන් තුළ පවා—විශාල කලකිරීමක් තියෙනවා.

සිරිසේන වැයිහේන නමැති මේ පුද්ගලයා පිලානේ මහා විද්‍යාලයට පත් කිරීම ගැන ඒ පළාතේ දරුවනුත් දෙමව්පියනුත් කව්රුත් විරුද්ධත්වය ප්‍රකාශ කර තිබෙනවා. පාසල් නැති කරන ඒ පුද්ගලයා අපට වුවමනා නැත කියා ඒ අය කියනවා. දෙපාර්තමේන්තුවේ සිටින නිලධාරීනුත්, ඇමතිවරයාත්, උප ඇමතිවරයාත් පාසලක වැඩවර්ජනයක් ඇති වුනාම නිතරම කියන්නේ ශිෂ්‍යයන්ට දඬුවම් කළ යුතුය කියායි. එහෙත් මේ පාසලේ තිබෙන්නේ ඉතාමත්ම සාධාරණ වැඩවර්ජනයක්.

මෙතැන තිබෙන ලොකුම ප්‍රශ්නය සිරිසේන වැයිහේන නමැති ඒ විදුහල්පතිවරයාගේ ශ්‍රේණිය උසස් කිරීමයි. ඒක කළේ කව්ද කියා සොයා බලා එසේ කළ උදවියට දඬුවම් දෙන්නට ඕනෑ. විදුහල්පතිවරුන්ගේ ශ්‍රේණිය උසස් කරන්නේ ඔවුන් වැඩ කරන පිළිවෙල අනුවයි. පාසල් නැති කරන පුද්ගලයන්ගේ ශ්‍රේණිය උසස් කරනවාද, නැද්ද කියායි අප ප්‍රශ්න කරන්නේ. දූෂණ වැඩ පිළිවෙලක් අනුව මේ පුද්ගලයාගේ ශ්‍රේණිය උසස් කර තිබෙනවා. ඒ දරුවන්ගේ අධ්‍යාපනය නැති කිරීමේ අදහසින්, මොට කිරීමේ අදහසින්, මේ ගුරුවරයා පත් කර තිබෙන බව පෙනෙනවා. ඒ නිසයි, වැඩවර්ජනය ගෙන යන්නේ. මේ පුද්ගලයාගේ ශ්‍රේණිය උසස් කළේ කවුද කියා සොයා බැලුවොත් ගරු ඇමතිතුමාට පෙනෙයි, අල්ලස් ගැනීමේ දූෂණ වැඩ පිළිවෙලක් අනුව එය කර තිබෙන බව. මේ ගැන විශාල කලකිරීමක් තිබෙනවා. අවංකව, වෙහෙස දරා වැඩ කරන ගුරුවරුන් ශ්‍රේණියෙන් උසස් කිරීම පසුගිය කාලය තුළ නතර කිරීම නිසා, උසස් ශ්‍රේණිවලට පත් නොකිරීම නිසා, මේ රටේ සිටින ගුරුවරුන් වැඩි සංඛ්‍යාවක් තුළ මේ රජය කෙරෙහි ලොකු කලකිරීමක් දැන් ඇති වී තිබෙනවා. එපමණක් නොවෙයි, එක්සත් ජාතික පක්ෂයට වැඩ කළ ගුරුවරුන්ට පවා මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[නීල් ද අල්විස් මයා.]
ආණ්ඩුව එපාවන තත්ත්වයක් දුන් ඇති වී තිබෙනවා. මා කලින් සඳහන් කළා, පිලානෙ මහා විද්‍යාලයේ අළුත් විදුහල්පති පත් කිරීම පිළිබඳ ප්‍රශ්නය නිසා, එම පත් කිරීමට විරුද්ධත්වය ප්‍රකාශ කිරීමක් වශයෙන්, අද එහි වැඩවර්ජනයක් පවතින බව. එම පත්කිරීම ගැන ඉක්මණින්ම කරුණු සොයා බලා වැරදි කර ඇති අයට සුදුසු දඬුවම් දෙනු ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

අ. භා. 7.18

**ආචාර්ය එන්. එම්. පෙරේරා** (යටියන්තොට)

*(கலாநிதி என். எம். பெரேரா—யட்டியாந்தோட்டை)*

(Dr. N. M. Perera—Yatiyantota)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නික වැරටියෙ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ කාරණය මාද අනුමත කරන අතර ඒ පිළිබඳව වචන ස්වල්පයක් කථා කරන්න බලාපොරොත්තු වෙනවා. වැලිවිට රිය අනතුරට භාජන වී මිය ගිය රථයේ රියදුරා මගේ කොට්ඨාශයේ පුද්ගලයෙක්. ඔහු ළඟදී ලංගමයට බැඳුණු කෙනෙක්. මේ පුද්ගලයා ගැන කරුණු මා සොයා බැලුවා. මට ලැබී ඇති ආරංචිවල හාටියට මොහු කලින් මෝටර් රථයක්—කාර් එකක්—එළවූ පුද්ගලයෙක්. බොහොම සුළු කාලයක් ලොරියක් එළවා තිබෙනවා. ඒත් සැතපුම් දෙක තුනක ප්‍රමාණයෙ පමණයි. මට දැනගන්න ලැබී ඇති හැටියට මාස හතරක් ඇතුළතදීයි මෙවැනි පත්වීමක් ලැබ ලංගමයට පැමිණ තිබෙන්නෙ. වැඩි පුහුණුවක් නොලද මෙබඳු පුද්ගලයකුට සීඝ්‍රගාමී බස්රථයක් ධාවනය කිරීමට භාර දීම භයානක දෙයක්. එපමණක් නොවෙයි, ආරංචිවල හැටියට මේ තැනැත්තාට අතිකාල දීමනා ලබාගන්නටයි මෙම ශීඝ්‍රගාමී බස් රථය දී තිබෙන්නෙ. මේ අන්දමට මහජනතාව ගැන කිසිම තැකීමක් නැතුව, ජීවිත ගැන කිසිම සැලකිල්ලක් නැතුව නුසුදුසු පුද්ගලයන්ට මෙවැනි බස්රථ භාර දීම භයානක වැඩක් මෙන්ම ඉතාමත් කනගාටුදායක දෙයක්. බණ්ඩාරවෙල පෙරළී, අනතුරට භාජන වුණු බස් රථයේ රියදුරාගේ නොසැලකිලිමත් භාවය නිසා එම අනතුරු සිදු වී ඇතැයි පොලිස් වාර්තාවේ සඳහන් බව පත්‍රයෙහි පළ වෙනවා. දෝවේ පංසල අසලදී, වේගයෙන් රිය ධාවනය කරමින් භයානක වංගුවක් ගැනීමේදී රථය පල්ලමට පෙරළී ගොස් තිබෙන බව පත්‍රයෙහි දැක්වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රියදුරන් පුහුණු කිරීමේ විශාල ජාවාරමක් අද පවතිනවා. රියදුරන් පුහුණු කරන ඉස්කෝල ගණනාවක්ම තිබෙනවා. පුහුණුව ලබා දී බලපත්‍රයත් ලබා දෙන්න රුපියල් පන්සියයක් ඉල්ලනවා. රුපියල් පන්සියය ගෙව්වාම බලපත්‍රයත් ලබා දෙන්න මෙම ආයතන පොරොන්දු වෙනවා. මේ නිසා බොහෝ විට කිසිදු දැනීමක් නැති පුද්ගලයන්ට රිය බලපත්‍ර ලැබී තිබෙනවා. ඉන් පසුව එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයකුගෙ මාර්ගයෙන්—ලිපියක් ලබාගෙන—ලංගමයට ගියාම රියදුරකු වශයෙන් රක්ෂාවක් ලැබෙනවා. මේකයි අද ඇති වී තිබෙන තත්ත්වය. මේ ආණ්ඩුව බලයට ආවාට පස්සෙ කොතරම් සංඛ්‍යාවක් රියදුරන් මේ අන්දමට ලංගමයට බඳවා ගෙන තිබෙනවාදැයි සොයා බලන්න. ඒ අන්දමට බැඳුණු බොහෝ දෙනකු අද ශීඝ්‍රගාමී බස් රථ එළවනවා. අන්න ඒ නිසයි මේ අන්දමේ භයානක විපත්ති සිදු වෙන්නෙ. වැලිවිට රිය අනතුරෙන් මිය ගිය එක් පුද්ගලයකු, හක්බෙල්ලැවක මහා විද්‍යාලයේ ප්‍රධානාචාර්ය මහත්මයයි. බරපතල පවුලක වගකීමක් භාර මේ මහතා මිය යාමෙන් එම පවුලට මුහුණ පාන්න වන තත්ත්වය මොකක්ද? මෙවැනි අපරාධ කර මොන තරම් වන්දියක් ගෙවා බේරෙන්නද? මෙය ඉතාම භයානක වැඩක්, බරපතල අපරාධයක්. ජීවිත 50 ක 60 ක වගකීම භාර දෙන විට ඊට සුදුසු පුද්ගලයෙකුට නොවෙද භාර දිය යුතු වෙන්නෙ? නොසැලකිලිමත්ව ක්‍රියා කරන පුද්ගලයන් අරයගෙ මෙයාගෙ වුවමනාකම් පිට ලංගමයට බඳවාගෙන සිදුවන භයානක අපරාධවලට වගකියන්නෙ කව්ද? මට දැනගන්න ලැබී ඇති හැටියට, නුවරඑළියෙ මන්ත්‍රීතුමාගෙ (ඩොනල්ඩ් ජේ. රණවීර මයා.) ලියමනක් උඩයි, මේ පුද්ගලයාට අතිකාල දීමනා ලබාගැනීම පිණිස ශීඝ්‍රගාමී බස් රථයක් භාර දී තිබෙන්නෙ. මේ ගැන මා විපරම් කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බැලුවා. මට ලැබී ඇති ආරංචියේ හැටියට අනිකුත් මන්ත්‍රීවරුන් ලියමනක් දීමට බැරියයි කියද්දී, නුවරඑළියෙ මන්ත්‍රීවරයාගේ ලියමනක් උඩයි මේ බස්රථය ලබාගෙන තිබෙන්නෙ. [බාධා කිරීමක්]

කම්කරු ඇමතිතුමා මේ අවස්ථාවෙ නොසිටීම ගැන මා කනගාටු වෙනවා. මෙයට දවස් දෙකකට පෙර එතුමාට මා ලිපියකින් දැනුම් දුන්නා, "රෝපරන් ඩම්" ප්‍රශ්නය ගැන කථා කිරීමට මා අදහස් කරන බවට. වතුකරයේ වෘත්තීය සමිති අංශයෙහි, සී. ඩබ්ලිව්. සී. සමිතියට විශේෂ තැනක් දී තිබෙනවා. ඇමතිතුමා මෙහි නැති නිසා මා ඒ කාරණය ඉදිරිපත් කරන්නේ නැහැ. එහෙත් මා එය හෙට ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වන නිසා ගරු ඇමතිතුමා මෙම ගරු සභාවට කරන ගෞරවයක් වශයෙන් මෙහි පෙනී සිටිනවා ඇතැයි මා අදහස් කරනවා.

අ. භා. 7.22

**බී. වයි. තුඩාවේ මයා.** (මාතර)

*(திரு. பி. வை. துடாவ—மாத்தறை)*

(Mr. B. Y. Tudawe—Matara)

ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් අද මා මේ අවස්ථාවේදී ප්‍රශ්නයක් අසන බව ඊයේ මා එතුමාට දැනුම් දුන්නා. එතුමා මෙහි නැහැ. එහෙත් ගරු මුදල් ඇමතිතුමා ඊට පිළිතුරු දීම බාරගෙන තිබෙන බව පෙනෙනවා.

මගේ ප්‍රශ්නය විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලැබූ ශිෂ්‍ය පිරිසක් පිළිබඳ එකක්. ශිෂ්‍ය ගුරු විභාගයට පෙනී සිට ඉන් පසු විශ්ව විද්‍යාලයට ඇතුළු වී එහි අධ්‍යාපනය ලබා දුන් රැකියාවක් නැතිව ගෙදරට වී සිටින ශිෂ්‍යයින් ගණනාවක් සිටිනවා. ඔවුන් ලැබූ විශ්ව විද්‍යාල අධ්‍යාපනය අනුව ඔවුන්ට රක්ෂා දෙන්නට බැරි නම් අඩු ගණනේ ඔවුන් කලින් සමත් වී තිබෙන ශිෂ්‍යගුරු විභාගය අනුවවත් ඔවුනට පත්වීම් දෙන ලෙස ඔවුන් ඉල්ලීමක් කරනවා. වැඩි සුදුසුකම් ඇති මේ පිරිසගෙන් අඩු මුදලට සේවය ලබා ගන්නට රජයට දැන් පුළුවන් වී තිබෙනවා. එම නිසා, රුපියල් 100 යේ වැටුපක් ලැබෙන ශිෂ්‍ය ගුරු පත්වීම්වත් ඔවුන්ට ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා. ඔවුන්ට ඒ අවස්ථාව ලබා දෙනවාද යන වග ගරු ඇමතිතුමාගෙන් මා දැනගන්නට කැමැතියි.

මගේ අනෙක් ප්‍රශ්නය මෙයයි: ගුරු සංගම්වල රැස්වීම් පැවැත්වීමට පාසල් ගොඩනැගිලි ඉඩ දෙන ලෙස ගරු අධ්‍යාපන ඇමතිතුමා නියෝග කර තිබෙනවා. එහෙත්, මාතර දිස්ත්‍රික්කයේ ලංකා ජාතික ගුරු සංගමයේ රැස්වීම පැවැත්වීම සඳහා පාසල් ගොඩනැගිල්ලක් ඉල්ලූ විට අධ්‍යාපන නිළධාරිතුමා එය දෙන්නට බැරි බව කණගාටුවෙන් ප්‍රකාශ කරන්නට සිදු වී තිබෙනවායයි. දන්වා එවා තිබෙනවා. මාතරට පමණක් මේ විධියේ නොසැලකිල්ලක් වෙනස්කමක් කරන්නේ මක්නිසාදැයි මා ගරු ඇමතිතුමාගෙන් අහනවා.

අ. භා. 7.24

**පර්සි වික්‍රමසිංහ මයා.** (කඹුරුපිටිය)

*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ—கம்புறுப்பிட்டிய)*

(Mr. Percy Wickremasinghe—Kamburupitiya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ කොට්ඨාශයේ කද්දුව-කඹුරුපිටිය පාර කැඩී බිඳී ගොස් මාස හයක් තිස්සේ ඉතාමත් අබලන් තත්ත්වයකට පත් වී තිබෙනවා. ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවට මේ ගැන කොපමණ කිව්වත් මේ පාර හදන්නේ නැහැ. මෙය ඉතාමත් හදිසි කාරණයක්. බස් අනතුරු සිදු වුණහම ජනසතු සේවා ඇමතිතුමාට අප දොස් කියනව. පාරවල් අබලන් වුණහම ඒවායේ ගමන් කරන බස්, අනතුරුවලට භාජන වෙනවා. මෙම පාරේ බස් සේවය දැන් මාස ගණනක් තිස්සේ නැවතී තිබෙනවා. මෙය අලුත්වැඩියා කරන ලෙස දෙපාර්තම්නේතුවට දැන්වූ විට එතැනින් අපට දන්වන්නේ තලනයන් හෙවත් "රෝලර්" නැති බවයි. කඹුරුපිටියට තිබෙන්නේ රෝලර් 4 යි. එයින් 2 ක්ම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කල් තැබීම

[පර්සි වික්‍රමසිංහ මයා.]

ප්‍රසිද්ධ වැඩ පිළිබඳ ඇමතිතුමාගේ ආසනය වන වැලිගම කොට්ඨාශයට ගෙන ගොස් තිබෙනවා. මුළු මහත් මාතර දිස්ත්‍රික්කයටම ඉතිරි වී තිබෙන්නේ අනෙක් රෝලර් 2 පමණයි. මගේ ප්‍රදේශයේ අබලන් පාරවල් සියල්ල වහාම යථා තත්ත්වයට පත් කරන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. කද්දුව-කඹුරුපිටිය පාර ගැන එතුමාගේ විශේෂ අවධානය යොමු කරන ලෙස මතක් කරනවා.

අ. භා. 7.25

**ගරු වී. ඒ. සුගතදාස (ජනසතු සේවා ඇමති)**

*(கௌரவ வி. ஏ. சுகததாச—தேசியமய சேவை அமைச்சர்)*

(The Hon. V. A. Sugathadasa—Minister of Nationalized Services)

නිකවැරටියෙ ගරු මන්ත්‍රීතුමාත් (එම්. තෙන්නකෝන් මයා.) යටියන්තොට ගරු මන්ත්‍රීතුමාත් (ආචාර්ය එන්. එම්. පෙරේරා) ඉතාමත් කණගාටුදායක සිද්ධි දෙකක් ගැන කථා කරන්නට යෙදුණා. ඉන් එකක් නම්, කොළඹ සිට බදුල්ල බලා ගිය බස් රථයක් බණ්ඩාරවෙලදී හදිසි අනතුරකට පත් වීමයි. එය සිදු වී තිබෙන්නේ එදා උදේ 8.45 ට පමණයි. 23 දෙනකු ඒ හදිසි අනතුරින් මැරුණු බවත් ඒ ගරු මන්ත්‍රීවරුන් කිව්වා. මේ ගැන පරීක්ෂණයක් පවත්වන්නට ලංකා ගමනාගමන මණ්ඩලයේ උසස් නිලධාරීන් 3 දෙනකු ඈනට එහි ගොස් සිටින බව මා ඒ ගරු මන්ත්‍රීවරුන්ට දන්වන්නට කැමැතියි. පත්තර මාර්ගයෙන් නම් නොයෙක් විධියේ ප්‍රවෘත්ති පැතිරී ගොස් තිබෙනවා. එක් පත්‍රයක් 23 දෙනකු මැරුණු බව කියන අතර තවත් එකක 25 දෙනකු මැරුණායයි පළ වුණා. මැරුණු ගණන 26 යයි තවත් පත්තරයෙක පළ වුණා. පරීක්ෂණයක් කරන තුරු ඒ ආරංචිවල ඇත්ත නැත්ත කුමක්දැයි කියන්නට බැහැ. එම නිසා, දැන් මේ හදිසි අනතුර ගැන පරීක්ෂණයක් පවත්වාගෙන යන බව ඒ ගරු මන්ත්‍රීවරුන් දෙදෙනාටම මතක් කරන්නට කැමැතියි.

වැලිවිට සිද්ධිය සම්බන්ධයෙන් යටියන්තොට ගරු මන්ත්‍රීතුමා කියන්න යෙදුණා, ඒ රියැදුරු මහතා අරගෙන මාස 4යි කියා.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**

*(கலாநிதி என். எம். பெரேரா)*

(Dr. N. M. Perera)

නැහැ, නැහැ, වැඩියි. මේ ශීඝ්‍රගාමී කාර්යය භාර දී මාස 4 බවයි මා කිව්වෙ.

**ගරු සුගතදාස**

*(கௌரவ சுகததாச)*

(The Hon. Sugathadasa)

එා කාරණය ගැන පරීක්ෂණයක් පවත්වාගෙන යන බව මා ප්‍රකාශ කරන්න කැමතියි. මේ කාරණා දෙකෙන්ම උද්ගත වී ඇති තත්ත්වය අනුව මගේ අදහසක් තිබෙනවා. ඉදිරියට මෙවැනි දේවල් සිදු වීම වළක්වා ගැනීම සඳහා මොන අන්මින් ක්‍රියා කළ යුතුද කියා විමසා බැලීම පිණිස ගමනාගමන මණ්ඩලයේ උසස් නිලධාරීන් දෙන්නෙක් හෝ තුන් දෙනෙක් පත් කිරීමට. කෙසේ වෙතත් මා දැන් පොරොන්දු වෙනවා, මේ කාරණා ගැන පරීක්ෂා කර බලා වාර්තාවක් දෙන්නට.

**නියෝජ්‍ය කථානායකතුමා**

*(உப சபாநாயகர் அவர்கள்)*

(Mr. Deputy Speaker)

The Hon. Minister of Finance will reply on behalf of the Minister of Education and Cultural Affairs.

අ. භා. 7.27

**ගරු වන්නිනායක**

*(கௌரவ வன்னிநாயக்க)*

(The Hon. Wanninayake)

පාඨශාලාවක වැඩ වර්ජනයක් ගැන බද්දේගම ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් නැඟුවා. ඒ සම්බන්ධයෙන් අධ්‍යාපන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අමාත්‍යාංශයෙන් මට ලැබී තිබෙන පිළිතුර නම්, මේ ගැන අංග සම්පූර්ණ පරීක්ෂණයක් පවත්වා ඒ වර්ජනයට වගකිය යුත්තා හෝ වගකිවයුත්තන් කවුද කියා සොයා බලා ඔවුන්ට දඬුවම් පැමිණවීමට දැන් අධ්‍යාපන අමාත්‍යාංශය කටයුතු කර ගෙන යන බවයි.

**නීල් ද අල්විස් මයා.**

*(திரு. நீல். டி அல்விஸ்)*

(Mr. Neal de Alwis)

කාට පගාව දීලාද ඒ ගුරුවරයාගේ ශ්‍රේණිය උසස් කරගෙන තිබෙන්නේ? ඒ ප්‍රදේශයේ පාසල් නැති කරන පුද්ගලයා උසස් කෙළේ කවුද?

**ගරු වන්නිනායක**

*(கௌரவ வன்னிநாயக்க)*

(The Hon. Wanninayake)

ඒ ගැන පරීක්ෂණයක් පැවැත්වීමට දැන් කටයුතු කරගෙන යනවා. බද්දේගම මන්ත්‍රීතුමාටත් වුවමනා නම් ඒ පරීක්ෂණ මණ්ඩලය ඉදිරිපිටට පැමිණ කරුණු ඉදිරිපත් කරන්න පුළුවන්.

**නීල් ද අල්විස් මයා.**

*(திரு. நீல் டி அல்விஸ்)*

(Mr. Neal de Alwis)

හොඳයි මට දන්වන්න. මම ගොස් කරුණු කියන්නම්.

**ගරු වන්නිනායක**

*(கௌரவ வன்னிநாயக்க)*

(The Hon. Wanninayake)

මාතර මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් ඉදිරිපත් කළා රැස්වීම්වලට ඉඩ දෙන්නෙ නැත කියා. රැස්වීම් පැවැත්වීමට ඉඩ දීම සම්බන්ධයෙන් ඒ ඒ පළාත්වල සිටින අධ්‍යාපන නිලධාරීන්ට වගකීම හා බලය පවරා තිබෙනවා. යම් කිසි පුද්ගලයකුට හෝ සමිතියකට හෝ යම් පාඨශාලා ගොඩනැගිල්ලක රැස්වීමක් පැවැත්වීමට වුවමනා නම් ඒ ගැන ඉල්ලීමක් කළාට පස්සේ, මේ ඉල්ලන්නේ කවුද, මොන කාරණයක් සඳහා ද පාඨශාලා ගොඩනැගිල්ලට එයින් යම් හානියක් වේවිද, උපකරණවලට යම්කිසි හානියක් වේවිද, ආදී කරුණු ගැන සම්පූර්ණ පරීක්ෂණයක් කරලයි ඒ සඳහා අවසර දෙන්නේ. එසේ කරනු ලබන පරීක්ෂණයේ ප්‍රතිඵලය අනුව තමයි යම් කිසි පාඨශාලා ගොඩනැගිල්ලක රැස්වීමක් පැවැත්වීමට අවසර දෙන්නෙ. අපේ පළාත්වලත් නොයෙක් අය නොයෙක් විධියේ රැස්වීම් පවත්වනවා. හැබැයි දෙපාතීමේන්තුවෙ වගකීමක් තිබෙනවා, පාඨශාලා ගොඩනැගිලි සහ උපකරණ ආරක්ෂා කිරීමට.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**

*(கலாநிதி என். எம். பெரேரா)*

(Dr. N. M. Perera)

යූ.එන්.පී. රැස්වීම්වලට පමණයි අවසර ලැබෙන්නේ.

**ගරු එම්. ඩී. බණ්ඩා (කෘෂිකර්ම හා ආහාර ඇමති)**

*(கௌரவ எம். டீ. பண்டா—விவசாய, உணவு அமைச்சர்)*

(The Hon. M. D. Banda—Minister of Agriculture and Food)

සාමකාමී රැස්වීම්වලට.

**ගරු වන්නිනායක**

*(கௌரவ வன்னிநாயக்க)*

(The Hon. Wanninayake)

ඊ ළඟට ශිෂ්‍ය ගුරුවරයකුගේ පත්වීමක් ගැන ප්‍රශ්නයක් විමසන්න යෙදුණා. මේ කියන අය ශිෂ්‍ය ගුරුවරයකු වශයෙන් පත් වුණාට පස්සේ ඒ පත්වීම හරාගන්නේ නැතුව විශ්ව විද්‍යාලයට ඇතුළු වී තිබෙනවා.

**තුඩාවේ මයා.**

*(திரு. துடாவ)*

(Mr. Tudawe)

ඉතින් මොකක්ද වරද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

බොහෝම හරි. එහෙත් ඔහු පත්වීම භාර නොගෙන ගියාට පසු එතැනට ගුරුවරයෙක් නැතුව තබන්න පුළුවන්ද? ඒ ගුරුවරයා උසස් අධ්‍යාපනය සඳහා ගියාය කියා ඔහු එන තුරු පොතුත් පැත්තකින් තබාගෙන ඒ ශිෂ්‍යයන් බලා සිටිය යුතුද? ඒ මහතාට දැන් කළ යුතුව තිබෙන්නේ උසස් අධ්‍යාපනය ලැබීම නිසා වඩා සුදුසුකම් ඇති බැවින් නැවත ශිෂ්‍ය ගුරුවරුන් ගන්නා විට ඉදිරිපත් වීමයි, එසේ නැත්නම් උපාධිධරයකු හැටියට පත්වීමක් ඉල්ලා සිටීමයි. එවිට ඔහුට පත්වීමක් ලැබේවි.

**එකල්හි වේලාව අ. භා. 7.30 වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා මන්ත්‍රී මණ්ඩලය කල් තබන ලදී.**

**මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව, අ. භා. 7.30 ට, 1968 පෙබරවාරි 11 වන ඉරිදා පූ. භා. 10 වන තෙක් කල් ගියේ ය.**

*அப்போது பி. ப. 7.30 மணியாகிவிடவே உப சபாநாயகர் வினு விடுக்காமலேயே சபையை ஒத்தி வைத்தார்.*

*அதன்படி, சபை 1968 பெப்ரவரி 11, ஞாயிற்றுக்கிழமை மு. ப. 10 மணிவரை ஒத்திவைக்கப் பெற்றது.*

*It being 7.30* P.M., MR. DEPUTY SPEAKER *adjourned the House without Question put.*

*Adjourned accordingly until 10* A.M. *on Sunday, 11th February 1968.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. (අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි.) මාස 6කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කලින් එවිය යුතුය.

சந்தா : பணம் கொடுத்த தேதியை யடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம். தனிப்பிரதி சதம் 30, தபால்மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்.

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months, each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org